# ප්‍රාතිහාර්‍යශතක

## විස්තරාර්ථ වර්ණනා.


මොරවක

පී. ඇෆ්. අභයවික්‍රම මහත්මයා

විසින් සම්පාදිත යි.



ඇන්. ජේ. කුරේ සහ පුත්‍ර මහතුන්

විසින්

විද්‍යාසාගර මුද්‍රණාලයෙහි

මුද්‍රිත යි.

2478

1935

# සංඥාපනය.

## i සංඥාව

ශ්‍රීඝනශාක්‍ය මුනීන්‍ද්‍රයන් වහන්සේ විසින් තීර්ථකයන්ගේ මාන මර්දනය කොට ලත් වස් 'ගණ්ඩම්බ' වෘක්ෂ මූලයෙහි දී දක්වන ලද යමකමහාප්‍රාතිහාර්ය වර්ණනා කිරීම කථාශරීරය කොට රචනා කරන ලද මේ මධුරමනොහර කාව්‍යයාගේ නාමය කර්තෘපාදයන් විසින් කාව්‍යයෙහි අනිර්දිෂ්ට ය. එහෙත් 'ප්‍රාතිහාර්ය ශතකය' යනු මේ ග්‍රන්ථයාගේ සංඥාව බව සුප්‍රකට ය. අන්වර්ථ වූ මේ නාමය ම ග්‍රන්ථකාරකයාණන්ට අභිමත වූ බවට සැකයෙක් නැති.

## ii නිමිත්ත

සර්වඥසන්ත්‍රවරයන් වහන්සේගේ ගුණසාගරය වර්ණනා කිරීමෙන් ලැබිය යුතු පුණ්‍යඵලයෙහි ලොල් බව මේ ග්‍රන්ථකරණයට අසාධාරණ කාරණ වූ සේ තැකිය යුතු. මෙහි කර්තෘපාදයාණන්, ස්වකීය කවිත්වය බුද්ධගුණවර්ණනය පිණිස ම නිපන් සේ තැකූ සිංහල කිවිමිණිවැලෙහි බැබළුණෙන් ස්වකවිත්වය නිමිති කොට බුදුගුණ කුසුම් රසට වසනන වනයක් බඳු මේ සුන්දර කාව්‍යය රචිත ය යි කිව ද නිවරද සේ ය. මේය එකල බෙහෙවින් අවනති යෙහි පැවති සිංහල සාහිත්‍යයට නැඟී සිටිනු වස් යථා ශක්තින් අත දීමක් නො වෙති යි ද සිතිය නො හේ.

බාහ්‍ය නිමිත්තක් වූ බවට නම් ග්‍රන්ථය දෙස් නො දෙයි.

## iii කර්තෘ

**ප්‍රාතිහාර්යශතකය** කර්තෘවරයාගේ ද නාමය නො දක්වයි. ග්‍රන්ථාන්තරයෙක ද ඒ අප විසින් නො දක්නා ලදි. එතෙකුදු වුවත් **සාල්ගාලේ මණිරතන** ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් රචිත ය යි ප්‍රකට ය. ඒ තත්වඥයන්ගේ ව්‍යවහාරයෙහි ආ හෙයින් සම්භාව්‍ය ය. එ මතු නො වෙයි. මණිරතන ස්වාමීන්ද්‍රයන් විසින් රචිත බවට සැකයක් නැති '**කව්මුතුහර**' නම් කාව්‍යයෙහි හා ප්‍රාතිහාර්යශතකයෙහි එන ඇතැම් වර්ණනයන් හා පදයොජනාදිය පිළිබඳ සාම්‍යයෙන් ද ග්‍රන්ථද්වය ම එකකර්තෘක බව සවුට කළ හැකි ය.

**මණිරත්න** ස්වාමීන්ද්‍රයන් '**කළුගල**' නම් වෙහෙර වාසතව්‍ය යකු වූ බව දක්වූහ. උන්වහන්සේ ම කව්මුතුහරෙහි :-

"92 මල් පලතුරුසැදි — න
වන ගෙලෙන් දිසි හැමදි — න
මුනිසුත යති හිඳි — න
සොඳුරු **කළුගල** වෙහෙර තිතිඳි — න

93 නඳන වන ලොවිඳු — ට
**මණිරතන** යති යත ම — ට
අදර බුහුමන් කො — ට
කෙලෙන් ආරුදනා තියු කො — ට" යි

මෙ කී **කළුගල** විහාරය **මාතර** කන්දබඩ පත්තුවට අයත් **ගල්ඇඹුඩ** නම් ග්‍රාමස්ථානයෙහි පිහිටියේ ය. මෙය විවේක කාමී මුනීන්ද්‍රපුත්‍රයන්ට රමණීයස්ථානයක් බව පෙනේ.

**මණිරත්න** හිමිපාණන්ගේ ජන්මභූමිය **මාතර** ගඟබඩ පත්තුවේ කඹුරුපිටියට බටහිරින් පිහිටි **සාලිඇල** (= සාල්යාල) නම් ග්‍රාමවරය යි. හාලිඇලේ වැව මේ අසල ය.

**කව් මුතුහර, ප්‍රාතිහාර්‍ය්‍යශතක** ද්වය පමණක් නො ව අමාරසය ද මුන්වහන්සේගේ කෘතියකි. මේ ග්‍රන්ථත්‍රයෙන් උන්වහන්සේ තුළ පැවති සිංහලභාෂාවිෂයෙහි අප්‍රතිහත බුද්ධිප්‍රභාවය හා පාලි සංස්කෘත භාෂාවන්හි හා ව්‍යාකරණ ඡන්දොලඞ්කාරාදියෙහි මහත් නෛපුණ්‍යය ද පැහැදිලි වේ. මේ හැමට වඩා බුද්ධධර්මයෙහි පැවති සුනිශිතඥතාය හා භක්ත්‍යතිශය ද සුවිශද ව දක්නා ලැබේ.

මෙ කී ග්‍රන්ථයන් රචනා කළ කාලය ගැන සලකා බලත් ම **මණිරත්න** ස්වාමිපාදයන් වහන්සේ අවනතියෙහි පැවති සිංහල සාහිත්‍යය නඟා සිටුවීමෙහි පුරෝගාමි වූ උතුමන් අතුරෙන් අග්‍රගණ්‍ය වූහ යි කීම අතිශයෝක්තියක් කොට නො සලකමු. තව ද මුන්වහන්සේ 'කවිවරයන්ගේ ජන්මභූමිය' යන කීර්ති නාමය මාතර ප්‍රදේශයට ලබා දීමට ප්‍රමුඛ වූහ යි අවිවාදයෙන් පිළිගත යුතු ය. **ජයවර්ධනපුර** කාලයෙන් පසු පරසතුරු උවදුරින් අන්ධකාරයෙහි නිමග්න ව පැවති ධර්මශාස්ත්‍රයන් හා බුද්ධශාසනය ද උන්නතියට පමුණුවා ලීමෙහි ප්‍රථම පුරුෂ වූ බෝධිසත්ත්වගුණොපෙත **වැලිවිට සරණඞ්කර** සඞ්ඝරාජයන් වහන්සේ හා තදීය ශිෂ්‍ය **කරතොට ධම්මාරාම** ස්වාමීන්ද්‍රයන් ඇසුරු කොට ධර්මශාස්ත්‍රවිෂයෙහි ප්‍රාවීණ්‍යය හා කවිත්වය ලත් මුන් වහන්සේ සිංහල සාහිත්‍යය පිළිබඳ නවප්‍රබෝධයට ගරු කරනුවන් විසින් ප්‍රාතඃස්මරණීය ම ය.

### iv පරිමාණය

ප්‍රාතිහාර්‍ය ශතකයෙහි ප්‍රමාණය වෙසෙසා නො දැක්වුව ද කාව්‍ය නාමයෙන් ම ඒ දත හැකි ය. ශතක යනු පද්‍ය සියයෙකින් නිබද්ධ කාව්‍යයට නමි. සූර්‍යශතක, බෞද්ධශතක ආදිය මෙති. සියයෙකින් ඔබ්බෙහි පද්‍ය කතිපයක් වුව ද ශතකත්වයට හානියක් නො වන බව පෙනේ. එහෙයින් මෙහි ප්‍රමාණය පද්‍යද්වයක් අධික කොට ඇති සිලෝ සියයෙකි. අපගේ සංස්කරණයෙන් පෙර ප්‍රකාශයට පැමිණි පිටපත්හි එකකින් අධික වූ සිලෝ සියයෙක් දක්නා ලැබේ. මෙහි එක් පද්‍යයක් ඉන් අධික වීමට හේතුව "අපගේ සංස්කරණය" යන හිසින් යුත් කොටසින් දන්නේ ය.

ඛණ්ඩ කාව්‍ය ලක්ෂණයෙන් යුක්ත වූ මේ ග්‍රන්ථය සර්ග විසින් නො බෙදුණේ ය.

### v ප්‍රයෝජනය

මුනීන්ද්‍රයන් වහන්සේගේ ගුණවර්ණනායෙන් වක්තෘශ්‍රොතෘ ජනයන් විසින් ලැබිය යුතු පුණ්‍යඵලය හා ශාක්‍යසිංහයන් වහන්සේ වෙත සෞගතයන්ගේ ශ්‍රද්ධාභක්ති වර්ධනය ද සිංහල සාහිත්‍යයට සංග්‍රහයක් කිරීම හා නවීනයන් කාව්‍ය නිර්මාණයෙහි උත්සාහවත් කොට ලීම ද මෙහි ප්‍රයොජන විසින් ඉෂ්ට ය යි තැකිය හැකි යි.

### vi නිර්මාණ කාලය

මේ කාව්‍යය නිම වූ වර්ෂය ද නො දක්වන ලද ය. එසේ වුවත් ශ්‍රී බුද්ධ වර්ෂ 2290 දී හෙවත් ක්‍රි: ව: 1747 දී රාජ්‍යශ්‍රියට පැමිණ පන්තිස් වසක් ලක්රජය කළ කීර්ති ශ්‍රී රාජසිංහ නරදෙවයන්ගේ කාලයෙහි රචිත ය යි සලකමු.

මේ පිළිබඳ විචාරයෙහි අතිශයින් උපයොගි වූ කවිමුතුහරෙහි පරස්පර විරොධි ලෙස වර්ෂයන් දක්නට ලැබීම සම්භාව්‍ය නිගමනයට බැසීමට බාධක ය.

බු: ව: 2326 වන වර්ෂයෙහි රජකු වූ බව මුද්‍රිත කව්මුතුහරෙහි:

"බුදුවසිති දෙදහ ස – තුන්සිය සවිසි වන ව ස
ගුණනුවණ යස රැ ස – තිරිඳු නරිඳෙක් වි සිරිලක හ ස" 5

යන්නෙන් හා කිර්ති ශ්‍රී රාජසිංහ ය යනු එතුමාගේ නාමය බව

"බුදුකුරු පුරු නිබ ද – මෙ කිත් සිරි රජසිහ ර ද
සිරි සඳ උර වැල ද – බිජි සිරිලක නර ඉසුර වි ද" 18

යන කවෙන් ද ප්‍රකාශිත ය.

මේ උක්තිය ඉතිහාසයට පටහැණි ය. **කීර්ති ශ්‍රී රාජසිංහ** අවනිපාලයන්ගේ රාජ්‍යෝදය බු: ව: 2290 දී වූ බව හා එතුමන් පන්තිස් වසක් ම රජසිරි වැළඳූ බව ද **මහාවංශාදියෙහි** කී හේයිති.

**කීර්ති ශ්‍රී රාජසිංහ** නරේන්ද්‍රයන් 2290 වන බුද්ධවර්ෂයාගේ මූල භාගයෙහි දී ම ඔටුනු පලන් හෙයින් එතුමන්ගේ පන්තිස් වස සම්පූර්ණ වන්නේ 2324 වැන්නෙහි දී ය. ඔවුන් ඇවෑමෙන් **රාජාධි රාජසිංහ** භූපාලයන් සිංහාසනාරූඪ වූයේ ද මේ වර්ෂයෙහි ම ය. මේ නිගමනය සර්වප්‍රකාරයෙන් නිරවද්‍ය බව, **රාජාධිරාජසිංහ** අවනීශයන් විසින් කරවන ලද 'රාජාධි රාජසිංහ කතිකාවතෙ' හි එන :-

> " **කීර්ති ශ්‍රී රාජසිංහ** දෙවිමහරජාණන් ශ්‍රී බුද්ධ වර්ෂයෙන් **දෙදාස් දෙසිය අනූ** වෙනි වර්ෂයෙහි සිරිලක රජ පැමිණ ............................**පන්තිස් හවුරුද්දක්** රාජ්‍ය ශ්‍රී වළඳා ස්වර්ගස්ථ වූ පසු එම රජතුමාණන් සහෝදර භ්‍රාතෘ වූ ......... .............. ශ්‍රී **රාජාධි රාජසිංහ** අප දෙවිමහරාජෝත්තමයන් ශ්‍රී බුද්ධ වර්ෂයෙන් **දෙදාස් තුන්සිය සූවිසි** වන වර්ෂයෙහි සකල නගරශ්‍රීන් විරාජමාන ශ්‍රීවර්ධනපුරයෙහි අසදෘශ වූ රාජ්‍යශ්‍රී පද ප්‍රාප්ත වූ..."

යන පාඨයෙන් පැහැදිලි වේ.

මෙසේ හෙයින් බු: ව: 2326 වැන්නෙහි කීර්ති ශ්‍රී රාජසිංහ රාජයන් වූ බව කීම සර්වප්‍රකාරයෙන් ම ප්‍රතිෂ්ඨා රහිත ය. සාහසික ව ඉතිහාස ග්‍රන්ථයන් මත දෝෂය ආරෝපණය කළත් රජකුගේ අවසාන වර්ෂය කීම කවීන්ගේ සම්ප්‍රදායට විරොධි වෙයි. කාව්‍යශෙඛරාදියෙන් එය සලකාන්න.

මූලින් කී වර්ෂය නිදොස්. '**කිත්සිරි රද සිහරද**' යයි කීයේ **රාජාධිරාජසිංහ** රජුන් උදෙසා ය සි කිසිවකු කියත හොත් එයට ද නැත යෙමු. 'රාජාදි රජසිහරද' යි අනායාසයෙන් කිය හැකි ව තිබිය දී 'මෙකිත් සිරි රජසිහරද' යි ප්‍රසිද්ධ වූ පූර්ව නරේශයකුගේ නාමය අපර නරනාථයකුට ද ව්‍යවහාර කිරීමෙන් ස්වකෘතීන්හි නිර්මාණ කාලය විවෙචනය කරනු කැමැතියන්ට දුර්ගයක් මවා ලිමට කර්තෘපාදයන් යතන කළහ යි නො සිතෙන හෙයිනි. එසේ කියන ලද නම් එය තමන් නිදොස් බව පිණිස ද නො වෙයි. එ මතු නො වෙයි. කාලවිරොධිත්වයෙන් ද ඒ මතය දුෂ්ට ය.

“ව සි න් සක තිරිඳු සතලොස් සියය ව න
ම සි න් බිතර පුණු පොහොලත් රතඟ දි න
බු දු න් දෙසූ මෙ දසරතදු පෙළ කෙමෙ න
නොසි න් නිම කෙළෙම් කාව හෙළදිව් බසි න” යයි

**කව්මුතුහර** 1700 වන ශක වර්ෂයේ බිතර පුණු පොහෝ දින අවසන් කළ බව ග්‍රන්ථාවසානයෙහි කියන ලදී. ඒ බුද්ධ වර්ෂයෙන් 2322 වැන්න යි. (= 1700 + 622 = 2322.) 2322 වැන්නෙහි දී නිම කළ ග්‍රන්ථයක 2326 වැන්නෙහි දී හෙවත් වර්ෂ සතරකින් පසු වන සුලු කිසිවකුගේ නාමය කෙසේ දක්විය හැකි ද? මෙසේ හෙයින් කව්මුතුහරෙහි ‘බුදුවසිති දෙදහස’ ආදි කව දුන් ඇති පරිදි සදෙස් ය යි සහෙතුක ව පවසමු. එය **රාජාධිරාජසිංහ** රජුගේ රාජ්‍යෝදය **මහාවංශ**යෙහි කී අයුරු විවෙචනය කොට ගැන්මෙහි අසමර්ථ වූ කිසියම් අර්ධාචීනයකු විසින් ග්‍රන්ථ කර්තෘන් වහන්සේගේ යෙදීම විපරීත කොට ගළපන ලද්දකැයි සලකමු. මේ රජුන්ගේ කාලයෙහි ම ජීවත් ව සිටි මණිරතන ස්වාමිපාදයන් විසින් තම් මේ වර්ෂයන් වරදවා යෙදීමට හේතුවක් නොමැති හෙයිනි. “ කීර්ති ශ්‍රී රාජසිංහ නරෙශයන් බු: ව: 2290 දී රජසිරි ලත් බව හා 35 වසක් වැජඹුණු බව මහාවංශයෙහි කියන ලදී. එහෙයින් එතුමන් ස්වර්ග පරායණය වූයේ 2325 වැන්නෙහි දී ය. එවිට රාජාධිරාජසිංහ නර නාථයන් සිංහාසනාරූඪ වූ වර්ෂය 2326 විය යුතු ය ” යි සලකා ඔවුන් එසේ කළහ යි සිතේ.

එහෙයින්,

“ බුදුවසිති දෙදහ ස – දෙසියතුනු වන ” ඈ විසින්

**මණිරත්න** ස්වාමීන්ද්‍රයන්ගේ පද්‍යය නො පැවැත්තේ ය යි කෙ සේ සලකමු ද?

**රාජාධිරාජසිංහ** රජුගේ සමයෙහි ද **මණිරත්න** හිමිපාණන් ජීවතුන් අතර වැජඹුණ බවට නම් අපගේ විවාදයෙක් නැත.

**කීර්ති ශ්‍රී රාජසිංහ** නරෙශ්වරයන්ගේ අවසාන භාගයෙහි රචිත **කව්මුතුහර**ට පළමු **ප්‍රාතිහාර්යශතකය** රචිත ය යි සිතිය හැකි යි. **ප්‍රාතිහාර්යශතක**යෙහි 2 වන පද්‍යය **කව්මුතුහර**රෙහි:

“ පිළිමිණි ගෙයස සැ දි – සරිතුලැඟි හස් බිත රැඳි
තම සේ දුක පැහැ දි – හසඟනක් ඡේ සිප වෙහෙස විඳි ” 247

යන පද්‍යය හා සසඳ බැලිය යුතු. මේ කුඩා පද්‍යයෙහි කිව මනා අදහස **ප්‍රාතිහාර්යශතක**යට අයත් පද්‍යයේ ඇති අයුරට වඩා කො තරම් චමත්කාරජනක ලෙස ගැප් කොට තිබේ ද? මෙ බඳු

අන්‍ය වූ ද ප්‍රයෝග අවිරල ය. මෙසේ හෙයින් ප්‍රාතිහාර්යශතකය රචනා කළ කාලයෙහි පැවතියාට වඩා කව්මුතුහර රචනා කරන කාලයෙහි කතීශ්වරයාණන්ගේ පද්‍යරචනාචාතුර්යය පරිණත ව පැවති බව පෙනේ.

## vii ග්‍රන්ථ තත්වය

ප්‍රාතිහාර්යශතකය ශාස්ත්‍රය අතිශයින් පිරිහී පැවති සමයක රචිත බව පළමු කියන ලදී. එ බඳු කාලයක රචිත ග්‍රන්ථයෙක අලඞ්කාරාදි ශාස්ත්‍රානුසාරයෙන් සියුම් ලෙස පිරික්සා බලන විට සදෙස් යෙදුම් දක්නට ලැබීම නො ව නො ලැබුණොත් එය ම පුදුමයකි. එහෙත් මේ කාව්‍යය බෙහෙවින් ම ප්‍රශංසාහී බව පෙනේ. රසවත් පද්‍යයන් නො අඩු හෙයින් "වාක්‍යං රසාත්මකං කාව්‍යම් – රසය ආත්ම කොට ඇති වාක්‍යය කාව්‍ය නමැ" යි ශ්‍රී විශ්වනාථ කවිරාජයන් කී සෙයින් මේ ග්‍රන්ථයාගේ කාව්‍යත්වයට පැමිණීම අතිවාර්ය ය. උත්පාදකශක්තිය විදහා දක්වන ප්‍රයෝග බහුල හෙයින් කවිත්වය පතනුවන් විසින් සෙවනාහී ද වෙයි.

ගීසිවුපද ලක්ෂණයුක්ත පද්‍යයන්ගෙන් කාව්‍යයන් රචනා කිරීම බෙහෙවින් සිංහල කවිවරයන් විසින් ආසෙවිත ය. ඒ හැම පද්‍යයෝ ම සිංහලයට පමණක් විශෙෂ වූ ඡන්දෝලක්ෂණ යුක්ත කොට නිබද්ධයහ. ප්‍රතිහාර්යශතකය ඒ ක්‍රමය ඉක්ම පෙරට තැබූ පළමු වන පියවර සේ සැලකිය යුතු යි. එතෙක් කල් පැවති සම්ප්‍රදාය යෙන් නො බැඳී සංස්කෘතයෙහි වර්ණවෘත්තයන්ට කී ඡන්දෝලක්ෂණ යුක්ත කොට බැඳි පද්‍යයන්ගෙන් කාව්‍යය පරිපූර්ණ හෙයිනි. සිංහල සාහිත්‍ය වෘක්ෂයේ අභිනව ශාඛාවක ප්‍රථම අඞ්කුරය ලෙස ප්‍රාතිහාර්යශතකය සම්භාවනා ලැබිය යුතු ය යනු අප අදහස යි. වස්තුනිර්දේශය කාව්‍ය මුඛ කොට රචිත ග්‍රන්ථයක් නො මැත්තෙන් පැවති සිංහල සාහිත්‍යයාගේ ඌනත්වය පහ වූයේ ද මේ ප්‍රාතිහාර්ය ශතකයෙනි.

ජේකයන්ගේ සම්භාව්‍ය ශබ්දප්‍රයෝගක්‍රමයන් උල්ලඞ්ඝනය නො කොට රචිත මේ ග්‍රන්ථය විද්‍යාර්ථීන් විසින් සෙවනාහී බව පවසමු.

## viii අපගේ සංස්කරණය

ප්‍රාතිහාර්ය ශතකය මින් පෙර කිහිප වරක් ප්‍රකාශයට පැමිණි නමුත් අතිශයින් ම දූෂිත ව පැවැත්තේ ය. පැරණි සන්නයෙන් යුක්ත කොට ඒ වාරයන්හි ප්‍රකාශයට පැමිණවූවන් විසින් පද්‍යයන් හෝ සන්නය ලේඛකයන් අතින් වූ ප්‍රකට

දෝෂයෙන් වත් මුද්‍ර ලූ බවෙක් නො පෙනේ. එහෙයින් මෙ තෙක් ප්‍රාතිහාර්‍ය ශතකයෙහි තත්ත්වය හැඳින ගැන්ම දුෂ්කර ව පැවැත්තේ ය. බොහෝ පද්‍යයන්ට අර්ථ දක් වූ අපුරු ග්‍රන්ථකර්තෘන් වහන්සේගේ අදහස වසා ලන ලෙස පැවති බව අපගේ සංස්කරණය හා සසඳ බැලීමෙන් දත හැකි ය. පැරණි සන්නය ද බොහෝ තන්හි දී අපගේ චිත්තාරාධනය නො කෙළේ ය. මෙ සේ හෙයින් පද්‍යයන්හි ඇති අර්ථය ප්‍රකට වන අයුරින් සුබෝධ ව්‍යාඛ්‍යානයක් ලියන්නට අපට සිදුවිය. එ පමණෙක් නො වෙයි. ආචාර්‍යවරයකුගේ සහාය යෙන් තොර ව වුවත් ව්‍යාකරණ ඡන්දෝලක්ෂණාදි කාව්‍යය පිළිබඳ සියල්ල සුව සේ උගත හැකි ලෙස අන්වය, අර්ථ, විස්තර, ටිප්පනී, පද්‍ය විභාග, සංලක්ෂ්‍යයන්ගෙන් අපගේ සංස්කරණය සරසා ලිමූ.

මේ සංස්කරණයෙහි 65 වන පද්‍යය බොහෝ පිටපත්හි නො දක්නා ලැබේ. එහෙත් සම්භාව්‍ය පුස්කොළ පිටපත්හි දක්නා ලැබෙන හෙයින් හා ප්‍රාතිහාර්‍ය ශතකකර්තෘවරයාණන්ගේ ම කෘතියකැයි හැඟෙන හෙයින් ද ඒ අප සංස්කරණයෙහි ස්ථානයක් ලද්දේ ය. එය පිට පත්හි දක්නා ලැබෙන්නේ 63 වන පද්‍යය වශයෙනි. එ තැන්හි අනුචිත හෙයින් අපගේ සංස්කරණයෙහි දී එය 65 වන අඞ්කය ගනී.

## ix උපකාරානුස්මරණය

අපගේ සංස්කරණය පිණිස පැරණි පුස්කොළ පිටපත් කිහිපයක් සපයා දීමෙන් වැලිගම අග්‍රබෝධි විහාරපරිවෙණාධිපති ගෞරවාර්හ කීර්ත්ති ශ්‍රී ධම්මරතනාභිධාන මාතර හම්බන්තර දෙපළාතේ ප්‍රධාන සඞ්ඝනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් කරන ලද උපකාරය අත්‍යන්ත ගෞරවයෙන් සිහිපත් කරමු.

අපගේ අභිනව ව්‍යාඛ්‍යානයට පැරණි සන්නය ඉවහල් වූ බව නො කිව හොත් අකෘතඥ කමෙකි. පැලියගොඩ විද්‍යාලඞ්කාර මහාවිද්‍යාලයෙහි උපාචාර්‍ය මොරවක ශ්‍රී සිද්ධාර්ථ ස්වාමීන් වහන්සේ මෙහි විස්තරාර්ථ වර්ණනාව ලිවීම පිණිස උවමනා උපදෙස් දීමෙන් හා ග්‍රන්ථාන්තරයෙන් කරුණු උපුටා දීමෙන් ද ප්‍රථම ශෝධ්‍ය පත්‍ර බලා දීමෙන් ද බොහෝ උපකාරී වූහ. බාල වියෙහි පිහිටි විචක්ෂණ වූ මේ ස්වාමීන්වහන්සේගෙන් ලත් සියලු ම උපකාර ආදරයෙන් සමරණය කරම්හ. විද්‍යෝදය මහාවිද්‍යාලයේ ආචාර්‍ය පූජ්‍ය පණ්ඩිත වැලිවිටියේ සෝරත ස්වාමිපාදයන් වහන්සේ විසින් අවසාන ශෝධ්‍යපත්‍ර බලා දීමෙන් කරන ලද අනුග්‍රහය ග්‍රන්ථයේ ගෞරවය දියුණු වීමට හේතු විය. ප්‍රසිද්ධ

ග්‍රන්ථ කර්තෘවරයකු වූ කීර්තිමත් මුන්වහන්සේගෙන් ලත් උපකාර ගෞරවයෙන් සිහිපත් කරමු. ග්‍රන්ථය දර්ශනීයාකාරයෙන් මුද්‍රණය කර දුන් ඇන්. ජේ. කුරේ සහ පුත්‍ර මහත්හු ද ප්‍රශංසාර්හයෝ ය.

පී. ඇෆ්. ජ. අභයවික්‍රම.

1935 අප්‍රේල් 15 දින
මොරවක දී ය.

# විෂය සූචිය.


| | | |
|---|---|---|
| 1. | කව්මුව | පද්‍ය අංක 1 |
| 2. | සැවැත්පුර වැනුම් | ,, 2 – 11 |
| 3. | දෙවුරම් වෙහෙර වැනුම් | ,, 12 – 18 |
| 4. | සිදුහත් කුමර වැනුම් | ,, 19 – 21 |
| 5. | මහබිනික්මන් වැනුම් | ,, 22 |
| 6. | පැවිදි වෙස් ගැනුම පටන් විදුරසුනැරීම තෙක් පුවත් | ,, 23 |
| 7. | මරයුද වැනුම් | ,, 24 – 30 |
| 8. | මරඟන වැනුම් | ,, 31 – 33 |
| 9. | මරඟන බස් | ,, 34 – 36 |
| 10. | මරඟනන් පැරදවීම | ,, 37 |
| 11. | මුනිරද වැනුම් | ,, 38 – 39 |
| 12. | යමාමහ පෙළහර පිළිබඳ පුවත් | ,, 40 – 57 |
| 13. | සැණකෙළි සිරි වැනුම් | ,, 58 – 68 |
| 14. | අනත් නා රජුගේ පැසසුම් | ,, 69 – 98 |
| 15. | දෙවාදීන් තිකුත් වීම | ,, 99 |
| 16. | තව්තිසා වැඩීම් ඈ පුවත් | ,, 100 – 101 |
| 17. | බුදුන් ලොව බැබළුණු අයුරු | ,, 102 |

**සැලකිය යුත්තක්**

1 වන පද්‍යයේ 3 වන පිපපතියෙහි "'තොස්' යන ධාතුහු" යන තන්හි ධාතුව 'තුස්' යි ද

25 වන පද්‍යයේ 8 වන පිපපතියෙහි 'දෘනාත්‍ය' යනු 'දනාත්‍ය' යයි ද ශුද්ධ විය යුතු.

අන්‍ය වූ ද මුද්‍රණ දෝෂයන් විරල ව දක්නා ලැබෙතත් ග්‍රන්ථය පරිශීලනය කරන්නවුන් විසින් ම ඒ දත හැකි හෙයින් ශුද්ධි පත්‍රයක් නො යෙදීමු.

# ප්‍රාතිහාර්ය්‍යශතක
# විස්තරාර්ථ වර්ණනා.

## නමවූ මුනිසරණ.

ස්වස්ති ප්‍රශස්ත සමස්ත ගුණරත්න රත්නාකරායමාණ අඞ්ගිරස ශාක්‍යසිංහයාණන් වහන්සේ විසින් දක්වන ලද චින්තාවිෂයාතික්‍රාන්ත යමකමහාප්‍රාතිහාර්ය්‍ය වර්ණනා කොට "ප්‍රාතිහාර්ය්‍යශතක" නම් රමණීය ග්‍රන්ථයක් රචනා කරනු කැමති සාල්යාලේ මණිරත්න මහතෙරපාණන් වහන්සේ වස්තුනිර්දේශය තතමුඛ කරනු පිණිස "සුරිඳුපුර පවස්නා" ආදි මුක්තක පද්‍යය කීහ.

1 සුරිඳුපුර පවස්නා නන් සුරන් සිත් සතො ස්නා
දෙවිඳු අග නිවෙස්නා සව් සැපත් රැස්නි රැ ස්නා
මන රඟ රඟ පු ස්නා නන් විමන් පැ නුමු ස්නා
පුර පවර පස ස්නා වී සැවැත් මි සදි ස්නා

**අන්වය හා පදාර්ථ:** **නන් සුරන්** - නොයෙක් දෙවියන්ගේ, **සිත්** - චිත්තයන්, **සතොස්නා** - සතුටු කරන්නාවූ, **රැස්නා** - රුචිකරන්නාවූ, **සව් සැපත් රැස්නි** - සකලසම්පත්ති රාශියෙන්, **දෙවිඳු** - ශක්‍රදේවේන්ද්‍රයාහට, **අගනිවෙස්නා** - අග්‍ර වාසස්ථානවූ, **සුරිඳු පුර** - සුරේන්ද්‍රපුරය (දෙව්ලොව හෝ අමරාවතී නගරය,) **පවස්නා** - ප්‍රකාශ කරන්නාවූ, **මනරඟ** - මනොඥවූ, **රඟ** - නෘත්‍යයන්, **පුස්නා** - පොෂණය කරන්නාවූ, **නන් විමන්** - නොයෙක් විමාන(ප්‍රාසාද)යන්ගේ, **පැ** - ප්‍රභාව, **නුමුස්නා** - නොමුදන්නාවූ, **පසස්නා** - පසසනු ලබන්නාවූ, **සදිස්නා** - දීප්ති සහිතවූ, **සැවැත්** - ශ්‍රාවස්තී නම්, **පුරපවර** - උතුම්වූ නගරයක්, **මි** - පෘථිවියෙහි, **වී** - වූයේය.

**විස්තර:** i සුරිඳු පුර පවස්නා...... ..........................
දෙවිඳු අග නිවෙස්නා සව් සැපත් රැස්නි රැස්නා,

රුචිකරවූ සකල සම්පත්ති රාශියෙන් තව්තිසා දෙව්ලොව හෝ අමරාවතී නගරිය බඳුයයි කීයේයි.

'සුරිඳුපුර' යනුවෙන් සාමාන්‍යයෙන් දිව්‍යලෝකය හෝ ශක්‍රපුරය අභිමත යි. එහෙත් 'දෙවිඳු අග නිවෙස්නා'යි වෙසෙසීමෙන් 'තව්තිසා' දෙව්ලොව ම යයි ගතයුතු. ශක්‍රයා සිව්මහරජය තව්තිසාය යන දෙදෙව්ලොවට අධිපති වුව ද, තව්තිසාහිම වෙසෙන හෙයින් ඒ ඔහට අගනිවෙස් වේ. නගර පක්‍ෂයෙහි ශක්‍රයාට **මසක්කසාර වසොක්කසාරා අමරවතී** යි නගරත්‍රයක් ඇතත් ප්‍රධානවාසස්ථාන හෙයින් අමරාවතී නගරය ම ගතයුතු.

මෙයින් ශ්‍රාවස්තිනගරයෙහි සකල සම්පත්තීන්ගේ සමෘද්ධිය සූචිතයි.

ii මනරඟ රඟ පුස්නා,

සැවැත්හි මනොඥවූ නෘත්‍යය හැමවිටම පවත්නෙන් එනුවර නෘත්‍යය ආරක්‍ෂා කොට නෙත පොෂණය කරන්නකු බඳු වේ. මනරම් නෘත්‍යයෙන් නිරන්තරවූ ය යුසේයි.

iii නත් විමන් පෑ නුමුස්නා,

ප්‍රාසාදයන්ගේ කාන්තිය නොහරින්නාවූ; දිවා රෑ දෙක්හි ම ප්‍රාසාදයන්ගේ කාන්තියෙන් එක පැහිර සිටි -

ශ්‍රාවස්ති නගරය දිවා රාත්‍රී දෙක්හි එකසේ බබලන ප්‍රාසාදයන්ගෙන් යුක්ත බව මින් කීහ.

**විපසනි:**

1. **සුරිඳුපුර** - දිව්‍යලෝකය හෝ ශක්‍රයාගේ නගර.

පුරසද සිංහලයෙහිදී නගරාර්ථයෙන් පිටත් ලෝකාර්ථයෙහි ද බෙහෙවින් යෙදුණු බැව් ජෙකප්‍රයෝගයන්හි දක්නා ලැබේ.

**ගුත්තිලයෙහි -**

"**තිදසපුර වන්දූ** - ඔවුන් ගුණ මොහු සිත නොවත් දූ"

" **පෙර සුර පුරට** පවුරෙව් මෙර වටා සි ටි
ස මු ද ර තරඟ සෙමෙරට ලූ කිරණ මි ටි
සු ග ඳු ර පටන් අඩකිත් එකිනෙකට මි ටි
ම න හ ර රුවන් සත්කුල පවුවලලු දි ටි"

"ඉන් නෝ වෙහි නොසිට-යවයි නෙරපූය **යම්පුරයට**"

මෙහි වනාහි 'සුරිඳු පුර' යි ගත් හෙයින් ශක්‍රයාගේ නගර යයි ම හෝ අරුත් ගත හැකියි. ඕහුට වනාහි පූර්වෝක්ත නගරත්‍රය වෙයි.

2. **පවස්නා** - 'පවස - පැවසීමෙහි' දැයින් 'නා' ප්‍රත්‍යය ව සකාරස්ථ අකාර ලෝපයෙන් සිද්ධ කර්තෘ කාරක වර්තමාන කාලික කෘදන්ත යි.

3. **සතොස්නා** - 'ස' පූර්ව 'තොස්' යන ධාතුන්ගෙ කෙරෙන් 'නා' ප්‍රත්‍යය යෙදී සිද්ධ කෘදන්ත යි.

4. **නිවෙස්නා** – 'නිවෙසන' ශබ්දයෙන් බුන් 'නිවෙසුන්' සඳින් අ ප්‍රත්‍යය ද සකාරයේ උකාර ලොපය ද වීමෙන් 'නිවෙස්න' යි සිද්ධ වේ දීර්ඝය වෘත්තය රැකීම පිණිස යි.

5. **රුස්නා** – 'රුස්' දයින් 'පවස්නා' යන්නට කී සෙයින් සිද්ධි දතයුතු.

6. **මනරඟ** – චිත්‍රාකාරවූ; සුන්දරය යුසේයි.

7. **විමන්**– දෙවියන්ගේ වාසස්ථානාදි අත්‍යුත්කෘෂ්ටගෘහයන්හි 'විමන්' සද යෙදෙයි. 'විමාන' ශබ්දයෙන් නිපන්නායි. සාමාන්‍යගෘහවාචක නොවන්නේ ද නොවේ.

"පැල්ලැඟ **විමන්** හැර" (කාව්‍යශේඛර.)

8. **පෑ** – රශ්මිවාචි පභා ශබ්දයෙන් පැහැ යි නිපන්න යි. හකාර ලොපයෙන් දීර්ඝ වී.

9. **නුමුස්නා** – නො පූර්ව 'මුස්' ධාතු කෙරෙන් 'නා' ප්‍රත්‍යයව 'නො' නිපාතයේ 'ඔ' කාරයට 'උ' කාරව සිද්ධයි.

10. **පුරපවර** – උතුම්වූ පුරයක්. ඒ උතුම්වීමට කාරණ තෙලෙස් වන ටිප්පනියෙන් දතයුතු.

11. **පසස්නා** – 'පසස්' ධාතු කෙරෙන් 'නා' ප්‍රත්‍යය ව කර්තෘ කාරකයට සාධාරණව සිද්ධ කෘදන්ත යි. මෙහි කර්ම අරුත්හි වේ.

12. **වී** – 'වූ - වීමෙහි' ධාතුවෙන් ප්‍රථම පුරුෂ එකවචන 'ඊ' විබත් යෙදී සිද්ධ අතීත කාලික ක්‍රියායි.

13. **සැවැත්** – 'සාවත්ථි' ශබ්දයෙන් නිපන්නයි.

ශ්‍රාවස්ති නගරය වනාහි **අචිරවතී** නදීතීරයෙහි පිහිටි **කොශල** දෙශයෙහි අතිශයින් සමෘද්ධිමත් ව පැවති ප්‍රධාන නගරයයි. එය ම කොශල නරෙන්ද්‍රයන්ගේ රාජධානිය ද විය. සැදැහැත් **අනේපිඬු**, **විශාඛා** ආදීහු ද එහි ම වාස්තව්‍යයෝ වූහ.

**ශ්‍රවස්ත** ඍෂිහුගේ වාසභූමිය වූ බැවින් 'ශ්‍රාවස්ති' නම් වීයයි වෛය කරණයෝ පවසත්. කිනම් දෙයක් ඇද්දැයි විචාළ විට **'සබ්බමත්ථි'** – (සියල්ල ඇත) යි පිළිතුරු දීම නිමිතිකොටගෙන මෙනම වීයයි නිරුක්තිනයක් ගන්නා ලැබේ.

කියනලද මැයි **පපඤ්චසූදනී** අට්ඨකථාවෙහි:-

"සබ්බද සබ්බූපකරණං සාවත්ථියං සමොහිතං
තස්මා සබ්බ මුපාදය සාවත්ථීති පවුච්චති."

බුද්ධකාලයෙහි සත්කෙළක් මනුෂ්‍යයන් විසූ මේ මහානගරයෙහි **ජේතවනාරාමය**, **පූර්වාරාමය**, **රාජකාරාමය** යන මහාවිහාරත්‍රය ද පිහිටියේය.

" දඹදිව ඉසුරු බ ර
රුස්කොට තුබූ තැන් ශු ර
කොසොල් රට මතන ර
**සැවැත්** නම් වී පුරෙක් පුවත ර "

යනාදීන් ශ්‍රී **රාහුල** මාහිමියෝ සැවැත් නුවර වැනූහ.

ශ්‍රාවස්තිය වටින් 'ලී' 6000 ක් පමණයයි නගරය පූර්ව සමෘද්ධියෙන් බෙහෙවින් පිරිහුණු කල්හි පැමිණි චීන ජාතික **'ශ්වාංජ්ශ්වාන්'** තුමාගේ භ්‍රමණ වෘත්තාන්තයෙහි සඳහන් වේ. සැවත් නුවර පිහිටි භූමිප්‍රදේශය මෙකල **සහෙත් මහෙත්** යයි ව්‍යවහාර කරනු ලැබේ.

14. **මි** – 'මහි' ශබ්දයෙන් නිපන් 'මිහි' සඳෙහි හකාර ලොපයෙන් හා ඒ නිමිත්තෙන් ඉකාරද්වය එක්ව එකම දීර්ඝයක් වීමෙන් 'මී' සද සිද්ධයි. බෙහෙවින් සියලු විබත් හි දී ස්වකීය රූපය නොහැරීම සිංහල ශබ්දයන්ගේ ලක්ෂණය හෙයින් මෙ ද පියවියෙන් සිට අදර අරුත් පවස යි.

15. **සදිස්නා** – දිස්න සහ වූයේ සදිස්න. ද්විතීය වෘත්තය පිණිස යි. දිස්න සදිත් දීප්තියුක්ත වස්තූන්ගේ ද ගැන්ම නිදෙසි.

**කොවුල් අස්නෙහි** –

" අස්නක් සදිසි සිරිසඳ සිදින හැමව ර
**දිස්නක්** ලෙසින් මුළු සිරිලකට පුවත ර "

**සංලක්ෂ්‍යය :**

1. **වෘත්තය** – 'මාලිනී' නම්. එයින් කීහ **කේදාර භට්ටයෝ:**–

"නනමයයයුතෙයං මාලිනී භොගිලොකෛඃ" යි

යම් පද්‍යයක සතර පාදයම 'න' ගණ 'න' ගණ 'ම' ගණ 'ය' ගණ 'ය' ගණ යන මෙයින් යුක්ත වී නම් අකුරු අටකින් හා සතකින් යතිය වීනම් ඒ **මාලිනී** නම්.

මෙහි තත්ත්වඥතාව පිණිස ඡන්දශ්ශාස්ත්‍රාගත කරුණු දතයුතුයි.

**අක්ෂර** – ඡන්දශ්ශාස්ත්‍රයෙහි ලඝුය ගුරු යයි අක්ෂර ද්වයෙකි. **උච්චාරණ**යෙහිදී එක්මාත්‍රාවක් ඇත්තේ ලඝු නම්. 'අ' යනු උදාහරණයි. මාත්‍රාද්වයක් ඇත්තේද බින්දුවකින් හෝ විසර්ගයකින් නොහොත් හල්වර්ණයකින් පෙරටුවූයේද ගුරු නම්. 'ආ' 'මං' 'සඃ' 'සත්' යනු ක්‍රමයෙන් උදාහරණයි. ප්‍රස්තාරයෙහි දී ලඝුව ඍජුරේඛාවකින් ද ගුරු වක්‍රරේඛාවකින් ද හඳුන්වනු ලැබේ.

{ අ ආ මං සඃ සත් }<br>{ — ‿ ‿ ‿ ‿ } මෙසේයි.

**ගණ** – (මෙබඳු අක්ෂරත්‍රයක් ඇත්තේ ගණයෙකි. ඒ ගණයෝ අට දෙනෙක් ඡන්දස්හි දක්වන ලදහ.

**එළුසඳැස් ලකුණෙහි:**—

" මන තුන් තුන් ගුරු ලුහු – බදස ඈ මැද කෙළ ගුරු
යරතැමැදවසත් ලුහු – අට ගණ මෙසේ දන්නේ "

තුන ම ගුරු ලඝු වූයේ ක්‍රමයෙන් 'ම' ගණ 'න' ගණ නම් වේ. ආදි මධ්‍ය අවසානයන්හි ගුරු ඇත්තෝ 'බ' 'ජ' 'ස' ගණයෝ යි. ආදි මධ්‍ය අවසානයන්හි ලඝු ඇත්තෝ 'ය' 'ර' 'ත' ගණයෝයි. මෙසෙයින් අටගණ දත්තේය.

## ප්‍රස්තාර ක්‍රමයෙන් නම් හා උදාහරණ:-

| | | |
|---|---|---|
| ⏑ ⏑ ⏑ | සෙත්වේවා | ම ගණ |
| — ⏑ ⏑ | තිලෝනා | ය ,, |
| ⏑ — ⏑ | බාරුසි | ර ,, |
| — — ⏑ | නරසි | ස ,, |
| ⏑ ⏑ — | සජ්දුනි | ත ,, |
| — ⏑ — | මඬෝර | ජ ,, |
| ⏑ — — | වේ සුබ | බ ,, |
| — — — | නොපට | න ,, |

{සෙත්වේවා - සජ්දුනි ආදි
නත්හි ද සඳැස්හි කි
අකුරු අකුරු තුනක්මවේ.}

'භ' ගණය සිංහලෙහි දී 'බ' ගණයයි ගන්නා ලැබේ.

**යති** — නම් පද්‍යයන්ගේ විරාමස්ථාන (නවත්වනතැන්) යි පාදාන්තයෙහි යතිය නිත්‍යයි. පාද මධ්‍යයෙහි වනාහි නියමිත අකුරින් වේ. එක් පදයක එක් වර්ණයක් පෙරව හෝ පසුව තිබිය දී යතිය වී නම් **යතිභින්න** නම් දෝෂය ලැබෙන බව ඡන්දශාස්ත්‍රයන්හි කීහ. එහෙත් ඇතැම් කිවිහු ඒ නොසැලකූහ. සිංහලෙහි මෙසෙයින්ම නොසලකනලද බව පෙනේ.

**මාලිනී** වෘත්තයාගේ ලඝු ගුරු වින්‍යාසය මෙසේ යි-:

| න | | | න | | | ම | | | ය | | | ය | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| — | — | — | — | — | — | ⏑ | ⏑ | ⏑ | — | ⏑ | ⏑ | — | ⏑ | ⏑ |
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 \| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 \| |
| | | | | | | | යති. | | | | | | | යති. |

**2. කාව්‍යමුඛය** — ප්‍රාතිහාර්යශතකය වස්තු නිර්දේශය කාව්‍යමුඛ කොට ඇත්තේය. ආදියෙහි වස්තුවක් දක්වූ හෙයිනි. කාව්‍යයන්ගේ මුඛය ඉෂ්ටාශංසන නමස්කාර වස්තුනිර්දේශ යන මෙයින් අන්‍යතරයකින් යුක්තවේ. කියනලද මැයි. {“ආශීර්නමස්ක්‍රියාවස්තු නිර්දේශෝවාපි තන්මුඛම්” / “වත්නිදෙස් ආසී හෝ - නමසර හෝ පෙරට වේ.”}

මෙකී කාව්‍යමුඛත්‍රය මහාකාව්‍ය සම්බන්ධයයි පුරාතනාචාරීන් විසින් කියන ලද නමුත් එයින් පිටත් ඛණ්ඩ කාව්‍යාදියෙහි ද දක්නාලැබේ.

ආශීර්මුඛ - **සියබස් ලකර.**

“සඳවා මුවනඹර - වෙනොනද සිව්මුවා
සරසවිය හස සව්සුදු - කිවිසිත් පුල්මදෙවු විල්”

නමස්ක්‍රියාමුඛ - **ගුත්තිලය.**

“සිය පිත් සිරින් සරු - දෙතිස් ලකුණෙන් විසිතු රු
කෙලෙසුන් සොරෙන් දුරු - වදිම් මුනි උතුමන් තිලෝගු රු”

**3. පද්‍යවිභාගය** — **මුක්තක** නම්. “නිමුණු අර්ථ ඇති අනික් සොලොවක් අපෙක්ෂානොකරන එක සොලොවෙක් **මුක්තක** නම්වෙ යි,”

2 **පවර පුර ලකල් කල් නිල් මෙවුල්දම් විලස්වූ**
**පිරි පිවු කලහස් ලොල් කල් වියෝවූ තමංසේ**
**දුක පිළි මිණි පවුරේ කල්කුහුල්නෙන් නැගීමෙන්**
**නුබ තල බිත ගැස්මෙන් තොස් සතැවුලී සැපත්වී.**

**අන්වය හා පදාර්ථ:** **පවර** – උතුම්වූ, **පුර**– (ශ්‍රාවස්ති) පුර නමැති, **ලකල්** – මනොඥවූ, **කල්** – වනිතාවගේ, **නිල් මෙවුල්දම් විලස්වූ** – ඉන්ද්‍රනීල මාණික්‍ය මෙඛලා දාමයකට බඳු විලාස ඇති, **පිරි**– පරිඛාවගේ, **පිවු**– මස්තකයෙහි. **ලොල්** – ඇලුණාවූ, **කල්**– කාන්තාව ගෙන්, **වියෝවූ** – විරහ (වෙන්) වූ, **කලහස්** – කලහංසතෙම, **පිළිමිණි පවුරේ** – ස්ඵටික මාණික්‍යමය ප්‍රාකාරයෙහි, **තමාසේ** – තමාගේ ඡායාව, **දුක** – දර්ශනය කොට, **කල්කුහුල්නෙන්** – කාන්තාවක (හංසඟනක) යන කුතුහලයෙන්, **නුබ තල** – ආකාශ තලයට, **නැගීමෙන්** – උද්ගතවීමෙන්ද, **බිත** – පිළිමිණි පවුරු භිත්තියෙහි, **ගැස්මෙන්** – සඝට්ටනයවීමෙන්ද, **තොස්**– සන්තොෂයටද, **සතැවුලී** – සන්තාපයටද, **සැපත්වි** – සම්ප්‍රාප්තවූයේය.

**විස්තර:** i පවරපුර ලකල්කල් නිල් මෙවුල් දම් විලස් වූ - පිරි,

ඒ ශ්‍රාවස්ති නගරය අවට්න් වූ සුනිල් දිය පිරි පරිඛා තොමෝ නගර නමැති කාන්තාවගේ ඉන්ද්‍රනිල මාණික්‍යමය මෙඛලාවක් වැන්නීය. මෙඛලාදාමය වනිතාවගේ කටිය අවට වෙයි. පරිඛාව නගරිය අවට වන්නීය. නිල්මිණි මෙවුල නීලවර්ණයෙන් බබලයි. පරිඛාවද ගම්භීර හෙයින් නිලින් බබලයි.

ii දුක පිළිමිණි පවුරේ කල් කුහුල්නෙන් නැගීමෙන්
නුබතල බිත ගැස්මෙන් තොස් සතැවුලී සැපත් වී.

උක්තප්‍රකාර පරිඛාවෙහි වූ වියොගි **කලහංස** තෙම තමාගේ ඡායාව පිළිමිණි පවුරෙහි දුක හංසඟනාකැයි ඇතිවූ කුතුහලයෙන් අහසට නැගීමෙන් ප්‍රියාව වෙත වහා යාගත හැක්කැයි සන්තොෂයට ද ගමං නොසිතූ ප්‍රාකාර භිත්තියක ගැටීමෙන් සන්තාපයට ද පැමිණියේය.

හංසයා තම පිළිබිඹුව දුක ඔබ්බෙහි වූ හංසඟනාකැයි සිතීම ද තමා ප්‍රාකාර යෙහි ගැටෙනතුරු නොදුනීම ද කීමෙන් පිළිමිණි පවුරෙහි ආකාශය හා නොවෙනස් බව හැඟවූහ.

**විපසනී:**

1. **පවරපුර ලකල් කල්** – අගල මෙවුල් දමකැයි ගත්හෙයින් පුරය කාන්තාවක කොට රූපණය කළ අයුරු යි. පවර වූයේ ද එම පුර වූයේ ද පවරපුර. ලයට කල් ලකල්. ලකල් ද ඕ ම, කල් ද ඕ ම නු යි = ලකල්කල්. පවර පුර ම ලකල්කල් - පවරපුරලකල්කල්.

2. **නිල් මෙවුල් දම්** – නිලින් කළ මෙවුල් දම = නිල්මෙවුල්දම.
මෙහි 'නිල්' සද නිල්මිණි යන අරුත් දේ. "නිලක් බැඳපු මුද්ද" යනාදි වශයෙන් ව්‍යවහාරයෙහි ද මේ දක්නං ලැබේ.

මෙවුල් දම නම් පෙර ස්ත්‍රීන් විසින් කටිප්‍රදේශයෙහි (ඉඟෙහි) පැළඳි මිණිවැලකි. 'මසෙක් ගොදුරු පතා මෙවුලේ මිණිගතා' ආදි කවිප්‍රයෝග දක්නා ලැබෙන හෙයින් මෙය සතාන සමයෙහි ද නොමුදන්නක් බව සිතිය යුතු.

3. **පිරි** – පරිඛා හෙවත් දිය අගල යි. පුරාණ නගරයන්හි සතුරන් වැද්ද නොදෙනු පිණිස අවටින් කිඹුල් ආදීන්ගෙන් ගැවසීගත් ගැඹුරු දිය අගල කරවන ලදි.

4. **කලහස්** – සියුම් මියුරු අව්‍යක්ත නාද කිරීම ප්‍රධාන කොට ඇති රාජහංස යි. 'කාලහංස' ශබ්දයෙන් නිපන්න යි. 'කලහංස' ශබ්දය කාදම්බ පක්ෂීන් කෙරෙහි ද වැටේ. පාලියෙහි දී 'කලහංස' ශබ්දය කාදම්බ ශබ්දය හා පමණක් පර්‍ය්‍යාය කොට දක්වූහ. **අභිධානප්‍රදීපිකාවෙහි**:–

"චිලිකුකුලිං – කාදමෙබා කලහංසොථ" යි ආයේ ය.

**රුවන්මලෙහි** ද මෙඅරුත්හි ම 'කලහස' සද දක්වන ලදී:—

"කලහංසයන්ට – කිනග කලහස නමැයි දත්" යි.

පාලි නිඝණ්ඩුවෙහි "කාදමෙබා කාලහංසොථ" යි එතත් එහි 'කාලහංස' යන තන්හි දීඝය කාලාන්තරයෙන් ජාත දෙෂයක් වියයුතු. පාලිනිඝණ්ඩුව රචනාකිරීමේ දී ආශ්‍රිත ග්‍රන්ථයක් වූ **අමරකොශයෙහි**:–

"කාදම්බඃ කලහංසඃ ස්‍යාත්" යී එන හෙයිනි.

5. **කල්** – කානනාව. කානනාවනෙන් වෙන්වූ හංස නෙමේ යයි ගැන්මෙන් මෙහි 'කල්' නම් මනුෂ්‍ය ස්ත්‍රියක නොව හංසියක බව හැගේ. කලහස් ශබ්දසංයොගයෙනි.

උදාහරණ:- 'සකිසොරා බෙනු දියතු' යි කීවිට අශ්වපොතකයකු සහිත එළදෙනක නොව වෙළඹක යාචනය කරන බව හැගේ. බෙනුශබ්දය අශ්ව පොතකවාචි කිසොරශබ්දය හා සංයොග වූ හෙයිනි.

6. **පිළිමිණි පවුරේ**–පිළිමිණියෙන් කළ පවුර= පිළිමිණිපවුර. පෙර රජවරු තම නුවරට සතුරන් වැද්ද නොදෙනු පිණිස නුවර අවට මහාප්‍රාකාර බැඳවූහ. පිළිමිණියෙන් පවුර කරවීම සවකීය සමෘද්ධිය ප්‍රකට කිරීම හා ශක්තිමත් බව ද ප්‍රයොජන කොට ඇත්තේය. සඵටික නම් මිණිවෙසෙසකි, හෙවත් පළිඟුයි. පළිඟු ආකාශය හා සමවර්ණයෙන් දක්නා ලැබෙන හෙයින් පවුර නොහැඳින එහි වූ පිළිබිඹුව අනෙකකැයි ඇතිවූ භ්‍රාන්තිය පැවසීම උචිත ම ය. **ශ්‍රී රාහුල** මාහිමියෝ ද මෙබන්දක් දුටහ.

**කාව්‍යශෙඛරයෙහි**:–

"දුවාණ පහපෙ ල
වඩින පුහුදුන් සගවැ ල
වඩිනා ගුවන් තු ල
උතුම් රහතුන් වෙනස නැති ක ල"

දූවාණ යනුදු පළිඟු ම ය.

7. **කුතුහල්නෙන්** – අපූර්‍ව වස්තු දක්නා කැමැත්තහුගේ අතිශය යුහුසුලුවූ ක්‍රියාභෙදයෙහි ද සැකයෙහිද 'කුහුල්' සද වැටේ.

මෙහි වනාහි හංසියක්මයහි නිශ්චිත අදහසින් ඇතිවූ යුහුසුලු බැවින් ඈය වෙත යන්නට අහසට නැඟිබව කීමෙන් කුහුල් සද පළමු දක්වූ අරුත්හිම යහි ගැන්ම උචිතයි. රුවන් මලෙහි- "දෙළකිඳුවෙහි දත්නෝ"හි කියන ලද්දේ මේ අරුතමය. 'කුතූහල' ශබ්දයෙන් 'කුහුල්' ය සි සිද්ධයි.

8. **ගැස්මෙන්** – ගැසුම් + එන්; 'ගස්' දයින් භාවයෙහි 'උම්' පස යෙදුණු විට 'ගැසුම්' යි සිද්ධයි. එයින් 'එන්' පස වී සකාරස්ථ උකාර ලොප යෙන් 'ගැස්මෙන් යනු සිද්ධයි. 'කැල්මෙන්' 'බැල්මෙන්' ආදිය මෙනි.

9. **සතැවුලි** – 'ස' උපසර්ගය පූර්‍වකොට ඇති 'තව - තැවී මෙහි' ධාතු කෙරෙන් භාවයෙහි 'උලි' ප්‍රත්‍යයව පිළිපෙරළියෙන් 'සතැවුලි'යි සිද්ධයි දීර්‍ඝය වෘත්තය පිණිස යි.

10. **සැපත්** – 'සම්පත්ති' ශබ්දයෙන් සිද්ධයි.

**සංලක්ෂ්‍යය:**

1. මෙම පද්‍යයෙන් සැවැත් නගරයෙහි අවට්න් ගැඹුරු දිය අගලක් හා ඒ සමීපයෙහි ම ආකාශය මෙන් දෘශ්‍යමාන වන මහපිළිම්ණි පවුරක් ද වූ බව ප්‍රකාශිත යි.

මෙය වැනුහ **ශ්‍රී රාහුල** මාහිමියෝ:-

**කාව්‍යශෙඛරයෙහි**:-

"නරනිඳු සතරක ර - සෙව්නා ලෙසින් නිරතු ර
කිරිසිඳුරිඳු එපු ර - වැන්න වටකළ පිරී මහවු ර" යි.

2. **වෘත්තය** – **මාලිනී** නම්. මෙහි 3 වන 4 වන පාදයන්හි "දුක පිළිම්ණි පවුරේ" "තොස් සතැවුලි" යි එතන් වෘත්ත භඞ්ගයෙක් නොවේ. සිංහලෙහි දී යි, වු, දෙදෙන ය්, ව්, දෙදෙන හා සම උච්චාරණ ඇතිහෙයින් හලන්ත මෙන් සලකා ඇතැම්විට ඉන් පූර්‍ව හ්‍රස්ව වර්‍ණ ගුරුවශයෙන් සලකනු ලැබේ. එහෙයින් මෙහි ගුරු ලඝු වින්‍යාසය මෙසේ යි:-

දු ක පි ළි ම් ණි පවු රේ | තොස් ස තැවු ලි සැ පත් වී
— — — — — — ◡ ◡ | ◡ — ◡ ◡ — ◡ ◡

3. **පද්‍යවිභාගය** – මුක්තකයි. (මෙබඳු සෙස්ස ද මෙසෙයින් සලකනු.)

3 **මිණිමුතු නිලුපුල් නෙත් හෙම් හසුන් පින් තෙනෙන් යුත්**
**පිළිම්ණි කන පවුරෙන් පත් විසල් සේ කසුන් වත්**
**බමර වැළ වලා ලූ පුල් සහස් පත් සුරත් අත්**
**ඵපුර පිරි ලකල්වූ කල් බඳෙව් ලෝ නුවන් ගත්.**

**අන්වය හා පදාර්ථ:** **මිණිමුතු**–මණිමුක්තාවූ;(පිපුණු) **නිලුපුල්**– නීලොත්පල නමැති; **නෙත්** – නෙත්‍ර ඇති, **හෙම් හසුන්** – සවණි

හංසයන් නමැති, **පින් තෙනෙන්** – පීනපයොධරයන්ගෙන්, **යුත්** – යුක්තවූ, **පිළිමිණි** – ස්ඵටික මණිමයවූ, **කනපවුරෙන්** – රන්කම් යුතු ප්‍රාකාරයෙන්, **පත්** – පැමිණි, **විසල්සේ** – විශාල ඡායා නමැති, **කසුන්වත්** – කාඤ්චන වස්ත්‍ර ඇති, **බමර වැල** – භෘඞ්ගාවලි නමැති, **ලූ** – ලනලද, **වළා** – වළලු ඇති, **පුල් සහස් පත්** – විකසිතවූ පද්ම නමැති, **සුරත් අත්** – අතිශයින් රක්තවර්ණ හස්ත ඇති, **එපුර** – ඒ නගරයෙහි, **පිරි** – පරිඛා තොමෝ, **ලකල් වූ** – මනොඥවූ, **කල්බඳෙව්** – අඞ්ගනාවක මෙන්, **ලෝ** – ලොකයාගේ, **නුවන්** – නෙත්‍ර, **ගත්** – ග්‍රහණය කළා ය.

**විස්තර:** මේ පද්‍යයෙන් ඒ ශ්‍රාවස්තිපුරයෙහි දියඅගළ අඞ්ගනක මෙන් වී ය යි වර්ණනා කෙරේ. සාම්‍යය කෙසේ වි ද? යත්:-

i මිණිමුතු නිලුපුල් නෙත්

ඒ පරිඛා තොමෝ සුපිපි නිලුපුල් නමැති නෙත් ඇත්තී ය. නෙත්‍ර නීලොත්පල දෙදෙනාගේ මහත් සාම්‍යයක් ඇති හෙයිනි. මෙසේ හෙයින් ම නිලුපුල් කාන්තාවන්ගේ ඇස් වැනි ය යි ගැන්ම පෙර මහකිවිවරුන්ට ද අභිමත විය.

**කාව්‍යශෙඛරයෙහි:-**

"එගඟ වරම්යුලැ ස්
තම පියතම බලන ලෙ ස්
පුබුදු **නිලුපුල්** රැ ස්
මැවූවා වැනි සිය දහස් ඇ ස්"

ii හෙම හසුන් පින් තෙනෙන් යුත්

කාන්තාවට පයොධර ඇත. පරිඛාව වනාහි රන්හස් නමැති පයොධර ඇත්තී ය. හංසයන් පයොධර වැනි හෙයින් මෙ ද යුක්ත ම ය. එහෙයින් කිහ-

**හංසසන්දේශයෙහි:-**

"සැරදෙ **හසරද** සඳ – පුන්සඳ පහන් පිරිසුදු
පියකරු පියන් පිරි – පියවුරු ලෙසින් හොබනා"

"**කොප සැපි රැගෙන සිටි තැනමත්** කෙරෙති රුති"

"**අපසර ගත් තැනමත්** බැඳ දෙති නි ගා
අපසර වෙති **හසගන** පුරගනන් ම ගා" යි

iii පිළිමිණි කනපවුරෙන් පත් විසල් සේ කසුන් වත්,

පරිඛාව ද සමීපයෙහි පිහිටි රන්කම් යුතු පිළිමිණිපවුරෙහි ඡායා නමැති රන්කම්යුතු වස්ත්‍ර ඇත්තී ය.

iv බමරවැල වළා ලූ පුල් සහස්පත් සුරත් අත්,

යශි, පුබුදු(රත්)පියුම් නමැති රක්තවර්ණ හස්තතල ඇත්තී ය. ඒ හස්තයෝ ද වට කොට හැසිරෙන භෘඞ්ගාවලි නමැති ලත ලද වළලු ඇත්තාහ. පදම හසන කොට තැකූ විට ඒ පියුම් අවට හැසිරෙන බිඟුවැල වළල්ලකැයි ගැන්ම යොග්‍ය යි.

v එ පුර පිරි ලකල් වූ කල්බදෙව්

උක්තප්‍රකාර අවයව ඇති හෙයින් පරිඛාව මනොඥවූ ම කාන්තාවක බඳු ය.

vi ලෝ නුවන් ගත්.

නුවන් ගැන්ම සිත සතුටු කිරීමෙන් කළ යුතු ය. එහෙයින් ලෝවැස්සන් පිණවී ය යු සේ යි.

**විපසනී:**

1. **මිණ්මුතු** – මිණි(= කොෂ)යෙන් මුතු - මිණිමුතු. පිබිදුණු.

2. **හෙම්හසුන්** – (= හෙම්හස්+උන්.) රන්වන් පියාපත් ඇති හංසයෝ 'හෙම්හස්' නම් වෙති. කියන ලද මැ යි **හංසසන්දෙශයෙහි**:-

"ගතින් ගෙන දිදී රන්වන් පියාප ත"

3. **පිළිමිණ්කනපවුරෙන්** – පිළිමිණියෙන් හා කනායෙන් කළ පවුර 'පිළිමිණිකනපවුර' නම්. 'පිළිමිණි' නම් පළිඟුයි, 'කනා' නම් සවර්ණයි. 'රජක, වරක' යනාදියෙන් 'රදා, වරා' යනාදි වශයෙන් බිඳෙන්නාක් මෙන් කනක' සදින් 'කනා' යි බිඳෙතු දු මෙහි 'කන' යි යොදන ලද්දේ වෘත්තය රකිනු පිණිස යි.

4. **කසුන්වත්** – කසුන් (රන්) සමින් යුතු වත - කසුන්වත.

5. **සහස්පත්** – දහසක් පත් යමක්හුගේ ද හේ සහස්පත්. නියමින් දහසක් ම නොව බොහෝ පත්‍ර ඇති යයි දතයුතු. මෙහි සහස් සද බහු සංඛ්‍යා වාචකයි.

6. **ලකල්** – මනොඥ. ලයට කල් - ලකල්.

7. **කල්බදෙව්** – කල්බද+එව්. මනොඥවූ ශරීර ඇතිහෙයින් ස්ත්‍රී 'කල්බද' නම් වෙති.

**සංලක්ෂ්‍යය:**

1. **වෘත්තය** – මාලිනී;; නම්. "පිළිමිණිකනපවුරෙන්" යන තන්හි ද වෘත්තයාගේ අභෙදයට හෙතු 2 පද්‍යයේ 2 සංලක්ෂ්‍යයෙන් දතයුතු. මතු ද මෙ බඳු තැන් එ සෙයින් ම සලකනු.

4 **මිණි කිකිණි දැලින් හා කේලිදෙව්නී සිරින් හා**
**එ පුර කුළුදෙලෙන් හා පත් මුදුන් සේරැයින් හා**
**කැරලි තිසුලගින් හා නන් අඟින් පත් සුදින් හා**
**බුජග වැජඹෙමෙන් හා පා තිනෙත් පැබෙරින් හා**

අන්වය හා පදාර්ථ: මිණිකිකිණිදැලින් හා - මාණික්‍ය කිඞ්කිණික ජාලාවන් කරණකොටගෙන ද, කේලි - පතාකා නමැති, දෙවනි සිරින් හා - ආකාශගඞ්ගාවගේශ්‍රිය කරණකොටගෙන ද, කුළු - කූටාගාර නමැති, දෙලෙන් හා - ජටාවෙන් ද, මුදුන් පත් - මස්තකප්‍රාප්තවූ, සේරුසිරින් හා - චන්ද්‍රයා කරණකොටගෙන ද, කැරලි - කොත් මුදුන් නමැති, තිසුලගින් හා - ත්‍රිශූලාග්‍රයන් කරණකොට ගෙන ද, නන් - නොයෙක්, අඟින් - හිතති ආදි ප්‍රාසාදාඞ්ගයන්ගෙන් නොහොත් ශරීරාඞ්ගයන්ගෙන්, පත් - පැමිණියාවූ, සුදින් හා - ධවලත්වය කරණකොටගෙන ද, බුජඟ - ධූතීයන්ගේ නොහොත් සර්පයන්ගේ, වැජඹමෙන් හා - පැලඹි මෙන් ද, බෙරින් හා - (විවිධ) භෙරීන් කරණකොටගෙන ද, එපුර - ඒ (ශ්‍රාවස්ති) පුරයෙහි, පා - ප්‍රාසාදයෝ, තිනෙත් - ත්‍රිනෙත්‍ර(ඊශ්වර)යා, පෑ - දැක්වූහ.

**විස්තර:** ඒ ශ්‍රාවස්ති නගරයෙහි ප්‍රාසාදයෝ ඊශ්වරයා වැනි වූහ යි මින් වර්ණිත යි. කවර සාම්‍යයකින් ද? යත්:-

i මිණිකිකිණි දැලින් හා,

ශ්‍රාවස්තිනගරයෙහි ප්‍රාසාදයෝ අවට ලකලද මැණික් එබ්බූ කිකිණි (මිණිගෙඩි) දැලින් යුක්ත වූහ. පෞරාණිකයෝ නගරප්‍රාසාදදියෙහි අලඞ්කාරයට හා ආරක්‍ෂාවට මිණිදැල් ලූහ. එහෙයින් කියන ලදි ගුත්තිල කාව්‍යයෙහි:-

"පුදකුසුම් සුවඳ ට "පිරි සියපත් රොන ට
බමන බිඟුදැල් විලස ට පුරෙහි වත්සුණුසුවඳ ට
ලෙල මිණිදැල් අව ට හැසිරෙන බමර ව ට
වැඩම කර දම්සබා මඩුව ට" හෙළු මිණිදැල් වැන්න අරක ට"යි.

ඉසුරා ද නාත්‍ය කරන අවස්ථාවන්හි මිණිකිකිණිදැල් පලඳිති යි සිතිය හැකි යි. එහෙත් එබැව් පැවසූ තැනක් ඊශ්වරවර්ණනායන්හි අප විසින් නොදක්නා ලදී.

ii කේලි දෙවනි සිරින් හා,

එහි ප්‍රාසාද මස්තකයන්හි දීර්ඝ වූ ධවල වූ ධ්වජයෝ ලෙල දෙති. ඊශ්වරයා වනාහි මස්තකයෙහි පිහිටි ආකාශ ගඞ්ගා ඇත්තේ ය. ශ්‍රී විෂ්ණුහුගේ පාදාඞ්ගුෂ්ඨයෙන් උපන් අහස් ගඟ ඊශ්වරයාගේ මස්තකයෙහි දළමඩුල්ලට ගලා බස්නා හෙයිනි.

ධ්වජ ආකාශගඞ්ගාජලධාරා බඳු බව කිවිහු කියති.

කොකිල සන්දේශයෙහි:-

" මෙ පු ර සොබන පිළිමිණි රුදු පහග බ ද
අ ඹ ර ලෙලෙන දද සෙද සෙද පවත් වැ ද
ප ව ර ඉසුරු සිර සුරගඟිනි මහත ද
නිතො ර වැහෙන හැළිසියසිරිසිලි සබ ද "

iii කුළුදෙලෙන් හා,

ප්‍රාසාදයෝ කුළුගෙවලින් යුක්තයහ. ඊශ්වරයා ජටාධාරී ය. කුළුගෙවල් හා ජටාව ඔවුනොවුන්ගේ මස්තකයෙහි වනුයෙන් මෙ ද සාම්‍යයෙකි.

iv පත්මුදුන් සේරසින් හා,

ඉතා උස් හෙයින් ප්‍රාසාදයෝ මස්තකයෙහි පිහිටි චන්ද්‍රයා ඇත්තාහ. ඊශ්වරයා දළමඩුල්ලෙහි පැලඳි චන්ද්‍රකලාව ඇත්තේ ය.

v කැරලි තිසුලගින් හා,

ප්‍රාසාදයෝ හුල්වූ කොත් කැරලි අගින් යුක්ත වෙති. ඊශ්වරයා හුල් තුනකින් යුත් 'ත්‍රිශූල' නම් ආයුධයක් ඇත්තේ ය.

vi ඝන් අඟින් පත් සුදින් හා,

ප්‍රාසාද හුනුහිආදියෙන් පැතිරි ධවලත්වයෙන් යුක්ත ය. ඊශ්වරයා සුදු හෙයින් ශරීරාඞ්ගයන්ගෙන් පැමිණි ධවලත්වය ඇත්තේ ය.

vii බුජග වැජඹමෙන් හා,

ප්‍රාසාද බූතියන්ගේ පැලඹීමෙන් යුක්ත ය. ඊශ්වරයා සර්පයන් පැලඳ ගෙන සිටින හෙයින් ඔවුන්ගේ පැලඹීමෙන් යුක්ත ය.

viii තිනෙත් පෑ,

ඊශ්වරයා බඳු වූහයි යුසේ යි.

ix බෙරින් හා,

ප්‍රාසාද නිරන්තරයෙන් වාදනය කරනු ලබන බෙරින් යුක්ත ය. ඊශ්වරයා සන්ධ්‍යාරම්භාදියෙහි දී පරිහරණය කරන බෙර ඇත්තේ ය.

**ටිප්පනි:**

1. **මිණිකිකිණිදැලින්** – මිණියෙන් යුත් කිකිණි - මිණිකිකිණි. මිණිකිකිණියුත් දැල - මිණිකිකිණිදැල. 'කිංකිණී' ශබ්දයෙන් කිකිණි යි නිපන ය. රනුගෙඩි යි.

2. **හා** – 'ද' අරුත්හි නිපාතයෙකි.

**කව්සිළුමිණෙහි:–** "සැදිණි මෙ ද නිරිඳු සඳ - පෙබයි **හා** මනකුමුදු"

**සිදතෙහි:–**

"හසු යුතු වියුතු ඊඟ - බුහු බසැ ඕ උ උන් **හා**
යළි අතිතෙහොත් අන්නෝ - අන්නාංහු නාහු ද වෙත්"

3. **කේලි** – ත්‍රිකෝණාකාර කොඩි යි. අවිශේෂයෙන් සියලු ධ්වජ හීම පිණිස ද යොදනු ලැබේ. 'කදලී' ශබ්දයෙන් 'කෙහෙලි' යි බිඳී හකාර ලොපයෙන් පූර්වාපර එකාරද්වය එක ම දීර්ඝයක් වීමෙන් 'කේලි' යි සිද්ධ යි.

4. **දෙව්නී** – සුරගඟ. සවණිදිය විෂ්ණුහුගේ පාදාඞ්ගුෂ්ඨයෙන් නික්ම අහසින් අවුත් කෛලාසවාසී ඊශ්වරයාගේ දළමඩුල්ලෙහි හැසිර එයින් නික්ම භූම්‍යවතීර්ණ ව **ගඞ්ගා** නදී නාමයෙන් ගලායන්නීයයි පෞරාණිකයෝ කීහ. 'අහස් ගඟ' යයි ගන්නා ලබන්නේ අහසෙහි ම පිහිටි කොටස යි.

එහෙත් මෙකල ශාස්ත්‍රඥයෝ නදියක්මෙන් අහස්හි දක්නා ලැබෙන්නේ ජලප්‍රවාහයක් නොව ලඟ ලඟ පිහිටි ආලෝකයෙන් බබුළුනොවූත් පැතිර සිටි තාරකාරාශියකැ යි පවසති.

5. **කුළු** – කූටාගාර. ප්‍රාසාදයන්ගේ මුදුනෙහි තනන කුඩා ගෙයකි. මෙකල ද ඇතැම් ගෘහයන්හි මේ දක්නා ලැබේ.

6. **දෙලෙන්** – දළ + එන්. දළ නම් ජටා (හිස්වෙළුම) යි.

7. **සේරුසින්** – චන්ද්‍රයා සේරුස් නම්. ශ්වෙත වූ රශ්මි ඇති හෙයිනි.

8. **කැරලි** – කොත් මුදුන්.

9. **තිසුලගින්** – තිසුලග්+ඉන්. ශූල්තුනක් ඇතියෙන් ඊශ්වර - යාගේ ආයුධය 'ත්‍රිශූල' නම්. තිසුලෙහි අග් - තිසුලග්.

10. **අඟින්** – ප්‍රාසාදපක්ෂයෙහි හිතතිආදිය ද ඊශ්වර පක්ෂයෙහි හස්තපාදදිය ද පවස යි.

11. **බුජග** – උභයපක්ෂයෙහි භූතිසර්ප යන දෙඅරුත් දෙයි. 'භුජඞග' ශබ්දයෙන් සිද්ධ යි.

12. **වැජඹමෙන්** – 'වජඹ' ධාතු කෙරෙන් භාවයෙහි 'උම්' ප්‍රත්‍ය යෙන් 'වැජඹුම්' යි සිද්ධ භාවකෘදන්තය එන්පස ගැන්මෙන් හා පිළිපෙරළිය යෙන් සිද්ධ යි. මෙබඳු භාවකෘදන්තයන්හි පිළිපෙරළිය මහාකවීන්ට ද රුචි වි ය.

කව්සිළුමිණෙහි:–

"මුහුදෙව් වැඩි සිරුනොත් - තරනිඳුඉඳු **වැජඹමෙන්.**"

13. **පා** – ප්‍රාසාදවාචි 'පහ' ශබ්දයාගේ හකාර ලොපයෙන් සිද්ධ යි.

14. **තිනෙත්** – නෙත් තුනක් යමකුගේ ද හේ තිනෙත්. ඊශ්වර යාහට කුපිත වූ විට ගිනි විහිදවිය හැකි නෙතක් නළල්මැද ඇත්තේ ය. එහෙයින් හේ තිනෙත් නම් වි.

සංලක්ෂ්‍යය:

1. වෘත්තය – මාලිනී යි.

**5 විදුනුබඳ දෙදෙන් සන් නිල්මිණෙන් වූ විමන්හි**
**දූසා වුවනත යෝනන් තන්හි තන්හි දෙරෝරෙන්**
**ගෙසරස සුග සක්වා මේකුළින් බිව දිස්නා**
**එ සොර තුසරපා යයි පත් සතැවුලී පුරේහි.**

**අන්වය හා පදාර්ථ:** **විදුනුබඳ** – විද්‍යුත් සදෘශ වූ, **දෙදෙන්** – ධවජයෙන්, **සන්** – සඤ්ඡන්නවූ (ගැවසිගත්), **නිල්මිණෙන්වූ** – ඉන්ද්‍රනීලමාණික්‍යමය වූ, **විමන්හි** – ප්‍රාසාදයන්හි, **තන්හි තන්හී** – ඒ ඒ තන්හි, **දෙරෝරෙන්** – ද්වාරොදරයෙන් (දොර කවුළු අතුරෙන්), **යෝනන්** – යුවතීන්ගේ, **වුවනත** –

වක්‍ත්‍රයන්(මුහුණු), **දැක** – දර්ශනය කොට, **මේකුළින්** – මේඝකූටයෙකින්, **බිව** – බහිර්ගත ව (නික්ම), **දිස්නා** – දර්ශනය වන්නාවූ, **එසොර** – ඒ කපටවූ, **තුෂරපා සසි** – චන්ද්‍රයා යයි (සිතා), **පුරේහි** – ඒ ශ්‍රාවස්තීපුරයෙහි, **ගෙසරස** – ගෘහ සරෝවරයන්හි (ගෙදිගුවිල්හි), **සක්වා යුග** – චක්‍රවාකයුගමයෝ, **සතැවුලි** – සන්තාපයට, **පත්** – පැමිණියහ.

**විස්තර:** විදුලිය වැනිවූ ධවජයන්ගෙන් ගැවසීගත් ඉන්ද්‍රනීලමාණික්‍යයන්ගෙන් තනන ලද ප්‍රාසාදයෝ මේඝකූට වැනි වෙති. එම ප්‍රාසාදයන්හි දවාරයෙන් පිටත බලන්නාවූ යුවතීන්ගේ මුහුණු චන්ද්‍රමණ්ඩල මෙන් දක්නා ලැබේ. එක් යුවතියක දවාරකවාටාදියකින් එබී බලත් ම ඇයගේ මුහුණ චන්ද්‍රයා මෙන් දිස් වේ. අන් යුවතියක අන් දොරකින් එබී බලත් ම ඇයගේ මුහුණ ද සඳමඬල ලෙස ම දිස්වේ. අන් ප්‍රාසාදයක යුවතියකගේ වත ද එසෙයින් ම දිස්වේ. මෙසේ තන් තන්හි පෙනීම විස්මයක ක්‍රියාවකි හෙවත් රූපවීමෙකි. එහෙයින් ඒ පුරාඞ්ගනාවන්ගේ වක්ත්‍ර, මේඝ පටලයන්ගෙන් නික්ම තන් තැනින් පෙනෙන්නාවූ කපට වූ චන්ද්‍රයා යයි රූපවී එනුවර චක්‍රවාක යුගමයෝ දුකට පැමිණියහ.

චන්ද්‍රයා ප්‍රකට ව දර්ශනය වන්නේ රාත්‍රි කාලයෙහි ය. සක්වාලිහිණි යුගමයෝ දිවාකාලය මුළුල්ලෙහි එක් ව ප්‍රීතියෙන් සිට රාත්‍රිකාලය වෙන් ව ගත කෙරෙත්. වෙන් ව විසුම සිතනු පවා ඔවුන්ට මහත් දුකකි. චන්ද්‍රයා වැනි කාන්තාවක්ත්‍ර මේඝකූට වැනි ප්‍රාසාදයන් ගෙන් නික්මෙනු දුටු චක්‍රවාක යුගමයෝ "දැන් චන්ද්‍රයා උදා විය. ඒ සන්ධ්‍යාසමය හෙයින් වියයුතු. දැන් අප වෙන් වියයුතු කාලය"යයි සිතා දුඃඛිත වූහ.

ශ්‍රාවස්තීපුරයෙහි කාන්තාවන්ගේ මුහුණු චන්ද්‍රමණ්ඩල බඳු වීම සක්වාලිහිණියන්ගේ භ්‍රාන්තියට හේතුව යි. වක්ත්‍ර චන්ද්‍ර දෙදෙන එක බඳු බව හංසසන්දේශයෙහි ද කියන ලදී:-

"රුවත් පහ කවුළුවෙන් පෙනෙන පුරඟ  න
වුවන් සඳ ද සඳ මඬල ද දිසි ගුව  න
නුවන් පුරා දකිමින් දෙක ම එක තැ  න
ලෙවන් සිත සතුටු වෙයි උවමට කිය  න" යි.

**විපසනී:**

1. **විදු** – විදුලිය යි. 'විද්‍යුත්' ශබ්දයෙන් නිපන් යි.

2. **නුබඳ** – උපමාද්‍යෝතක ශබ්දයෙකි. 'අනුබන්ධ' ශබ්දයෙන් 'අනුබඳ' යි නිපන් ව අකාර ලෝපයෙන් 'නුබඳ' යි සිද්ධ යි.

3. **දෙඳෙන්** – දද+එන්. 'ධජ' ශබ්දයෙන් දද යි නිපන් යි.

4. **නිල්මිණෙන්** – නිල්වූයේ ද එ ම මිණිවූයේ ද ඒ ම නු යි නිල්මිණි. 'නීල' ශබ්දය ඉන්ද්‍රනීල මණිවාචක ද වන හෙයින් ඉඳුනිල් මිණි ම මෙහි ගතයුතු.

**ඉන්ද්‍රනීලමාණික්‍ය** නම් කිරෙහි ලූ විට කිරි නීලවර්ණයට පමුණුවන මිණි වෙසෙසකි. කියනලද මැ යි:-

“ක්ෂීරමධ්‍යෙ ක්ෂිපෙන්නීලං ක්ෂීරං වෙ නීලතාං නයෙත්
ඉන්ද්‍රනීලමිතිඛ්‍යාතම්............” යි

5. **විමන්හි** – 1 පද්‍යයේ 7 විපසනිය බලනු.

6. **වුවනක** – වුවනත් + අ. වුවනම වුවනත්. අත්සද ස්වාර්ථයෙහි යි. අනතය යි අරුත් ගැන්ම අනවශ්‍ය යි.

**කව්සිළුමිණෙහි:-**

“ ඔහු සිහිඳු සුවඳ - මුවනඹරෙනුතුළ මියුරු
වදන් මුවරඳිනි තමන් - **සවනක්** බිඟුන් සනහා”

**ගුත්තිලකාවෙහි:-**

“ නැඟි **දෙරණක** ප   ලා ”

7. **යෝනන්** – යෝන + අන්. තරුණියෝ යෝන නම් වෙති.

8. **දෙරෝරෙන්** – දෙරෝර+එන්. දෙර+උදර යන තන්හි පූර්ව පර ‘අ’ ‘උ’ ස්වර දෙයට ‘ඕ’ කාරයක් හා ‘ද’ කාර ලොපය ද කිරීමෙන් ‘දෙරෝර’ යි ස්වරාදෙශ සන්ධියෙන් සිද්ධ යි.

9. **ගෙසරස** – ගෘහ සමීපයෙහි වූ තඩාග යි. සරස යනු “සරස්” ශන්තෙන් සිද්ධ යි.

10. **සක්වායුග** – සක්වාලිහිණි නම් විල්හි හැසිරෙන පක්ෂි වෙසෙසකි. ඔවුන් දිවාකාලයෙහි යුගම වශයෙන් එක් ව හැසිරෙන හෙයින් ‘සක්වායුග’යි ගත්හ.

11. **මේකුළින්** – මෙඝ සමූහය ‘මේකුල’ නම් වේ.

12. **බි** – ‘බහි’ ශබ්දයෙන් බිහි යි නිපන් යි. හකාර ලොපයෙන් දීර්ඝ වී.

13. **ව** – ‘වූ-වීමෙහි’ ධාතුවෙන් සිද්ධ පූර්වක්‍රියා යි.

14. **දිස්නා** – ‘දිස්’ ධාතුකෙරෙන් ‘නා’ ප්‍රත්‍යය ව සිද්ධ කෘදන්ත නාම යි.

15. **ඝෞර** – ඝෞර. ඝොර ශබ්දයෙන් නිපන් යි. මෙහි වනාහි කපට යන අරුත් හි ප්‍රයුක්ත යි.

16. **තුසරපා** – තුසර (හිම) බඳු පා (රැස්) යමක්හුගේ ද හේ තුසරපා. චන්ද්‍ර යි. ‘හිමරැස්’ යනු පර්‍ය්‍යාය වචනයන්ගෙන් ගත්සේ යි. ‘තුසර’ නම් හිම යි. ‘පා’ සද රශ්මිවාචක ද වේ.

17. **පත්** – පැමිණි යන අර්ථවත් ‘පතන’ ශබ්දයෙන් නිපන් කෘදන්ත යි.

18. **සනැවුලි** – 2 පද්‍යයේ 9 විපසනිය බලනු.

සංලක්‍ෂ්‍යය:

1. වෘත්තය - මාලිනී යි.

2. ආශ්‍රිතය - මෙම සිලෝව ෂඩ්භාෂාපරමේශ්වර ඉරුගල් කුලතිලක පරිවෙණාධිපතීන් වහන්සේ විසින් විරචිත කෝකිල සන්දේශයෙහි දෙව්නුවර වණ්ණනායෙහි වූ,

"ඉ ඳු නි ල් මිණි තුල පා සිව් මැඳුර තු ර
ම න ක ල් කල් වත සඳ සඳිසි නොවිත ර
සු වි පු ල් ගෙදිගුවිල් වැද සරතා හිත ර
වි ය වු ල් දුක් ව සක්වා යුග ගියෝ තෑ ර"

යන පද්‍යය ඇසුරු කොට රචිත යි.

6 සුසෑදි සැලලියන්ගේ පත් සවන් නිල් නුවන්හි
සලෙළුවනලලත් සිත් තන්හි තන්හි පුරේහි
සිය කැමි නොබලත් වූ මල්සරා මල්සරා පස්
තම හවෙහි බැහුහ යි මම් හඟිම් සැවු නො දී අත්.

**අන්වය හා පදාර්ථ:** පුරේහි - ඒ (ශ්‍රාවස්ති) පුරයෙහි, **සුසෑදි** - මනාව සැරසුණාවූ, **සැලලියන්ගේ** - සලීල යුවතීන්ගේ, **සවන්** - කර්ණසමීපයට, **පත්** - පැමිණියා වූ, **නිල්නුවන්** - නීල නෙත්‍ර නමැති, **හි** - බාණ (ඊතල) යන්, **සලෙළුවන්** - කාමුකයන්ගේ, **සිත්** - චිත්තයන්, **තන්හි තන්හි** - ඒ ඒ ස්ථානයන්හි දී, **අලලත්** - සෝභා කරත් ම (සලඹනකල්හි), **මල්සරා** - අනඞ්ගයා, **සැවු** - චාපය(දුන්න)ට, **අත්** - හස්තය, **නො දී** - දානය නො කොට, **සියකැමින්** - ස්වකීය කමීයෙන්, **ඔබලත් වූ** - දුර්වල වූ, **මල්සරා පස්** - පුෂ්පශරපස, **තම හවෙහි** - ස්වකීය තූණීරයෙහි, **බැහුහයි** - ප්‍රක්‍ෂිප්ත කළහ යි, **මම්** - මම, **හඟිම්** - චින්තනය කොරෙමි.

**විස්තර:** i සුසෑදි සැලලියන්ගේ පත් සවන් නිල් නුවන්හි
සලෙළුවනලලත් සිත් තන්හි තන්හි පුරේහි

ඊතල ජනයන්ගේ හෘදය විදාරණය කොට ඔවුන් අතිශයින් ම පීඩිතයන් කෙරේ. යුවතීන්ගේ නෙත්‍රයෝ ද තරුණයන්ගේ සිත් රාගයෙන් පීඩිත කරන හෙයින් හී තල බඳු වෙති.

ඒ ශ්‍රාවස්තිනගරයෙහි යුවතීන්ගේ නෙත්‍ර නමැති ශරයෝ(හී)ද සලලාලයන් ගේ සිත් කැලඹූහ. එසඳ

ii සිය කැමි නොබලත්වූ මල්සරා මල්සරා පස්
තම හවෙහි බැහුහ යි මම් හඟිම් සැවු නො දී අත්.

අනඞ්ගයා ස්වකීයකම්යෙන් තෙවත් පුෂ්පබාණයන්ගේ කෘත්‍යය වූ ජනයන්ගේ සිත් රාගයෙන් කැලඹීම කොට දුර්වල වූ මල්සැර පස, දුන්නට අතවත් නො තබා, හී කොපුවෙහි බැහුයේ ය යි සිතමි.

අනඞ්ගයාගේ මල්සැර (ලතා)වාපයෙහි යොදා විදීමෙන් අර්ථයක් නැත. ඔවුන් විසින් කළ යුතු කාර්ය්‍ය යුවතීන්ගේ නෙත්‍ර සිදු කරන බැවිනි, එහෙයින් ඊතල කොපුවෙහි බහාගත් බව සිතීම මැනවි. අනඞ්ගයාගේ ශර දුබල වූ බව කීමෙන් යුවතීන්ගේ ඇස් දනත් ඇලලීමෙහි අනඞ්ග බාණයන් ටත් වඩා සමර්ථ බව සූචිත යි.

**ටිප්පනී:**

1. **සුසැදි** – මනාව සැදුණේ = සුසැදි. 'සු' පූර්ව 'සද' ධාතු කෙරෙන් කර්තෘකාරකයෙහි 'ඉ' ප්‍රත්‍යය ව සිද්ධ කෘදන්ත යි.

2. **සැලලියන්ගේ** – සැලලි + අන්ගේ. 'සැලලි' නම් යුවතිය යි.

3. **සවන්** – කර්ණ යි. මෙහි සමීපොපචාර වශයෙන් කර්ණ සමීපය ගත යුතු.

4. **නුවන්හි** – නුවන් ම හී = නුවන්හී. ඊතලයන්ගේ බඳු ක්‍රියා ඇති හෙයිනි. 'අලලත්' යන කාලාර්ථ ක්‍රියාවට සම්බන්ධ වන හෙයින් 'නුවන්හි' යනු අදර අරුත්හි කම් විබත් වේ. මෙබඳු තන්හි **කාලසප්තමිය** මාතෘභාෂා වන්හි විහිත ය. පතිරජ පිරුවන් හිමියෝ අදර අරුත් හි කම් විබත් නියම කළහ.

5. **සලෙළුවන්** – සලෙළු + අන්. කාමුක තරුණ ජනයෝ සලෙළු නම් වෙති.

6. **අලලත්** – 'අලල' ධාතු කෙරෙන් කාලාර්ථයෙහි 'ත' පස යෙදී ප්‍රත්‍යයස්ථ අකාර ලුප්ත ව සිද්ධ අසම්භව් කිරිය යි.

7. **ඔබලත්** – ඔබල ම - ඔබලත්. බලහීන වූයේ යි.

8. **මල්සර** – මල් ම ශර(හී)කොට ඇති හෙයින් අනඞ්ගයා 'මල්සර' ආදි ශබ්දයන්ගෙන් හඳුන්වනු ලැබේ.

9. **මල්සරපස්** – මල් හී පස. ඔහු නම්:- පද්ම ය, අශොක ය, මී අඹ ය, දසමන් ය, නීලොත්පල ය. යන මොහු යි. එහෙයින් කීහ:-

"අරවින්දමශොකඤ්ච - චූතඤ්ච නවමල්ලිකා
නීලොත්පලඤ්ච පඤ්චෙතෙ - පඤ්චබාණස්ස සායකාඃ" යි.

මේ ශරයන්ගෙන් විදිකල ඇති වන වෙදනාව නම් කාම පීඩාව යි.

10. **හමෙහි** – 'හට'නම් ශරධාරය (හීකොපුව) යි. **මුවදෙව්දාහි** – "බලා එදා මල්හී - තම හට ම ලී මල්හී"

11. **බැහුහයි** – **"මල්සර පස් මල්සර බැහුහ යි"** යනු වාක්‍ය සම්බන්ධයයි. මෙහි 'බැහුහ' යනු 'බහ' ධාතු කෙරෙන් 'උහ' පස යෙදී සිද්ධ ප්‍රථම පුරුෂ බහුවචන ක්‍රියා යි. 'යි' යනු වාක්‍ය සම්බන්ධයෙහි නිපාත යි. මල්සර යනු බැහුහ යන ක්‍රියාව හා සම්බන්ධ වූ කර්තෘ යි. එකවචන වීම නිදෙසි. සෙසු මෙබඳු ප්‍රයොග බලා මෙ ද කතු විබත් යයි ගත යුතු. ඇතැම්හු කම්විබත් ය යෙති. සවප්‍රධාන ව ක්‍රියාවක් කරන තැනැත්තනු වාච්‍යවන පදය කතු විබතැයි ගැන්ම වඩා යෝග්‍ය යි.

යි - යයි - යන - ආදි පදයකින් මහාවාක්‍යය හා සම්බන්ධ වන අනන්‍යවාක්‍යයන්ගේ සන්දේශාර්ථ ප්‍රකාශක ක්‍රියාපදය ප්‍රථම පුරුෂ බහුවචනයෙන් ම සිටී. කතෘ පුරුෂ ත්‍රයෙන් කවර පුරුෂයක හෝ කතු විබත් එකබසින් හෝ බහු බසින් සිටී.

මොවුන් ඡේකප්‍රයෝගානුකූල ව යෙදිය යුතු අයුරු මෙසේ දත යුතු.

## වර්තමාන.

| | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍ර: | * මල්සර | (හෝ) † මල්සරත් | ×බහති යි | හඟිමි. |
| ම: | § තා | ,, §§ තොප | ×බහති යි | ,, |
| උ: | ‡ මා | ,, ** අප | ×බහති යි | සිතවු ද? |

## අතීත.

| | | | | |
|---|---|---|---|---|
| ප්‍ර: | මල්සරා හෝ | මල්සරත් | †† බැහූහ යි | හඟිමි |
| ම: | තා ,, | තොප | †† බැහූහ යි | ,, |
| උ: | මා ,, | අප | †† බැහූහ යි | සිතවු ද? |

මෙසෙයින් ගැන්මෙහි සම්භාව්‍යත්වය දක්වනු ලබන ඡේකප්‍රයෝගයන්ගෙන් දතයුතු. ඡේකප්‍රයෝග ලඟ ඇති විහ්නයෙන් ඉන් අඞ්කිත පදයාගේ යෝග්‍යත්වය සලකනු.

" වුහුටු හය සෙනඟ තුරරෙණ් වැද *නිද ස
කිලුටු ×**වෙති** දෙ සැඩකර සර පහ ස " (හංස)

" විසිතුරු මෙපුරවර †**අඟනන්** වෙමින් ලො ල
පියයුරු පටින් බැඳ ×**වසති** සිතේ බ ල " (ගිරා)

"† **පර සතුරන් එති එති** යන බස වා
හැර අඹුදරුවන් යන තොප වල වා " (ලෝවැඩසඟරා)

" †**දෙවියන්** ×**වෙසෙති** යි මිනිසුන් විසින් පිදිය යුතු රුක "
(විශුද්ධිමාර්ග සන්නය)

" ඈදුර (**අප) තුටු ×**නො වෙති** යි - නො සිත **අප සිප්
×**නොදනි** යි
උනුමු (§තා) වෙණ ×**සදති** යි - නො දත්තමු (§තා) ගායනා
×**කෙරෙති** යි " (ගුත්තිල)

" §§**තොප** ගෙන ×**එති** යෙහි දිව බිම හෙන අත ර " (හංස)

" ‡**මා** මෙසඟනට බත් නො දිය ×**හෙති** යි ගත්තාව' යි කීහු " (අමාවතුර)

" ම දූ **තොප** කහවත් ††**හන්හ** යනු අසා කහවත් හන,

---

× වෙති යනු වෙති යි යන තන්හි යකාර ලොපයෙන් ඉකාරද්වය එක ම දීර්ඝයක් විමෙන් සිද්ධ යි.

" මහත් යහන් ††පිහ යනු අසා මෂ යහන් පියා පවු හැඳෙක හොවී "
(අමාවතුර)

**සන්දෙහාර්ථ ප්‍රකාශක** යනු කුමට ද? යත්:-

"මලිය දිවි දෙයි යන - ඇඳහිලි නැති ව නිවස න
හිමි සහ දවස් යන - දුකට සරි කො ද දුකක් ලොව වෙ න "
(කාව්‍යශෙඛර).

මෙ ඈ තන්හි අනාගතාඛ්‍යාත වුව ද, යන - හි ආදි පද පර ව ඇත ද, පූර්වොක්ත නියමය නො යෙදෙයි. මෙහි සන්දෙහාර්ථය නො ව නිශ්චයාර්ථය ම අභිමත හෙයිනි.

වාක්‍ය විෂයෙහි මේ ප්‍රයොගය ලැබෙනුයේ තමහට අප්‍රත්‍යක්‍ෂයක් ආප්ත වචනයෙන් හෝ ශ්‍රැතිමාත්‍රයෙන් දැන කියන විට පමණෙකි. එ ද සන්දෙහාර්ථ යෙහි ම ඇතුලත් වන හෙයින් සාමාන්‍යයෙන් වාක්‍ය විෂයෙහි පූර්වොක්ත ප්‍රයොගය යෙදෙන් යනු නො යෙදෙයි.

වාක්‍ය විෂයෙහි වුව ද ප්‍රත්‍යක්‍ෂාර්ථයක් කියන විට යෙදිය යුත්තේ සාමාන්‍ය නියමයෙනි.

" යශොධරා දෙවි වනාහි..............තොප **පුතාණුවෝ** අතුරු වේ බැහ සිඟාකයි කීහු."

" බුදුහු මෙතෙක් තැන් **වැඩියහ**, මෙතෙක් තැන් වැඩියහ" යි........"
(අමාවතුර).

12. **හඟිම්** – 'හඟ' ධාතු කෙරෙන් වර්තමාන කාලික උත්තම පුරුෂ එක වචන 'ඉම්' ප්‍රත්‍යය ව සිද්ධ යි.

13. **සැවු** – දුන්න. 'චාප' ශබ්දයෙන් 'සැවු'යි සිද්ධ යි. අනඞ්ගයා ගේ චාපයෙහි දණ්ඩ උක්දඬුවකි. දුනුදිය බිඟුවැලකි.

**සංලක්‍ෂ්‍යය.**

1. **වෘත්තය – මාලිනී නම්.**
2. **ආශ්‍රිතය** – මෙය කව්සිළුමිණෙහි–

" සලෙළුවන් අලළන - පුරයෝනන් නුවන්හි,
සියකැම්නොබල මල්සර - සැනපි ගී වී මල්සර "

යන පද්‍යය ඇසුරු කොට විරචිත යි.

**7 එපුරැ වෙහි ගජන් කැන් රැව් සියන් පා ඇකිල්ලේ**
**කුමුටු කල ගිගුම් ගත් මී ලොලින් මි ලොලුන් ‡ සන්**
**දෙසවනතින පත් වූ වාගෙසින් * ගස් ලදින් එත්**
**තුරඟ කුරඟසින් පත් රොන්රැසින් මී මැවූ එව්.**

‡ අද්. * නස්.

**අන්වය හා පදවි: එපුර** - ඒ (ශ්‍රාවස්ති) පුරයෙහි, **වෙති** - වීථියෙහි, **ගජන්කැන්** - (නිතර හැසිරෙන) හස්ති සමූහයාගේ, **පා ඇකිල්ලේ** - පාද ශෘඞ්ඛලාදාමයෙහි, **රැව්සියන්** - රාවශතයන්, **කුමුවූ කළ** - යට කළාවූ, **ගිගුම්** - නාදය, **ගත්** - ග්‍රහණයකළාවූ, **මීලොලින්** - මධුලොලත්වයෙන් උපලක්ෂිත වූ, **මීලොලුන්** - භෘඞ්ගයන්ගෙන්, **සන්** - ගැවසී ගත්තා වූ, **දෙසවනතින** - කර්ණ ද්වයෙන්, **පත් වූ** - පැමිණියා වූ, **වාවෙයින්** - වාතවෙගයෙන්, **ගස් ලදින්** - ඝට්ටන (ප්‍රහාර) ලාභයෙන්, **එත්** - (භූමිය දෙසට ම) ආගමනය කරන කල්හි, **තුරඟ** - අශ්වයන්ගේ, **කුරගසින්** - ඝුර ඝට්ටනයෙන්, **පත්** - (අහසට) පැමිණියා වූ, **රොන් රැසින්** - රජස් සමූහයෙන්, **මි** - පෘථිවියක්, **මැවූ එව්** - මවනලද්දක් බඳු වී.

**විස්තර:**

i සැවැත් නගරයෙහි හැසිරෙන්නාවූ හස්තීන්ගේ පාදයන්හි වූ අයොමය හැකිලිවලින් නාද නික්මේ. ඒ නාදය යටපත් කොට නාද කෙරෙමින් මද ජලයෙහි ලොල් වූ බමරු පැමිණ කන් පෙදෙසෙහි හැසිරෙති. බමරුන් කපොලයෙහි මදජලය පානය කරන විට පීඩිත වූ හස්තීහු බමරුන් සහිත වූ ම කන්තල සොලවත්. ඉන් ඇති වූ වාතය අශ්වයන්ගේ කුර පහරින් පොළොවෙන් නැඟි රජස් නැවත පෘථිවිය දෙසට යොමු කරයි. නිතර හැසිරෙන්නා වූ අශ්වයන්ගේ කුරපහරින් නො නැවත රජස් නැඟෙ යි. එවිට ඒ රජස් පෘථිවියට ත් හස්තීන්ගේ කර්ණප්‍රදෙශයට ත් අතර වූ මධ්‍යාකාශයෙහි ඝන ව පිරී ගනී යි. අතිශයින් ඝන ව රැස්වූ රජස් අන්‍ය පෘථිවියක් මෙන් දක්නා ලැබේ. "මී මැවූ එව්"යි කීයේ එහෙයිනි.

එනුවර හස්ත්‍යශ්වසංචාරය අත්‍යධික බැව් කී සේ යි.

**ටිප්පනී**

1. **වෙති** - වේහි කිවමනා තන්හි වෘත්තය පිණිස මත් අඩු කිරී මෙන් සිද්ධ යි. 'වේ' නම් වීථිය යි.

2. **ඇකිල්ලේ** - ඇකිලි+ඒ. එක වචන වුව ද, හස්තිසමූහයෙහි එකකු පාසා වෙන් වෙන් ව සම්බන්ධ වන හෙයින් රාශ්‍යර්ථයක් ලැබේ.

3. **කුමුවූ** - 'කුමුදු = ගැලීමෙහි' ධාතු කෙරෙන් 'උ' ප්‍රත්‍යය හා දකාර යට වකාරා දෙශ ද වී කර්තෘකාරකයෙහි සිද්ධ කෘදන්ත යි.

4. **කළ** - 'කර' දයින් කර්තෘ කර්ම කාරකද්වයට සාධාරණ ව සිද්ධ කෘදන්ත යි. මෙහි කර්තෘකාරකයෙහි යි. කර ධාතු කෙරෙන් 'ළ' ප්‍රත්‍යය කොට ර කාර ලොපයෙන් ද පද සිද්ධිය කෙරෙත්.

5. **ගිගුම්** - ගුම් ගුම් යි කියයුතු තන්හි පූර්ව 'ගුම්' ශබ්දයාගේ මකාර ලොපයෙන් හා ගකාරස්ථ උ කාරයට පිළිපෙරැළි ඉකාරයක් ද කිරීමෙන් ගිගුම් යි සිද්ධ යයි ඇතැම්හු කියත්. 'ගුම්' ශබ්දයාගේ පූර්ව 'ගු' යන්නට අතිශයාර්ථයෙහි ද්විත්වාදිය කිරීමෙන් ද සිද්ධ කළ හැකි යි.

6. **ගත්** – 'ගත්' ධාතුවෙන් කර්තෘකාරකයෙහි සිද්ධ කෘදන්ත යි. මෙහි වනාහි 'කර' ධාත්වර්ථයෙහි 'ගත්' ධාතුව පවතී. 'ගත්, ලා' ධාතූන්ගේ මෙබඳු විශෙෂ ප්‍රයොගයක් දක්නා ලැබේ. 'දමා ගනී' – දමයි. 'කියා ලන්නේ'- කියන්නේ. මේ තන්හි ද 'ගත්, ලා' ධාතු පූර්වක්‍රියාවෙහි වූ ධාත්වර්ථයාගේ අවසාන ක්‍රියාර්ථය පමණක් දෙයි.

7. **මිලොලින්** – මීලොල් + ඉන්. උපලක්ෂණාර්ථයෙහි කරණ විබත්. මීයෙහි ලොල් - මීලොල්.

8. **මිලොලුන්** – මීයෙහි ලොල් හෙයින් භෘඞ්ගයෝ 'මීලොල්' නම් වෙති.

9. **දෙසවනතින** – දෙසවනතින්. 'අත්' සද ස්වාර්ථයෙහි ය.

10. **වෙසින්** – වෙ + ඉන්. යකාරාගමය හා මාත්‍රාභානිය ද කිරීමෙන් සිද්ධ යි.

11. **ගස්** – සමූහය යි. "රෙදෙ සත්හිතෙපුරේ - තුරඟකුරගසිනු දුහු" ආදියෙහි මෙ අරුත් හි 'ගස්' සද දක්නා ලැබේ.

12. **තුරඟ** – 'තුර'ඞ්ග' ශබ්දයෙන් නිපන් යි. 'තුරඞ්ග' යනු ශීඝ්‍ර ව ගමන් කරන හෙයින් අශ්වයන්ට නම්.

13. **රොන්** – රජස් (=දූලි). 'රෙණු' ශබ්දයෙන් නිපන් යි.

14. **මැවූ** – 'මව = මැවීමෙහි' ධාතු කෙරෙන් කර්මකර්තෘකාරකද්වයට සාධාරණ 'උන' ප්‍රත්‍යය යෙදී සිද්ධ යි. මෙහි කර්මකාරකයෙහි යි. පද සිද්ධින්හි පිළිපෙරළි ආදි ප්‍රකට ව්‍යාකරණ විධි යොග්‍ය අයුරින් දතයුතු.

15. **එව්** – උපමාද්‍යොතක අව්‍යයෙකි.

**සංලක්ෂ්‍යය:**

1. **වෘත්තය – මාලිනී යි.**

**8 පිළි මිණි තොරණින් සත් නිල් මිණෙන් වූ විමන්හි**
**පල හෙළ ඝන නිල් පෑ පත් එමාවේ පුරේහි**
**අඳුර පතළ කල්හි රන් ලියන් මෙන් ම දිස්නා**
**සරන බිසරුවන් සිත් තැවුලි දුන්වී සතොස් හා.**

**අන්වය හා පදර්ථ:** **පුරේහි** – (ශ්‍රාවස්ති)නගරයෙහි, **පිළි මිණි තොරණින්** – ස්ඵටිකමාණික්‍යමය තොරණයන්ගෙන්, **සත්** – ගැවසී ගත්තා වූ, **නිල් මිණෙන් වූ** – නීලමාණික්‍යමය වූ, **විමන්හි** – ප්‍රාසාදයන්හි, **පලහෙළ** – ප්‍රකට වූ ධවල ය, **ඝනනිල්** – නිබිඩ (ඝන) නීල ය (යන), **පෑ පත්** – ප්‍රභාවන්ට පැමිණි, **එමාවේ** – ඒ මහා වීපි තොමෝ, **අඳුර** – අන්ධකාරය, **පතළ කල්හි** – ව්‍යාප්ත වූ කල්හි, **රන් ලියන් මෙන් ම** – සුවර්ණ ලතාවන් සේ ම, **දිස්නා** – දෘශ්‍යමාන වූ, (= දක්නා ලැබෙන), **සරන** – සංචාරය කරන්නා වූ, **බිසරුවන්** – අභිසාරිකාවන්ගේ, **සිත්** – චිත්තයන්හි, **තැවුලි** – තාපය, **දුන්වී** – ඉපදවී ය, **සතොස් හා** – සන්තොෂය ද (ඉපදවී).

**විස්තර:** i පිළිමිණි තොරණින් සත් නිල් මිණෙන් වූ විමන්හි,
පළහෙළ ගනනිල් පෑ පත් එමාවේ පුරේහි,

ශ්‍රාවස්තීයෙහි මහා වීදිය, උභයපාර්ශ්වයෙහි වූ ස්ඵටිකමාණික්‍යමය තොරණයන්ගෙන් යුක්ත වූ ඉන්ද්‍රනීලමාණික්‍යමයප්‍රාසාදයන්ගේ කාන්තියෙන් සුදට හා නිලට පැමිණෙ යි. එහි පිළිමිණි රැස් පැතිරි තැන් සුදු වෙ යි. ඉඳුනිල් මිණිරැස් පැතිරි තැන් නිල් වෙයි. ශ්වෙත නීල වර්ණයන්ට පැමිණි වීදිය යයි කීයේ එහෙයිනි.

ii අඳුර පතළ කල්හි,

අන්ධකාරය පැතුරුණු කල්හි; රාත්‍රි කාලයෙහි ය යු සේ යි.

iii රන්ලියන් මෙන් ම දිස්නා,

ස්වර්ණලතාවන් මෙන් දක්නා ලැබෙන. (අභිසාරිකා) ස්ත්‍රීහු කෙසෙයින් ස්වර්ණලතා වැනි වෙත් ද ? යත්:- **ශ්‍රීරාහුල** මාහිමියෝ සාම්‍යය මෙසේ දුටහ.

**කාව්‍යශේඛරයෙහි:–**

“ තොලතුල් පතුල් පලු – හසමල් කැහින් සිත් ක ළු
පියයුරු පල ඉසුලු – ලියෝ ලිය වැනි පුර සරන සු ළු ”

iv සරන බිසරුවන් සිත් තැවුලි දුන්වී සතොස් හා.

වල්ලභයන් විසින් කියනු ලබන සඞ්කෙතස්ථානයන්ට යන ස්ත්‍රීහු අභිසාරිකා නම් වෙති. ඔව්හු අන්ධකාරයෙහි ම හැසිරීම ප්‍රිය කෙරෙති. සැවැත් නගරයෙහි වීදිහු එහි හැසිරෙන අභිසාරිකාවන්ගේ සිත් විටින් විට සන්තාපයට පමුණුවත්. විටින් විට සතුටු ද කෙරෙත්. ප්‍රාසාදයන්ගේ පිළිමිණි තොරණින් ධවල වූ මාර්ග ප්‍රදෙශයටවත් අභිසාරිකාවන්, සෙස්සන් අප දකිතියි සන්තාප ද, ඉන්ද්‍රනීල මාණික්‍යයන්ගේ කාන්තියෙන් නිල් වූ පෙදෙසට පැමිණ තමන් අන්‍යයන්ට නො පෙනෙන හෙයින් සතුටු ද වන හෙයිනි.

**විපසනි:**

1. **පළ හෙළ ගන නිල්** – ‘පළ’ නම් ප්‍රකට යි. පළ වූයේ ද එම හෙළ වූයේ ද– පළහෙළ. ගන වූයේ ද එම නිල් වූයේ ද = ගනනිල්. පළහෙළ ද ගනනිල් ද = පළහෙළ ගනනිල්.

2. **එ** – ප්‍රසිද්ධාර්ථයෙහි ඒ ශබ්ද යි. හ්‍රස්වයට හෙතු දතයුතු.

3. **මාවේ** – මහාවීදි. ‘මහවේ’ යි තද්භව ව හකාර ලොපයෙන් හා දීර්ඝයෙන් ද ‘මාවේ’ යි සිද්ධ යි.

4. **පතළ** – ‘පත්ථට’ ශබ්දයෙන් ‘පතළ’ යි සිද්ධ යි.

5. **රන් ලියන්** – රනින් නිපන් ලිය(ලතාව). රන්ලියන් යනු ‘මෙන්’ යොගයෙහි කම් විබත්.

6. **දිස්නා** – (5 පදයේ 14 විපසනිය බලනු).

7. **සරන** – 'සර' ධාතුකෙරෙන් කර්මකර්තෘ කාරකාදිවයට සාධාරණ 'න' ප්‍රත්‍යයෙන් සිද්ධ කෘදන්ත යි. මෙහි කර්තෘකාරකයෙහි යි.

8. **බිසරුවන්** – බිසරු+අන්. 'අභිසාරිකා' ශබ්දයෙන් 'අබිසරු'යි සිද්ධ යි. අභිසාරිකාවෝ නම් වල්ලභයන් පතමින් සංකේතස්ථානයට යන ස්ත්‍රීහු යි. එහෙයින් කීහ.

" කාන්තාර්ථිනී තු යා යාති සඞ්කෙතං සාභිසාරිකා " යි.

**දිවාභිසාරිකා, ජ්‍යොත්ස්නාභිසාරිකා, අන්ධකාරාභිසාරිකා**යි ඔව්හු තෙවැදෑරුම් වෙති. මෙහි වනාහි අන්ධකාරාභිසාරිකාවෝ ගන්නා ලැබෙත්.

අබිසරු යන තන්හි අකාර ලොපයෙන් බිසරු යි සිද්ධ යි. සරන+අබිසරු 'සරනබිසරු'යි පරසර ලොප් සඳින් හෝ සිද්ධ යි.

9. **දූන්වී** – ඉපදවී. ඉපදීම් අර්ථයෙහි වූ 'ජන' ධාතුවෙන් සිද්ධ 'දන' ධාතුව 'දිනී, දිනු' ඈ විසින් වර නැගේ. ප්‍රයොජ්‍යවිෂයෙහි 'ව' ප්‍රත්‍යය හා පිළිපෙරළි ද වී. 'දූනවී' ඈ විසින් රූප ලැබේ. **කාව්‍යසිළුමිණෙහි:**– "**දූනවි** සැක බිසරුවන්" මෙහි "අස්නක් පන්වා" යනාදියෙහි මෙන් විකල්පයෙන් ස්වර ලොපය යි.

10. **හා** – ද, සහ - යන නිපාතයන්ගේ අර්ථඇති නිපාතයෙකි. මෙහි ද අරුත්හි යි. 4 පද්‍යයේ 2 විපපනිය බලනු.

**සංලක්ෂ්‍යය:**

1. **වෘත්ත ය – මාලිනී** නම්.
2. **ආශ්‍රිත ය** - මෙය **පරෙවිසන්දෙශයෙහි:**–

" ඈ ති දෙර දෙර ඉඳුනිල් මිණි රන් තො ර ණ
පැ ති ර අඳුරු කර හැර පැලඹෙන කි ර ණ
නි ති රැග සරන වේ මැද සුරඟන හ ර ණ
වෙ ති මෙහි බිසරු දිගැසිය සහ තුටු උ ර ණ "

යන පද්‍යය ඇසුරු කොට 'රන්තොරණ' යනු 'පිළිමිණිතොරණ'යි මදක් වෙනස් කොට සම්පාදිත බව පිළිගත යුතු.

9 **දෙපස යටග නැංවූ කේලි කෙවුනා රළින් සන්**
**නිති සරන නරන් කැන් මින් කැලන්ගෙන් සුපුන් වූ**
**නිරිඳු රැඳු එපායෙන් පත් එ මාවේ පුරේහි**
**සිරිනුදුල හිමව් පව්වෙන් නිකුත් නි විලස් පෑ**

**අන්වය හා පදර්ථ:** **පුරේහී** – (ශ්‍රාවස්ති) පුරයෙහි, **නිරිඳු** – නරේන්ද්‍රයන්ගෙන්, **රැඳූ** – රඤ්ජිත වූ, හෙවත් රජුන්ට වාසස්ථාන වූ, **එපායෙන්** – ඒ ප්‍රාසාදයෙන්, **පත්** – පැමිණියාවූ, **දෙපස** – උභය පාර්ශ්වයෙහි, **යටග** – යෂ්ට්‍යග්‍රයෙහි, **නැංවූ** – නංවන ලද, **කෙවුනා** – බබලන, **කේලි** – පතාකා නමැති, **රළින්** – තරඞ්ගයන්

**ගෙන්**, **සන්** – සඤ්ජාත වූ (ගැවසීගත්), **නිති** – අනවරතයෙන්, **සරන** – සංචාරය කරන්නා වූ, **නරන් කැන්** – මනුෂ්‍ය සමූහ නමැති, **මින් කැලන්ගෙන්** – මනුෂ්‍ය සමූහයන්ගෙන්, **සුපුන්** – සම්පූර්ණ වූ, **එ මාවේ** – ඒ මහා වීථි තොමෝ, **සිරිනුදුල** – ශ්‍රීන් උජ්වලිත වූ, **හිමව් පව්වෙන්** – හිමාලය පර්වතයෙන්, **නිකුත්** – නිෂ්ක්‍රාන්ත වූ, **නී** – නදියක, **විලස්** – විලාසය (ආකාරය), **පෑ** – දැක්වී.

**විස්තර:**

ශ්‍රාවස්තිනගරයෙහි කොශල නරේන්ද්‍රයන්ගේ රජභවනයෙහි පටන් ඇති මාර්ගය හිමාලය පර්වතයෙන් බැස යන නදියක් වැනි විය යි මින් වර්ණිත යි.

රජභවනය සඵටික මාණික්‍යාදියෙන් නිර්මිත හෙයින් ධවලත්වයෙන් ද ඉතා මහත් බැවින් විශාලත්වයෙන් ද හිමාලය පර්වතයට සම වේ යි. වීථිය කෙසෙයින් ගඞ්ගාවක සිරි ගනී ද යත්:-

රළ වැනි වූ බබළන ධවජයන්ගෙන් ද මත්ස්‍ය සමූහයන් වැනි නිරන්තර යෙන් හැසිරෙන ජනසමූහයන්ගෙන් ද යුක්ත හෙයින් ගඞ්ගාවක සිරි ගනි යි.

ගඞ්ගාවක් වැනි වීථිය හිමාලය පර්වතය වැනි රජභවනය දක්වා ඇති හෙයින් හිමාලය පර්වතයෙන් නිකුත් ගඞ්ගාවක් වැනි ය යි කීම යොග්‍ය වූ රම්‍ය වර්ණනයෙකි.

**විපසනී:**

1. **සටග** – යටි+අග. 'යටි' සද ලතා පර්යාය කොට රුවන්මලෙහි දක්වන ලදී. මෙහි 'සැරයටි' ආදි වචනයන් හි මෙන් නො මහත් ලී, යකඩ කුරු ආදියෙහි වැටේ.

2. **නැංවූ** – 'නඟ - නැඟීමෙහි' ධාතු කෙරෙන් වූ ප්‍රයොජ්‍ය කර්ම කාරක කෘදන්ත යි. ධාත්වන්ත ගකාර ලොපයෙන් හා ඌනමාත්‍රාවට වෘද්ධි කිරීමෙන් ද පිළිපෙරැළියෙන් ද සිද්ධ යි.

3. **නෙවුනා** – 'නෙවු' ධාතු කෙරෙන් කර්තෘකාරකයෙහි 'නා' ප්‍රත්‍යය ව සිද්ධ කෘදන්ත යි.

4. **මින්** – මත්ස්‍ය; 'මීන' ශබ්දයෙන් භින්න යි.

5. **කැලන්** – කැල+අන්. සමූහාර්ථ වාචී කැල ශබ්දයා කෙරෙන් අන් විභක්ති ව සිද්ධ යි.

6. **ගෙන්** – අවධි, කරණ අර්ථ ප්‍රකට කරන නිපාතයෙකි. "ඔවුනු දු ගෙන්, ඔවුනු දු ගේ ආදි ප්‍රයොග දක්නා ලැබෙන හෙයින් ගෙන්, ගේ ආදිය විභක්ති ප්‍රත්‍යය වශයෙන් නො ව 'පිණිස' ආදිය වැනි විභක්ත්‍යර්ථද්‍යොතක නිපාත ය යි සිදත්සඟරාව නිපදවීමට පෙර සිටි ඇදුරන් සැලකූ බව පෙනේ. සිදත්සඟරාව නිසා ගෙන්, ගේ, හට යන මොහු විභක්ති ප්‍රත්‍යය බවට පැමිණියහ.

7. **නිරිඳු** – නරනට ඉඳු = නිරිඳු. ශ්‍රාවස්ති නගරයෙහි විසූ නිරිඳේ කොශල රජදරුවෝ යි. කොශල දේශයට ඊශ්වර හෙයින් එහි විසූ සියලු රජවරු ම එනමින් ව්‍යවහාර කරනු ලැබූහ. සම්බුදුන් වහන්සේ වැඩසිටි කල මේ නගරයෙහි වාසය කළේ **ප්‍රසේනජිත්කොශල** නම් නරේන්ද්‍රයෙකි. 'රාජකාරාමය' බුදුන් වහන්සේ කෙරෙහි දැඩි භක්තිය ඇති මෙතුමා විසින් කරවන ලදී.

8. **රැඳු** – 'රඳ' ධාතු කෙරෙන් 'උ' ප්‍රත්‍යය ව සිද්ධ අතීත කෘදන්ත යි.

9. **හිමව්පව්වෙන්** – හිමව්පවු + එන්. හිමව්පව්ව නම් හැමවිට ම හිමරාශියට වාසස්ථාන හෙයින් හිමාලය නම් වූ, ඉන්දියා දේශයෙහි උත්තර දිශායෙහි වූ මුළුලොවින් ම ඉතා උස් පර්වත රාජයා යි.

**මහාකවිකාලිදාසයෝ** හිමාලයෙහි ලක්ෂණ සැකෙවින් දක්වූහ.

**කුමාරසම්භවයෙහි:–**

" අස්ත්‍යුත්තරස්‍යාං දිශි දේවතාත්මා
හිමාලයෝ නාම නගාධිරාජඃ,
පූර්වාපරෞ තෝයනිධී වගාහ්‍ය –
ස්ථිතඃ පෘථිව්‍යා ඉව මානදණ්ඩඃ. " යි.

උත්තර දිශාවෙහි පෘථිවියෙහි මිනුම් දණ්ඩක් මෙන් පූර්වඅපර සාගරයන්ට පිවිස සිටි දෙවියන්ට වාසස්ථාන වූ හිමාලය නම් මහාපර්වත රාජයෙක් ඇත්තේ ය. (වර්තමානයෙහි හිමව් පව්ව පූර්වාපර සාගරයන්ට නො පැමිණේ යි)

10. **නී** – නදිය. පියවියෙන් සිට සබඳ විබත් අරුත් දේ.

11. **පැ** – 'පා' ධාතුවෙන් කර්තෘකාරකයෙහි සිද්ධ කෘදන්ත යි.

**සංලක්ෂ්‍යය:**

1. **වෘත්තය** – **මාලිනී** යි.

**10 මඳහස පැනැ'දීමෙන් ලා නොයෙක් මත් තෙපුල් සන්**
**පියොවුරු වුරුවල්හි නිල්වසාපා නැඟීමෙන්**
**බැමලිය සරසුන්හි ලා නුවන්හි කළුන් ගොස්**
*** විදි දුනුමුවකැන් වී වල්සරන් මෙන් පුරේයි**

**අන්වය හා පදාර්ථ:** **මඳහස** – මන්දස්මිත නමැති, **පන්** – පර්ණයන්, **ඇදීමෙන්** – ප්‍රසාරණය කිරීමෙන්, **මත්තෙපුල්** – මත් ව කියන වචන නමැති, **නොයෙක්සන්** – නොයෙක් ශබ්දයන්, **ලා** – බහා හෙවත් කොට, **පියොවුරු** – පයොධර නමැති, **උරුවල්හි** – මහාරණ්‍යයෙහි, **නිල්වසා** – නිල්වූ වසාරාජි නමැති, **පා නැඟීමෙන්** –

* විදුනු මුවකැලන්

පාශ නැඟීමෙන් ද, **බැමලිය** - භ්‍රෑලතා නමැති, **සරසුන්හි** - ශරාසනයන්හි, ( = දුනුවල); **නුවන් හී** - නෙත්‍ර නමැති ශර, **ලා** - බහා, **වල්සරන් මෙන්** - වනචරයන් ( = වැද්දන්) පරිද්දෙන්, **ගොස්** - ගමනය කොට, **කලුන්** - කාන්තාවන් විසින්, **විදි** - විදිනා ලද, **දුනුමුවකැන්** - ධූර්ත නමැති මෘග සමූහයා, **පුරේහි** - (ඒ ශ්‍රාවස්ති) නගරයෙහි, **වී** - වූයේය.

**විස්තර:**

ඒ සැවැත්හි වැද්දන් වැනි වූ කාන්තාවන් විසින් විදිනු ලැබූ ධූර්ත ජන නමැති මෘගසමූහයෝ වූහ යි මින් වර්‍ණිත යි. කෙසේ කෙසෙයින් කාන්තාවෝ වැද්දන් වැනි වූහු ද? යත්:-

i මදහස පතෑ'දීමෙන්

වැද්දෝ මුවදඩයම පිණිස මුවන් ඇති පෙදෙස අවට පත් අදිති. එම පත් දුටු විට මුවන් එය ඉක්මවා බැහැර නො යන හෙයිනි. මෙ සෙයින් කාන්තාවෝ මන්‍දසමිත(=මදසිනා)නමැති පත් අදිති. කාන්තාවන්ගේ මන්‍දසමිතය දුක ධූර්තයන් යා නොහෙන හෙයින් ඔවුන්ට සමිතය මුවන්ට(ගොජ)පත් වැනි වෙයි.

ii ලා නොයෙක් මත් තෙපුල් සත්

වැද්දෝ නොයෙක් මධුර ශබ්ද කොට මුවන් පොලඹති. කාන්තාවෝ වනාහි රාගයෙන් මත් ව කියන අනුරාග වචනයන්ගෙන් සලෙළුවන් සාලඹති.

iii පියොවුරුවුරුවල්හි නිල්වසා පා නැඟීමෙන්

වනචරයෝ මුවන් බැඳීම පිණිස අරණ්‍යයෙහි පාශ(මල)තබති. පුරඹන තාවෝ ස්වකීය මහත් පයොධර සමීප නමැති අරණ්‍යයන්හි වූ නිල්වසා රොද නමැති පාශයන්ගෙන් යුක්ත වෙති. නිල්වසාරොදින් කාමුකජනයන්ගේ සිත් බැඳෙන හෙයින් ඒ ඔවුනට පාශ බඳු වෙයි.

iv බැමලිය සරසුන්හි ලා නුවන් හී

වැද්දෝ දුන්නෙහි ඊතල බහා මුවදඩයමට සැරසෙති. මුවන් විදිති. කාන්තාවෝ වනාහි ස්වකීය ඇස්බැම නමැති දුන්නෙහි නෙත්‍ර නමැති හී යොදා ගෙන සැරසෙති. ඉන් ධූර්තයන් විදිති. බැමලිය වක්‍ර හෙයින් දුනු බඳු වෙයි. එහි යොදන ලද්දක් මෙන් දක්නා ලැබෙන කාන්තාවන්ගේ නෙත්‍රයෝ ඊතල බඳු වෙති. ඊතලයෙන් කරන දෙයට නොදෙවෙනි දෙයක් ඉනුදු කළ හැකි හෙයිනි.

මෙ සෙයින් එපුර ලියෝ වැද්දන් වැනි වෙති. ඔවුන් විසින් විදිනු ලබන මුව කැල නම් ධූර්තජන සමූහයා යි.

**ටිප්පනී:**

1. **මඳහස** – මන්‍දස්මිතය. මඳක් දත් පෙනෙන ලෙස මුඛය විකසිත කිරීම 'මන්‍දස්මිත' නම්.

2. **පනැදීමෙන්** – පත්+ඇදීමෙන්. පත් නම් ගොක්කොළ ආදි පත්‍ර වර්‍ග යි. මුවන් පණි සංඥව නො ඉක්මවන හෙයින් ක්‍ෂෙත්‍රාදීන්ගේ ආරක්‍ෂාව පිණිස ද පත් ඇදීම පෙර සිට පැවතෙන සිරිතකි. (**නිග්‍රොධමිග ජාතක කථාව** බලනු.)

3. **නොයෙක් සත්** – එකෙක් නො වූයේ = නොයෙක් නොයෙක්; වූයේ ද එ ම සත් වූයේ ද ඒ මනු යි = නොයෙක් සත්. මෙහි 'සත්' සද ශබ්දාර්ථයෙහි වේ.

4. **පියොවුරු** – සතන යි. 'පයොධර' ශබ්දයෙන් නිපන්න යි. වසා රජිය පයොධරයන්හි නො ව පයොධර සමීප ප්‍රදෙශයෙහි ඇති හෙයින් 'පියොවුරු' යි කීයේ සමීපොපචාර වශයෙනි.

5. **උරුවල්හි** – උරු වූයේ ද එ ම වල් වූයේ ද ඒ මනු යි = උරුවල්. එහි උරුවල්හි. දීර්‍ඝය වෘත්තය රැකීම පිණිස යි. 'වුරුවල්හි' යි පද්‍යයෙහි ඇත්තේ වකාරාගමයෙනි.

6. **නිල්වසා** – නිල් වූ වසා = නිල්වසා. වසා නම් ස්ත්‍රීන්ගේ නාභි ප්‍රදෙශයෙහි ඇති රොම පඞ්ක්තිය යි.

7. **පා** – පාශ(මල).

8. **නැගීමෙන්** – නැඟිම්+එන්. 'නග' ධාතු කෙරෙන් භාවයෙහි 'ඊම්' ප්‍රත්‍යය ව සිද්ධ කෘදන්ත යි. තැළීම්, පෙළීම්, වෙළීම් ආදිය ද මෙසෙයින් දත යුතු.

9. **බැමලිය** – බැම ම ලිය = බැම ලිය.

10. **සරසුන්හි** – 'ශරාසන' ශබ්දයෙන් 'සරසුන්' යි නිපන්න යි. දුන්නට නම්.

11. **නුවන්හී** – නුවන් ම හී = නුවන්හී. නෙත්‍ර හී බඳු වන අයුරු 6 වන පද්‍යයෙන් දත යුතු.

12. **විදි** – 'විද' ධාතු කෙරෙන් 'ඉ' ප්‍රත්‍යය ව කර්‍මකාරකයෙහි සිද්ධ කෘදන්ත යි.

13. **දුතු මුව කැන්** – දූතු නමැති මුව = දුතුමුව. දුතු මුවන්ගේ කැන් = දුතු මුවකැන්. 'ධූර්‍ත' ශබ්දයෙන් 'දුතු' යි නිපන්න යි. ස්ත්‍රී - සුරා ආදියෙහි ඉතා ඇලුණෝ දුතු(=ධූර්‍ත)නම් වෙත්. 'කැන්' සද සමූහාර්‍ථයෙහි යි.

14. **වී** – අතීතකාලික එකවචන ක්‍රියා යි. 'දුතුමුවකැන්' යනු මින් උක්ත කර්‍තෘ යි. ප්‍රාණිවාචක ශබ්දයන් කෙරෙන් සමූහාර්‍ථයෙහි වූ 'කැන්, මුළු' ආදි ශබ්ද උක්ත ව සිටි කල විකල්පයෙන් ක්‍රියාව බහුවචනයෙන් සිටී. "**දනකැන් දනිති නොරතුරු ඇසුමෙන්නෙපුල**" යනාදියෙහි මෙනි.

එහෙයින් මෙහි 'වී' යන ක්‍රියාව නිදොසි. 'සැත්, මුළු' ආදිය ඒකවචන ව යෙදුණ හොත් ක්‍රියාව ඒකවචනයෙන් සිටින හෙයිනි.

**මුවදෙව්දාහි :-**

" දුටු ද වෙන පනනට - නිසි පලබරරුක්පෙළ
**සාමුවමුළු** නො **පිනී** - සා ලෙල වන බියෙන් වන.

පෙර සේ නො මෙ **බිණී** - මියුරු මිලොල් **බිඟු මුළු**
සුවඳ මුවරදිනවලා - රමණී පුල්වනගලේ.

නො වැ නමා විසී - දිය හිමියා ගුණ විසී
පෙර සේ ලොල් දුහැ නමා - විසී **සියොත්සියුපුසැන්.** "

15. **වල්සරන්** – වල්සර+අන්. වල්හි සරනුයේ = වල්සර. කතෘ කාරකයෙහි සිද්ධ කෘදන්ත නාම යි.

**සංලක්ෂ්‍යය:**

1. **වෘත්තය** – **මාලිනී** නම්.

2. **ආශ්‍රිතය** – මේ පද්‍යය **සැවුල් අස්නෙහි** :-

" මදහසපතැද මනරා තෙපුල සත් කා ර
පියයුරු වල දිසාපස යොදමින් පත ර
බැම සැව් නොත් සැරෙන් විද ගෙලෙළු මූව ස ... ර
පුරසර වනසරන් මෙන් සරති එනුව ර "

යන පද්‍යය ඇසුරු කොට සම්පාදිත යි. එ ද පරෙවිසඳැස්හි වූ,

" එ පු ර ළිය සරල් දිගු නිල් වරල් ව ලේ
න බ ර වුවත් දෙදහස දණු'ද මනක ලේ
ස ම ර සරණ සවලළුත් සිත් මියුල් කැ ලේ
නොහැර විද ඇවිදි සැර පසිනි ඇමක ලේ "

යන පද්‍යය බලා රචිත ය යි හැඟේ.

**11 මුළු සලෙළු දනන්ගේ සිත් සතොස්නා අවන්හල්**
**දිගනිනොසල වෙස් රැස් නෙත් සතප්නා විසල් සල්**
**ඇමැති ගණ හසුන් කැන් සිත් සෙ ලග්නා සුපුල් විල්**
**එපුර එපුර වැස්සන් සිත්මිණෙව් සිත් සතොස්වී.**

**අන්වය හා පදාර්ථ:** **මුළු සලෙළු දනන්ගේ** – සකල සල්ලාල ජනයන්ගේ, **සිත්** – චිත්තයන්, **සතොස්නා** – සන්තෝෂ කරන්නා වූ, **අවන්හල්** – ආපාන ශාලාවක් වැනිවූ ද, **දිගනින්** – ඒ ඒ දිශා වෙත්, **ඛසල** – රැස් වූ, **වෙස්රැස්** – වෛශ්‍ය සමූහයන්ගේ, **නෙත්** – නෙත්‍රයන්, **සතප්නා** – සන්තර්පණය කරන්නා වූ, **විසල්සල්** – විශාල ආපණයක් වැනි වූ ද, **ඇමැතිගණ** – අමාත්‍ය සමූහ නමැති,

**හසුන්කැන්** – හංස සමූහයා, **සිත්සෙ** – සිත්වූ පරිද්දෙන්, **ලග්නා** – වාසය කරන්නාවූ, **සුපුල් විල්** – සුපුෂ්පිත තටාකයක් බඳු වූ ද, **එපුර** – ඒ ශ්‍රාවස්තී පුරය, **සිත්මිණි එව්** – චින්තාමාණික්‍යයක් මෙන්, **එපුර වැස්සන්** – ඒ නගර වාසීන්ගේ, **සිත්** – චිත්තයන්, **සතොස්වී** – සන්තෝෂ කරවී.

**විස්තර :**

ඒ ශ්‍රාවස්ති නගරය චින්තාමාණික්‍යයක් මෙන් පුරවාසීන් සන්තෝෂ කරවී. කෙසේයින් ද? යත් :-

i මුළු සලෙළු දනන්ගේ සිත් සතොස්නා අවන්හල්

ආපාන ශාලා(=සුරාසැල්)සල්ලාලජනයන්ගේ සිත් සන්තොස්වයි. ශ්‍රාවස්තිය සියලු සල්ලාලජනයන්ට එක ම සුරාසැලක් බඳු විය. මේ එනුවර බොහෝ සුරාසැල් වූ බව කීසේ යි.

ii දිගහිනොසළ වෙස් රුස් නෙත් සතප්නා විසල්සල්

ආපණශාලා වෙළෙඳුන්ගේ සිත් සතප්වයි. එනුවර එක ම ආපණ ශාලාවක් මෙන් ඔවුන්ගේ සිත් සන්තර්පණය කෙළේය. මින් වෙළෙඳශාලාවන්ගේ ආධික්‍යය සූචිත යි.

iii ඇමැති ගණ හසුන් කැන් සිත් සෙ ලග්නා සුපුල් විල්

සුපුල් විල්හි හංසයෝ සතුටින් වෙසෙති. එනුවර, අමාත්‍ය සමූහ නමැති හංසයන්ට සුපුෂ්පිත තඩාගයක් වැනි විය. මේ එනුවර බොහෝ අමාත්‍යයන් සතුටින් විසූ බැව් කීසේ යි.

මෙසේ හෙයින් ශ්‍රාවස්තීනගරය චින්තාමාණික්‍යයක් මෙන් කැමැති කැමැති දෙයින් ඒ ඒ ජනයන් සන්තෝෂ කරවන්නේ වි.

**විපසනි :**

1. **මුළු** – ද්‍රවිඩ භාෂාවට ද සාධාරණ ශබ්දප්‍රකෘතියකි.

2. **සලෙළු** – තරුණයා, ක්‍රීඩාපරවශ පුරුෂයා යන අරුත්හි වේ.

3. **සතොස්නා** – 'ස' උපසර්ගය පූර්ව කොට ඇති 'තුස්' ධාතු කෙරෙන් කර්තෘකාරකයෙහි 'නා' ප්‍රත්‍යය ව සිද්ධ කෘදන්ත යි. උකාරයට පිළිපෙරළි ඔකාර යි.

4. **අවන්හල්** – සුරාශාලා. 'ආපාන' ශබ්දයෙන් 'අවන්' යි සිද්ධ යි. ආපණශාලා යයි පරණ සන්නයෙහි අරුත් පවසා තිබේ. එහෙත් ඒ සාවද්‍ය යි. සත්සව්හු 'ආපණ' සද 'අවුණු' යි සිංහල කොට ගවතීය ග්‍රන්ථයන්හි යෙදූහ.

මහකිවි **පැරකුම්රජ**තුමෝ අවන්හලක් මෙසේ වැනූහ

**කව්සිළුමිණෙහි :-**

“ඉමිහිලැගිනි ගෙහමි - කළ තලාතෙනිනික්වැඹ
පෙණතුළ උතුරු සයුරේ - සිරි ඉසිලී අවන්හල්”

5. **දිගතින්** – දිග්+අතින්. 'අත්' සද සමාසයෙහි යි. බුව නාත, සවනාත ආදියෙහි මෙනි.

6. **ඔසල** – 'අව' උපසර්ගයට ආදේශ වූ 'ඔ' පූර්ව කොට ඇති 'සර' ධාතු කෙරෙන් 'ල' ප්‍රත්‍යය ව රකාර ලොපයෙන් සිද්ධ කර්තෘකාරක කෘදන්ත යි. 'ඔ' යනු ද වෙන් වූම උපසර්ගයෙක යනු මෞද්ගල්‍යායනාචාර්යයන්වහන්සේගේ මතය යි. 'ඔසට' ශබ්දයෙන් 'ඔසල' යි නිපන්න ය යි ද ගත හැකි යි.

7. **වෙස්** – වෙළෙඳ ගොවි කුලයන්හි ජාතයන් කෙරෙහි වෙස් සද වැටේ. මෙහි වෙළෙඳුන් කෙරෙහි යි.

8. **සතප්නා** – 'සතප්' ධාතුකෙරෙන් 'නා' ප්‍රත්‍යය ව සිද්ධ කෘදන්ත යි.

9. **සල්** – මෙහි 'සල්' සද ආපණාර්ථයෙහි වේ.

10. **ලග්නා** – 'ලග්' ධාතු කෙරෙන් ආධාරකාරකයෙහි 'නා' ප්‍රත්‍යය ව සිද්ධ කෘදන්ත යි. ලගිනේ යම් තැනෙක්හි ද ඒ ලග්නා.

11. **සිත්මිණෙව්** – සිත්මිණ+එව්. 'සිත්මිණ' නම් සිතූ පැතූ සියලු සම්පත් දෙනසුලු මහඟු මිණිරුවනකි. මෙ ද සාගරමථනයෙහි දී උද්ගත ව දෙවියන් අතට පත් වූවකැ යි කිවීන්ගේ අදහස යි.

12. **සතොස්වි** – 'සං' පූර්ව 'තුස්' ධාතුකෙරෙන් 'ඊ' ප්‍රත්‍යය හා 'ව' ප්‍රත්‍යය ද යෙදී සිද්ධ ප්‍රයොජ්‍ය අතීතකාලික ක්‍රියා යි.

**සංලක්ෂ්‍යය:**

1. වෘත්තය – මාලිනී යි.

**12** **මේ තුන් ලෝ වැසි නන්දනා නෙතදනා නන්මල්**
**සුපුල් විල්රැසින්**
**නන් පෑ පත් කුළුගේ සියෙන් බිහිදොරින් තැන්**
**තැන්හි දුන් රන්දෙදෙන්**
**දූල්වූ නන් වැටුපෙන් සැදුම් ලද ඇඟෑ රැස්නෙන්**
**සහස්රැස් දිනූ**
**දේනා නම් වෙහෙරෙක් ද වි පුරවරේ වෙත්හි සැවැත්හි**
**එකල්.**

**අන්වය හා පදාර්ථ:** **එකල්** – තත් කාලයෙහි, **සැවැත්හි පුර වරේ** – ශ්‍රාවස්තී නගරයාගේ, **වෙත්හි** – සමීපයෙහි, **මේ තුන් ලෝ වැසි** – මේ ලොකත්‍රය වාසි වූ, **නන් දනා** – නානා ජන යන්ගේ, **නෙත් අදනා** – නෙත්‍රාකර්ෂණය කරන්නාවූ ද, **සුපුල්** – මනා ව විකසිත වූ, **නන්මල්** – නොයෙක් පුෂ්ප ඇති, **විල්රැසින්** – තඩාග රාශියෙන් ද, **නන් පෑ පත්** – නොයෙක් කාන්තියට පැමිණි යා වූ, **කුළුගේ සියෙන්** – කූටාගාර ශතයෙන් ද, . **බිහිදොරින්** – බහිර්ද්වාරයෙන් ද, **තැන් තැන්හි** – ඒ ඒ ස්ථානයෙහි, **දුන්** – දෙන ලද හෙවත් නංවන ලද, **රන් දෙදෙන්** – හෙමධ්වජයෙන් ද

(උපලක්ෂිත වූ), **දැල්වූ** – දල්වන ලද, **නන් වැටුපෙන්** – නොයෙක් ප්‍රදීපයෙන්, **සැදුම් ලද** – සැරසීම් ලද්දා වූ, **ඇඟෑ රැස්නෙන්** – අග්ඝිකාවන්ගේ රශ්මියෙන්, **සහස්රැස්** – සූර්යයා, **දිනූ** – ජය ගත්තා වූ, **දේනා නම් වෙහෙරෙක් ද** – ජේතවන නම් විහාරයක් ද, **වී** – වූයේය.

**විස්තර:** i මේ තුන් ලෝ වැසි නන්දනා නෙතදනා

නෙත්‍ර ආකර්ෂණය වනුයේ ශොභාවෙනි. එහෙයින් අත්‍යධික ශොභාවෙන් යුක්ත වූ ය යි කී සේ යි. තුන්ලෝ වැසියන්ගේ ම නෙත්‍ර ආකර්ෂණය කරන බව කීමෙන් ආධික්‍යය හැඟේ.

ii නන් පෑ පත් කුළුගේ සිරයෙන්

විවිධ සායම් ගෑමෙන් හෝ මාණික්‍ය කාන්තිය පැතිරීමෙන් නොයෙක් පැහැයට පැමිණී;

iii දුල් වූ නන් වැටුපෙන් සැදුම්ලද ඇඟෑ රැස්නෙන් සහස් රැස් දිනූ

බොහෝ වූ පහන්ඇඟෑවල ආලෝකයෙන් සූර්යයාටත් වඩා ආලෝක යුක්ත වූ ය යි කී අයුරු යි.

iv පුරවරේ වෙත්හි සැවැත්හි

ජේතවන මහාවිහාරය ශ්‍රාවස්තීනගර සමීපයෙහි විය. යතීන්ගේ සුඛ විහරණාදියට බාධක හෙයින් නගරයෙහි ම නො කරවන ලදී. දෙව්රම් වෙහෙර ශ්‍රාවස්තීනගරයෙන් 'ලී'පහකට හයකට පමණ දුරින් පිහිටා තුබුනු බැව් ශවාන්ජ්ශවාන් තුමාගේ භ්‍රමණ වෘත්තාන්තයෙහි සඳහන් වේ.

**ටිප්පනී :**

1. **තුන් ලෝ** – ස්වර්ග මර්ත්‍ය පාතාල (= දෙව් මිනිස් නා) යන තුන් ලෝ.

2. **වැසි** – 'වස්' ධාතු කෙරෙන් 'ඉ' ප්‍රත්‍යය ව සිද්ධ කෘදන්ත යි. වසනුයේ වැසි.

3. **කුළුගේ** – ගෙමුදුන්හි තනනු ලබන කුඩා ගෙය.

4. **බිහිදෙරින්** – බිහිදෙර+ඉන්. බිහිදෙර නම් වාසල (= පිට දෙරටුව) යි.

5. **රන්දෙදෙන්** – රන්දද+එන්. රන්දදෙන් යි සන්ධි වූ ඉක්බිති පිළිපෙරැළි ව දෙදෙන් යි වී. රන්කම්යුතු දද = රන්දද.

6. **වැටුපෙන්** – වැටුප් නම් ප්‍රදීප යි.

7. **ඇඟෑ** – 'ඇඟෑ' නම් තොරණ විශෙෂයකි. පහනින් යුතු එ ම ඇඟෑ පහන් ඇඟෑ නම් වෙයි. මලින් යුක්ත වූයේ මල් ඇඟෑ නම් වෙයි.

8. **සහස්රැස්** – දහස්ගණන් රැස් ඇති හෙයින් සූර්යයාට නමි. මෙහි සහස් සද දහස්ගණන් (= බොහෝ) යන අර්ථ දෙයි.

9. **දිනු** – 'දන' ධාතු කෙරෙන් 'ඌ' ප්‍රත්‍යය ව සිද්ධ කෘදන්ත යි.

10. **දේනා නම් වෙහෙරෙක්** – ජේතවන නම් විහාරයක්. **ජේත** නම් රජකුමරකු සතු ව පැවති මහරම් උයනක් මිලට ගෙන බිම් ගැනීම ය, විහාර කර්මාන්ත ය, පූජෝත්සව ය යන තුනට සිව් පණස් කෙළක් ධනය වියදම් කොට '**අනාථපිණ්ඩික**' නම් මහසිටුතුමා විසින් ශ්‍රාවස්තීනගර සමීපයෙහි කරවා බුදුරජාණන් වහන්සේට පිළිගන්වන ලද මහාවිහාරය '**ජේතවනාරාම**' නමින් ම හඳුන්වනු ලැබී. පූර්වස්වාමියාගේ නමින් ජේතවන ය යි කීම ලෝකව්‍යවහාරානුසාරයෙනි. ජේතකුමාරයාගේ උයන ය යි ප්‍රසිද්ධ ව පැවති නම උයන විකිණීමෙන් ද නො වෙනස් විය.

11. **පුරවරේ වෙත්හි** – පුරවරය සමීපයෙහි. අප්‍රාණිවාචක ශබ්දයන් කෙරෙන් සම්බන්ධාර්ථය ප්‍රකාශකිරීමට ද අදර විබත් යෙදෙන බැවින් 'පුරවරේ' යි ගත්හ.

12. **සැවැත්හි** – 'පුරවරේ' යන්නට විශේෂණ වූ අදර විබති.

**සංලක්ෂ්‍යය.**

1. **වෘත්තය – ශාර්දූල වික්‍රීඩිත** නමි. අන්තයෙහි ගුරක් සහිත 'ම – ස – ජ – ස – ත – ත' යන ගණ ද දොළසකින් හා සතකින් යති ද වී නම් ඒ ශාර්දූල වික්‍රීඩිත නම් වෘත්ත ය යි. එහෙයින් කීහ.

**වෘත්තරත්නාකරයෙහි :–**

" සූර්‍යාශ්වෛර්මසජස්තතාඃ සගුරවඃ ශාර්දූලවික්‍රීඩිතම් " යි.

මෙහි සූර්‍ය – අශ්ව ශබ්ද **භූතසංඛ්‍යා**ක්‍රමයෙන් දොළස - සත යන අරුත් දේ. ප්‍රස්තාරය මෙසේ යි.

ම – ස ජ ස ත ත ගුර
◡◡◡, ——◡, —◡—, ——◡, | ◡◡—, ◡◡—, ◡|
යති. යති.

13 නන් රුක්හි කලඳුන් නදින් විලිමුවන් සැල්මෙන්
ගිගුම් මත් බිඟුන්
පුල් සල්හි නලනුනදින් පිවුදසුන් මත් වූ කොකා
පිල්බරුන්
විල්හොල්හි මතරැව් පැනී බට මුවන් නන් රන්
හසුන් රැව් සිරුන්
ඒ දේනා වෙහෙරේ තුරේ පසඟ රැව්මෙන් නන් සවන්
ගත් දනන්.

**අන්වය හා පදාර්ථ:** ඒ දේනා වෙහෙරේ – ඒ ජේතවන විහාරයෙහි, **නන් රුක්හි** – නොයෙක් වෘක්ෂයන්හි, **කලඳුන් නදින්** – කලන්දකයන්ගේ නාදයෙන් (සූකනවූ), **විලිමුවන්** – වලීමුඛයන් (=වඳුරන්) ගේ, **සැල්මෙන්** – චලනයෙන් (=ඔබමොබ පැනීමෙන්) වූ (නාද ද), **මත් බිඟුන්** – මත්තභෘංගයන්ගේ, **ගිගුම්** – ගර්ජිතාව ද, **පුල් සල්හි**

පුෂ්පිත වූ ශාලවෘක්ෂයන්හි නොහොත් පුෂ්පිත වෘක්ෂයන්හි, **රිවුදසුන්** – කොකිලයන්ගේ, **නලනුනදින්** – මාරුතානුකූල වූ නාදයෙන් යුක්ත වූ, **මත් වූ** – ඔදවැඩියා වූ, **පිල්බරුන්** – මයූර යන්ගේ, **කෙකා** – කෙකා රවය ද, **විල්කොල්හි** – තටාක තීර යන්හි, **පැනී** – පැන් කැමති ව, **බමමුවන්** – බටුවා වූ මෘගයන් ගේ, **මතරැව්** – මත්තරාවය ද, **නන් රන් හසුන්** – බොහෝ වූ ස්වර්ණහංසයන්ගේ, **රැව්** – නාද ද, **සිරුන්** – චීරිකාවන් ( = රැහින්) ගේ, **රැව්** – නාද ද, **තුරේ** – තූර්යයෙහි, **පසහරැව්මෙන්** – පඤ්චාඞ්ගික නාදය මෙන්, **නන් දනන්** – නානාජනයන්ගේ, **සවන් ගත්** – ශ්‍රවණ ග්‍රහණය කෙළේ යි.

**විස්තර:** ඒ ජේතවන විහාරය අවට පිහිටි උයනෙහි කලඳුකාදීන්ගේ නාදද තටාකතීරයන්හි මෘගයන්ගේ මත්තරාවාදිය ද තූර්යයක්හි පඤ්චාඞ්ගික රාවය මෙන් ජනයන්ගේ සවන් පිනවී.

**පිපසනී:**

1. **කලඳුන්** – කලඳ යනු ලෙහෙනුන්ට නම්. 'කලන්දක' ශබ්දයෙන් සිද්ධ යි.

2. **නදින්** – මේ උපලක්ෂණාර්ථයෙහි කරණවිබත්. එහෙයින් 'නාද යෙන් යුක්ත වූ' යයි අරුත් දතයුතු.

3. **විලිමුවන්** – විලිමුව නම් වානර යි. 'වලිමුඛ' ශබ්දයෙන් සිද්ධ යි. මෙය රිලවුන් කෙරෙහි වැටෙන බව රුවන්මල්කාරයෝ කීහ.

4. **සැල්මෙන්** – සැලුම් + එන්. 'සල්' ධාතුවෙන් පදසිද්ධිය වන අයුරු 2 පද්‍යයේ 8 වන පිපසනියෙන් දත යුතු.

5. **නලනුනදින්** – නල නම් සුළඟ යි. ඊට අනුකූල වූ නද නලනුනද නම්. මෙද උපලක්ෂණාර්ථයෙහි කරණ විබත්.

6. **රිවුදසුන්** – රිවු නම් කවුඩු යි. එබඳු දර්ශනය ඇති හෙයින් කොවුල් තෙම 'රිවුදස්' නම් වී. කපුටන් තම දරුවන් වැඩීමෙහි දක්ෂයන් කොට ඇති හෙයින් හෝ මෙනම විය හැකි යි.

7. **කෙකා** – මයූරයන්ගේ නාදය 'කේකා' නම්. තද්භව වශ යෙන් සිංහලට ගෙන 'කෙකා' යි හ්‍රස්ව ව උච්චාරණය කරනු ලැබේ.

8. **පිල්බරුන්** – පිල් කලඹ ඇති හෙයින් මොනර 'පිල්බර' නම් වේ.

9. **විල් කොල්හි** – විල්හි කොල් = විල්කොල්. කොල් නම් තීරය යි. 'කූල' ශබ්දයෙන් සිද්ධ යි.

10. **පැනී** – පැන් ඉස්නේ පැනී. 'පැන්' ශබ්දයා කෙරෙන් ඉච්ඡාර්ථ යෙහි 'ඊ' ප්‍රත්‍යය ව සිද්ධ තද්ධිත පද යි.

11. **රන් හසුන්** – රන්වන් පියාපත් ඇති හංසයෝ රන්හස් නමු. 'සුවණ්ණ හංස' ජාතකයෙහි ස්වර්ණමය පියාපත් ඇති හංසයන් ගැන ද සඳහන් වේ.

12. **සිරුන්** – සිරූ යනු රැහිත්ව නම්. 'චිරිකා' ශබ්දයෙන් හිතා යි.

13. **වෙරේ** – වෙර+ඒ. 'විහාර' ශබ්දයෙන් වෙහෙර යි බිඳී හකාර ලොපයෙන් දීර්ඝ ව 'වේර' යි සිද්ධ යි. වේරේ යි කිවමනා තැන්හි වෙරේ යි කීම වෘත්තය පිණිස යි.

14. **තුරේ** – තුරූ+ඒ. 'තූරිය' ශබ්දයෙන් තුරූ යි හිතා යි.

15. **පසඟ රැව්** – තූර්‍ය, ආතතය, විතතය, ආතතවිතතය, ඝණය, සුෂිරය යි පඤ්චාංගයකින් යුක්ත වෙයි. ඔවුන්ගේ නාද පසඟරැව් නම්.

16. **ගත්** – 'ගත්' ධාතුවෙන් කර්තෘ කාරකයෙහි සිද්ධ අතීත කෘදන්ත යි.

**සංලක්ෂ්‍ය:**

1. **වෘත්තය – ශාර්දූල වික්‍රීඩිත** නමි. විස්තර 12 පද්‍යයේ 1 සංලක්ෂ්‍යයෙන් දත යුතු.

**14 නන් දික්හී සරණෙන් දිනූ සතැවුලී නෑමෙන්**
**නිවා මෙන් ගැ ලී**
**පුල් විල්හී සියපත් සහස් කරඬු මෙන් සොල්වා**
**නිසල් පත් අගින්**
**ගන් මින් රොන් අඟරා සෙ ගත්හි නවරා ගන්මින් ම**
**පායින් වෙසෙස්**
**යාගත් ඒ උවටා ලෙසින් නල සවස් සව්වන් කර**
**ඒ වෙනේ.**

**අන්වය හා පදාර්ථ:** **නන් දික්හි** – නානාදිශාවෙහි, **සර ණෙන්** – සඤ්චාරයෙන්, **දිනූ** – ජාත වූ, **සතැවුලී** – සන්තාපය, **පුල්විල්හි** – පුෂ්පිත තඩාගයන්හි, **ගැලී** – තිමගත ව, **නෑමෙන්** – ස්නානයෙන්, **නිවා මෙන්** – නිර්වාපණය කොට ගෙන මෙන්, **සිය පත්** – පද්ම, **සහස් කරඬු මෙන්** – * දහස් ගණන් කරණ්ඩකයන් මෙන්, **නිසල්** – නිශ්චල වූ, **පත් අගින්** – පත්‍රයන්ගේ අග්‍රයෙන්, **සොල්වා** – චලනය කොට, **රොන්** – පරාගයන්, **ගන්මින්** – ග්‍රහණය කෙරෙමින්, **අඟරා** † **සෙ** – අඞ්ගරාගයක් පරිද්දෙන්, **ගත්හි** – ශරීරයෙහි, **නවරා** – ලිම්පනය කොට, **පායින්වෙසෙස්** –

* සුවඳ පිරූ, † සෙගත්හි – සෙව්‍යගාත්‍රයෙහි,

ප්‍රසාධන (= සැරසීම්) විශෙෂයන්, **ගන්මින් ම** – ග්‍රහණය කෙරෙමින් ම, **සවස්නල** – සායාහ්නමාරුතය, **ඒ වෙනේ** – ඒ විහාර සමීප උයනෙහි වූ, **සච්චන් කරා** – ශ්‍රාවකයන් වෙත, **ඊ උවටා ලෙසින්** – ඒ විහාරයෙහි උපස්ථායකයකු මෙන්, **යා ගත්** – යාත්‍රා ග්‍රහණය කෙළේය හෙවත් එළඹුණේය.

**විස්තර:**

ඒ විහාරය සමීපඋයනෙහි වැඩහුන් භික්ෂූන් කරා සායාහ්න මාරුතය විහාරයෙහි උපස්ථායකයකු මෙන් එළඹුණේය. කෙසෙයින් එළඹුණේ ද? යත් :-

i තත් දික්හි සරණෙන් දිනූ සතැවුලී නැමෙන් නිවා මෙන්
ගැලී - පුල්විල්හි.

නොයෙක් දිශායෙහි සඤ්චාරයෙන් හටගත් සන්තාපය පුල්විල්හි ගැලී නැමෙන් නිවාපණය කොට ගෙන මෙහි. මේ, විල් ආශ්‍රයෙන් සිසිල් ව ය යු සේ යි.

ii සියපත් සහස් කරඹු මෙන් සොල්වා තිසල් පත් අගින්
ගත්මින් රොන් අඟරා සෙ ගත්හි තවරා

දහස්ගණන් කරඹු විවෘත කරන්නාක් මෙන් පද්මයන්ගේ පත්‍ර අගින් සොල්වා (= ඔබ මොබ කොට) රොන් ගෙන අඞ්ගරාගයක් මෙන් ශරීරයෙහි ගල්වා,

මේ පියුම් රොනින් යුක්ත ව ය කී අයුරු යි. මල්රොන් අඞ්ගරාගයක් බඳු වෙයි. එහෙයින් ඊට ආධාර වූ පියුම් අඞ්ගරාග බඳා තැබීමට ආධාර වූ කරඹු මෙහි. පියුම් බොහෝ හෙයින් ‘ සහස් කරඹු ’ = දහස් ගණන් කරඹු යයි ගත්හ.

iii ගත්මින් ම පාසින් වෙසෙස්

මෙහි ප්‍රසාධන විශෙෂ ග්‍රහණය නම් මල්රොන් තවරාගෙන සැරසීම යි. අන් සැරසීමක් නො දක්වූයෙන් හා එය සැරසීම් වෙසෙසක් වන හෙයින් ද වේ.

**ටිප්පණී:**

1. **සතැවුලී** – ‘ස’ උපසර්ගය පූර්ව කොට ඇති ‘තව’ ධාතුකෙරෙන් භාවයෙහි ‘උලි’ ප්‍රත්‍යය යි. දීර්ඝය ව්‍යත්‍යය පිණිස යි.

2. **ගැලී** – ‘ගල’ ධාතුවෙන් සිද්ධ පූර්වක්‍රියා යි.

3. **පුල් විල්හි** – සවස් කාලයෙහි මැල වී ගිය පියුම් ඇත ද පුල් විල් ය යි කීමට බාධාවක් නැත.

4. **සිය පත්** – සියක් පත් ඇත්තේ යමක ද ඒ = සියපත්. මෙහි ‘ සිය ’ සද සිය ගණන් යන අරුත් දේ.

5. **කරඬු** - දෙපියන් මැනැවින් සපයි එන අයුරින් තනන ලද සුගන්ධාදි යම් යම් දේ බහා තැබීමට ගන්නා බඳුන් වෙසෙසකි. එබඳු බඳුන් වෙසෙසක තථාගතයන් වහන්සේගේ ශාරීරික ධාතු තබා රැකීමෙන් ඒ පිණිස වූ විශෙෂ නාමයක් මෙන් වත්මන් වහරෙහි පවතී.

6. **ගන්මින්** - පූර්වක්‍රියාර්ථයෙහි මිශ්‍ර ක්‍රියා යි. 'ගන්' ධාතුකොරෙන් මින් ප්‍රත්‍යය යි.

7. **අගරා** - සඳුන්සුනු ආදි විලවුන් වෙසෙස්.

8. **පාසින්** - සැරසුමට නම්. 'පසාධන' ශබ්දයෙන් නිපන ව 'පහසින්' යි සිටි විට 'හ' කාර ලොපයෙන් දීර්ඝ ව 'පාසින්' යි සිද්ධ යි.

9. **ඊ** - එහි. 'එහි' යනු විකල්පයෙන් ඉහි යි සිටි. හකාර ලොපයෙන් හා දීර්ඝයෙන් 'ඊ' යි සිද්ධ යි.

10. **උවටා** - එළඹ සිටිනා තැනැත්තේ උවටා නම්. 'උපඨාක' ශබ්දයෙන් නිපන යි.

11. **සවුවන්** - සවු + අන්. 'සාවක' ශබ්දයෙන් 'සවු' යි නිපන යි.

**සංලක්ෂ්‍යය :**

1. වෘත්තය - ශාර්දූල වික්‍රීඩිත යි.

**15 නන් මල් රොන් අගරා සගත්හි නාවරා පුල්මල්**
**කැනින් හිස් පුරා**
**මී බි මත් බිගුනත් දරා සියසරා පුල්වැල් වෙණින් දත් සරා**
**කේකා නන් ලිය ගී නගා අඟ අඟා වාවේන සා අත් නගා**
**පුල් නන් රුක් නළුකැන් රඟා දින ලඟා දේනා**
**තිලෝ නෙත් * දගා**

අන්වය හා පදාර්ථ : **නන් මල් රොන්** - අනෙක කුසුමයන්ගේ රේණු නමැති, **අගරා** - අඞ්ගරාගය, † **සගත්හි** - ස්වකීය ශරීරයෙහි, **නාවරා** - ලිම්පනය කොට, **පුල්මල් කැනින්** - විකසිත වූ පුෂ්පමඤ්ජරීන්ගෙන් (= මල්පොකුරු වලින්), **හිස් පුරා** - මස්තකය පූරණය කොට, **මී** - මධුව, **බි** - පානය කොට, **මත්** - මත්ත වූ, **සියසරා** - ශතරාව ඇති, **බිගු** - භෘඞ්ග(ශ්‍රෙණි)නමැති, **නත් දරා** - තන්ත්‍රිධාරි වූ, **පුල් වැල් වෙණින්** - විකසිත ලතා නමැති වීණා වෙන්, **දත් සරා** - ජත්‍රැව සරසා, **කේකා** - මයූර නාද නමැති, **නන්ලිය ගී** - අනෙක ලයාන්විත ගීත, **නගා** - කොට, **අඟ අඟා** - වඩ වඩා, **වා වේන** - වාත වේගයෙන්, **සා අත්** - ශාඛා නමැති හස්ත, **නගා** - උද්ගත කොට, **පුල් නන් රුක්** - විකසිත නොයෙක් වෘක්ෂ නමැති, **නළු කැන්** - නාටක සමූහයා විසින්, **තිලෝ** - තුන්ලෝවාසීන්ගේ, **නෙත් දගා** - නෙත්‍රයන් බන්ධනය කොට, **දේනා ලඟා** - ජේතවන විහාර සමීපයෙහි, **රඟා දින** - නෘත්‍යයක් කරණ ලද්දේය.

---

* සෙ- ප්‍රශස්ත වූ. † දිගා,

## විස්තර:

ඒ ජේතවන විහාරසමීපයෙහි වූ නොයෙක් වෘක්ෂ නමැති නාටක සමූහයා විසින් තුන්ලෝවාසීන්ගේ නෙත් පිනවා නෘත්‍යයක් පවත්වන ලද්දේය. හෙවත් උපවනයෙහි වෘක්ෂ සමූහය රඟදෙන නාටක සමූහයක් වැනි විය. කෙසෙයින් ද? යත් :-

i නත් මල් රෙන් අඟර සඟන්හි තවර

නළුවෝ අඞ්ගරාගයෙන් (= විලෙවුන් වෙසෙසකින්) සැරසෙති. වෘක්ෂයෝ මල්රෙන් නමැති අඞ්ගරාග තවරා ගත්හ.

ii පුල්මල් කැනින් හිස් පුරා

නළුවෝ හිසෙහි මල් පලඳිත්. වෘක්ෂයෝ ස්වභාවයෙන් ජාත මල් පොකුරු රැසින් ස්වමස්තකයන් පුරා ගත්හ.

iii මී බී මත් බිඟු නත් දරා සියසරා පුල්වැල් වෙණින් දත් සරා

නළුවෝ ස්වකීය අංශකූට (= උර) මතුයෙහි වීණාවෙහි කොණක් තබා අතින් අල්වා ගෙන ගායනා කෙරෙමින් නටත්. වෘක්ෂයෝ මධුපානයෙන් මත් ව බෙහෙවින් නාද පවත්වන භ්‍රමර පඞ්ක්ති නමැති තත් ඇති විකසිත ලතා නමැති වීණාවන්ගෙන් සැරසී ගත්හ. (ලතාවීණාය යි පරිකල්පනය කළ විට එහි වූ ගුම්ගත් බිඟුවැළ තත් ය යි ගැන්ම උචිත ම ය. වෘක්ෂ නාටකයන් කොට තකාත් ම තත්සම්බන්ධ ලතා වීණා ය යි ගැන්ම ද මනොඥ යි.)

iv කේකා නත් ලිය ගී නඟා

ලයාන්විත ගීත කෙරෙමින් නළුවෝ නටත්. වෘක්ෂයන්හි වූ මයුරයන්ගේ කේකාරාව ම වෘක්ෂයන්ගේ ලයාන්විත ගීත වී.

v වා වේන සා අත් නඟා.

නළුවෝ අත් නඟමින් නෘත්‍ය කෙරෙත්. වෘක්ෂයන්ගේ ශාඛාවන් වාත වේගයෙන් වඩ වඩා උදනත වීම නළුවන්ගේ අත් නැඟීමට සම වේ.

මෙ සෙයින් විහාර සමීප උයන්හි වූ විකසිත වෘක්ෂ සමූහය නාටක සමූහයක් නෘත්‍ය කරන්නාක් මෙන් බැබලිණ.

## ටිප්පණී:

1. **කැනින්** — කැන නම් මඤ්ජරිය (= පොකුර) යි.

2. **දරා** — ධාරී වූ. මේ පූර්වක්‍රියාවක් නො වේ. 'ගඟදර' ආදියෙහි මෙන් ධාරණාර්ථයෙහි 'දර' ශබ්ද යි.

3. **සියසරා** — ශතරාව ඇති. බොහෝ රාව ඇති ය යන අර්ථ යි.

4. **දත්** — ජත්‍රුව. ජත්‍රු නම් අංශ සන්ධිය යි. අභෙදෙපචාරයෙන් අංශකූටයට (= උරහිසට)ද මෙ නම යෙදෙ යි. වෘක්ෂයන්හි ජත්‍රු නාමයෙන් විශෙෂ අවයවයෙක් නැත. එහෙත් ජනයන් ජත්‍රුවෙහි වීණා පැලඳගන්නා හෙයින් ද වෘක්ෂ නාටකයන්නැයි ගත් හෙයින් ද 'දත්සරා' යි කීහ.

5. **ලිය ගී** – ලයාන්විත ගීත. ලයෙන් යුත් ගී = ලයගී. පිළිපෙරැළි යෙන් ලියගී. ලය නම් නෘත්‍ය ගීත වාද්‍යයන්ගේ එක් සවර විශෙෂයකින් යුත් සම බව යි.

6. **වෙන** – 'වෙග' ශබ්දයෙන් නිපන් 'වේ' සද කොරත් කරණ විබත් 'න' ප්‍රත්‍යයකින් සිදුබ කටයුතු යි.

7. **නගා** – 'නග' ධාතු කෙරෙන් 'ආ' ප්‍රත්‍යය ව සිදුබ පූර්වක්‍රියා යි

8. **නළ** – 'නට' ශබ්දයෙන් නිපනා යි.

9. **කැන්** – සමූහාර්ථවාචි ශබ්දයෙකි. මඤ්ජරී රශ්මිවාචි කැන් ශබ්ද ද ඇත්.

10. **දින** – 'දා (=දෙ)' ධාතුවෙන් සිදුබ කර්මකාරක ක්‍රියා පද යි.

11. **ළඟා** – සමීපාර්ථවාචි 'ළඟ' ශබ්දය ව්‍යත්තය පිණිස දීර්ඝ කොට යෙදූහ.

12. **දේනා** – 'ජේතවන' ශබ්දයෙන් බිඳුණ ද උයන නොව විහාරය ම මින් කිය වේ. මුඛ්‍ය වස්තුව කෙරෙහි පැවැත්ම ශබ්දයන්ගේ ස්වභාවය හෙයිනි.

13. **දගා** – දග - බැඳීමෙහි ධාතුවෙන් සිදුබ පූර්වක්‍රියා යි.

**සංලක්ෂ්‍යය:**

1. **වෘත්තය** – **ශාර්දූල වික්‍රීඩිත** යි.

**16 ළද ලෙළ ලිය ප ල් ලා විල්තෙරේ රුක් සිය ල් ලා**
**දූකැ එහි බඳ ලො ල් ලා ගොස් තමා නෙත් නො**
**සො ල් ලා**
**දෙන මුව මුව පො ල් ලා හොත් නුවන්පෑ සුනි ල් ලා**
**දූහැ එහි කළ ලො ල් ලා වන් එවල්හි සිලි ල් ලා**

**අන්වය හා පදාර්ථ: විල්තෙරේ** – තඩාග තීරයෙහි, **රුක් සියල්ලා** – සියලු වෘක්ෂයන්හි, **ළද** – අභිනව වූ, **ලෙළ** – ලීලෝපෙත වූ, **ලිය පල්ලා** – ලතා පල්ලවයන්, **දූකැ** – දර්ශනය කොට, **එහි** – ඒ පල්ලවයෙහි, **බඳ ලොල්ලා** – බඳනා ලද ලොභ ඇති, **මුව පොල්ලා** – මෘග පොතක තෙම, **තමා නෙත්** – තමාගේ නෙත්‍ර, **නො සොල්ලා** – චලනය නො කොට, **ගොස්** – ගමනය කොට, **මුව** – මුඛය, **දෙන** – (පල්ලවයට) දානය කරත් ම, **සුනිල්ලා** – අතිශයින් නීලවර්ණ වූ, **නුවන් පෑ** – නෙත්‍ර ප්‍රභාව, **හොත්** – හුණු වා වූ, **එහි** – ඒ පල්ලවයෙහි, **කළ ලොල්ලා** – කරන ලද ලෞල්‍යය, **දූහැ** – හැර, **එවල්හි** – ඒ ජේතවන උයන්හි, **සිලිල්ලා** – (තඩාග) ජලයට, **වන්** – ප්‍රවිෂ්ට වී.

**විස්තර:**

ගඞ්ගා තීරයන්හි වූ වෘක්ෂයන් වැලඳ සිටි ලතාවන්හි ලපටි ලීලෝපේත පත්‍රයෝ වෙති. ලපටි පත්‍රයන්ට අතිශයින් ලොල් වූ මෘග පෝතක තෙම තොත් තො හොල්වා ගොස් ඊට මුව ලං කෙරෙයි. එවිට නෙත්‍රයෙහි නීලවර්ණ කාන්තිය හුණු ලපටි පත්‍රය තිල්වන් ව පැසුණු පත්‍රයක් වැනි වෙයි. එවිට එහි ලෝභය දුරු කොට සමීප විලට බසියි. පැසුණු පත මුවන්ට වඩා ප්‍රිය නැති හෙයිනි. ගඞ්ගා ජලයට බැසීම එහි ලපටිපත්‍රයන්ගේ ඡායාව දක්නා ලැබෙන හෙයින් එහි ලපලු ඇතැයි සිතීමෙනි.

**විපසනී:**

1. **ලද –** තරුණ යන අර්ථවත් නිෂ්පන්න ශබ්දයෙකි.

2 **පල්ලා –** පලු + ආ. පලු සඳ බාල පත්‍ර වාචි යි. 'පල්ලව' ශබ්දයෙන් භින්න යි.

3. **දැකැ –** 'දිස්' ධාතුහට ආදේශ වූ 'දක්' යන්න කෙරෙන් 'ඇ' ප්‍රත්‍යය හා පිළිපෙරළි ව සිද්ධ පූර්වක්‍රියා යි.

4. **එහි –** සමුදය වශයෙන් සලකා එකවචනයෙන් කීම යි.

5. **ගොස් –** 'ගනුවා' යන පූර්වක්‍රියාශ්‍රයෙන් පැමිණි නිපාතන පූර්වක්‍රියා යි.

6. **දෙන –** 'දා' ධාතුවට ආදේශ වූ 'දෙ' යන්නෙන් කාලාර්ථයෙහි 'න' ප්‍රත්‍යයට සිඩ කෘදන්ත යි.

7. **මුවපොල්ලා –** මුවපොලු + ආ. මෙහි 'පොලු' සඳ 'පෝතක' යන අරුත්හි වේ.

8. **හොත් –** 'හෙ - හිමෙහි' ධාතු කෙරෙන් 'ත්' ප්‍රත්‍යය හා පිළිපෙරළි ව ආධාරකාරකයෙහි සිද්ධ අතීත කෘදන්ත යි.

9. **සුනිල්ලා –** සුනිල් + ආ. මනානිල් = සුනිල්.

10. **දැහැ –** හැරීමෙහි 'දහ' ධාතු කෙරෙන් 'ඇ' ප්‍රත්‍යය ව සිද්ධ පූර්ව ක්‍රියා යි.

11. **වත් –** පිවිසීමෙහි 'වද' ධාතුකෙරෙන් 'ත්' ප්‍රත්‍යය ව 'ද' කාර ලෝපයෙන් කර්තෘකාරකයෙහි සිද්ධ කෘදන්ත යි.

12. **එවල්හි –** මෙහි 'වල්' සඳ උද්‍යාන පර්යාය යි.

**සංලක්ෂ්‍යය:**

1. **වෘත්තය –** මාලිනී යි.

**17 පුලිනතල අසුන් වි නන් සුපුල් මල් විසත් වි**
**ගිනිසිළු ම වැටුප් වි කල් සුපුල් වැල් ලියන් දුන්**
**පබල විදිනිප ත් වි දම් සවන්වස් කැදිමෙන්**
**මත සියොන නද ත් වි දම් නිවෙස් එව් එවල් වි.**

**අන්වය හා පදගත** : **පුලිනතල** – වැලිතලා ම, **අසුන් වී** – ආසන වී ය, **නන් සුපුල් මල්** – නොයෙක් සුපුල්ල පුෂ්ප ම, **වියන් වී** – විතානය වූයේ ය, **ගිනිසිළු ම** – ලාඹගලී කුසුම ම, **වැටුප් වී** – ප්‍රදීප වී ය, **කල්** – මනෝඥ වූ, **සුපුල් වැල්** – සුපුෂ්පිත ලතා නමැති, **ලියන් දුන්** – කාන්තාවන් විසින් දෙන ලද, **පබල** – අභිනව පල්ලව ම, **විදිනිපත් වී** – විජනී පත්‍ර වූයේ ය, **දම් සවන් වස්** – ධර්මශ්‍රවණය පිණිස, **කැඳි මෙන්** – කැඳවන්නන් පරිද්දෙන්, **මත සියොත නද ත් වී** – මත්ත විහඞ්ග නාදත් වූයේය,(මෙසෙයින්) **එවල්** – ඒ ජේතවනාරණ්‍යය, **දම් නිවෙස් එව්** – ධර්ම ශාලාවක් මෙන්, **වී** – වූයේ ය.

**විස්තර:**

ජේතවනාරණ්‍යය ධර්මශාලාවක් බඳු වී. කෙසෙයින් ද යත්:-

i පුලිනතල අසුන් වී.

ධර්මශාලාවෙහි හිඳගැනීමට අසුන් වෙයි. ඒ වනයෙහි සුදුවැලිතලාව ම ආසන වි ය.

ii නන් සුපුල් මල් වියන් වී.

දහම් හලෙහි වියන් ඇත්තේ ය. වනයෙහි එකිනෙක ගැටෙන සේ සමීප ව සුපිපි මතු භාගයෙහි සිටි කුසුම් ම විතානය විය. වියනක් මෙන් උපරිභාගයෙන් ආච්ඡාදනය කොට සිටි හෙයිනි.

iii ගිනිසිළු ම වැටුප් වී.

දහම්හල්හි දල්වූ පහන් වෙයි. එ උයන්හි ලාංඹගලී (= නියඟලා) මල් ම පහන් වී. රක්තවර්ණ වූ ලියනගලා මල පහන් සිළක් මෙන් දක්නා ලැබෙන හෙයින් මෙසේ කීහ. ලියනගලාමල් රක්තවර්ණ හෙයින් ගිනිසිළු වැනි බව කවීන්ගේ වර්ණනයන්ගෙන් පැහැදිලි වේ. **ධර්මප්‍රදීපිකාවෙහි** :– "බමර බැර පුල්ලෙළ ලියනගලා මැ දසනුදෙසෙහි සහදුම් ලැව් දල සේ පැතිණ." **මුවදෙව්දාකාරයෝ** ද ලියනගලා මල් රක්තවර්ණ හෙයින් ගිරවුන්ගේ තුඩු වැනි බව හැඟවූහ.

"අවුදු **ගිරාපෙළ** – වනහිස්හි ලොළිනවුසි
සදම්නි මෙන් **පුල්** ලෙළ – **ලියනගලා ලියෙන්** වල්" යි.

iv පබල විදිනිපත් වී.

ධර්මකථිකයන් විජනී පත්‍ර (= පවන්අතු) ගෙන දහම් දෙසන හෙයින් දහම් හල්හි විජනී පත්‍ර ඇත්තේය. වනයෙහි බාලපල්ලව ම විජනීපත්‍ර විය. බාල හෙයින් පඬුවන් වූ මහත් පල්ලව විජිනිපත් වැනි ය යි දුටහ. ඒ පත්‍ර ද ලතාවන්ගේ ය. "කල්සුපුල්වැල් ලියන් දුන්" යනු එ බව කිවිවරුන්ගේ බසින් කීසේ යි.

v දම් සවන් වස් කැඳී මෙන් – මතසියොත නදත් වී,

ධර්මශ්‍රවණය පිණිස කැඳවීම දහම් හල්හි පවතී. ඒ උයන්හි පක්ෂීන්ගේ රාවය ධර්මශ්‍රවණය පිණිස කැඳවීමක් වැනි වී.

මෙ සෙයින් ඒ ජේතවන උයන දහම් හලක සිරි ගති.

**විපසනී:**

1. **පුලින** - වාලුකා වාචී මාගධ භාෂාව හා තත්සම ශබ්දයෙකි.

2. **තල** - මේ පාලි සංස්කෘත භාෂාවන්හි 'වාලුකාතල, භූමිතල ආදි ශබ්දයන්හි යෙදෙන ස්වරූපාර්ථවාචී තත්සම ශබ්දයෙකි.

3. **අසුන්** - යම් තැනෙක්හි හිඳ ගනිත් නම් ඒ අසුන් නම්. ආසන ශබ්දයෙන් නිපන් යි.

4. **වී** - උක්ත පදය බහුවචනාන්ත වුව ද, අප්‍රාණී වාචක හෙයින් සිංහලයෙහි දී ක්‍රියාව එකවචනයෙන් සිටීම නිදෙසි.

5. **ගිනිසිළු** - ලියනගලාවලට නම්. ලියනගලාමල් ද අභේදෝපචාරයෙන් ගිනිසිළු නමින් ම ගන්නා ලදී. ප්‍රත්‍යය ලොප් කිරීමෙන් හෝ සිද්ධ යි. කියන ලද මැ යි **සිදත්හි** :- "මල්පිලි ඈ ඒ ඒ ලිය රුක් නමින් ද අබේදුවසරින් පසවත් කිරීමෙන් හොත වහරු යෙදේ" යි.

6. **ම** - අවධාරණයෙහි නිපාත යි.

7. **වැටුප්** - වැට, වැටුප් දෙසද ම ප්‍රදීප පර්‍යායයි.

8. **පබල** - අභිනව පත්‍ර. 'ප්‍රබාල' ශබ්දයෙන් නිපන් යි.

9. **විදිනිපත්** - පවන් සලා ගැනීම් ආදියට ඉවහල් තල්අතු ආදිය කින් කරන ලද්ද. 'වීජනීපත්‍ර' යනු ආශ්‍රයෙන් විදිනිපත් යි වහරට පැමිණියේ යි.

10. **කැඳි** - කැඳවනුයේ = කැඳි. 'කැඳ' ධාතුකෙරෙන් කර්තෘකාරකයෙහි 'ඉ' ප්‍රත්‍යය වී සිද්ධ කෘදන්ත යි. 'කැඳ' ධාතු කෙරෙන් ස්වාර්ථයෙහි වූ 'ව' ප්‍රත්‍යය සහිතවත් රහිතවත් පදසිද්ධිය වන බව දක්නා ලැබේ. කැඳවයි ආදි 'ව' ප්‍රත්‍යය සහිත ප්‍රයෝග සුලභ ය. **කව්සිළුමිණෙහි** :- '**කැඳූ** දුවහරනෙන් - සරන විසකුණු බමුණන්' ආදි තන්හි 'ව' ප්‍රත්‍යය රහිත ප්‍රයෝග දක්නා ලැබේ 'කැඳී' යන තන්හි දීර්ඝය වෘත්තය පිණිස යි. 'කැඳි' යි ප්‍රකෘතියෙන් සිට බහුවචනය ප්‍රකාශ කෙරෙයි. මේ ප්‍රථමා විභක්ත්‍යන්ත විය යුතු වුවත් 'මෙන්' යන නිපාතයාගේ යෝගය ඇති හෙයින් කර්මවිබක්ති බුහු බසැයි සැලකිය යුතු. සිංහලයෙහි දී 'මෙන්' ආදීන්ගේ යෝගයෙහි පෙර විබත කම්විබත් බවට පෙරළේ. 'මෙන්' ආදීන්ගේ යෝගයෙහි සතුවිබත් ආදිය ද කම් විබතින් සිටිය යුතු ය යි නියමයක් නැත.

11. **සියොත** - 'සියොත්' සද පක්ෂි, වාතක (= කෑදෑති) යන මොවුන් කෙරෙහි වැටේ. මෙහි 'පක්ෂි' යන අරුත්හි වේ. අකාරාන්ත කිරීම වෘත්තය පිණිස යි.

12. **දම්නිවෙස්** - දම් දෙසුම් පිණිස වූ නිවෙස් = දම්නිවෙස්. සපදත් විබත් සමස්. 'නිවාස' ශබ්දයෙන් 'නිවෙස්' යි සිද්ධ යි. 'නිවාස' නම් ආවාස ගෘහාදිය යි.

**සංලක්ෂ්‍යය:**

1. වෘත්තය - **මාලිනී** යි.

**18 මිණි දූදිරි කිරීමෙන් සිව්වනක් සව් පිරිස් රැස්**
**නඹුරුවන දහම් රැස් රැස් සියෙන් දම් හසුන් සෙල්**
**නැඟි දිවයුරු හව්වෙන් බුන් කෙලෙස් තුල් තමස්රැස්**
**මුනිරජ ලකළේ නෙත් ගත් එදේනා සුපුල් විල්.**

**අන්වය හා පදාර්ථ:** **දම්හසුන් සෙල්** - ධර්මාසන නමැති උදය පර්වතයට, **නැඟි** - ආරූඪ වූ, **දිවයුරු හව්වෙන්** - දිවාකර ලීලාවෙන්, **බුන් කෙලෙස්** - භග්න වූ ක්ලේශ සංඛ්‍යාත, **තුල් තමස් රැස්** - මහත්වූ අන්ධකාර රාශි ඇති, **මුනිරජ** - සර්වඥරාජ තෙම, **දහම් රැස්** - ධර්ම රාශි නමැති, **රැස් සියෙන්** - රශ්මි ශතයෙන්, **සිව් වනක් සව්පිරිස්රැස්** - චතුර්වර්ණ සකල පර්ෂද් රාශි නමැති, **නඹුරු වන** - තාමරස වනය, **මිණිදූදිරි කිරීමෙන්** - ප්‍රබොධ කිරීමෙන්, **නෙත් ගත්** - නෙත්‍ර ග්‍රහණය කළා වූ, **එදේනා සුපුල් විල්** - ඒ ජේතවන නමැති සුපුෂ්පිත තටාකය, **ලකළේ** - අලඞ්කෘත කෙළේය.

**විස්තර:**

මුනීන්ද්‍රයන් වහන්සේ දිවාකර ලීලාවෙන් ඒ ජේතවන විහාර නමැති සුපුල්විල අලඞ්කාර කළසේක. සූර්‍ය්‍යා උදය ගිරි හිසට නැඟී රශ්මියෙන් පියුම් පුබුදුවා විල් අලඞ්කාර කෙරෙයි. බුදුහු ධර්මාසන නමැති උදය ශෛලයට නැඟී දහම් නමැති රැසින් භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා යන සිව්වනක් පිරිස නමැති පියුම් ප්‍රබොධ කෙරෙති. සිව්වනක් පිරිස්හුගේ ප්‍රබොධය නම් මාර්ගඵලාවබොධය හෝ දහමින් චිත්තප්‍රසාදය ලබා ගැන්ම යි. සූර්‍ය්‍යා බිඳිනලද අඳුරු ඇත්තේ ය. බුදුහු බිඳිනලද කෙලෙස් අඳුරු ඇත්තෝ ය. මෙසෙයින් සාම්‍යය ඇත්තෙන් දිවාකරයාගේ ලීලාවෙන් යී කීහ.

මුනීන්ද්‍රයන්වහන්සේ දහම් දෙසනෙන් ජනයන් ලවා මාර්ගඵලාවබොධය කරවමින් ඒ දෙව්රම් වෙහෙර වැඩවිසූහ යි කී සේ යි.

**විසපනී:**

1. **මිණිදුදිරි** – මෙහි මිණි නම් පුෂ්පකොශය යි. දුදිරි නම් ජර්ජර බව යි. පුෂ්පකොශය ජර්ජර වනුයේ මල පුබුදු වන විට ය. එහෙයින් 'මිණි දුදිරි' නම් විකසිත බව යි.

2. **සිව්වනක්** – චතුර්වර්ණයක්. මෙහි වර්ණ (= වන්) සද ජාති වාචක ය. එහෙයින් සතර ජාතියකය යන අර්ථ යි. ඒ නම් භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන මොහු යි.

3. **තඹුරුවන** – තඹුරු යනු පියුම්වලට නම්. තඹුරු බෙහෙවින් ඇති පෙදෙස තඹුරුවන නම්. 'තාමරස' ශබ්දයෙන් 'තඹර' යි භින්න යි. 'තඹුරු' යි ද සිටී.

4. **හසුන්** – ආසනයෝයි. 'ආසන' ශබ්දයෙන් අසුන් යි සිද්ධේ. අකාර ස්ථානයෙහි 'හ' කාරය ආගමයෙන් පැමිණියකි. 'සිරුහන්වත' ආදියෙහි මෙනි.

5. **සෙල්** – ශෛල පර්වතාදි අර්ථයන්හි වේ. පියුම් ප්‍රබුද්ධ වන්නේ සූර්යයා උදයපර්වතයෙහි සිටින විට ය. එහෙයින් මෙහි 'සෙල්' යනු 'උදය පර්වතය' යි ස්ථානොචිත වශයෙන් දත යුතු.

6. **නැඟී** – 'නග' ධාතුකෙරෙන් කර්තෘකාරකයෙහි 'ඉ' ප්‍රත්‍යය ව සිද්ධ කෘදන්ත යි.

7. **දිවයුරු** – දිව(=දවාල)කරනුයේ = දිවයුරු. 'දිව' යනු පූර්ව කොට ඇති 'කර' ධාතුකෙරෙන් කර්තෘකාරකයෙහි 'උ' ප්‍රත්‍යය කළ විට 'දිවකරු' යි සිද්ධ යි. පිළිපෙරළියෙන් 'දිවකුරු' යි වේ. කකාරයට යකාරාදේශයෙන් දිවයුරු යනු වේ. 'දිවංකර' ශබ්දයෙන් භින්න ය යි ද ගත හැකි යි.

8. **හව්වෙන්** – හවු + එන්. 'භාව' ශබ්දයෙන් හවු යි භින්න යි.

9. **තුල්** – මහත් දේට නම්. 'ථූල' ශබ්දයෙන් භින්න යි.

10. **තමස්** – අන්ධකාර අවිද්‍යා යන අර්ථයන්හි වේ. සංස්කෘතයෙහි 'තමස්' සදක් ඇති හෙයින් තත්සම යි.

11. **මුනිරජ** – මුනිනට රජ = මුනිරජ. විබත් සමස්. නොහොත් මුනි වූයේ ද එ ම රජ වූයේ ද ඒ ම නු යි = මුනිරජ. වෙසෙසුත් සමස්.

12. **ලකළේ** – 'ලකර' ධාතුකෙරෙන් 'ළ' ප්‍රත්‍යය හා 'ර' කාරයට ලොප ද කිරීමෙන් සිද්ධ 'ලකළ' යන කෘදන්ත පදය 'ඒ' විබත් ගෙන සිටියේ යි.

13. **නෙත්ගත්** – නෙත් ගැනීම නම් තමා කෙරෙහි අනුන්ගේ නෙත යොමු කරවීම යි. ඒ කළ හැක්කේ ශොභාධිකත්වයෙනි. එහෙයින් 'ශොභා යුක්ත' ය යි කී අයුරු යි.

**සංලක්ෂණය:**

1. වෘත්තය - මාලිනී යි.

2. **සමාලෝචනා** - සුපුල් විල අලංකාර කෙළේ තඹුරුවනය මිණිදූදිරි කිරීමෙකැයි කියන ලද හෙයින් මෙහි 'සුපුල්විල්' යි ගැන්ම සදෙස් නො වේ දැයි ප්‍රශ්න කළ හැකි යි. සුපුල්විලක නම් ප්‍රබෝධ කිරීමෙන් නැවත කළ යුතු අලංකාරයක් නැති හෙයිනි. එහෙත් මේ සදෙස් නො වේ. යම් සේ බත් පිණිස වූ පිසීම 'බත් පිසීම' ය යි කියනු ලැබේ ද, එ සෙයින් සුපුල්විලක් කිරීම පිණිස තඹුරු මිණිදූදිරි කිරීමෙන් අලංකාර කිරීම 'සුපුල්විල මිණිදූදිරි කිරීමෙන් ලකළේ' ය යි කියන ලදැයි සැලකිය යුතු. නැත හොත් සුපුල්විල මිණිදූදිරි කිරීමෙන් අලංකෘත කෙළේය යනු පුනරුක්ත දෝෂයෙන් දුෂ්ට වේ. 'සුපුල්' වෙනුවට 'විමල්' ආදි අන්කිසි පදයක් යොදන ලදනම් මේ කිසි අවුලක් නැත.

19 ඔහු පිය සුදෙවුන් මව් දේවි මායා මහා ඈ
දිනිතිය ගබ හස්නෙන් පත් එබෝසත්හු කල්මී
වැලඳු තඹුරතින් පා කල්හු මෙන් කල් † වියෝ සත්
පදවර කර සිගොස් නන් දිගත් කුස් පුර දින්.

**අන්වය හා පදාර්ථ:** **ඔහු** - ඒ සර්වඥයන් වහන්සේගේ, **පිය** - පිතෘ තෙම, **සුදෙවුන්** - සුද්ධෝදන නම් මහරජ ය, **මව්** - ජනනී තොමෝ, **මහා ඈ මායා දේවි** - මහා යනු ආදි කොට ඇති මායා දේවි ය, හෙවත් මහාමායා දේවි ය, **දිනිතිය** - මාතෘවගේ, **ගබහස්නෙන්** - ගර්භ නමැති ආසනයෙන්, **පත්** - පැමිණියාවූ, (= බිහිවූ), **එබෝසත්හු** - ඒ බෝධිසත්වයන් වහන්සේගේ, **පා** - පාද අම්බුජය, **මීකල්** - මහීකාන්තාව, **වියෝකල්** - විරහ කාන්තාවක්, **කල්හු මෙන්** - (කලකින් ආ) ස්වකීය වල්ලභයක්හු මෙන්, (නො හොත්) **කල් වියෝ කල්හු මෙන්** - චිරාත් කාලයක් පිටත විසූ වල්ලභයක්හු මෙන්, **තඹුරතින්** - පද්ම නමැති හස්තාබ්ජයෙන්, **වැලඳු** - ආශ්ලේෂ කළා ය. (බෝධිසත්වයන් වහන්සේ) **සත් පදවර** - සප්ත පදව්‍යතිහාරයක්, **කර** - කොට, **සිගොස්** - ('අග්ගොහමස්මි' යනාදීන්) අභීත නාදයක්, **නන් දිගත් කුස්** - නොයෙක් දිශා කුක්ෂිය, **පුර** - පූරණය කොට, **දින්** - දුතය කෙළේය.

**විස්තර:**

i දිනිතිය ගබ හස්නෙන් පත් එබෝසත්හු කල් මී
වැලඳු තඹුරතින් පා කල්හු මෙන් කල් වියෝ,......

බෝධිසත්වයන් වහන්සේ ධර්මාසනයකින් බස්නා ධර්මකථිකයකු මෙන් මව් කුසින් සුව සේ බිහි ව පෘථිවියට අවතීර්ණ වූ හෙයින් මාතෘ ගර්භ නමැති ආසනයෙනැ යි කීහ. බිහි වූ බෝසතුන් වහන්සේගේ සිරිපා, පොළොව පළා නැගි

† පියව

සත්බුමු පියුම් පිළිගත්තේ ය. මිහිකත තඹුරු අතින් පාදයන් වැළඳ ගත්තී ය යි කීමෙන් එ බැව් පවසති. වැළඳ ගැන්ම ද අත්‍යධික ගෞරව ප්‍රේමභාරවනත ව ය. දීර්ඝකාලයක් වියෝගී ව සිටි වල්ලභයකු හෝ, චිරන්තන කාන්තාවක් සලකින් පැමිණි සවල්ලභයා වැළඳ ගැනීමක් මෙනැයි කීමෙන් එබැව් ප්‍රකාශිත යි.

ii සත් - පදවර කර සිගොස් කත් දිගත් කුස් පුර දිත්.

බෝධිසත්වයන්වහන්සේ සප්තපදව්‍යතිහාරයක් කොට හෙවත් සත්පිය වරක් ගොස්

"අග්ගොහමස්මි ලොකස්ස
ජෙට්ඨොහමස්මි ලොකස්ස
සෙට්ඨොහමස්මි ලොකස්ස
අයමන්තිමා ජාති නත්ථිදානි පුනබ්භවො".

යන අභීත නාදයක් සකලලොකකුහරය පූරණය කොට (= මුළුලොවට ඇසෙන සේ) ප්‍රකාශ කළහ.

**ටිප්පනී :**

1. **සුදොවුන්** – 'සීහහනු' රජහුගේ දෙටුපිත්, බුද්ධ වර්ෂයෙන් යට 80 වන වර්ෂය පමණේ දී '**කිඹුල්වත්**' පුරයෙහි වෙසෙමින් ශාක්‍යජනපදය පාලනය කළ රජතුමා.

2. **මහාමායාදේවි** – 'සුප්‍රබුද්ධ' නම් කොළිය රජහුගේ සහෝදරී වූ පූර්වෝක්ත සුදොවුන් රජුගේ අගමෙහෙසිය.

3. **දිනිතිය** – 'දිනිති' නම් මව යි. 'ජනෙත්තී' ශබ්දයෙන් නිපන යි.

4. **වැළඳු** – 'වළඳ' ධාතුකෙරෙන් 'උ' ප්‍රත්‍යය ව සිද්ධ කර්තෘකාරක කෘදන්ත යි. නොහොත් 'වළඳ' ධාතුකෙරෙන් 'උ' විබත් යෙදී සිද්ධ අතීත කාලික ප්‍රථම පුරුෂ බහුවචන ක්‍රියා යි. සිංහලයෙහි ස්ත්‍රීලිංගික එකවචනාන්ත පදයක් වුව ද උක්ත වන කල්හි අතීතාඛ්‍යාතඑකවචනය වශයෙන් යෙදෙන්නේ කෘදන්ත පදයකි. නොහොත් බහුවචනාඛ්‍යාතයෙකි.

**කාව්‍යශේඛරයෙහි:-**

"දූරූ දෙළදූක් ලකුණු ද ද දූ"

"ගුරු නියොවින් එළ ඳ
විලඳ ගෙන ලූ දිලෙන ගිනි මැ ද"

5. **තඹුරතින්** – පෘථිවිය කාන්තාවක කොට තකත් ම සිරිපා පිළි ගැනීමට ඉවහල් වූ පියුම් අත් ය යි ගැන්ම උචිත ම ය.

6. **වියෝ** – වියෝ නම් වෙන් වීම යි. පති පත්නීන්ගේ වෙන් ව විසී මෙහි මෙය විශෙෂයෙන් ම යෙදේ.

7. **පදවර** – පද වාර, පිය මාරු කොට තැබීම.

8. **සිඟොස්** – සිංහයාගේ ඝෝෂය අගිත ය. එබඳු අයිත ඝෝෂය 'සි ඟොස්' නම් වේ.

9. **දිගත්** – දිග ම = දිගත්, 'අත්' සද ස්වාර්ථයෙහි යි.

10. **දින්** – 15 පද්‍යයේ 10 වන ටිප්පනිය බලනු. වාක්‍යාවසාන අකාරය මෙහි නො යෙදිණ.

**සංලක්ෂ්‍යය.**

1. **වෘත්තය – මාලිනී යි.**

**20. පිළිවෙළිනි ළඳෙස් රැස් මෙන් * වැඩෙත් සව් කලාවෙන්**
**යස රැසිනලු වි දික් සත්සර පත් සරකල්**
**මුළු දියැ වියතුන් සිත් පාසිලිල් රැස් උදම් වී**
**රුපු කතනෙත සේරැස්පැමිණින් තෝ අමින් වි.**

**අන්වය හා පදාර්ථ :** **සත්සර** – සත්වසාර වූ බෝධිසත්වයන් වහන්සේ, **සරකල් පත්** – ශරත්කාලයට පැමිණි, **ළඳෙස්රැස්** – බාල චන්ද්‍රයා, **සව්කලාවෙන් මෙන්** – සකල (ෂොඩශ) කලාවෙන් මෙන්, **පිළිවෙළිනි** – ක්‍රමයෙන්, **වැඩෙත්** – වර්ධනය වත් ම, නොහොත් (සරකල් පත් ළඳෙස්රැස් මෙන් පිළිවෙළිනි) **සව්කලාවෙන්** – සකල කලාඥතයෙන් උපලක්ෂිත ව, **වැඩෙත්** – වර්ධනය වත් ම, (උන්වහන්සේගේ) **යස රැසින්** – කීර්ති නමැති (චන්ද්‍ර) මරීචියෙන්, **දික්** – දිශාවෝ, **අලු වී** – ආලෝකවත් වූහ. **මුළුදියැ** – සමස්තලෝකයෙහි, **වියතුන් සිත්** – ව්‍යක්තයන්ගේ චිත්ත නමැති, **පාසිලිල් රැස්** – ක්ෂීරසාගරය, **උදම් වී** – උදම වි ය, **රුපුකත නෙත්** – ශත්‍රුවනිතාවන්ගේ නෙත්‍ර නමැති, **සේරැස්පැමිණින්** – චන්ද්‍රකාන්ත මාණික්‍යයෙන්, **තෝ** – ජලය, **අමින් වී** – අධික වශයෙන් (වගනය) වි ය.

**වියරණ :**

i පිළිවෙළිනි ළඳෙස්රැස් මෙන් වැඩෙත් සව් කලාවෙන්
යස රැසිනලු වි දික් සත්සර පත් සර කල්

ශරත් කාලයෙහි ආකාශය මේඝපටලාදීන් තොර ව අතිශයින් නිර්මල ව බබලයි. චන්ද්‍රයා ද එහෙයින් ම රිදී වන් නිමල් රස් දහරින් ලොව පුරා ලමින් බැබළෙයි. බාල චන්ද්‍රයා කලාවෙන් කලාව වැඩෙමින් ක්‍රමයෙන් වර්ධනයට යෙයි. බෝධිසත්වයන් වහන්සේ ද මෙන් වැඩිණැයි කීමෙන් උපද්‍රව රහිත ව අනල්පදීප්තියෙන් ක්‍රමයෙන් වර්ධනය වූ බව හැඟවූහ. 'සව්කලාවෙන්' යි අර්ථ ශ්ලේෂයෙන් යෙදීමෙන් සිව්සැටකලා දැනීමෙන් ද යුක්ත ව වැඩුණු බැව් හඟවති. 'දික් යසරැසිනලු වී' යයි කීමෙන් කීර්තිය ද ලොව පතළ වූ බව ප්‍රකාශ කෙරෙති.

ii මුළුදියැ වියතුන් සිත්පාසිලිල් රැස් උදම් වී,

* වඩුත්

චන්ද්‍රෝදයෙන් ක්ෂීරසාගරය උදම් වෙයි. ජලවෘද්ධියට පැමිණ බැබලෙයි. බාලචන්ද්‍රයා මෙන් වැඩෙන බෝසතුන් දුක පියතුන්ගේ සිත් නමැති කිරි සයුර උදම් වී ය. බෝසතුන් සෙහෙන් වැඩෙනු දුක විඥලොකයාගේ සිත් ප්‍රීතියෙන් උදම් වී ය යි කී අයුරු යි.

iii රූපකත නෙත සේරුස්පැමිණෙන් හෝ අමිත් වී.

චන්ද්‍රකාන්තිය හුණු විට චන්ද්‍රකාන්තපාෂාණයන්ගෙන් ජලය වැගිරෙන්නට පටන් ගනී. බොධිසත්වචන්ද්‍රයාගේ දර්ශනයෙන් ශත්‍රුවනිතාවන්ගේ නෙත්‍රයන්ගෙන් ජලය වැගිරෙන්නට වූ බැවින් ශත්‍රුවනිතාවන්ගේ නෙත්‍ර, චන්ද්‍රකාන්තපාෂාණ ය යි ගන්න. බොධිසත්වයන් වහන්සේ කාරණ කොට ගෙන තම පක්ෂයට මහත් පරිහානියක් වන බව දුටු ශත්‍රුවනිතාවන් තමවල්ලභයන්ගේ විනාශය ඉතින් නියත ය යි සිතා කඳුළු වගුරුවමින් හැඬූ බව කී අයුරු යි.

**ටිප්පණි :**

1. **පිළිවෙළිනි** – 'පටිපාටි' ශබ්දයෙන් 'පිළිවෙළ' යි සිඳුනා යි.

2. **ලසෙරුස්** – බාලචන්ද්‍රයා. අමාවක පසු වූ දින සිට කලාවෙන් කලාව වැඩෙමින් දක්නා ලැබෙන චන්ද්‍රයා බාල චන්ද්‍ර නම්. උදය පර්වත මස්තකයෙහි වූ සූර්යයා 'ලහිරු' ය යි කියනු ලැබේ. එහෙත්, උද වන විට කලා පූර්ණ වූ චන්ද්‍රයාගේ ද අභිනවත්වයක් ඇතත් 'ලසඳ, බාලචන්ද්‍ර' යන නාමයන් ගෙන් හඳුන්වනු නො ලැබේ. **ශාරිකා සන්දේශයෙහි විභීෂණ** දිව්‍යරාජයාගේ දළ යුවළ වර්ණිත අයුරින් ද ඒ දත යුතු.

"සි රි ස ර හිඟුල් පිල සේහසවැලෙවි ග න
සු ර ව ර සලෙළ රතලවනත දළ දුල න
ම න හ ර සඳ වලාපෙළ සොලවර පෙනෙ න
පැ හැ සර ලසඳයුවලෙක් ඇත් නම් එ මෙ න"

3. **වැඩෙත්** – 'වඩ' ධාතු කෙරෙන් 'ත්' ප්‍රත්‍යය හා 'එ' පස හා මාත්‍රාංශවෘද්ධිය ද වීමෙන් සිද්ධ කාලාර්ථ කෘදන්ත යි. **සිදතෙහි** කාලාර්ථයෙහි අසමාප්‍ය ක්‍රියා නාමයෙන් හඳුන්වන ලදී.

4. **සව් කලාවෙන්** – මෙහි 'කලා' සද අර්ථශ්ලේෂයෙන් චන්ද්‍රයාගේ කොටස්, කලාශිල්ප යන දෙඅරුතක් දෙයි.

චන්ද්‍රයාට ඇත්තේ කලා සොළස හෙයින් චන්ද්‍ර පක්ෂයෙහි 'සව්කලා' නම් කලා සොළස යි. කලා ශිල්පවාචි පක්ෂයෙහි 'සව්කලා' නම් අක්ෂරය, ලිඛිතය, ගණිතය, ගන්ධර්වය, තර්කය, ව්‍යාකරණය යනාදි සිව්සැටක් කලා වේ යි.

5. **සත්සරා** – සත්වයන්ට සාර වූයේ හෙවත් උතුම් වූයේ සත්සර. පාලියෙහි මෙඅරුත්හි 'සත්තසාර' යි යෙදේ. 'සත්සර' සද සෙසු සිංහල කවීන් විසිනුදු ප්‍රයුක්ත ය.

**කව්සිළුමිණෙහි :–**

"වි කුසාවත් නම් - නුවරෙක් උපන් සත්සර"

6. **සරාකල්** - ශරත් කාලය. වප් සිල් දෙමස ප්‍රමාණ කොට ඇති සෘතුව. ශරත් කාලය අතිශයින් මනොහර කාලයකි. එ බැවි මේ ආදී වර්‍ණිත යන්හෙත් දත යුතු:

" ශරදි කුමුදසඞ්ගාද් වායවො වාන්ති ශීතා
විගතජලදවෘන්දා දිග්විභාගා මනොඥා:,
විගතකලුෂමම්භ: ශ්‍යානපඞ්කා ධරිත්‍රී
විමලකිරණචන්ද්‍රං ව්‍යොම තාරාවිචිත්‍රම් "

**ශරත්කාලයෙහි** වාතයෝ කුමුද සංසර්ගයෙන් ශීත ව හමත්. පහ වූ මෙඝසමූහ ඇති දිශාභාගයෝ මනොඥ වෙති. ජලය කලුෂ භාවයෙන් තොර වී. පෘථිවී හොමෝ වියලුණ මඩ ඇත්තී ය. නිර්‍මල රශ්මියෙන් යුත් චන්ද්‍රයා ඇති ආකාශය තාරකාවන්ගෙන් විසිතුරු වී.

7. **වියතුන්** - වියත් - ව්‍යක්ත; පණ්ඩිත.

8. **පාසිලිල්රුස්** - කිරිසයුර. ' පෘ ' නම් ක්‍ෂීරය හෝ ජලය යි. 'පය' ශබ්දයෙන් ඝිතන යි. 'පය' ශබ්දය, ක්‍ෂීර ජල යන උභයාර්ථයෙහි වෙයි. සාගරය ' සිලිල් රුස් ' නම්. කිරිවන් දිය ඇති සයුර ක්‍ෂීරසාගර නම්.

9. **උදම්** - උදැම නම් - දමය උල්ලඞ්ඝනය කිරීම (= බැම් කඩා ගැණි ම) යි. දම් ලිහා ගතුවෝ සීමාව ඉක්මවා යති. එමෙන් ජලවෘද්ධියෙන් ඇතිවන සාගරයාගේ සීමාව ඉක්ම වීම වෙයි අභිමත යි. චන්ද්‍රොදයෙන් සාගරයාගේ ජල වෘද්ධිය වන බැව් කිවිහු පවසති.

10. **සේරුස් පෑ මිණින්** - චන්ද්‍රයා ' සේරුස් ' නම්. එබඳු පැහැ ඇති මිණ ' සේරුස් පෑ මිණ ' නම්, චන්ද්‍රකාන්ත පාෂාණ ය යි කී අයුරු යි. " සේරුස් කත් මිණ " යි ගන්නා ලද නම් ව්‍යක්ත ව අර්ථය ලැබේ.

11. **අමින්** - සමූහ, බොහෝ.

**සංලක්‍ෂ්‍යය:**

1. **වෘත්තය - මාලිනී නම්.**

මේ වෘත්තයෙන් නිබද්ධ පද්‍ය මත්තෙහි ලක්‍ෂණානුසාරයෙන් දත යුතු.

**21 විය පැමිණි එබෝසත් සත්සරා දික් සුනිල් වූ**
**බැම ගතගත යෝනන් නෙත්කි සැවු මෙන් කුසුම්හී**
**සමර රුපුබලන් නෙත් දික් දිනූ කේලි කව්වෙන්**
**යදිදන සියොතුන් කැන් නෙත්හි මේ ලෙස්නි දිස්නේ.**

**අන්වය හා පදාර්ථ:** **විය පැමිණි** - තරුණ වයසට පැමිණියා වූ, **සත්සරා** - සත්වයන්ට සාර වූ, **එබෝසත්** - ඒ බොධිසත්ව තෙම, **දික්** - දීර්‍ඝ වූ, **සුනිල් වූ** - අතිශයින් නීලවර්‍ණ වූ, **බැම** - භ්‍රැලතාවන් විසින්, **ගත් අගත** - ගන්නා ලද අග්‍රභාග ඇති, **යෝනන්**

**නෙත්හි** – යුවතීන්ගේ නෙත්‍රයන්ට, **කුසුම්හී** – අනඞ්ගයාගේ, **සැවු මෙන්** – (ලතා) චාපය මෙන් ද, **සමර** – යුද්ධයෙහි දී, **රුපු බලන් නෙත්** – ශත්‍රුභටයන්ගේ නෙත්‍රයන්ට, **දික් දිනූ** – දිග් විජය කළා වූ නොහොත් දිග්විජය කිරීමෙන් පසු නැඟූ, **කේලි** – පතාකා වක්හුගේ, **හව්වෙන්** – ලීලාවෙන් ද, **යදි දන** – යාචක සමූහ නැමැති, **සියොතුන් කැන්** – චාතක (=කෑදැති) සමූහයාගේ, **නෙත්හි** – නෙත්‍රයන්ට, **මේ ලෙස්නි** – මෙඝයක් මෙන් ද, **දිස්නේ** – දර්ශනය වන්නේ, (**වී** – වූයේ ය.)

**විස්තර :**

තාරුණ්‍යයට පැමිණි බොධිසත්ත්වයන් වහන්සේ ඔවුනොවුන්ගේ නෙත්‍රයන්ට නන්විලසින් දෘශ්‍යමාන වූහ. කෙසේයත් ද යත්:-

i බැමගතගත යෝනත් නෙත්හි සැවු මෙන් කුසුම්හි

දීර්ඝ වූ ඉතා නීලවර්ණ වූ භ්‍රූලතාවන් (=බැම) විසින් ගන්නා ලද අග්‍ර භාග ඇති හෙවත් භ්‍රූකෙළවර දක්වා දීර්ඝ වූ යුවතීන්ගේ නෙත්‍රයන්ට අනඞ්ගයාගේ චාපයක් මෙන් දෘශ්‍යමාන වූහ. අනඞ්ගචාපයෙහි දණ්ඩ උක්දඬුවකි. දුනුදිය බිඟුවැලකි. අනඞ්ගයා එ ම දුන්නෙහි පද්මාදි පුෂ්පශර බහා විද ජනයන්ගේ සිත්හි කාමචේතනා ඇති කෙරෙයි. මෙසේ හෙයින් 'යුවතීන්ගේ නෙත්‍රයන්ට අනඞ්ගයාගේ චාපය වැනි වූහ.' යනු බෝසතුන්ගේ තරුණරුව යුවතීන්ගේ සිත්හි කාමොත්පාදක වී ය යි කී අයුරු යි.

ii සමරරුපු බලන් නෙත් දික්දිනූ කේලි හව්වෙන්.

දිග් විජයෙහි නගන ලද ධ්වජය ශත්‍රුපක්ෂයෙහි භටයන්ට භයජනක වෙයි. එ මෙන් දිග්විජයෙහි නැඟූ ධ්වජයක් බඳු තරුණ බොධිසත්ත්වයන් වහන්සේ දැක ශත්‍රුපක්ෂයෙහි භටයෝ බිය වූහ යි කී අයුරු යි.

iii යදිදන සියොතුන් කැන් නෙත්හි මේ ලෙස්හි දිස්නේ.

චාතකයෝ (=කෑදැත්තෝ) ගඞ්ගාආදියෙන් ජලය පානය කළ නො හැක් කෙන් පිපාසාවෙන් පීඩිත ව සිට වසින විටක ම වැසි බිඳු බී සැනසෙත් ලු. එහෙයින් මෙඝය ඔවුන්ට අතිශයින් ප්‍රිය ය. අන්කිසිවකින් තම පිපාසාව සන්සිඳුවා ගත නො හැකි හෙයිනි. යම් සේ මෙඝය පිපාසාව දුරු කොට කෑදැත්තන් සනහා ද එ මෙන් බෝසතුන්වහන්සේ යාචකයන්ගේ ධනාශා නමැති පිපාසාව පහ කොට සනහන හෙයින් ඔවුන්ට ප්‍රිය වූහ යි කී අයුරු යි.

**විසඳුම්:**

1. **විය පැමිණි** – (තරුණ) වියට පැමිණියේ වියපැමිණි නමි.

2. **බෝසත්** – බොධිසත්ත්ව. බුද්ධබොධිය පිණිස සමතිස් පැරුම් පුරමින් සංසාරයෙහි වසන උතුමෝ බොධිසත්ත්ව නම් වෙති.

3. **සුනිල්** – ඉතා නිල් = සුනිල්. 'සු' උපසර්ගය අතිශයාර්ථාදියෙහි ද දක්නා ලැබේ.

4. **යෝනන්** – යෝන + අන්. තරුණ ස්ත්‍රී යෝන නමි.

5. **සැවු** – චාපය – දුන්න.

6. **කුසුම්හී** – අනඞ්ගයා. කුසුම් හී වූයේ යමකුට ද හේ = කුසුම්හී. 6 පද්‍යයේ 9 ටිප්පනිය බලනු.

7. **සමර** – අනඞ්ගයා, යුද්ධය, සමරණය ආදි අර්ථයන්හි 'සමර' සද යෙදේ. මෙහි යුද්ධයෙහි යි.

8. **දික්දිනූ** – දික් දිනූයේ යමකින් ද ඒ = දික්දිනූ. කරණ විබත් සමස්.

9. **සියොතුන්** – 'සියොත්' සද පක්ෂි කැදැති යන අර්ථයන්හි වේ. මෙහි දෙවන අර්ථය ගත යුතු.

10. **නෙත්හි** – සපදන් අරුත්හි අදර විබති.

11. **දිස්නේ** – 'දිස්' ධාතු කෙරෙන් 'න' ප්‍රත්‍යය ව කර්තෘ කාරකයෙහි සිද්ධ කෘදන්තය 'ඒ' විබත් ගත් සේ යි.

**සංලක්ෂ්‍යය :**

1. **ක්‍රියාකාරක පද සම්බන්ධය** :– එබෝසත් දිස්නේ වී. ක්‍රියාව අධ්‍යාහාර වශයෙහි.

**22 යසොවුරු ලිය වන් වූ ඒ කලුන් සිත් සතොස්වා**
**එවිරු එකුනුතිස් වස් දෙව් නලන් වන් නලන් හා**
**සමග විඳ සිරිනන් පුත් රුවන් ඒ කලුන් හා**
**දූහැ තුරග අරා සත් සෙත්හි සිත් ලා ම යා ගත්.**

**අන්වය හා පදාර්ථ:** **එවිරු** – ඒ වීර පුරුෂ තෙම, **ලිය වන් වූ** – (කොමලත්වාදීන්) ලතාවක් බඳු වූ, **යසොවුරු** – යශොධරා නම් වූ, **ඒ කලුන් සිත්** – ඒකාන්තාවගේ චිත්තය, **සතොස්වා** – සන්තොෂ කොට, **එකුනුතිස්වස්** – එකුන් තිස් හවුරුද්දක් මුළුල්ලෙහි, **දෙව්නලන් වන්** – දිව්‍ය නාටිකාවන් වැනි වූ, **නලන් හා** – නාටිකාවන් හා, **සමඟ** – එක් ව, **නන්සිරි** – නොයෙක් ඓශ්වර්‍ය්‍යී, **විඳ** –

විනෑතය කොට, **පුත්රුවන්** – පුත්‍රරත්නය ද, **ඒ කලුන් හා** – ඒ කාන්තාව ද, **දැහැ** – හැර, **සත්සෙත්හි ම** – ලොකාර්ථයෙහි ම, **සිත් ලා** – සිත් බහා, **යා ගත්** – ගෘහාභිනිෂ්ක්‍රමණය කොළේ ය.

**විසතර:** සුඛබොධ යි.

**විපසනී:**

1. **යසොවුරු** – සුප්‍රබුද්ධ නම් කොළිය රජහුගේ දූහිතෘ වූ **සිද්ධාර්ථ** කුමාරයාණන්ගේ අගමෙහෙසිය. 'යසොධරා' ශබ්දයෙන් භින්න යි. 'ද' කාරයට 'ව' කාරාදෙශ යි. 'සොහොවුරු' ආදියෙහි මෙනි.

2. **සතොස්වා** – 'ස' උපසර්ග පූර්වකොට ඇති 'තුස්' ධාතුකෙරෙන් 'ආ' ප්‍රත්‍යය හා ධාතු ප්‍රත්‍ය මධ්‍යයෙහි 'ව' ප්‍රත්‍යය ද යෙදී සිද්ධ ප්‍රයොජ්‍ය පූර්වක්‍රියා යි.

3. **පුත්රුවන්** – '**රාහුල**' නම් පුත්‍රරත්නය.

4. **හා** – ද නිපාතාර්ථයෙහි යි.

5. **දැහැ** – 'දහ' ධාතුකෙරෙන් 'ඇ' ප්‍රත්‍යය හා මාත්‍රාංශවෘද්ධිය ද වී සිද්ධ පූර්ව ක්‍රියා යි.

6. **තුරඟ** – අශ්වයා. 'තුරඞ්ග' ශබ්දයෙන් භින්න යි. මෙහි සිද්ධාර්ථ කුමරයන් වහන්සේගේ '**කන්ථක**' නම් මඞ්ගල අශ්වරාජයා සාමාන්‍ය 'තුරඟ' ශබ්දයෙන් කියනු ලැබේ.

7. **යා ගත්** – ගමන් ගත්තේ ය. මෙයි **මහාභිනිෂ්ක්‍රමණය** හැඟවීම පිණිස යොදන ලදී. මහාභිනිෂ්ක්‍රමණය නම් සියලු උපභොග පරිභොග වස්තු හැර පියා ගිහිගෙන් නික්මීම යි.

**සංලක්ෂ්‍යය:**

1. **සතොස්වා** – යනු අකර්මක 'තුස්' දයින් සිද්ධ යි. එහෙත් ප්‍රයොජ්‍ය 'ව' පත්‍යය යෙදුණු හෙයින් සකර්මක වේ. එහෙයින් 'සිත්' යනු කර්මත්වයෙන් අභිමත යි.

**23 බෝසත් නිනෙරපත් වැවුජ්හි නැහිදුම් වත් කොස්**
**ගුවන්හි දමා**
**සිව්වන් දුන් එ කසාවතින් ගෙන තවුස් වෙස් ගම්**
**නියම් ගම්හි දූ**
**බික් ගැන්මෙන් දන සෙත් කෙරේමින දදු සෙත් දුන්**
**තණ්ස්මින් නිපන්**
**අස්නේ බෝතුර මුල්හි උන්නෙ සුරරුක් මුල්හි සහස්**
**නෙත්හු මෙන්.**

අන්වය හා පදර්ථ: **නීතෙර පත්** - අනෝමානදීතීර ප්‍රාප්ත වූ, **බෝසත්** - බෝධිසත්ව තෙම, **වැටුප්හි** - ප්‍රදීපයකින්, **නැඟි** - උද්ගත වූ, **දුම් වත්** - ධූමරාජියක් බඳු වූ, **කෙස්** - (ඛඩ්ගයෙන් කැපූ) කේශධාතුව, **ගුවන්හි** - ආකාශයෙහි, **දමා** - හැර, **සිව් වත්** - (ඝටීකාර) බ්‍රහ්මයා විසින්, **දුන්** - දෙන ලද, **එ කසා වතින්** - ඒ කාෂාය වස්ත්‍රයෙන්, **තවුස්වෙස්** - තාපසවේශය, **ගෙන** - ග්‍රහණය කොට, **ගම් නියම්ගම්හි දු** - ග්‍රාමනිගමග්‍රාමයන්හි ද, **බික් ගැන්මෙන්** - භික්ෂා ග්‍රහණයෙන්, **දනසෙත් කෙරෙමින්** - ලොකාභිවෘද්ධි කෙරෙමින්, **සෙත් දද දුන්** - සොත්ථිය නම් බ්‍රාහ්මණයා විසින් දෙන ලද, **තණ ඉස්මින්** - කුශතෘණ විසුරුවා, **නිපන්** - (එයින්) නිෂ්පන්න වූ, **අස්නේ** - ආසනයෙහි, **බෝතුර මුල්හි** - බෝධි ද්‍රැම මූලයෙහි, **සුර රුක් මුල්හි** - දිව්‍ය වෘක්ෂ මූලයෙහි, **සහස්නෙත්හු මෙන්** - ශක්‍ර දිව්‍යරාජයා පරිද්දෙන්, **උන්නෙ** - හුන්නේ යි.

**විස්තර:**

i බෝසත් නීතෙර පත්.

මහාභිනිෂ්ක්‍රමණය කළ බෝධිසත්වයන්වහන්සේ **අනෝමා** නම් නදියෙහි පරතීරයට සම්ප්‍රාප්ත වූහ. එබැව් හගවනු වස් සැකෙවින් මෙසේ කීහ.

ii වැටුප්හි නැඟි දුම්වත් කෙස්.

ප්‍රදීපයක් සම්බන්ධ ව පවත්නා උද්ගත වූ ධූමරාජියක් බඳු වූ කේශකලාපය. බෝධිසත්වයන් වහන්සේගේ ප්‍රභායුක්ත ශරීරය පහන් සිළක් වැනි ය. එහෙයින් මස්තකයෙහි වූ කේශකලාපය ඉන් නැඟි දුම් රේදක් වැනි ම වෙයි.

iii සිව්වත් දුන් එකසාවතින් ගෙන තවුස් වෙස්.

කේශච්ඡේදනය කළ බෝධිසත්වයන් වහන්සේ 'මේ මහාර්ඝ වස්ත්‍ර තපසට අයෝග්‍යය' යි තමන් ඇඳ සිටි වස්ත්‍ර ගැන සැලකූහ. එවිට ම **ඝටීකාර** නම් බ්‍රහ්මයා අටපිරිකර ගෙනවුත් පිළිගැන්වි ය. බෝධිසත්වයන් වහන්සේ එහි වූ කාෂාය වස්ත්‍ර හැඳ පොරොවා පැවිදි වෙස් ගත්හ

iv දද සෙත් දුන් තණිස්මින් නිපන් - අස්නේ.

පැවිදි වෙස් ගත් සිද්ධාර්ථ ගෞතමයන්වහන්සේ ආචාර්යවරුන් වෙත නිවන් සොයමින් ද දුෂ්කර ක්‍රියාවන් ද සාවුරුද්දක් ගෙවා මහබෝමැඩ වෙත වඩනා සඳ මඟ දී හමු වූ '**සොත්ථිය**' නම් බ්‍රාහ්මණයකු විසින් **කුශතෘණ** අටමිටක් පිළිගන්වන ලදී. තවුසන් ආසනය පිණිස කුශතෘණ පරිහරණය කරන හෙයිනි. ගෞතමයන් වහන්සේ කුශතෘණ **ගයාවෙහි** බෝධිවෘක්ෂ මූලයෙහි අතුරා ඒ මත වීර්‍යාධිෂ්ඨානයෙන් වැඩ උන්හ.

**ටිප්පණි :**

1. **නී** – නදී වාචක ශබ්දයෙකි.

2. **වැටුප්හි** – වැටුප්+හි. ප්‍රදීපවාචී ශබ්දයෙකි. 'වැටුප්හි' යනු අවයි අර්ථයෙහි ආධාර විභක්ති යි.

3. **වන්** – තුල්‍යාර්ථ වාචක ශබ්දයෙකි.

4. **ගුවන්හි** – ගුවන් යි 'ගගන' ශබ්දයෙන් පැමිණියේ යි. මේ විෂයාධාර යි.

5. **සිව්වක්** – බ්‍රහ්මයා. මුඛසතරක් ඇති හෙයින් මහාබ්‍රහ්මයා 'චතුර්මුඛ' නමැයි වෙද මත යි. බුද්ධධර්මය හා ඒ මතය නො සැසඳෙතත් ලොකව්‍යවහාර වශයෙන් බ්‍රහ්මවාචක කොට මාගධ භාෂාවෙහි 'චතුරානන' ආදි ශබ්ද යොදනු ලැබේ, සිංහලයෙහි ද එසේ මැ යි.

6. **ගම්** – කුඩාගම.

7. **නියම්ගම්** – නිගමග්‍රාම, වෙළෙඳුන් වසන තීර්ථාදියෙන් යුත් මහගම.

8. **දු** – 'ද' නිපාතයාගේ කවීන් විසින් ප්‍රයුක්ත එක් අවස්ථාවකි. මෙයින් නො කියන ලද්දවුන්ගේ සංග්‍රහය වේ. එහෙයින් නගර රාජධානි ජන පදාදිය ද ගන්නේ යි.

9. **කොරේමින** – 'කර' ධාතුකෙරෙන් 'මින්' ප්‍රත්‍යය යෙදී සිද්ධ (වර්තමාන) මිශ්‍රක්‍රියා කෘදන්තය 'කරමින්' යනු යි. විකල්පයෙන් පිළිපෙරළි යෙන් කොරෙමින් යි ද යෙදේ. මෙහි 'කොරේමින' යනු වෘත්තය පිණිස 'ර' කාරගත 'එ' කාරයට දීර්ඝකිරීමෙන් හා අන්තයෙහි 'අ' කාරයක් යෙදීමෙන් ද සිද්ධ යි.

10. **දදා** – දද+ආ. ද්විජ, (බ්‍රාහ්මණ) පක්ෂි යන අර්ථ වාචී ශබ්දයෙකි. 'ධජ' ශබ්දයෙන් බිඳුන් කොඩි වාචී දද සදක් ද 'දද්ධ' ශබ්දයෙන් බිඳුන් තැණ හීනයන්ට නම් වූ 'දද' සදක් ද දක්නා ලැබේ. මෙසේ නොයෙක් ශබ්ද යන්ගෙන් බිඳුනා වූ සමාන ස්වරූප ඇති ශබ්ද සිංහලයෙහි බෙහෙවින් දක්නා ලැබේ.

11. **සෙත්** – සොත්ථිය. මෙයින් 'සොත්' යි සිංහල කටයුතු වුවත් 'සෙත්' යි ගැන්ම ද නිදෙසි. **අමාවතුරෙහි** :– "පුන්පැරුම් **සෙත්** බමුණා දුන් අටමිටක් කුසතණ ගෙන".

12. **නිපන්** – නිෂ්පන්න. කුශතෘණ අතුල ඉක්බිති තුදුස් (= 14) රියන් අස්නක් වූ බව හැඟවීම පිණිස ප්‍රයුක්ත යි.

13. **බෝතුර** – අශ්වත්ථ වෘක්ෂරාජයා මින් අභිමත යි. 'බොධි' නම් බුද්ධත්වය යි. ඒ බොධිය ලැබීමට ඉවහල් වූ වෘක්ෂය ද එනාමින් ම අභෙදොප චාරයෙන් ව්‍යවහාර කරනු ලැබේ.

14. **සහස් නෙත්හු** – දහසක් නෙත් යමක්හුගේ ද හේ = සහස්නෙත්. දහසක් අර්ථ එකවිට සැලකිය හැකි ප්‍රඥාවක් ඇති හෙයින් 'ශක්‍රයා' මෙනම් විය යි ධර්මයෙහි දක්වනු ලදී. එහෙත් පුරාණ ග්‍රන්ථයන්හි ගෞතම ඍෂිවරයා ගේ ශාපයකින් ඇති වූ නෙත් දහස නිසා ම එනම් විය යි දක්නා ලැබේ.

**සංලක්ෂ්‍යය :**

1. **වෘත්තය** – **ශාර්දූල වික්‍රීඩිත** නම්. 12 පද්‍යයේ සංලක්ෂ්‍යය බලනු. මත්තෙහි මෙ ම වෘත්තයෙන් නිබද්ධ පද්‍ය ලක්ෂණානුසාරයෙන් දත යුතු.

**24 බෝ මුල්හි සමතිස් පෙරුම් හැම පුරා ලද්දෙන්**
**මෙ මා බන් පලක්**
**නූනම් මම් සවුනේ ගෙවා දැන ම මුත් හුන් කල්**
**එදා ඒ මහත්**
**දූන් දූන් ඒ සිදුහත් නිකුත්* වෙති පසින් ඉන්**
**යා නො දී ගොස් වහා**
**ඌ ගන්ව යි මරදෙව් කියමිනි දවගත් මේයම්නමින්**
**යෝබලන්.**

**අන්වය හා පදාර්ථ :** **හැම සමතිස් පෙරුම්** – සකල සමත්‍රිංශත් පාරමී ධර්මයන්, **පුරා** – පූරණය කොට, **ලද්දෙන්** – ලබන ලද හෙයින්, **බෝ මුල්හි** – බොධි වෘක්ෂ මූලයෙහි, **මෙ මා බන් පලක්** – මා විසින් බඳනා ලද පර්‍යඞ්කය, **සවුනේ** – සකලදෙශමණ්ඩලය, **ගෙවා** – කෙළවර කොට, **දැන ම මුත්** – ජානනය කොට ම මිස, **මම්** – මම, **නො + ඌනම්** – නොහරින්නෙමි, (යි) **එදා** – එදවස, **ඒ මහත්** – ඒ මහොත්තමයා, **හුන් කල්** – වැඩහුන් කල්හි, **ඒ සිදුහත්** – ඒ සිද්ධාර්ථකුමාරයන්, **දූන් දූන්** – මේ අවස්ථාවෙහි ම, **පසින්** – අපගේ (මාර) පාශයන්ගෙන්, **නිකුත් වෙති** – නිෂ්ක්‍රාන්ත වෙති, **ඉන්** – එසේ හෙයින්, **වහා ගොස්** – ශීඝ්‍ර ව ගමනය කොට, **යා නො දී** – (පාශ ඉක්මවා) යන්නට අවසර නො දී, **ඌ** – ඒ සිද්ධාර්ථ ගෞතමයන්වහන්සේ, **ගන්ව යි** – ග්‍රහණය කරවු ය යි, **කියමිනි** – කථනය කෙරෙමින්, **අමින් යෝබලන්** – අපරිමිත වූ යෝධ භට යන්, **මේයම්නි** – යුද්ධාභිමුඛ කෙරෙමින්, **මරදෙව්** – මාරදෙව් තෙම, **දවගත්** – (බෝමැඩ වෙත) ධාවනය කෙළේ ය.

---

* යව.

**විස්තර :**

i **දූත් දූත් ඒ සිදුහත් නිකුත් වෙති පසින්.**

යම් යම් දේ බැඳීමට අවශ්‍ය රැහැන් පාශ නම් වෙයි. රැහැන් මෙන් සත්වයන් සංසාරයෙහි බැඳ තබන කාම ගුණ නොහොත් සියලු කෙලෙස් ද පාශ වැනි හෙයින් පාශ ය යි කියනු ලැබේ. එහෙයින් කියන ලදී.

“ මුත්තොහං **සබ්බපාසෙහි** යෙ දිබ්බා යෙ ච මානුසා ” යි.

බුද්ධත්වයට පැමිණෙන විට අර්හත්මාර්ගඥානයේ දී ම සියලු කෙලශපාශ නැසෙන හෙයින් බුදු වීම කෙලශපාශයෙන් නිකුත් වීමකි.

**ටිප්පනී:**

1. **සමතිස් පෙරුම්** – බුද්ධත්ව ලැබීම පිණිස පූරණය කට යුතු පාරමී ධර්ම සමතිස.

එනම්:- දාන, ශීල, නෛෂ්ක්‍රම්‍ය, ප්‍රඥා, වීර්‍ය, ක්‍ෂාන්ති, සත්‍ය, අධිෂ්ඨාන, මෛත්‍රී, උපෙක්‍ෂා යන මොහු දශපාරමිතා නම් වෙති. ඒ දශය ම **දානපාරමිතා, දානඋපපාරමිතා, දානපරමාර්ථපාරමිතා** යන තන්හි මෙන් ක්‍රමයෙන් හෙදත්‍රයෙන් එකක් පාසා ගුණිත වූ විට සමතිසක් වේ. ඒ සමතිස්පැරුම් නමි.

2. **බත්** – ‘බඳ’ ධාතු කෙරෙන් ‘ත්’ ප්‍රත්‍යය කොට ද කාර ලොපයෙන් සිද්ධ කර්මකාරක අතීත කෘදන්ත යි.

3. **පලක්** – පර්‍ය්‍යඞ්කය. ආසනය. ‘පල්ලඞ්ක’ ශබ්දයෙන් නිපන්න යි. ඌරුබද්ධාසනය ද පල්ලඞ්ක නමි.

4. **නූනම්** – නො+උනමි. ‘උන = මිදිමෙහි’ ධාතු කෙරෙන් උත්තම පුරුෂ එකවචන ‘මි’ පස යෙදී සිද්ධ වර්තමාන ක්‍රියා යි. නො+උනමි යන තන්හි පූර්වස්වර ලොපයෙන් හා පරස්වරයට දීර්ඝ කොට පැමිණවීමෙන් ද ‘නූනමි’ යි සිද්ධ යි.

5. **සව්නේ** – ඥෙය වූ (=දතයුතු) සංස්කාර, විකාර, නිර්වාණ, ලක්‍ෂණ, ප්‍රඥප්ති යන පංචවිධ ධර්ම සකලඥෙයමණ්ඩල නමි. සියලු දත යුතු දේ එහි සංග්‍රහ වන හෙයිනි.

6. **නිකුත් වෙති** – මේ ප්‍රයොගය පිළිබඳ දතයුතු දේ 6 වන පද්‍යයේ 11 වන ටිප්පනියෙන් දත යුතු.

7. **ගන්වයි** – ‘ගත්’ ධාතු කෙරෙන් ‘ව’ ප්‍රත්‍යය යෙදී සිද්ධ විධි ක්‍රියා යි. වර්තමාන ව්‍යවහාරයෙහි එකවචන වශයෙන් සලකනු ලබන මේ විධි ක්‍රියා පදය ග්‍රන්ථකවීන් විසින් බහුවචන වශයෙන් ද ප්‍රයුක්ත යි.

**ගුත්තිල කාව්‍යයෙහි :-**

"කියව නො සතුටු වත්ව කාර          ණ"

"ඈම් කො ද ඒ හිමි කියව ම          ට"

"නොවසව තෙපි මවෙ          ත"

**25 බෝමුල්හි වරසුන් අරා බුදු වෙමි සි උන්නේ ද පස්කම් වරා**
**ඌ ගන්ව සි කියමින් එමින් ම පෙනෙමින් පාමින් අමින් වෙස් දහස්**
**එල්වා හිස් සැවරූ සියන් උර පළා පැලාපොළා ආ * බෙලේ**
**දක්මින් ඒ විරූ නන් දිගත්හි දවගත් ගිම්රැස් තමස් රැස් ලෙසින්.**

**අන්වය හා පදාර්ථ :** **බෝමුල්හි** – බොධිද්‍රුම මූලයෙහි, **වරසුන් අරා** – වජ්‍රාසනාරූඪ ව, **පස්කම් වරා** – පඤ්චකාමයන් වර්ජිත කොට, **බුදුවෙමි සි** – බුද්ධත්වයට පැමිණෙමි යි, **හුන්නේ ද** – වැඩ සිටියේ නමුත්, **ඌ ගන්ව සි කියමින්** – උන්වහන්සේ අල්වා ගනිවු ය යි කථනය කෙරෙමින්, **එමින් ම** – ආගමනය කොට ම, **පෙනෙමින්** – දෘශ්‍යමාන වෙමින් ද, **අමින් වෙස් දහස්** – අපරිමිත වූ වෙශ සහස්‍රයන්, **පාමින්** – දක්වමින් ද, **හිස් සැවරූ සියන්** – හිස් හා මෘතරූප ශතයන්, **එල්වා** – අවලම්බනය කොට ගෙන ද, **උර පළා** – වක්ෂඃප්‍රදෙශය විදාරණය කොට, **පැලා** – දක්වමින් ද, **අපොළා** – ආස්ඵොටනය කොට (=අත්පිඩිගසා), **ආ බෙලේ** – ආවා වූ (මර) සෙනඟ, **ඒ විරූ** – ඒ වීරයන් වහන්සේ, **දක්මින්** – දර්ශනය කොට, **ගිම්රැස්** – සූර්යයා (දැක), **තමස් රැස් ලෙසින්** – අන්ධකාර රාශියක් (පලායන්නාක්) මෙන්, **නන් දිගත්හි** – නානා දිශාන්තයට, **දවගත්** – ධාවනය කළහ.

**විස්තර:** සුබොධ යි.

**ටිප්පනී :**

1. **බුදු** – දුඃඛ, සමුදය, නිරොධ, මාර්ග යන චතුරාර්‍ය සත්‍යයන් පරොප දෙශයෙන් තොර ව අවබොධ කර ගත් දුර්ලභ උත්තමයන් වහන්සේ 'බුදු' (=බුද්ධ) නම් වෙත්. සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේ ඒ බුද්ධත්වය නො ලැබ නො නැගිටිමි යි අදිටන් කොට වජ්‍රාසනයෙහි වැඩහුන් හෙයින් "බුදු වෙමි සි උන්නේ ද" යි කියන ලදී.

---

* බලේ.

2. **පස්කම්** – රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන පස. කැමැත්ත (=ලෝභය) ඇති කරන හෙයින් මොවුහු කාම නම් වෙති.

3. **ගන්ව** – 24 වන පද්‍යයේ 7 වන ටිප්පනිය බලනු.

4. **වෙස් දහස්** – මෙහි ‘දහස්’ සද රාශිභේද වාචක යි.

5. **සැවරූ** – මෘතශරීර ‘සැව’ නම්. ‘ශව’ ශබ්දයෙන් සිද්ධ යි.

6. **පළා** – ‘පළ - පැළීමෙහි’ ධාතුවෙන් ‘ආ’ ප්‍රත්‍යය ව සිද්ධ පූර්ව ක්‍රියා යි.

7. **අපොළා** – ‘අපොළ’ ධාතුවෙන් සිද්ධ පූර්වක්‍රියා යි.

8. **බෙලේ** – බල+ඒ. සේනා වාචක ‘බල’ ශබ්දය දන්ත්‍ය ‘ල’ කාර යුක්ත වේ. හට වාචී කල මූර්ධන්‍ය ‘ළ’ කාර යුක්ත වේ. මෙහි දන්ත්‍ය ‘ල’ කාර යුක්ත බල ශබ්දය උචිත යි.

9. **දක්මින්** – පූර්වක්‍රියාර්ථයෙහි මිශ්‍රක්‍රියා යි. මෙ බඳු යෙදුම් කවිප්‍රයෝගයන්හි සුලභ ය.

**ගුත්තිලකාව්‍යයෙහි :–**

“සු ව දි ත් බිම පිරිබඩ ගෙන මොනව ට
**ස ද මි න්** සිහසුන මුතු සේසත් ය ට
**න බ මි න්** දෙපසෙහි දිළි රත් මිණිව ට
**ඉ සි මි න්** අසෙනිය මල් විසිතුරු සො ට”

10. **දිගත්හි** – කර්මාර්ථයෙහි ආධාර විභක්ති යි.

**26 දැල්වූ වත් අවටින් නිකුත් නල කඳින් පෑ නන් දිගත්**
**පත් යුගත්**
**ලේ § දුරා දෙකොපුල් පුරා විද සර නන් දික් පුරා**
**වෙස් දරා**
**ගොස් දෙස් බස් නො සරස් කියා එ විගසා රොස්මින්**
*** පරොස් බස් කියා**
**වන් වන් සෙන් කළ මන් මතැත්හු නලරන් හව්වෙන් ම**
**බුන්නෝ එසත්.**

**අන්වය හා පදාර්ථ :** **දැල්වූ** – විවෘත කරන ලද, **වත් අවටින්** – † මුඛය හාත්පසින්, **නිකුත් නලකඳින්** – නිෂ්ක්‍රාන්තවූ වහ්නිස්කන්ධයෙන්, **යුගත් පත්** – යුගාන්තකාලයට පැමිණි, **නන් දිගත් පෑ** – නොයෙක් දිගන්ත දක්වා, **ලේ දුරා** – රුධිර ධාරාවෙන්, **දෙකො**

§ උදුරා. * සරොස්. † මුඛාවාටයෙන්.

**පුල් පුරා** - උභය කපොලය පූරණය කොට, **නන් දික් පුරා** - නොයෙක් දිශා පූරණය කොට, **සරා විද** - ශර විද, **වෙස් දරා** - හිම විවිධ වෙශ ධාරණය කොට, **නොසරස් ගොස්** - වහා ගොසින්, **දෙස් බස් කියා** - සාක්ෂ්‍ය බස් කථනය කොට, **එවිගසා** - එකෙණෙහි, **රොස්මින්** - රොෂ වෙමින්, **පරොස් බස් කියා** - පරුෂ වචන කථනය කොට, **වන් වන් සෙන්** - ආ ආ (මාර) සේනාව, **කල මන්** - කළා වූ අභිමානය, **මනැත්හු** - මන්නහස්ති යකු, **නලරන් හව්වෙන් ම** - බටවනයක් (බිඳින්නාක්) මෙන් ම, **එසත්** - ඒ මහාසත්ව තෙම, **බුන්නෝ** - භග්න කෙළේ යි.

**විස්තර :**

i දූල්වූ වත් අවටින් නිකුත් නලකදින් පෑ නන් දිගත් පත් යුගත්.

මහායුගයක අන්තයෙහි අග්නි, ජල, වායු යන මෙයින් එකකින් ලොක විනාශය වෙයි. අග්නියෙන් ලොව නස්නා කල සූර්යයන් සත්දෙනකුන්ගේ පහළ වීමෙන් සියලු දිගන්ත මහා අග්නිජාලාවනේ එකපැහිර වැලඳ ගනු ලබයි. මාරසේවකයෝ මුඛ නාස්පසින් නිකුත් වූ ගිනිකදින් ප්‍රගාන්ත ගින්නෙන් ඇවිළ ගත් දිශාන්ත දක්වමින් හෙවත් අතිරෞද්‍ර අග්නිජ්වාලා එකපැහිර පතුරුවමින් පැමිණියහ.

ii ගොස් දෙස් බස් නොසරස් කියා.

**මාරයා** නවවිධ වර්ෂණාදීන් ද **සිද්ධාර්ථගෞතම**යන් වහන්සේට කිසි හානියක් නු වූ විට චක්‍රායුධයෙන් ද පැහැර ඉනුදු කිසි අර්ථයක් නො වූයෙන් " සිද්ධාර්ථකුමාරය, තෙල පලග තොප අයත් නො වේ. මං අයත් ය. එහෙයින් ඉන් නැඟී යව " යි කීය. " ඊට දෙස් කවුරුදු " යි ඇසූ කල **මරදෙව්** තම පිරිස දෙසට අත දිගු කොට ' මොවුහු හැමදෙන මට දෙස්හ ' යි කී විට මාර සේවකයෝ " මම් දෙස්මි, මම් දෙස්මි " යි පොළොව පැළී යන පමණ මහ හඬ පැවැත්වූහ.

iii මනැත්හු නලරන් හව්වෙන් ම.

මන්නහස්ති තෙම නිරායාසයෙන් බටවනයක් සිඳ බිඳ ලීමෙහි සමත් වෙයි. එ මෙන් මහාසත්වයන් වහන්සේ මාරසේනාවන්ගේ මානය නිරුත්සාහයෙන් සිඳ බිඳ ලූහ යි හඟවනු පිණිස මෙසේ කීහ.

**විපසනි :**

1. **දූල්වූ** - ' දල් ' ධාතු කෙරෙන් ' උණ ' ප්‍රත්‍යය හා ප්‍රයොජ්‍ය ' ව ' ප්‍රත්‍යය යෙදී සිද්ධ කර්මකාරක අතීත කෘදන්ත යි.

2. **අවටින්** - ' ආවාටයෙන් ' ය යි සමහරුන් අරුත් දක්වතත් සිංහල යෙහි ඒ අර්ථයෙහි ' අවට ' සදක් නො දක්නා ලැබේ. එ අරුත්හි ' වළ ' යී දක්නා ලැබේ. ' ආවාට ' ශබ්දයෙන් ' අවළ ' යි බිඳී ' අනත් ' යනු ' නත් ' වූ සේ

අකාර ලෝපයෙන් ඒ සිද්ධ යි. කූපවාපි 'අවට' සදක් සංඝාතයෙහි ඇතත් ශාන්පසින් ය යි අරුත් ගැන්ම මෙහි උචිත යි. **සමන්තකූට වර්ණනා** වෙහි ද මෙබන්දක් වැනූහ. ("වනාන්ත භූමකාබන්ධානි - භූධ්‍රකාවර කොටිහි" මුවකුහර සොලවරින් ධූමස්කන්ධයෝ උද්ගත වෙත්) යි.

3. **නල** – වහනිය. 'අනල' ශබ්දයෙන් පැමිණි අයුරු යි. අකාර යාගේ අභාවය ශාස්ත්‍රක්‍රමයෙන් සලකන්නේ ය.

4. **යුගත්** – යුගයෙහි අත් = යුගත්. යුග නම් කාලමාන විශේෂයෙකි. ඔහු **කෘත, ත්‍රේතා, ද්වාපර, කලි** යයි සතරෙකි.

5. **දෙස්බස්** – සාක්ෂ්‍ය වචන.

6. **රෙස්මින්** – 'රෙස්' සද නාමධාතුවක් වශයෙන් ගෙන ඉන් පර ව 'මින්' ප්‍රත්‍යය යෙදීමෙන් සිද්ධ යි.

7. **පරොස් බස්** – පරුෂවචන. කිසිවකුට කිපුණු සිතින් කියනු ලබන රළු වචන.

**කාව්‍යශේඛරයෙහි :–**

"සතොසි බිණුමස නා - සමගින් කිපුණු සිති නා
බිණීම ද තදි නා - මෙසේ තුනහින් පරුස වද නා"

8. **නළ රත්** – නළ + අරත්.

9. **බුන්නේ** – බුනු + ඒ. 'බිද' ධාතුවෙන් කර්තෘ කාරකයෙහි සිද්ධ බුනු' යන කෘදන්තය විබත් ගෙන සිටි අයුරු යි.

**27 පානා නන් විකරන් ගෙනෙමිනි කිකරුන් රෙන් වන්**
**අවග්හි දිලි**
**දල්වා ඇස් වනකස් නරස් සිහවගුන් ඈ රූ දහස්**
**දක්වමින්**
**හව්ලෝකුස් පුරමින් මහත් සැඩ හඬින් වස්වමිනි**
**මස් මේ දහස්**
**රෙස්මින් ආ රුපුසෙන් වැවූප්හි පලගුන් මෙන්**
**වන්හ බෝසත් නොදෙසි.**

**අන්වය හා පදාර්ථ : නන් විකරන්** – අනේක විකාර (වේශ යන්), **පානා** – දක්වන්නා වූ, **කිකරුන්** – කිංකර (=සේවක) යන්, **ගෙනෙමිනි** – ගෙනවුත්, **අවග්හි** – අපායාග්නියෙහි, **දිලි** – ජ්වලිත වූ, **රෙන්වන්** – රේණු (=පුපුරු) බඳු වූ, **ඇස්** – නෙත්‍රයන්, **දල්වා** – විවෘත කර, **වනකස්** – රිලා ය, **නරස්** – වලස් ය, **සිහ** – සිංහ ය, **වගුන් ඈ** – ව්‍යාඝ්‍රය යනාදි සත්වයන්ගේ, **රූ දහස්** – රූපසහස්‍ර

යන්, **දක්වමින්** - දර්ශනය කරවමින්, **හව්ලෝකුස්** - සකල ලෝක කුක්ෂිය, **පූරමින්** - පූරණය කෙරෙමින්, **මහත් සැඬ හඬින්** - මහත් වූ චණ්ඩනාදයෙන්, **මස් මේ දහස්** - පාෂාණ මේඝ සහස්‍ර යන්, **වස්වමිනි** - වර්ෂණය කෙරෙමින්, **රොස්මින්** - රෝෂ ව, **ආ** - පැමිණියා වූ, **රුපුසෙන්** - ශත්‍රු සේනාවෝ, **වැටුප්හි** - ප්‍රදීප යෙක්හි, **පලඟුන් මෙන්** - පතඞ්ගයන් මෙන්, **බෝසත් තෙදෙයි** - බෝධිසත්ත්වයන් වහන්සේගේ තේජසෙහි, **වන්හ** - ප්‍රවිෂ්ට වූහ.

**විස්තර :-**

i පානා නත් විසරත් ගෙනෙමිනි කිකරුන්.

මාරසේනාවෙහි හිස්සුත් රූ ආදි විවිධ විකාර වෙශ දක්වන්නා වූ බොහෝ කිඞ්කර (=සේවක)යෝ වූහ. එහෙයින් මෙසේ කීයේය.

ii අවග්හි දිලි රොන් වන් ඇස් දල්වා.

අපායාග්නිය අතිශයින් රෞද්‍ර ය. යොදුන් දහසක් දුර සිට බලන්නාහු ගේ ද ඇස් පුපුරුවා ලිය හෙන තරම් ය. එ ම ගින්නෙහි දිලියෙන ගිනිපුපුරු වල තත්ත්වය ද එ සෙයින් ම දන්නේ ය. එබඳු භයානක දීප්තිමත් ඇස් දල්වා ගෙන (= ඇර ගෙන) ආහ.

iii වැටුප්හි පලඟුන් මෙන් වන්හ බෝසත් තෙදෙයි.

ප්‍රදීප ශිඛාවෙහි හුණු පලඟැටියෝ බල බිඳී කිසිවක් කොට ගත නොහෙති. එ සෙයින් මාරසේවකයෝ ද මහාසත්ත්වයන් වහන්සේගේ තේජස්හි පිවිස කිසිවක් කොට ගත නුහුණුවූහ යු සේ යි.

**විපසනි:**

1. **පානා** - 'පා - දක්වීමෙහි' ධාතු කෙරෙන් 'නා' ප්‍රත්‍යය ව කර්තෘ කාරකයෙහි සිද්ධ වර්තමාන කෘදන්ත යි.

2. **කිකරුන්** - සේවකයන්, " නුඹකෙරෙම් දූයි පිළිවිස කරනුයේ කිකරු " යි **පතිරජ පිරුවන් හිමියෝ** මෙහි අරුත් දක්වූහ. 'කිංකර' ශබ්දයෙන් නිපන් යි.

3. **රොන්** - රොන් සඳ පරාග, ධූලි, කුඩාපුපුරු ආදියට නමි. අවග්හි දිලි කුඩා පුපුරු නම් ගිනිපුපුරු යි.

4. **අවග්හි** - අවා + අග්හි. 'අවා' නම් අපාය යි. 'අග්' නම් ගින්න යි.

" අවා පුරයට නියෑ ... ශ්‍රී " " කෙලෙස'ග නිවු නිස ග " යනාදි කවිප්‍රයෝග මෙ තැන්හි සිහි කරන්නේ ය.

5. **දිලි** - 'දල - දිලීමෙහි' ධාතුකෙරෙන් 'ඉ' ප්‍රත්‍යය යෙදී සිද්ධ කර්තෘ කාරක කෘදන්ත යි.

6. **වනාකස්** – රිලවුන්ට නමැයි **රුවන්මල්හි** කියන ලදී.

7. **තරස්** – 'තරච්ඡ' ශබ්දයෙන් සිද්ධ යි. 'තරච්ඡ' ශබ්දය කර බාතා වලසුන්ට නම්.

8. **වගුන්** – වග නම් දිවියාට ඉතා සමාන සත්වයෙකි. ශරීරයෙහි වූ දීඝ ලපවලින් විශෙෂය දන්නේ යි. 'ව්‍යඝ්‍ර' ශබ්දයෙන් සිද්ධ යි.

9. **වස්වම්නි** – 'වස්' ධාතු කෙරෙන් 'මිනි' ප්‍රත්‍යය හා මධ්‍ය යෙහි ප්‍රයොජ්‍ය 'ව' ප්‍රත්‍යය ද යෙදී සිද්ධ යි.

10. **මස්** – කුඩාගල්. **රුවන්මලෙහි** :–

කුඩාගල්වලට :- "පහණ, සල, **මසුපුල්**". මස්+උපුල්.

**පරණ සන්නයෙහි ව්‍යාඛ්‍යානය ද වන ලෙස 'හිමස්' සදක් ගෙන කළ අරුත් බිණීමෙන් අර්ථයෙක් නැති.**

11. **වන්හ** – 'වද - පිවිසීමෙහි' දයින් අතීත ප්‍රථම පුරුෂ බහුවචන 'හ' ප්‍රත්‍යය යෙදී සිද්ධ ක්‍රියා පද යි.

12. **නොදෙයි** – නොදෙති. සබඳ අරුත්හි හෝ අදර අරුත්හි ම හෝ යෙදෙන අදර විබත්හි වූ 'එහි' ආදි ප්‍රත්‍යයන්ගේ හකාරයට යකාරදෙශ කිරීම සත්කවීන්ට ඉෂ්ට ය. සුබොධවමාරණය පිණිස යි.

(i) **ගුත්තිල කාව්‍යයෙහි** :–

"වැනෙයි සැඩ පවනෙ  හි - **රනෙයි** පෑ දද ගුවනෙ  හි"

**හංස සන්දෙශයෙහි** :–

"ලෙල මුතු ලැල් දල පුඹු **සේසනෙයි** ය  ට
තුල සුදුපට තුඟු සිංහාසනේ පි  ට"

(ii) **එහි ම** :–

"තෑ වී සඳුල් බිඳ නැඟි ගිනි  **ක දේ යි දී**
පෙ වී පණසිපත මදුතුන්  **බ දේ යි දී**
ලෑ වී ඔප කඟින් කගවන්  **යු දේ යි දී**
නි වී රුපුන් මියොගින් සුර  **මෑදේ යි දී**"

**28 නෙවුනා දත් යුවලින් එ දෙව් ම යස වන් බොල් වූ**
**මෙදෙන් නෙත් කොපොල්**
**ඡ් දෙව් කෝ අඟ දුම් රැසක් සෙ ඉමහත් ඡ් ඇත්හු**
**මේඝා වගා**
**ඡ් කල් දෙව්රණ මේ නිපන් සෙණ විලස් සක්සැත්**
**ගැසි ගොස් මැසි**
**ඡ් ගොස් පාබිසි වත් බිදෙත් එමරදෙව් එක්සත්**
**කෙළේ දම්රදූ.**

**අන්වය හා පදාර්ථ:** **තෙවුනා** – බබලන්නා වූ, **දත් යුවලින්** – දන්තයුග්මය කරණකොටගෙන, **එ දෙව් ම** – ඒ මාර දෙවියාගේ ම, **යස වන්** – කීර්තිය බඳු වූ, **බොල් වූ මෙදෙන්** – බහල වූ මදයෙන්; **තෙත් කොපොල්** – ආර්ද්‍රවූ කපොල ඇති, **ඒ දෙව්** – ඒ (මාර) දෙවියාගේ, **කෝ අග** – ක්‍රෝධාග්නියෙහි, **දුම් රැසක් සෙ** – ධූම රාශියක් පරිද්දෙන්, **ඉමහත්** – ඉතා මහත් වූ, **ඒ ඇත්ගු** – ඒ (ගිරිමෙඛල) නම් හස්තියා, **වහා** – ශීඝ්‍ර ව, **මෙයා** – අභිමුඛ කොට, **ඒ සල්දෙව්** – ඒ මාර දෙවි තෙම, **මැසි** – අමර්ෂී ව, **ගොස්** – ගමනය කොට, **රණමෙනිපත්** – තමාගේ යුද්ධ නමැති මෙසයෙහි උපන්, **සෙණ විලස්** – අශනියක් බඳු වූ, **සක් සැත්** – චක්‍රායුධය, **හෑසි** – හැසුයේ ය (=මෙහෙයූයේ ය), **ඒ** – එය, **ගොස්** – ගමනය කොට, **පාබිසි වත්** – (ගෞතමයන්වහන්සේට) පාබිස් සක් මෙන් වන කල්හි, **එ මරදෙව්** – ඒ මාරයා, **බිදෙත්** – පරාජය වත් ම, **දමිරද** – ධර්මරාජයන් වහන්සේ, **එක්සත් කොළේ** – විජය ග්‍රහණය කළහ.

**විස්තර :**

i තෙවුනා දත් යුවලින් එ දෙව් ම යස වන්.

කීර්තිය ශුභ්‍රවර්ණ ය යි කවීන් විසින් කල්පිත ය. එය කවුරුන්ගේ වුවත් එසේ ම විය යුතු. බ්‍රහ්මාදීන්ට ද ආවිෂ්ට වීමෙහි සමර්ථ කාමභවික සියලු සත්වයන් සවවශයෙහි පවත්වන මාරයාට ද මහත් කීර්තියක් ඇත. එ මෙන් බබලන දළ යුවලින් ය යි කීමෙන් දන්තයුගමයාගේ අධික ශුභ්‍රවර්ණය සූචිත යි.

ii බොල් වූ මෙදෙන් තෙත් කොපොල්.

මත්තහස්තීන්ගේ කපොලාදි ස්ථානයන්ගෙන් මදජලය වැහිරෙයි. එ හෙයින් ඝන වූ මදයෙන් යුත් කපොල ඇති බැව් කීමෙන් මත්ත භාවය හැඟවූහ මත්තහස්තීහු අතිශයින් ම චණ්ඩ වෙති.

iii ඒ දෙව් කෝ අග දුම් රැසක් සෙ ඉමහත්.

**ගිරිමෙවුලා** එක්සිය පනස් යොදුන් හෙයින් අතිමහත් වේ. මහත් බව මාරයාගේ ක්‍රොධාග්නියෙන් ජනිත ධූමරාශියක් මෙනැ යි පරිකල්පිත යි. මාරයාගේ ක්‍රොධාග්නිය අතිවිශාල ය. ඉන් නැගි දුම් කඳක් වෙතොත් ගිරි මෙවුලා මෙන් අතිමහත් විය යුතු හෙයිනි.

iv දෙව්රණ මේ නිපත් සෙණ විලස් සක් සැත් හෑසී.

**මාරයාගේ චක්‍රායුධය** මෙරගල් සක්වලගල් පවා කිලිල් සෙයින් කඩන්නට සමර්ථ මහානුභාව ඇත්තේ ය. මාරයා ඉතුදු හෑසී ය. ඒ සෙණ පහරක් මෙන් වී ය. සෙණ මෙඝයෙහි හටගනී. චක්‍රායුධය සෙණක් වුවහොත් ඒ කවර මෙඝයෙක්හි උපන්නේ ද යත් :- ඒ මාරයාගේ යුද්ධ නමැති මේඝයෙහි ම නිපන්නක් විය යුතු.

### v ඒ ගොස් පෑබිසි වත් බිඳෙත් එමර දෙව්.

මාරයා තම චක්‍රායුධය, අන් කුමකින් බැරි වුවත් මින් වැනසිය හැකි ය යි කෙලවරට ම තබා ගෙන සිටියේ ය. එයිනුදු කිසි අර්ථයක් නො වූයෙන් බල බුන් බව දැන පලා යන්නට වන. එකල්හි:

### vi එක්සත් කෙළේ දම්රජ.

ශ්වේතච්ඡත්‍රය රාජ්‍යලක්‍ෂණයෙකි. එක් රාජ්‍යයකට ඇත්තේ එක් ශ්වේත ච්ඡත්‍රයකි. රාජ්‍ය කීපයක් එක්සත් කළැ යි යනුවෙන් පෙර ඡත්‍ර කීපයක් තිබුනු රජ්‍ය කීපයක් එක් සතක් යටට හෙවත් එක්රජ කෙනෙකුන්ගේ යටතට ගත් බව හඟවයි. එක්සත් කරණ විට සෙසු රජවරු පැරදෙත්. එහෙයින් 'එක්සත්' සද ජයගැනීම් අර්ථයෙහි ව්‍යවහෘත යි. මෙහි ඡත්‍ර තැගීමක් නො ව ජයග්‍රහණය කෙළේ ය යන අර්ථය ගත යුතු.

**විසඳුම්:**

1. **බොල්** – සත. 'බහල' ශබ්දයෙන් සිද්ධ යි.

2. **ඉමගත්** – මෙහි 'ඉ' යනු අති උපසර්ගයාගේ අර්ථයෙහි යි.

3. **සෙණ** – ප්‍රාකෘත 'අසණි' ශබ්දයෙන් සිද්ධ යි.

4. **මැසි** – 'අමෂි' ශබ්දයෙන් 'ඇමැසි' යි සිදේ. 'වෂී' ශබ්දයෙන් 'වැසි' යි සිදෙන්නාක් මෙනි. 'අමැසි' ශබ්දයා කෙරෙන් අපත්‍යාර්ථයෙහි 'ඉ' ප්‍රත්‍යය වූ විට 'ඇමැසි' යි ම ලැබේ. අකාර ලොපයෙන් 'මැසි' යි ද ව්‍යත්‍යය පිණිස මත් වැඩි කිරීමෙන් 'මෑසි' යි ද සිද්ධ යි.

5. **පාබිසි** – 'සිසි' ශබ්දයෙන් 'බිසි' යි සිද්ධ යි. පා පිසීමට ඒ යොදනු ලබනුයෙන් 'පා' සදක් සමග 'පාබිසි' යි කියනු ලැබේ. 'දිසිරි' ආදි ව්‍යවහාර මෙනි.

6. **එක්සත්** – එක් සතක් (=ඡත්‍රයක්) ඇත්තේ යමකට ද ඒ එක්සත්. එකකු යටතෙහි පවත්නා දෙශය යි. ඒ ප්‍රතිපක්‍ෂ අධිපතීන් නැති හෙයින් විය යුතු. එ හෙයින් සතුරන් ජයගැන්ම හැඟවීමට මෙසේ යොදනු ලැබේ.

**සංලක්‍ෂ්‍යය:**

1. **පාබිසි වත්** – මාරයා විසින් හරින ලද චක්‍රායුධය පාබිසි වත් වූ බව මෙහි සඳහන් වේ. එහෙත්,

**අමාවතුරෙහි:–**

"තමාගේ චක්‍රායුධය මහසත්හට විහිට. හේ ගොස් මහසත්හු මුදුනේ මල්සතක් සෙයින් සිටියේ යි". ඈ විසින් මුදුනෙහි පුෂ්ප ච්ඡත්‍රයක් මෙන් සිටි බව කියන ලදී.

29 සොල්වා සෙල් සහවල් තුමුල් මුලුපුටා සල්සෙල්
විසල් ඉස් වටා
පාෂාණ් පාදපුලම් ගෙනේ මහණ තා පාෂාණ්
දුබාණ් දු සේ
සැසි ගොස් නොසරස් සරොස් ව බැණ බස් දුස්වෙස්
පිසස් රැස් එ වන්
* මන් සින්ද කෙලෙසුන් පසුන් කොට දසුන්
තුන්ලෝ කෙළේ ලෝතුමා.

**අන්වය හා පදර්ථ :** **සහවල්** – අරණ්‍ය සහිත වූ, **සෙල් සොල්වා** – පර්වත චාලනය කොට, **තුමුල් මුල්** - මහත් වූ මූලයන්, **උපුටා** – උදුරා, **විසල්** – මහත් වූ, **සල්සෙල්** - වෘක්ෂ හා ශෛල, **ඉස් වටා** – ඉස වට සිසාරවා, **මහණ** – ශ්‍රමණය, **තා** – යුෂ්මතුන්, **පාද ගෙනේ** – පාදයෙන් ග්‍රහණය කොට, **පාෂාණ්** – පාෂාණ යෙක්හි, **දුබාණ් දු සේ** – කිලුටු කඩක් පරිද්දෙන්, **පාෂාණ්** – සක් වළගල්හි, **අපුලම්** – ආස්ඵෝටනය කෙරෙම්, (යයි) **නොසරස්** – වහා, **සැසි ගොස්** – සාහසික ව ගමනය කොට, **සරොස් ව** – රොෂ සහිත ව, **බස් බැණ** – (පරුෂ) වචන කියා, **එ වන්** – ඒ ප්‍රවිෂ්ට වූ, **දුස් වෙස්** – දුෂ්‍ය වූ වෙශ ඇති, **පිසස් රැස්** – පිශාච සමූහයාගේ, **මන් සින්ද** – මානච්ඡේදන කොට, **කෙලෙසුන් පසුන් කොට** – ක්ලේශයන් ප්‍රවජිතන ද කොට, **ලෝතුමා** – ලොකොත්තම තෙම, **තුන්ලෝ** – ත්‍රිවිධලොකවාසීන්, **දසුන් කෙළේ** – දාසයන් කෙළේ යි.

**විස්තර :**

i මන්සින්ද කෙලෙසුන් පසුන් කොට දසුන් තුන්ලෝ
කෙළේ ලෝතුමා.

උක්තප්‍රකාරයෙන් ආ මාරයස්නාවන්ගේ මානභාංශය හා සකල ක්ලේශ යන්ගේ ප්‍රහාණය ද කොට බුද්ධත්වයට පැමිණියහ. බුද්ධත්වයට පැමිණි උත්තම යන් වහන්සේ තුන්ලෝවාසීන් විසින් ම දාසයන් මෙන් කරන සියලු උපස්ථාන ගෞරවාදරාදියට යොග්‍යසේක. එහෙයින් දාසයන් කෙළේය යි කීහ.

**විප්පනී :**

1\. **සොල්වා** – 'සල්' ධාතුකෙරෙන් 'ආ' ප්‍රත්‍යය හා ප්‍රයොජ්‍ය 'ව' ප්‍රත්‍යය යෙදී 'සල්වා' යි සිද්ධ යි. මෙය පිළිපෙරළියෙන් 'සොල්වා' යි ද ව්‍යවහාර කරනු ලැබේ.

2\. **සහවල්** – වල් සහ වූයේ = සහවල්. අන්අරුත් සමස්.

3\. **උපුටා** – 'උපුට' ධාතුවෙන් සිද්ධ පූර්ව ක්‍රියා යි. 'උප්පාටෙත්වා' යන පූර්වක්‍රියාවෙන් ගිනන ව නිපාතන වශයෙන් ලැබෙන පූර්වක්‍රියා රූපයක් හෝ විය හැකි යි.

---

* මන් සුන් සුන් කෙලෙසුන් පසුන් කෙළෙ දසුන් තුන්ලෝ තමා ලෝතුමා.

4. **වටා** – 'වට' ධාතුවෙන් සිද්ධ පූර්ව ක්‍රියා යි.

5. **පාෂාණ** – 'පාෂාණ' ශබ්දයෙන් පහණ, පහණ, පාෂාණ යි සිද්ධ යි.

6. **අපුලමි** – 'අපුල' ධාතු කෙරෙන් 'මි' ප්‍රත්‍යය ව සිද්ධ උත්තම පුරුෂ ක්‍රියා යි.

7. **දුබාණී** – අයහපත් කිලිටි වස්ත්‍රය. 'බාණී' සද වස්ත්‍රාදියෙහි වැටේ. **සංස්කෘතයෙහි** දු ඇති හෙයින් තත්සම යි.

8. **දු** – නිරර්ථක යි. පාද පූරණය ප්‍රයෝජන කොට ඇත්තේ යි. 'රෙදේ' ආදි අන්සදක් යොදන ලද නම් එසේ නො වේ.

9. **පිසස්** – 'පිසාච' ශබ්දයෙන් සිද්ධ යි. කුණුමස් අනුභව කරන්නේ 'පිශාච' නම්.

**80. ඔහු තෙදිනි පුළුන් රල් වාවෙසින් මෙන් තමා සෙන්**
**පලන එ ගිරිමෙවුලා වෙවුල වෙවුලා එවල්හි**
**නො දුසා උවදෙසක් අන් පස්නමින් මු දනම්හ යි**
**එ සඳ සඳවතුන් වෙත් ගොස් මෙ ලෙස් වි එදෙව් පුත්.**

**අන්වය හා පදාර්ථ : ඔහු තෙදිනි** – උන්වහන්සේගේ තේජසින්, **වා වෙසින්** – වාත වේගයෙන්, **පුළුන් රල් මෙන්** – පුළුන් පිඩු මෙන්, **තමා සෙන්** – තමාගේ සේනාව හා, **එ ගිරිමෙවුලා** – ඒ ගිරිමෙඛල නම් හස්තියා, **වෙවුල වෙවුලා** – වෙවුලමින්, **එවල්හි** – ඒ අරණ්‍යයෙහි, **පලන** – පලායන කල්හි, **එදෙව්පුත්** – ඒ මාර දිව්‍ය පුත්‍රයා, **අන් උවදෙසක්** – අන්‍යෝපදේශයක්, **නො දුසා** – දර්ශනය නො කොට, **එසඳ** – එකල්හි, **සඳවතුන් වෙත්** – (දු) ලදුන්ගේ සමීපයට, **ගොස්** – ගමනය කොට, **මු** – මුන්වහන්සේ, **පස්නමින්** – පසුබටකාමයෙන්, **දනම්හ යි** – ජය ගත්තමු යන, **මෙලෙස්** – මේ ආකාරයෙන්, **වි** – කථනය කෙළේය.

**විස්තර :**

i ඔහු තෙදිනි පුළුන් රල් වාවෙසින් මෙන් තමා සෙන්
පලන එගිරිමෙවුලා වෙවුල වෙවුලා එවල්හි.

වජ්‍රාසනය තොප අයත් බවට දෙස් කවුරු දු යි මාරයා ඇසූ සඳ **සිද්ධාර්ථ ගෞතමයන්** වහන්සේ පාරමී ධර්මයන් සිහි කොට පෙර පුත්‍රදානාදි අවස්ථාවන්හි කම්පිත වූ මහපොළොව දෙසට අත දිගු කළසේක. එවිට මිහිකත දෙස් කියන්නියක මෙන් මහහඬින් කම්පිතවන්ට පටන් ගත්තා ය. එයින් බිය පත් වූ **ගිරිමෙඛල** හස්තිරාජයා හා මරසෙන් පලා ගියහ. "වා වෙසින් පුළුන් රල් මෙනැ" යි එහි දු නිර්ණය හඟවති. වාතවේගයෙන් ඉතා සැහැල්ලු වූ පුළුන් රල් ඒ ඒ අත විසිර යෙයි, මරසෙන් ද එ මෙන් වූහයි කීමෙන් ගෞතමයන් වහන්සේගේ වාතවේගයක් බඳු ප්‍රබලත්වයත් මරසෙනගෙහි පුළුන්රල් බඳු ලඝුත්වයත් දක්වූහ.

### ii එසඳ සඳවතුන් වෙත් ගොස්.

සඳ වන් වත් (=මුහුණු) ඇති හෙයින් 'සඳවත්' යනු ස්ත්‍රීන්ට නමකි. එවිට ස්ත්‍රීන් වෙත ගොස් ය යනු මෙහි අර්ථ යි. මේ අවස්ථාවෙහි මාරයා පැමිණියේ දූලදූත් වෙතට ය යන බව ප්‍රසිද්ධ හෙයින් දූලදූන් වෙත ගොස් ය යි අරුත් ගත යුතු.

**විසසනි :**

1. **රල්** – 'රඞ්ග' ශබ්දයෙන් නිපන් වූ සමූහාර්ථවත් 'රළ' සදක් දක්නා ලැබේ. එය කිසි විටෙකත් හලන්ත ව සිටින බවක් සත්කවීන්ගේ ප්‍රයෝගයන්හි නො දක්නා ලැබේ. මෙහි බහුවචනය හෝ වෘත්තය පිණිස 'රල්' යි ගන්නා ලදී. ස්වල්පයක් යන අර්ථයෙහි වූ 'රල්‍ය' සදක් කථාව්‍යවහාර යෙහි දක්නා ලැබේ.

2. **පලන** – 'පල - පලා යෑමෙහි' ධාතු කෙරෙන් 'ත' ප්‍රත්‍යය යෙදී සිද්ධ කාලාර්ථයෙහි අසමාප්‍ය ක්‍රියා යි.

3. **එ ගිරිමෙවුලා** – මෙහි 'එ' සද ප්‍රසිද්ධාර්ථයෙහි යි. ගිරිමෙවුල් නම් මාරයාගේ වාහන වූ හස්තිරාජයා යි.

4. **වෙවුල වෙවුලා** – 'වෙවුල' ධාතුවෙන් සිද්ධ පූර්වක්‍රියා යි. 'දිදී' ආදියෙහි මෙන් පූර්වයාහට හ්‍රස්ව වී. පූර්වක්‍රියාද්වයක් එක් වූ විට මිශ්‍ර ක්‍රියාර්ථය ලැබේ.

5. **නො දක** – නො පූර්ව 'දිස්' දයින් සිද්ධ පූර්ව ක්‍රියා යි. කර්මයක් අභිමත ස්ථානයන්හි දී 'දිස්' ධාතුහට 'දක්' යන ආදේශය වේ.

6. **උවදෙසක්** – ඉෂ්ටාර්ථය සිදු කර ගැනීමට උපාය දක්වා යොද වන්නහුගේ වාක්‍යය මෙහි උපදෙශ නම්.

7. **සඳ වතුන්** – සඳවන් වත් ඇත්තී = සඳවත්. අන්අරුත් සමස්.

8. **වී** – කීමෙහි 'විය' ධාතු කෙරෙන් 'ඉ' ප්‍රත්‍යය යෙදී 'වියි' යි සිද්ධ කල්හි යකාර ලොපයෙන් හා පූර්වපර සමානස්වර එක් ව දීර්ඝ වීමෙන් 'වී' යි සිද්ධ යි.

**සංලක්ෂ්‍යය.**

1. **වෘත්තය – මාලිනී** නම්. මෙතැන් සිට 36 දක්වා ඇති පද්‍ය ද මේ වෘත්තයෙන් නිබද්ධ යි.

2. **සමාලොචන** – ගෞතමයන් වහන්සේ ගිරිමෙවුලා සහිත මර සෙනඟ සූර්‍ය්‍යයා අස්තංගත වන්නට පළමු පරදවා අලුයම් කාලයෙහි සර්වකෙලෙසුන් නසා බුදු වූහ. එහෙයින් පූර්වපද්‍යයෙන් කෙලෙසුන් නැසූ බැව් කියා පසු ව ගිරිමෙවුලාගේ හා මාරසේනාවන්ගේ පලා යෑම කීමෙන් ක්‍රමභඞ්ග යෙක් වෙයි ද ? යත්:- නොවෙ යි. මෙහි පූර්වාර්ධයෙන් මාරයා දූවණියන් වෙත නික්මුණු අවස්ථාව හා ඒ පිණිස ඇති වූ හේතුව පමණක් දැක්වීම අභිමත හෙයිනි.

**31.** **අසමිනප නුවන්හිපාර ලත්කල් තබා ලා**
**සවන සවන තෙප්ලෙක් වී ද ඒ යේ ද අන් තැන්**
**ඉති බැණ ගිය දෙව්දූ රන්ලියන් මෙන් දූහුම් ගත්**
**සලෙළුමතගජන් පා ලූ ඇකිල්ලේ විලස් ගත්.**

**අන්වය හා පදාර්ථ:** **අසමින්** – (මාරයා කී බස්) ශ්‍රවණය කොට, **අප නුවන්හී පාර** – අපගේ නෙත්‍ර නමැති ශරයන්ගේ ප්‍රහාරය, **ලත් කල් තබාලා** – ලැබූ කල් තබා, **සවන තෙප්ලෙක්** – ශ්‍රවණීය වචනයක්, **සවන** – ශ්‍රවණයෙහි, **වී ද** – වූයේ නම්, **ඒ** – ඒ තැනැත්තේ, **අන්තැන්** – අන්‍යස්ථානයකට, **යේ ද** – ගමනය කෙරේ ද?, **ඉති** – මෙසේ, **බැණ** – කථනය කොට, **දූහුම් ගත්** – ජඞ්ගම වූ, **රන්ලියන් මෙන්** – ස්වර්ණ ලතාවන් මෙන්, **ගිය** – (බුදුන් වෙත) ගමනය කළ, **දෙව්දූ** – (මාර) දෙව දුහිතෘහු, **සලෙළු මතගජන්** – සල්ලාල නමැති මත්තහස්තීන්ගේ, **පා** – පාදයන්හි, **ලූ** – ලන ලද, **ඇකිල්ලේ** – ශෘඞ්ඛලා දාමයෙක්හි, **විලස් ගත්** – විලාසය ග්‍රහණය කළහ.

**විස්තර:**

i අප නුවන්හිපාර ලත්කල් තබා ලා.

යුවතීන්ගේ නෙත්‍ර තරුණයන්ට ශර (= හී) බඳු ය. කාම පීඩා ඇති කරන හෙයිනි. නෙත්‍ර නමැති හීවලින් පහර දීම නම් බැලීම යි. මාරස්ත්‍රීන්ගේ නෙත් සැර පහර ලැබ පුහුදුන් ඔවුන්ගේ අභිමතයන් ඉක්ම පැවතිය නො හෙන හෙයින් මෙසේ කීහ.

ii රන්ලියන් මෙන් දූහුම්ගත්.

මාර දුහිතෘහු ස්වර්ණලතා බඳු වෙති. ශොභනාභවයෙනි. ඔව්හු ගමන් ගත්හ. එහෙයින් ජඞ්ගම (= හැසිරෙන) ස්වර්ණලතා බඳු ය යි කීහ.

iii සලෙළු මත ගජන් පා ලූ ඇකිල්ලේ විලස් ගත්.

සල්ලාලයන් යා නො දී රඳවන්නා වූ ය යි කී අයුරු යි. පාදයෙහි ලූ හැකිල්ලෙන් මත්තහස්තීන් බැහැර යා නො දී රකිති. එහෙයින් හැකිල්ලෙන් (= දම්වැලෙන්) වනුයේ හස්තීන්ගේ ගමන් වැලැක්ම යි. මාර දූහු ද තරුණයන්ට හැකිලි වූහ. දුටු සඳ බඳනා ලද්දවුන් මෙන් යා නොහී රුඳෙන හෙයිනි.

**ටිප්පනී:**

1. **පාර** – පහර. හකාර ලොපයෙන් දීර්ඝ.වී.

2. **තෙප්ලෙක්** – තෙපුලෙක්. 'තෙපල, තෙප්ල' යනු විකල්ප රූප යි.

3. **දෙව් දූ** – මරදෙවියාගේ දුවණියෝ. තණ්හා, අරති, රගා යන තිදෙන.

4. **දැහුම්** – හැසිරීම. 'ජඞ්ගම' ශබ්දයෙන් සිද්ධ යි.

5. **ලූ** – 'ලා - ලීමෙහි' ධාතුවෙන් සිද්ධ කර්මකාරක අතීත කෘදන්ත යි.

6. **ඇකිල්ලේ** – ඇකිලි + ඒ. 'සඞ්කලි' ශබ්දයෙන් 'සැකලි, සැකිලි, හැකිලි, ඇකිලි' යි සිද්ධ යි. මෙහි පිළිපෙළින් හකාරාදේශ හා හකාර ලෝපය ද දත යුතු.

**32.** **කොඳවැල දසනින් හා පුල් පියුම් වත් සිරින් හා**
**පලු ලෙළ රතනින් හා පිල් සදැස් නිල් කෙසින් හා**
**බිඹුවැල ලවනින් හා හෙම්හසුන් පුන් තෙනෙන් හා**
**කතරඹ වටොරින් හා ගත් කලුන් මන් මතින් හා**

**අන්වය හා පදාර්ථ:** (ඒ මාරවධූහු) **කොඳවැල දසනින් හා** – කුන්ද කුඩ්මල පඞ්ක්තියකට බඳු දන්තයෙන් ද, **පුල් පියුම්වත්** – විකසිත වූ පද්ම වැනි වක්ත්‍රයන්ගේ, **සිරින් හා** – ශෝභාවෙන් ද, **පලු** – පල්ලව වැනි, **ලෙළ රතනින් හා** – ලීලායුක්ත රක්ත හස්තයෙන් ද, **සදැස් පිල් නිල් නිල්කෙසින් හා** – සදැස් පිල් බඳු වූ නීලවර්ණ කේශ කලාපයෙන් ද, **බිඹුවැල** – පක්ව බිම්බ ඵල බඳු, **ලවනින් හා** – අධරයෙන් ද, **හෙම්හසුන්** – සුවර්ණහංසයන් බඳු, **පුන් තෙනෙන් හා** – පීන පයෝධරයෙන් ද, **කත රඹ වටොරින් හා** – සුවර්ණ රම්භා වෘක්ෂ බඳු වෘත්තෝරුයුගමයෙන් ද, **මතින් හා** – මත්තවිලාසයෙන් ද, **කලුන්** – පුරුෂයන්ගේ, **මන්** – චිත්තයන්, **ගත්** ග්‍රහණය කළහ.

**විස්තර:**

ඒ පැමිණි මාර ස්ත්‍රීහු පුරුෂයන්ගේ සිත් ගත්හ. කුමකින් ද යත්:-

i කොඳ වැල දසනින් හා

කුන්ද කුඩ්මල පඞ්ක්තියක් බඳු සුදු කුඩා දත් පුරුෂයෝ ප්‍රිය කෙරෙති.

ii පුල් පියුම් වත් සිරින් හා

විකසිත රක්ත පද්මයක් බඳු පරිපූර්ණ තාම්‍රවර්ණ වක්ත්‍රයෝ පුරුෂයන්ගේ සිත් ගනිති.

iii පලු ලෙළ රතනින් හා

බාල පත්‍ර බඳු ලීලෝපේත මෘදු රක්තවර්ණ හස්ත ද ජනයන්ට ප්‍රිය ය.

iv පිල් සදැස් නිල් කෙසින් හා

මයූරයන්ගේ සදැස් පිල්, සෙසු වර්ණ මඳ වශයෙන් ඇතත්, බෙහෙවින් නීලවර්ණ ය. එබඳු කේශකලාප ද දනන් සිත් ගනී.

v කිඹුවැල ලවනින් හා

ඉදුණු බිඹුපල අතිශයින් රක්ත වර්ණ ය. සටහනින් ද තොලකට සම ය. එබඳු තොල් ද ජනප්‍රිය යි.

vi හෙම් හසුන් පුත් තෙනෙත් හා

ස්වර්ණහංසයා ක්‍රමයෙන් සිහින් වූ පරිපූර්ණ පූර්වකාය ඇති රන්වන් පක්ෂියෙකි, එ මෙන් රන්වන් පුත් පියොවුරු ද දනන් නෙත් රඳවයි.

vii කනරඹ වටොරින් හා

රන් රඹ කඳ සුවෘත්ත (= මනා ව වට) ය. ක්‍රමයෙන් සිහින් ද වේ. එබඳු ඌරු යුගමය දනන් සිත්ගන්නේ වේ.

viii මතින් හා

ස්ත්‍රීන්ගේ මන්ත විලාසය ද කාමුක ජනයන්ගේ සිත් ගනී. පූර්වෝක්ත හැම දෙයින් ම මාරවධූහු පුරුෂයන්ගේ සිත් ගන්නෝ වූහ.

**විපසනි:**

1. **කොඳ** – රාත්‍රිකාලයෙහි විකසිත වන සුදු කුඩා මල් වෙසෙසකි.

2. **වැල** – මෙහි පඞ්ක්ති යන අර්ථයෙහි යෙදිණ.

3. **පලු** – දලු හෙවත් ලපටි පත්‍ර.

4. **සඳැස් පිල්** – මයුරයන්ගේ අර්ධචන්ද්‍රාකාර සටහන් ඇති පියාපත්.

5. **බිඹු** – බිම්බ හෙවත් කෙම්. මේ රදලිය ය යි සිතිය හැකි යි. කොවක්කා ය යි ද කියත්.

6. **ලවනින්** – ලවන්+ඉන්. 'ලවන්' යනු තොලට නම්. 'ලවන' ශබ්දයෙන් සිද්ධ යි.

7. **හෙම් හසුන්** – 3 වන පද්‍යයේ 2 වන විපසනිය බලනු.

8. **කනරඹ** – 'කනා' යනු ස්වර්ණයට නම්. ස්වර්ණයට බඳු පැහැ ඇති රඹ 'කනාරඹ' නම්. 'කනරඹ' යි ගන්නා ලද්දේ වෘත්තය පිණිස මත් අඩු කිරීමෙනි.

9. **වටොරින්** – වටොර+ඉන්. 'ඌරු' ශබ්දය තත්සම වශයෙන් හා 'උරු'යි තද්භව වශයෙන් ද ව්‍යවහාර කරනු ලැබේ. එහෙත් 'වෘත්තොරු' ශබ්දයෙන් පැමිණි විට 'වටොර' ය යි සමාසයෙහි දී අකාරාන්ත ව දක්නා ලැබේ.

**කාව්‍යශේඛරයෙහි:-**

"වෙරළුම්ණී රසබුස් - ඉසිනෙව් **වටොරු** රඹගස්"

10. **කලුන්** – කල්+උන්. කල් සඳ ස්ත්‍රීන්ට මෙන් ම පුරුෂයන්ට ද නම්.

33. එ මරරුපු සුගත් වත් පුල් කමල්හි සුනිල් නෙත්
බිඟුවැල හැර නෙත්කල් රූවිලස් තෝනිදන්හි
පබළ ලියකුරෙක්හි කේමලින් පත් විලස් පෑ
දදවරණ සඳ මේ විහු දිස්නෙන් දසන්හි.

**අන්වය හා පදාර්ථ:** **එමරරුපු** - ඒ මාර ශත්‍රු වූ, **සුගත්** - සර්වඥයන්වහන්සේගේ, **වත් පුල් කමල්හි** - වක්ත්‍ර නමැති විකසිත පද්මයට, **සුනිල්** - ඉතා නීලවර්ණ වූ, **බිඟුවැල** - භෘඞ්ගාවලිය, **හැර** - යවා, **නෙත්කල්** - දර්ශනීය වූ, **රූවිලස්** - (ස්වකීය) රූප විලාස නමැති, **තෝ නිදන්හි** - සාගරයෙහි, **පබළ ලියකුරෙක්හි** - ප්‍රවාල ලතාඞ්කුරයෙක්හි, **කේමලින්** - පෙණ (රුස) කින්, **පත් විලස්** - පැමිණියා වූ විලාසය, **පෑ** - දක්වා, **දසන්හි** - දන්ත යන්ගේ, **දිස්නෙන්** - දීප්තියෙන්, **දදවරණ** - දන්තාවරණයන් (= තොල්), **සඳ** - සරසා, **මේ** - මතු කියනු ලබන ප්‍රකාර ප්‍රවෘත්ති යක්, **විහු** - කථනය කළහ.

**විස්තර:**

i එමර රුපු සුගත් වත් පුල් කමල්හී සුහිල් නෙත්
බිඟුවැල හැර,

මාරශත්‍රු වූ **සුගතයන්**වහන්සේගේ වක්ත්‍රය විකසිත පද්මයක් වැනි වේ. මාරාඞ්ගනාවන්ගේ නෙත්‍රයෝ නිලවර්ණ හෙයින් භෘඞ්ගයන් බඳු වෙති. ඔවුන්ගේ නෙත්‍ර පඞ්ක්තිය බිඟුවැලකට බඳු වේ. එහෙයින් ‘වත් පුල් කමල්හි සුනිල් නෙත් බිඟුවැල හැර’ යි කීහ. තථාගතයන් වහන්සේගේ මුහුණ බලා ය යි කී අයුරු යි.

ii නෙත් කල් රූ විලස් තෝනිදන්හි
පබළ ලියකුරෙක්හී කේමලින් පත් විලස් පෑ
දදවරණ සඳ මේ විහු දිස්නෙන් දසන්හි.

මාරාඞ්ගනාවෝ සාගරයෙහි වූ ප්‍රවාල ශාඛාඞ්කුරයකට පෙණ රොදක් පැමිණීමෙන් ඇති වන ශොභාව දක්වා වක්‍ෂ්‍යමාණාකාර බසක් කීහ. කෙලෙ සින් ඒ සිරි දැක්වූහු ද? යත් :- ඔවුන්ගේ රූපවිලාසය ම සාගරය වී. එහි වූ දෙතොල්හු ප්‍රවාලලතාඞ්කුර වූහ. රක්තවර්ණ හෙයිනි. එහි පැතුරුණු දන්ත කාන්තිය ම පෙණ පිඩු වී. ශ්වෙත වර්ණ සාම්‍යයෙනි. පෙණරොද ශ්වෙත වර්ණ ය. දන්තකාන්තිය ද සුදු වේ. ස්මිත (= සිනා) කාලයෙහි දන්තකාන්තිය දෙතොල්හි පැතිරේ. එහෙයින් මේ ස්මිතයෙන් යුක්ත ව මෙසේ කීහ යි කී අයුරු යි.

**විපසනී :-**

1. **මරරුපු** - මරුගේ රුපු = මරරුපු. සර්වඥයන්වහන්සේට නම්. මෙහි විශෙෂණ වශයෙන් යෙදී තිබේ.

2. **සුගත්** – බුදුහු. විස්තර මෙසේ දත යුතු.

**බුදුගුණ ලඞ්කාරෙහි :-**

"යහපත් කොට ගෙතෑ සි - සුන්දර තැනට සැපතෑ සි
සොඳුරු බස් කියතෑ සි - කියති ඒ මුනිරජුට **සුගතෑ** සි"

3. **කමල්හි** – කර්මාර්ථයෙහි ආධාර විභක්ති යි.

4. **හැර** – 'හර' ධාතුවෙන් සිද්ධ පූර්ව ක්‍රියා යි. 'හර' ධාතුව ද්විකර්මක හෙයින් 'නෙත්බිඟුවැල, පුල්කමල්හි' ය යි කර්මද්වයක් වී.

5. **තෝනිදන්හි** – 'තොයනිධි' යනු සාගරයට නමි. මෙහි 'තොය' ශබ්දයෙන් 'තෝ' යි ද 'නිධි' ශබ්දයට පර්යාය වූ 'නිධාන' ශබ්දයෙන් 'නිදන්' යි ද ගෙන සාගර වාචක ශබ්දයක් කොට යෙදූහ. නොහොත් 'තොයනිධි' ශබ්දයෙන් 'තෝනිදු' යි ගෙන 'අන්හි' පස හා යෙදීමෙන් 'තෝනිදන්හි' යි සිද්ධ යි. 'නිධි' ශබ්දයෙන් 'නිදු' යි ගැන්ම ශාස්ත්‍රීය බව ජලනිධි වාචී 'දලනිදු' ආදි ශබ්ද කෝෂග්‍රන්ථයන්හි හා කවිප්‍රයෝගයන්හි ද ඇති හෙයින් පිළිගත යුතු.

**මුවදෙව්දාහි :-**

"විසාද**ලනිදු** පසු රා - නිත් ගජකැනට සොස රා"

6. **කෝමලින්** – 'කෝමල්' යනු ද පෙණවලට නමෙකි.

7. **දදවරණ** – දන්තාවරණ (= තොල්.) දද, වරණ ය යි ඕෂ්ඨපර්යාය දෙසදක් ලෙස **රුවන් මලෙහි** වෙන් කොට ඇතත් ඒ නො මැනවි. එහි වරද ග්‍රන්ථශෝධකයන් අතෙහි ය.

8. **දිස්නෙන්** – දිසුන් නම් දීප්තිය යි.

9. **දසන්හි** – 'දසන්' යනු දත්වලට නමි. සිංහලයෙහි දී අප්‍රාණ වාචක ශබ්දයන්ගේ සම්බන්ධාර්ථය කීම පිණිස අදර විබත් යෙදේ.

එහෙයින් මෙහි දන්තයන්ගේ කාන්තිය කිව මනා විට 'දසන්හි දිස්නෙන්' යි යෙදූහ. තත්සම ශබ්දයන්ට මේ නියමය නැත්තේ ය. "**දන්තයන්ගේ** දීප්තිය, **චිත්තයන්ගේ** ප්‍රභේද" මෙ ඈ යෙදුම් ඊට සාධක යි.

**සංලක්ෂ්‍යය :**

1. **වත් පුල් කමල්හි සුනිල් නෙත් බිඟු වැල හැර.**

කිසිවකු මුහුණ බැලීම කිව්හු මෙසෙයින් දකිති.

**ගුත්තිලයෙහි :-**

"නිරිඳු සඳ එබස ට - **බෝසත්හු වත් තඹර** ට
**සියනෙත් බිඟු විහි** ට - එසඳ පැවසී තෙපුල් මෙලෙස ට"

34. තර විදු කලඹෙව් මේ ගබ්හි තෙවුනා මෙ තා දූන්
හිඳ විඳි සිරි කිම් ද කල් විනා * වී මෙරුක් මුල්
පබවත වත දක්නා වස් නොයෙක් වෙස් දූරු බැව්
දිය දෙස බිලියම් ද යාදසුන් යාදසුන් † වස්.

**අන්වය හා පදවි:** **දූන්** - මෙකල්හි, **මේ ගබ්හි** - මෙඝ ගර්භයෙක්හි, **තෙවුනා** - බබළන, **තරවිදුකලඹෙව්** - ස්ථිර විද්‍යුත් කලාපයක් බඳු වූ, **මෙ තා** - මේ යුෂ්මතුන්, **කල් විනා වී** - කාන්තාවන්ගෙන් වෙන් ව, **මෙ රුක් මුල්** - මේ වෘක්ෂ මූලයෙහි, **හිඳ** - නිෂණ්ණ ව, **විඳි** - වින්දනය කළා වූ, **සිරි කිම් ද** - ශ්‍රිය (= සම්පත්තිය) කවරේ ද ? **පබවත වත දක්නා වස්** - ප්‍රභාවතියගේ වක්ත්‍රය දර්ශනය කිරීම පිණිස, **නොයෙක් වෙස්** - අනේක වේශ, **දූරුබැව්** - (යුෂ්මතුන්) ඉඳුලු බවට, **දිය දෙස්** - ජගත් (ලෝකයා) සාක්ෂ්‍යය. (එහෙයින්) **යාදසුන්** - ශෝභන දර්ශන ඇති (යශෝධරාදි) වනිතාවන්ගේ, **යා දසුන් වස්** - යහපත් දර්ශනය පිණිස, **බිලියම් ද** - බලිකර්මයක් ද ? හෙවත් මන්ත්‍ර ජපකිරීමක් ද ?

**විස්තර:**

i තරවිදු කලඹෙව් මේ ගබ්හි තෙවුනා මෙ තා දූන්,

විදුලිය අතිශයින් දීප්තිමත් ය. වහා නස්නාසුලු ද වේ. බුදුරජාණන් වහන්සේ මෙඝයෙක්හි නො නැසී පවත්නා විදුලි කලඹක් මෙනැයි කීමෙන් ශරීරයෙහි නිරන්තරයෙන් පවත්නා දීප්තිමද්භාවාදි ශෝභනත්වය කියන ලදී.

ii පබවත වත දක්නා වස් නොයෙක් වෙස් දූරු බැව් -
දිය දෙස,

**තථාගතයන්**වහන්සේ සසරෙහි දී **කුශරජ** ව උපන්හ. උන්වහන්සේ පෙර පවකින් විරූප වූ මුහුණක් ඇති ව උපන් හෙයින් රූපශ්‍රී ලොකයෙහි අභිෂේක ලත් සිය පිය මෙහෙසි **ප්‍රභාවතිය** කලකිරෙතැ යි ප්‍රසිද්ධියේ දැක ගත නො හී මැණියන්ට තම අදහස දන්වා මැණියන්ගේ උවදෙසින් ඇත් ගොවු වෙශධාරී ව ඇත්හලෙහි සිට මැණියන් හා ඇත්හල බැලීමට පැමිණි **ප්‍රභාවතිය**ගේ රූසිරි ඇස්පුරා දැක ගත්හ. අස්ගොවුවෙස් දරා අස්හලෙහි දී ද මෙසෙයින් ම දැක ගත්හ. මෙසෙයින් පසු ව ද ඇයගේ වක්ත්‍රය දැකීමෙහි ලොභයෙන් ම අරක්කැමි වෙස් ආදිය ද ගත්හ.

මේ ප්‍රවෘත්තිය එකල ලොකයා දැන සිටි හෙයින් මීට ලොකයා සාක්ෂ්‍යය යි කීහ.

iii බිලියම් ද යාදසුන් යාදසුන් වස්,

ලෝ වැස්සෝ යම් යම් ශාන්ති ලබා ගැනීම පිණිස බලිකර්ම (= බලිදීම් පෙරටු කොට ඇති මන්ත්‍ර ජප කිරීම්) කෙරෙති. හුදකලාව භාවනා කෙරෙමින් වැඩ හුන් බුදුන්ගෙන් ස්ත්‍රීන් දැකීම පිණිස පූර්වොක්ත ආකාර ඇති බලි කර්මයක් කරන්නෙහි දැ යි මරහතෝ ඇසූහ.

---

* වුත්. † වත්,

**විසඳනී :**

1. **හාර** – 'හර' සඳ දීපති තනවුරු ආදි අර්ථයන්හි එවි. මෙහි තනවුරු යන අරුත්හි වේ.

2. **කලම්බව** – කලම්බ + එව්. 'කලාප' ශබ්දයෙන් 'කලප්' යි සිදී ප කාරයට බ කාරාදෙශ වීමෙන් හා සවරාගම වීමෙන් ද කලබ යි සිද්ධ යි. ඉක්බිති කාලාග්‍රවාචි 'කලම්බ' ආදි ශබ්දයන්හි මෙන් බ කාරය උපනම්ථිත වූ මිකාරයාගේ අභිය හා යෙදීමෙන් 'කලම්බ' යි සිද්ධ යි.

3. **විඳි** – 'විඳ' ධාතු කෙරෙන් 'ඉ' ප්‍රත්‍යය යෙදී කර්මකාරකයෙහි සිද්ධ කෘදන්ත යි. 'විදි' යි කතෘ කාරකයෙහි ද කෘදන්තයක් ලැබේ.

4. **පබවත** – මද්‍ර නරේන්ද්‍රයාගේ ප්‍රභාවතී නම් දූ කුමරිය.

5. **වෙස්** – ප්‍රකෘති විලාසය හැර අන්‍ය විලාස ගැන්ම මෙහි වෙස් නම්.

6. **බිලියම්** – බිළිසාම්. 'ස' හට 'ය' ආදේශයෙන් බිලියම්. බිළිඳිම පෙරටු කොට ඇති මන්ත්‍ර ජල්පනය.

7. **යාදසුන්** – යාදස් + උන්. 'යාදස්' යනු යතපත් දයිත ඇති හෙයින් සත්ත්වට නම්.

8. **වස්** – පිණිස යන අර්ථයෙහි නිපාතයෙකි.

**35** **සිදුහත සිදුහත්හි වත් නො දිස්නේ නො දිස්නේ**
**මෙනෙ තුල මෙ මහත් දුක් මා නුවන්තෝ ලොබින් වූ**
**පලුපුල සියපත් ඈ වත්නි අත්නෙත් වුවන් ඈ**
**කැරැ අතල ගලක් ලා තෝ මැවූ වන් එ සිව්වත්.**

**අන්වය හා පදාර්ථ : සිදුහත** – සිද්ධාර්ථ කුමාරය (යුෂමතුන්ට), **සිදුහත්හි වත්** – සමීප (ගෘහී) යෙක්හි වුවත් වූ, **තෝ** – ජලය, **දිස්නේ** – දර්ශනය වෙයි. (එහෙත්) **ලොබින් වූ** – (යුෂමතුන් පිණිස හටගත්) ලොභයෙන් වූ, **මෙනෙ** – චිත්තයෙහි, **තුල** – ඉතිර ගියා වූ, **මෙ මහත් දුක්** – මේ මහා දුක්ඛයෙන් වූ, **මා නුවන් තෝ** – මාගේ නෙත්‍රජලය (= කඳුළු), **නො දිස්නේ** – දර්ශනය නො වෙයි. **එ සිව්වත්** – ඒ බ්‍රහ්මයා විසින්, **පලුපුල සියපත් ඈ වත්නි** – පල්ලවය, උත්පලය, පද්මය යනාදි වස්තු වලින්, **අත්නෙත් වුවන් ඈ** – හස්තය, නෙත්‍රය, වක්ත්‍රය යනාදිය, **කැරැ** – නිර්මාණය කොට, **අතල ගලක් ලා** – (අභ්‍යන්තරයෙහි) පැතුරුණු ගලක් බහා, **තෝ** – යුෂමත් තෙම, **මැවූ වන්** – මවන ලද්දෙකු වැන්න.

**විස්තර:**

i සිදුහත සිදුහත්හි වත් නො දිස්නේ නො දිස්නේ
මෙනෙතුළ මෙ මහත් දුක් මිං නුවන්නෝ ලොබින් වූ,

අබඇටයක් ඇතුළත වූ ජලය වුවත් ඔබට පෙනෙ යි. ඔබ කෙරෙහි ලොභයෙන් හටගත් දුකින් වූ නෙත්‍රජලය (=කඳුළු) නො පෙනෙන්නේ ය යි කීමෙන් කඳුළු දුක දුකත් නො දක්නාකු මෙන් සිටින බව හඟවයි. අබළුව ඉතා කුඩා දෙයකි. එහි වූ ජලය දක්නේ සූක්ෂම දෘෂ්ටියෙනි. බුදුහු පියවි මසැසින් හාත්පස යොදුනක් ඇතුළත වූ ඉතා සියුම් වූ හෝ මහත් වූ සියලු දේ දවල් හෝ රාත්‍රියෙහි දක්නට සමර්ථ වෙති, එහෙයින් මෙසේ කීයේය. එබන්දකු විසින් වැගිරෙන කඳුළුධාරාවත් නො දක්ම නො විය හැක්කකි. කඳුළු දුසැ දුකත් තමන් නො සනහා සිටින බැව් දත්. හෙයින් ම මරගනෝ වක්‍ෂ්‍යමාණාකාරය ද කීහු.

ii පලුපුල සියපත් ඇ වත්හි අත්නෙත් වුවත් ඇ
කැරැ අතළ ගලක් ලා තෝ මැවූ වන් එ සිව්වත්,

මේ ඔබගේ අත් බාල පත්‍ර මෙන් මෘදු ය. නෙත්‍ර නිල් මහනෙල් මෙන් පියකරු ය. මුහුණ පියුමක් මෙන් මනොහර ය. මෘදු ය. එහෙත් හෘදයාදි අභ්‍යන්තරය නම් පැතුරුණු මහ ගලක් වැනි ම ය – අතිශයින් දෘඪ ය යි කී අයුරු යි. ඔවුන්ගේ කඳුළු දුකත් සනහන්නට නො අං හෙයින් සිත දෘඪ ය යි හැඟෙනෙන් මෙසේ කීහ.

**බ්‍රහ්මයා** ලොකය ද සත්වාදි සියලුදේ ද මවනැ යි බ්‍රහ්මභක්තිකයින්ගේ තර්කණය යි. එහෙයින් 'සිව්වත් තෝ මැවූ වන්' යි කීහ. කවි සමයෙහි දී සෙසු භක්තිකයන් විසිනුදු තම අදහස් හැඟවීම පිණිස බ්‍රහ්මනිර්මාණය ගන්නා ලැබේ.

**ටිප්පනී:**

1. **සිදුහත** – බුද්ධත්වය ලැබූ පසුත් පෙර නමින් ඇමතූ අයුරු යි

2. **සිදුහත්හි** – 'සිදුහත්' යනු පුදුඅබවලට ද නමි. එහි වූ ජලයක් සඳහන් කරන හෙයින් අබළුව හෙවත් අබපියල්ල මෙයින් ගන්නා ලදැ යි දත යුතු.

**ගුත්තිලයෙහි:-**

"අබළුවකින් පම ණ – නො කළැකි දිය සෙ සතර ණ"
යන තන්හි මෙනි.

3. **දිස්නේ** – 'දිස්' ධාතු කෙරෙන් 'නා' ප්‍රත්‍යය ව කර්මකාරක යෙහි සිද්ධ කෘදන්ත නාමයා කෙරෙන් පළමු වන විබත් එකබස් 'ඒ' ප්‍රත්‍යය යෙදී සිද්ධ යි.

4. **තුළ** – 'උතුරු' ධාතුවෙන් 'උතුළ' යි කර්තෘ කාරක කෘදන්ත පදය ලැබේ. එය ම 'නත්' ආදියෙහි මෙන් පූර්වවර්ණයට ලොප් කිරීමෙන් 'තුළ' යි වී.

5. **දුක්** – දුකින් වූ නුවන්තෝ = දුක්නුවන්තෝ යැයි එක් සමාස පද යක් කොට සැලකිය හැකි ව තුබූ නමුත් 'මා' යනු මධ්‍ය විරාමත් එසේ නො සැලකිය හැකි ව තිබේ. එහෙයින් 'දුක්' යනු ප්‍රකෘතියෙන් සිට කරණ විබත් අරුත් පවසතැයි දත යුතු.

6. **නුවන්තෝ** – කඳුළු. නුවන්හි තෝ = නුවන්තෝ.

7. **පලුපුල සියපත්** – පලු+උපුල්. පලු ද උපුල් ද = පලුපුල්. පලු පුල් ද සියපත් ද = පලුපුල්සියපත්. ද අරුත් සමස්. පලුපුල් යනු පලුපුල යි ස්වරාන්ත වූයේ වෘත්තය රැකීම පිණිස යි. සමාසයෙහි දී පූර්වපද ප්‍රකෘති යෙන් ම සිටිය යුතු වුවත් වෘත්තභේද, සුඛෝච්චාරණ පිණිස ඇතැම් විට වෙනස් වේ.

සියක් (= බොහෝ) පත් ඇත්තේ = සියපත්. මෙහි සිය සද රාශිභේද වාචක ය.

8. **අතුළු** – 'අතුරු - ඇතිරීමෙහි' ධාතුවෙන් කර්ම සාධ්‍ය කාරක ද්වයට සම වූ කෘදන්තය 'අතුළු' යි ලැබේ. 'අතළු' යනු පිළිපෙරළියෙන් වී. මෙහි සාධ්‍යකාරකයෙහි වේ.

9. **මැවූ** – 'මව' ධාතුවෙන් කර්ම සාධ්‍ය කාරකද්වයට සාධාරණ ව සිද්ධ කෘදන්ත යි. මෙහි කර්මකාරකයෙහි යි.

10. **සිව්වත්** – බ්‍රහ්මයා. හේ මුඛ සතරක් ඇත්තෙන් එනම් වී ල.

**36.** **මල්හී මල්හි බිඟු තුඬග ලී සල් හි වල් හි විසල් වූ**
**නිල්හී නිල්හී සිසිකත දි ලී සෙල්හි මුල් හි ගඟුල් වී**
**පුල්හී විල්හි වැද නලඹලේ සෙල්හි සෙල්හි සොකා වී**
**මල්හී මල්හි* ස සරසුන ලී කල්හි කල්හි ම වෙද්ද.**

**අන්වය හා පදාර්ථ:** **විසල් වූ** – මහත් වූ, **වල්හි** – අරණ්‍යයන්හි, **සල්හි** – ශාලද්‍රුමයන්හි, **මල්හී මල්හි** – පුෂ්පයක් පාසා, **බිඟු** – භෘඞ්ග තෙම, **තුඬග ලී** – චඤ්චුවග්‍රය බැහී ය. **නිල්හී නිල්හී** – නිල් වන ලැහැබ්හි, **සිසිකත** – චන්ද්‍රකාන්තිය, **දිලී** – බැබලිණ, **සෙල්හි මුල්හි** – පර්වත පාදයන්හි, **ගඟුල් වී** – ගඞ්ගාජලය විය. **පුල්හි විල්හි** – පුෂ්පිත තඩාගයන්ට, **වැද** – ප්‍රවිෂ්ට ව, **නල** – මාරුතය, **අඹලේ** – ආවර්තිතය වී ය. **සෙල්හි සෙල්හි** – පර්වතයක් පාසා, **සොකා වී** – මයූරනාද විය. **මල්හී** – අනඞ්ග තෙම, **ස සරසුන** – ස්වකීය ශරාසනයෙහි (= දුන්නෙහි), **මල්හි** – පුෂ්පබාණයන්; **ලී** – බැහී. **කල්හි කල්හි ම** – කාන්තාවන් හා සඞ්ගමයට යෝග්‍ය කාල යෙහි ම, **වෙද්ද** – (මෙ කී කාරණයෝ) වන්නාහු නො වෙත් ද?

---

* නම සැරනලා.

**විස්තර :**

හැසිරෙන භෘඞ්ගයන් ඇති විකසිත පුෂ්ප, දීප්තිමත් චන්ද්‍රකාන්තිය, සිසිල් ජලධාරා, සිසිල් සුවඳ මඳනල, මිහිරි මයුරනාද යන **අනඞ්ගයා**ගේ පක්‍ෂචාරී මෙ කී දේ මෙකල්හි විද්‍යමාන ය. අනඞ්ගයා තමාගේ ලතාචාපයෙහි පියුම්, හෝපලු, මීඅඹ, දුසමන්, නිලුපුල් යන ශර පස බැහුයේ ය. හෙවත් පූර්වොක්ත පක්‍ෂචාරීන්ගෙන් බලය ලත් **අනඞ්ගයා** ජනයන්ගේ සිත්හි කාමොත්පාදය කෙරෙයි. අනඞ්ගයා පුෂ්පබාණයන්ගෙන් ජනයන්ගේ කාම චේතනා උපදවන බැවිනි. එහෙයින් මේ කාලය ඍද්ධි හා සඞ්ගතියට යෝග්‍ය කාලය නො වේ දෝ යි සර්වඥයන්වහන්සේ තමන් කෙරෙහි පොලඹවා ගැන්මට මාරදූතිකාහු විචාරත්.

**විපසනී :**

1. **මල්හි මල්හි** – හිනහා වූ පුෂ්ප, බමරුන්ගේ තුඩග ලීම් සංඛ්‍යාත ක්‍රියාවෙන් සම්බන්ධ කරනු කැමැත්තෙහි ද්විත්වය යි. **ක්‍රියා ගුණ ද්‍රව්‍ය** තුනින් කිසිවකින් සම්බන්ධ කරනු කැමැත්තෙන් මෙසේ කීම **වීප්සා**වෙහි ද්විත්ව නම්.

2. **නිල්හි** – 'නිලි' යි ඝන වනයට නම්. 'නිල්' යි නුග ගසට නම්. එයින් හෝ අවිශෙෂයෙන් සියලු ගසින් යුතු පෙදෙස කීම පිණිස යෙදූ සේ යි.

3. **සිසිකත** – චන්ද්‍රකාන්තිය යි.

4. **ගඟුල්** – ගඞ්ගාජලය. මෙහි වනාන්ත පර්වතයන්ගෙන් ගලා බස්නා ජලධාරාවන්ගේ ජලයට නම්. මෙහි නිර්ඣර (= ගඟුලැලි) කියන ලද නම් වඩා මැනවි. එහෙත් එඅරුත් දීමට 'ගඟුල්' ශබ්දයාගේ ශක්තියක් නැත. මෙහි උල්පත් වාචී උල් (=උඟල්) සද 'ජලය' යන අරුත් දෙයි.

5. **අඹලේ** – 'අඹර' ධාතුවෙන් කර්තෘ කම් කාරකාදවයට ගම ව 'අඹල' යි කෘදන්ත පදය ලැබේ. මෙහි කර්තෘකාරකයෙහි යි. පෙර විබත් එකබස් ගැන්මෙන් 'අඹලේ' යි වි ය.

6. **මල්හි** – මල් හි වූයේ යමෙකුම ද ගේ = මල්හි. අන්අරුත් සමස්.

7. **මල්හි** – 6 වන පද්‍යයේ 9 වන විපසනිය බලනු.

8. **සසරදුන** – (අනඞ්ගයාගේ) ස්වකීය දුන්න. එහි ලිය උක් දඬුවකි. දුනුදිය බිඟුවැලකි. ඒ **ලතාචාප** නම්. ස්වකීය යන අර්ථයෙහි 'ස' සද සිංහලයෙහි විරල ය. එහෙත් නො යෙදෙන්නේ නො වේ.

9. **වෙද්ද** – වෙත් ද. පරරූපසන්ධියෙන් සිද්ධ යි. ප්‍රශ්නාර්ථයෙහි 'ද' නිපාතය වෘත්තය පිණිස දීර්ඝ වී.

**සංලක්‍ෂ්‍යය :**

1. **වෘත්තය** – **මන්දාක්‍රාන්තා** නම්.

එහි ලක්ෂණ කීහ කෙදාරභට්ටයෝ
**වෘත්තරත්නාකරයෙහි:-**

"මන්දාක්‍රාන්තා ජලධිෂඩගෛර්ම්භෞ නතෞ තාද්ගුරූ චෙත්" ඊ.

(අන්තයෙහි ගුරු දෙකකින් යුක්ත වූ 'ම - භ - න - ත - ත' යන ගණයෝ වෙත් නම්, සතරකින් සයකින් සතකින් යති වේ නම්, ඒ මන්දාක්‍රාන්තා නම්)

වින්‍යාසය:- ⏑ ⏑ ⏑, ⏑ | — —, — — —, ⏑ | ⏑ —, ⏑ ⏑ —, ⏑, ⏑ |
යති යති යති.

**37. මනහර රසභව්වෙන් රූවිලස් නන් ලෙසින් පෑ**
**තෙපලන ඉති දෙව්දූ ඒ ගොයුම්ගොත් මහත්මා**
**සරණ සිරි සැඳෑ පෑ පත් සරානී කලානී**
**කොළෙ මුහුළු සුපුල් වූ වත් පියුම් ඒ කලුන්ගේ.**

**අන්වය හා පදාර්ථ:** **මනහර** – මනොඥ වූ, **රසභව්වෙන්** – ශෘඞ්ගාර රසයෙන් හා භාවයෙන් යුක්ත වූ, **රූ විලස්** – රූප විලාසයන්, **නන් ලෙසින් පෑ** – අනෙකාකාරයෙන් දක්වූ, **දෙව් දූ** – ඒ මාර (දිව්‍ය) දුහිතෘන්, **ඉති තෙපලන** – මෙසේ කියන කල්හි (ද), **ඒ ගොයුම්ගොත් මහත්මා** – ඒ ගෞතම ගොත්‍ර ඇති මහාත්මයන් වහන්සේගේ, **සරණ සිරි** – පාද තල ශොභා නමැති, **සැඳෑ පෑ** – සන්ධ්‍යා ප්‍රභාවට, **පත්** – පැමිණියා වූ, **සරා** – රාග සහිත වූ, **නී** – නභපඞ්ක්ති නමැති, **කලානී** – අභිනව චන්ද්‍ර තෙම, **ඒ කලුන්ගේ** – ඒ කාන්තාවන්ගේ, **සුපුල් වූ** – සුපුෂ්පිත වූ, **වත් පියුම්** – මුඛතාමරසයන්, **මුහුළු කොළෙ** – මුකුලිත කෙළේ සි.

**විස්තර:**

i මනහර රසභව්වෙන් රූවිලස් නන් ලෙසින් පෑ.

මරඟනන් කාමොද්දීපනය කරන ශෘඞ්ගාර රසයෙන් හා සිත්හි ඇති අදහස අඞ්ගවිලාසයෙන් හැඟවීම් සංඛ්‍යාත භාවයෙන් ද යුක්ත වූ, යම් යම් පුරුෂයන් ප්‍රිය කරන අයුරින් රූ විලස් එක්දහස් අටසියයක් මවා ගෙන පොලඹවා ගන්නට යත්න කළ හෙයින් මෙසේ කීහ.

ii සරණ සිරි සැඳෑ පෑ පත් සරානී කලානී
කොළෙ මුහුළු සුපුල් වූ වත් පියුම් ඒ කලුන්ගේ.

සන්ධ්‍යාකාලයෙහි පියුම් මුකුලිත වීම ස්වභාවයෙකි. කුමුදු විකසිත වීම ද එසේ මැ යි. සන්ධ්‍යාකාලයෙහි චන්ද්‍රයා උදා වේ. සන්ධ්‍යාවලාපටලයන්ගේ කාන්තියෙන් ද යුක්ත ය. එහෙයින් චන්ද්‍රයා පියුම් මුකුලිත කෙරෙමින් කුමුදු ප්‍රබුද්ධවනැ යි කිවිහු සලකති. එහෙයින් රක්ත වූ පාද තලයන්ගේ ශොභා නමැති සන්ධ්‍ය

ප්‍රභාවට පැමිණි නඛපඞ්ක්ති නමැති චන්‍ද්‍රයා ඒ භාග්‍යවතුන්ගේ මුහුණු මුකුලිත කෙළේ ය යි කීහ. ඉෂ්ටාර්ථ සිද්ධිය නො වූ විට මුහුණු මැලවේ. එහෙයින් බුදුහු මාරාඞ්ගනාවන් ව්‍යර්ථ වූ උත්සාහ ඇත්තන් කළහ යි කී අයුරු යි. පාද තල ශෝභාවෙන් යුක්ත නියපෙළ නමැති චන්‍ද්‍රයා මුවපියුම් මුකුලිත කෙළේ ය යි කීමෙන් බුදුහු තමන් වැඩහුන් යෝගීත්ව සුදුසු පද්මාසනය මාරාඞ්ගනාවන්ගේ වචන කාරණ කොට ගෙන වෙනස් කිරීම් මාත්‍රයකුදු නො කොට ඔවුන්ගේ යත්නය ව්‍යර්ථ කළහ යි හඟවති.

**විසඳනි :**

1. **රසභව්ෙවන්** – රසභවු + එන්. නාට්‍යයෙහි ශෘඞ්ගාර, හාස්‍ය, කරුණාදි රස නවයකි. නාට්‍යයෙහි දී ශෘඞ්ගාරාදි (= කාමරසාදි) ය උපදවන අවස්ථා එනම් වේ. මෙහි මරඟනන්ගේ රූ විලස් කාමෝත්පාදක හෙයින් (ශෘඞ්ගාර) රසයුක්ත ය යි කීහ. භාව නම් සිත්හි ඇති අදහස අඞ්ග විලාස යෙන් හැඟවීම යි.

2. **පෑ** – 'පා - දූක්වීමෙහි' ධාතුවෙන් කර්තෘකාරකයෙහි සිද්ධ කෘදන්ත යි. පරණ සන්නයෙහි 'පෑ - දක්වා' යි පූර්වක්‍රියාවක් ලෙස ගෙන අරුත් පවසා තිබේ. 'කා' ආදි ආකාරාන්ත ධාතුන්ගෙන් 'කෑ' යනාදි පූර්වක්‍රියා රූප නො ලැබේ. නමුත් **කාව්‍යශෙඛරයෙහි** "දත් කැකුළු **පෑ ලා** - සුරතල් සිනා සී ලා" යන තන්හි 'පෑ' යි පෙර කිරියක් දක්නා ලැබේ. එහෙත් එය 'පා ලා' යයි විය යුතු ද?, නැතහොත් 'දන්තකුඞ්මලයන්ගේ **ප්‍රභාවෙන්** යුක්ත කොට' ය යි අරුත් ගත යුතු ද යනු පිරික්සිය යුතු. ඒ කෙසේ වුවත් පෑ යි පූර්වක්‍රියාවක් **සද්ධර්මරත්නාවලි** ආදි ග්‍රන්‍ථයන්හි දක්නා ලැබේ.

3. **ගොයුම්ගොත්** – බුදුහු ගොත්‍රයෙන් ගෞතම නම් වෙති.

4. **මහත්මා** – 'මහාත්මන්' ශබ්දයෙන් සිංහලට ගත් අයුරු යි.

**රුවන්මලෙහි ද :-**

"නමව් කුලුණෙන් බැස - ඛියකරු සසර සයුරේ
බමන මුළු සත්වග සෙත් - කොළඹට අලෙ **මහත්මා**" යි.

5. **සැඳෑ පෑපත්** – සැඳෑහි පෑ = සඳෑපෑ. සැඳෑපෑයට පැමිණියේ සැඳෑපෑපත්. විබත් සඟිස් ගැබ් විබත් සමස්.

6. **සරා** – රා සහ වූයේ = සරා. අන් අරුත් සමස්. 'රා' යි මෙහි රත්න වර්‍ණයට නමි.

7. **කලානී** – කලානිධි (= චන්‍ද්‍රයා)හට නමි. කලා යි චන්‍ද්‍රයාගේ සොළොස් වන භාගයට නමි, එම කලාවන්ට ආධාරස්ථාන හෙයින් චන්‍ද්‍රයා 'කලානිධි' නම් වේ.

8. **වත් පියුම්** – වත් ම පියුම් = වත්පියුම්. නඛ පඞ්ක්තිය චන්‍ද්‍රයා ය යි රූපණය කොට ගත් හෙයින් වක්‍ත්‍ර පද්ම ය යි රූපණය කළහ.

**38. දසනුදෙස රුපුන් කැන් මේ ලෙසින් මේ ලෙසින් යත්**
**විමලඹර කලානී මෙන් ගගන් කැන් සහස් නෙන්**
**සැණකෙළි කෙළනා වූ නන් දෙසින් නන් වෙසින් ආ**
**අසුර සුර දහස්නෙන් ඒ තිලෝනා බිජී ලෙව්.**

**අන්වය හා පදාර්ථ :** **රුපුන් කැන්** - ශත්‍රු සමූහයා, **දසනු දෙස** - දිශානුදිශාවන්හි, **මේ ලෙසින්** - උක්තප්‍රකාරයෙන්, **මේ ලෙසින්** - මේඝයක් මෙන්, **යත්** - පහ ව යන කල්හි, **විමලඹර** - නිර්මල වූ ආකාශයෙහි, **ගගන් කැන් සහස්නෙන්** - තාරකා සමූහ සහස්‍රයන්ගෙන් උපලක්ෂිත වූ, **කලානී මෙන්** - චන්ද්‍රයා මෙන්, **සැණ කෙළි කෙළනා වූ** - උත්සව ක්‍රීඩා කරන්නා වූ, **නන් දෙසින්** - අනේක දිශායෙන්, **නන් වෙසින්** - අනේක වේශයෙන්, **ආ** - පැමිණියා වූ, **අසුර සුර සහස්නෙන්** - දානව අමර සහස්‍රයන් කාරණ කොට ගෙන, **ඒ තිලෝනා** - ඒ ත්‍රෛලෝක්‍ය නායකයන් වහන්සේ, **ලෙව්** - ලෝකයෙහි, **බිජී** - භ්‍රාජමාන වූ සේක.

**විස්තර :**

මේඝයන් පහ ව යන කල්හි නිර්මල වූ ආකාශයෙහි තාරකා සහස්‍රයන්ගෙන් උපලක්ෂිත වූ චන්ද්‍රයා අතිශයින් බබළන්නට පටන් ගනී. එ මෙන්, පැමිණ සිටි මාරයා ප්‍රමුඛ ශත්‍රු සමූහයා දිශානුදිශාවන්හි පලායන කල්හි උත්සව ක්‍රීඩා කෙරෙමින් නොයෙක් දිශායෙන් විවිධ උත්සව වේශයෙන් පැමිණියා වූ බොහෝ වූ අසුරයන් හා දෙවියන් කාරණ කොට ගෙන බුදුහු ලෙව්හි බැබළුණාහ.

**ටිප්පනී :**

1. **දසනුදෙස** - දස ද අනුදෙස ද = දසනුදෙස. ද අරුත් සමස්. දස නම් නැගෙනහිර, බස්නාහිර, උතුර, දකුණ යන ප්‍රධාන දිශා සතර යි. අනු දෙස නම් නිරිත, ගිනි, වයඹ, ඊසාන යන සතර මහ දික් අතර පිහිටි දිශාවෝ යි.

2. **මේ** - මේඝයට නමි.

3. **ලෙසින්** - ලෙස + ඉන්. ලෙස යනු උපමාද්‍යෝතක ශබ්දයෙකි.

4. **යත්** - 'යා' ධාතුවෙන් සිද්ධ කාලාර්ථයෙහි අසම්භාව්‍ය ක්‍රියා යි.

5. **විමලඹර** - විමල වූ අඹර = විමලඹර, එහි විමලඹරෙහි. වෙසෙස සුන් සමස්.

6. **සැණකෙළි** - සැණෙහි කෙළි. උත්සව වාචී 'ඡණ' ශබ්දයෙන් සැණ යි සිද්ධ යි.

7. **කෙළනා** - ක්‍රීඩා කිරීමෙහි 'කෙළ' ධාතුවෙන් කර්තෘකාරක යෙහි 'නා' ප්‍රත්‍යය ව සිද්ධ කෘදන්ත පද යි. ....

8. **නන්වෙසින්** – උත්සව ක්‍රීඩා පවත්වනු පිණිස ශක්‍රාදීන් හත් අසුරින් සැරසී ආ හෙයින් ඒ සැරසුණු අයුරු ම වෙහි විවිධ වේශය යි කීහ.

9. **තිලෝනා** – කාම, රූප, අරූප හෝ ස්වර්ග, මර්ත්‍ය, පාතාල යන ලෝකත්‍රයට අසහාය නායක හෙයින් බුදුහු තිලෝනා නම් වෙති.

10. **බිජී** – බැබළුම්හි 'බජ' යන අකර්මක ධාතු කෙරෙන් 'ඊ' විබත් යෙදී සිද්ධ අතීත කාලික ප්‍රථම පුරුෂ ඒකවචන ක්‍රියා යි.

**මුවදෙව්දාහි :–**

"අතේ නුවර දෙලෙනු - දුළු දඹදිව් තල විමල්
සුවත් පියුමැත් කෙමි එව් - බිජී මියුරු නුවර නම්"

යනාදි තන්හි මෙනි.

**39. නන් දික් යත් මුරු රැස් අලව් රජගහා ඈ ලෙව්**
**මහත් නන්පුරේ**
**නන් නන් දික්හි නිකුත් මහත් යස තෙදැත් මිපල්හු**
**මෙන් නන් රුපුන්**
*** බින්මින් මන් එ අලව් නලාගිරි අඟුල්මල් ඈ රුපුන්**
**රැස් මහත්**
**සිව්සස් වත් දෙසමින් දනාහට වසත් සව්නේ ගෙවා**
**දත් සුගත්.**

**අන්වය හා පදාර්ථ :** **මුරුරැස්** – (උත්සව පූජාව පිණිස පැමිණි යා වූ) දෙව සමූහයා, **නන් දික් යත්** – පූජාවසානයෙහි ඒ ඒ දිගට ගිය කල්හි, **අලව් රජගහා ඈ** – ආලවකය රාජගෘහය යනාදි වූ, **ලෙව්** – ලොකයෙහි, **මහත්** – උතුම් වූ, **නන්පුරේ** – අනෙක පුර යන්හි වූ, **නන් රුපුන්** – අනෙක ශත්‍රූන්ට, **නන් නන් දික්හි** – නොයෙක් නොයෙක් දිශාවන්හි, **නිකුත්** – නිෂ්ක්‍රාන්ත වූ, **මහත්**– මහත් වූ, **යස තෙදැත්** – කීර්ති හා තේජස් ඇති, **මිපල්හු මෙන්** – මහීපාලයක්හු බඳු ව, **එ අලව්** – ඒ ආලවකය, **නාලාගිරි** – නාලාගිරිය, **අඟුල්මල් ඈ** – අඞ්ගුලිමාලය යනාදි වූ, **මහත් රුපුන් රැස්** – මහත් වූ ශත්‍රු සමූහයාගේ, **මන්** – මානය, **බින්මින්** – භග්න කෙරෙමින්, **දනාහට** – මහාජනයානට, **සිව්සස්වත්** – චතුරාර්ය සත්‍ය සම්මිශ්‍ර කථා වස්තූන්, **දෙසමින්** – දේශනා කෙරෙමින්, **සව්නේ** – සකලඥෙය මණ්ඩලය, **ගෙවා** – කෙළවර කොට, **දත්** – ජානනය කළා වූ, **සුගත්** – තථාගතයන් වහන්සේ, **වසත්** – වාසය කරණ කල්හි,

* බුන්මින් – මුද්‍රිත.

**විස්තර :**

ඒ රැස් වූ දෙව සමූහයා උත්සවාවසානයෙහි ඒ ඒ දිශාවන්ට ගිය කල්හි **ආලවක රාජගෘහාදි** නොයෙක් පුරයන්හි දී, සතුරන්ගේ මත් සිඳලන්නා වූ මහීපාලයකු මෙන් **ආලවක** යක්ෂ **නාලාගිරි** හස්ති **අඞ්ගුලිමාල** චෞරාදි සතුරන්ගේ මත් බිඳිමින් මහාජනයාහට චතුරාර්ය සත්‍යයන් දේශනා කෙරෙමින් තථාගතයන්වහන්සේ වසන කල්හි, (අනන්තර පද්‍යය හා සම්බන්ධ යි.)

**ටිප්පනී :**

1. **යත්** – 'යා - ගමනෙහි' ධාතුවෙන් සිද්ධ කාලාර්ථ අසම්භාව්‍ය ක්‍රියා යි. ගිය කල්හි යයි අරුත් ගත යුතු. "උරදු කල් කරන ඔහුනි නතපා රදවන්" යන තන්හි මෙහි.

2. **මුරැරැස්** – මුරුන්ගේ රැස් = මුරුරැස්. මුරු යනු දෙවියන්ට නමි.

3. **අලව්** – **ආලවක** නම් රට **ආලවක** නම් රජහට වාසස්ථාන ව පැවති එනම් රාජධානිය.

4. **රජගහා** – මගධ දේශාධිපති වූ 'බිම්බිසාර' නම් නරදෙවයාට වාසස්ථාන ව පැවති එනම් රජධානිය.

5. **නන්පුරේ** – නන්පුර+ඒ. අදර විබත් එකබස යි. මෙහි බහුවචනයක් කිවමනා හෙයින් බහුවචනය යොදන ලද නම් මැනවි.

6. **මීපල්හු** – මිය පල්හේ = මීපල්. සත් විබත් සමස්. මේ උපමානය හා සම්බන්ධ උපමෙය වූ සුගත් යනු අදර විබත් හෙයින් මෙ ද අදර විබති.

7. **බින්මින්** – 'බිඳ' ධාතු කෙරෙන් මින් ප්‍රත්‍යය යොදා 'බිඳිමින්' යි කිය යුතු තන්හි වෘත්තභේදය පිණිස ඌන මාත්‍රයට මත් වැඩි කොට, ද කාර ලොපයෙන් තනා ගත් රූපයෙකි. මෙහි 'නස්මින්' ආදි පදයක් යොදන ලද නම් මැනවි.

8. **අලව්** – අලව් රට අසල අරණ්‍යයෙහි වාසය කළ අති රෞද්‍ර යක්ෂයෙකි. **හස්තාලවක** කුමාරයා කෙරෙහි හා ඔහු කෙරෙහි ද කාරුණ්‍යයෙන් උත්සාහවත් වූ බුදුහු අලව්යකුගේ විමනට හුදකලා ව වැඩියහ. එවිට **අලව්** යකු විමන නො සිටියෙන් ඔහුගේ භාර්යාදීන්ට දහම් දෙසූහ. පසු ව සිය දෙරටු පාල **'ගද්‍රභ'** නම් තැනැත්තහුගෙන් මෙ පුවත දත් **අලව්** යක් තෙම කොපාග්නියෙන් දිලිහී අවුත් මහ යුද කොට පරදවා ගත නො හී පසු ව තම පරපුරෙන් ආ **'කිංසුධ විත්තං පුරිසස්ස සෙට්ඨං'** යනාදි ප්‍රශ්න විචාර බුදුන් ඒ සියල්ල විසඳූ පසු පැහැද දහම් අසා සෝවාන් ව උපාසකයෙක් වී. මේ දිග්මාත්‍රයෙකි. මෙසෙයින් බුදුහු ආලවකයාගේ මත් බිඳ ලූහ.

9. **නාලාගිරි** – 'නාලාගිරි' යි කිය යුතු තන්හි වෘත්තයාගේ අභේදය පිණිස මෙසේ කීහ. **නාලාගිරි** නම් **දෙව්දත්**හුගේ උපදෙශයෙන් **අජාසත්** රජහු විසින් බුදුන් මරනු පිණිස රා පොවා මත් කොට උන්වහන්සේගේ අභිමුඛයට මෙහෙයවන ලද හස්ති රාජයා යි. හෙතෙම මත් ව කොපාග්නියෙන් දිලිහී හමු වූවන් මරමින් ගොස් බුදුන්ගේ මහා මෛත්‍රියෙහි ආනුභාවයෙන් මද සිඳී දමිත ව බුදුන් සරණ ගියේ ය. දමිත වූවායින් පසු ඒ ඇත් තෙම **'ධනපාල'** නාමයෙන් ද ප්‍රසිද්ධ වී.

10. **අඟුල්මල් – අඞ්ගුලිමාල** නම්:- කොසොල් රට බ්‍රාහ්මණයකුගේ පුත්‍රයෙකි. හෙතෙම කුඩා කල ශාස්ත්‍ර උගැන්ම පිණිස **තක්සලා** පුර ගොස් සවබුද්ධිප්‍රභාවයෙන් සෙසු සියලු ශිෂ්‍යයන් පරදවා වහා ශාස්ත්‍ර උගත්තේ ය. මෙය ඉවසිය නො හැකි වූ ශිෂ්‍යයෝ කේලාම් කියා ආචාර්‍ය්‍යයා බිඳුවා ලූහ. ආචාර්‍ය්‍යයෝ 'මොහු කවුරුන් ලවා හෝ මරවමි' යි සිතා 'ඇඟිලි දහසක් ගුරුපඬුරු වශයෙන් ගෙනවුත් දී සියරටට යව' යි කීහ. දැඩි ගුරුභක්තිය ඇති හෙතෙම එතැන් පටන් වන මාර්ගයෙහි රැක සිට මිනිසුන් මරා ඇඟිලි එකතු කරන්නට පටන් ගත්තේ ය. ඔහු සිය නම අස්වා කඩුව ගෙන ලුහුබඳිනා සඳ භීතියෙන් කම්පිත ව මුහුණින් නො හී සිටිය හැකි කිසිවෙක් නො විය. කලින් තමා රැස් කළ ඇඟිලි කපුටු ආදීන් විසින් ගෙන යන ලදු ව නැති වූ හෙයින් පසු ව රැස් කළ ඇඟිලි නැති නො වනු පිණිස ලනුවක බැඳ මාලාවක් මෙන් කර පැළඳ ගත් හෙයින් '**අඞ්ගුලිමාල**' නම් වී. පසු කලෙක ඔහු කෙරෙහි අනුකම්පාවෙන් ඒ වනයට වැඩි තථාගතයන් වහන්සේ මරා ඇඟිල්ලක් ගනිමි යි ලුහු බැඳ එන විට උන්වහන්සේ ප්‍රාතිහාර්‍ය්‍යයෙන් හා ධර්‍මය දෙශනා කිරීමෙන් ද ඔහු දමනය කළහ. හෙතෙම පැහැද පැවිදි ව රහත් වී.

11. **සිව්සස්වත්** – සිව් සස් ම වත් = සිව්සස් වත්. සිව්සස් නම් ජාති ජරා ආදි සියලු දුඃඛ ලක්‍ෂණ වූ **දුඃඛ සත්‍යය**, ඒ දුඃඛය ඇති කරන හෙයින් සමුදය නමින් දන්නා ලද **සමුදය සත්‍යය**, ඔවුන් දෙදෙනාගේ ම අභාවය කරන ශාන්ත සුඛ ලක්‍ෂණ **නිරෝධ සත්‍යය**, ඒ නිරෝධය ලබා ගැනීම පිණිස පිළිපැදිය යුතු ආකාරය වූ **මාර්ග සත්‍යය** යන මේ සතර යි.

12. **සව්නේ** – දත යුතු සියලු ධර්‍ම. සංස්කාර, විකාර, නිර්‍වාණ, ලක්‍ෂණ, ප්‍රඥප්ති යන පසෙහි දත යුතු සියලු ධර්‍ම සංග්‍රහ වේ.

13. **සුගත්** – බුදුහු යහපත් වූ නිවනට පැමිණීම් ආදි අර්‍ථයන්ගෙන් සුගත් නම් වෙති. මේ ප්‍රකෘතියෙන් සිට 'වසත්' යන කාලාර්‍ථ අසම්භාව්‍ය ක්‍රියාවට කර්‍තෘ වන හෙයින් කර්‍තෘ විභක්තිය සෙවුනේ යි.

**සංලක්‍ෂ්‍යය:**

1. **වෘත්තය – ශාර්දූල වික්‍රීඩිත** නම්.

**40. * ජ් සව්නේ අපි දත්මහ යි ලොවුතුරු දමක් සතන්හි නැතත්**
**නන් දික්හි කියමින් දනා සගනිමින් ගන්මින් අමින් වෙස් දහස්**
**රැස් වූ තිත් වග බස් අසා නොසිවසා මිපල් කොසොල් ගොස් සකුස්**
**දේනා නම් වෙහෙරේ සුගත්හට මෙ වී පාමුල් මුදුන් මල් කොපින්.**

---

* ජ සව්නේ ගෙවමින් දහම් ලොවුතුරු දම්හයි සතන්හි නැතත්. මුද්‍රිත පොත්

**අන්වය හා පදාර්ථ:** **ඒ සව්නේ** – ඒ සකලදේශ මණ්ඩලය, **අපි දත්මහ යි** – අපි ජානනය කළම්හ යි, **ලොවුතුරු දමක්** – නවලෝකෝත්තර ධර්මයක්, **සතන්හි** – සන්තානයෙහි, **නැතත්** – නැත්තේ වී නමුත්, **නන් දික්හි** – නානා දිශාවන්හි, **කියමින්** – ප්‍රකාශ කෙරෙමින්, **දනා සඟනිමින්** – ජනසංග්‍රහය කෙරෙමින්, **අමින් වෙස් දහස්** – අපරිමිත වේශ සහස්‍රයන්, **ගන්මින්** – ග්‍රහණය කෙරෙමින්, **රැස් වූ** – රාශිභූත වූ, **තිත්වග** – තීර්ථක සමූහයාගේ, **බස් අසා** – වචනයන් ශ්‍රවණය කොට, **නො ඉවසා** – ක්ෂමා නො කොට, **කොසොල් මිපල්** – කොශල රජතෙම, **සකුස්** – වහා, **ගොස්** – ගමනය කොට, **පාමුල්** – ශ්‍රීපාද මූලයන්, **මුදුන් මල් කොටින්** – මුදුන් මල් කොට (= වැඳ), **දෙනා නම් වෙහෙරේ** – ජේතවන නම් විහාරයෙහි (විසූ), **සුගත් හට** – සර්වඥයන් වහන්සේට, **මෙ** – මේ ප්‍රවෘත්තිය, **වී** – කථනය කෙළේ ය.

**විස්තර:**

i පාමුල් මුදුන් මල් කොටින්,

මේ තථාගතයන් වහන්සේගේ ශ්‍රීපාදද්වන්ද්වය හිසින් වැඳ ය යි කී අයුරු යි. පාමුල්හි හෙව වදින විට වදින්නහුගේ ශීර්ෂය වැඳුම් ලබන්නහුගේ පාද මූලයට ළං වේ. එහෙයින් වැඳුම් ලබන්නහුගේ දෙපා වදින්නහුගේ හිසමත පැළඳි මුදුන් මල් කඩක් වැනි වේ. මුදුන් මල් නම් හිස මත පළඳිනා මාලා දමයෙකි. පාද මූලයන් මුදුන් මල් බඳු වනුයේ හිසින් වදින විට ය.

**විපසනී:**

1. **සව්නේ** – 39 වන පද්‍යයේ 12 වන විපසනිය බලනු.

2. **දත්මහ** – 'දත්' ධාතුවෙන් සිද්ධ අතීත කාලික උත්තම පුරුෂ බහුවචන ක්‍රියා යි.

3. **ලොවුතුරු දමක්** – ලෝකෝත්තර ධර්මයක්. සෝතාපත්ති, සකෘදාගාමි, අනාගාමි, අරහත්ත යන සතර මඟ හා එම සතර ඵල ආදිය ලෝකෝත්තර ධර්ම යි.

4. **සතන්හි** – සතන් නම් පරම්පරාව යි. පරම්පරා වශයෙන් පවත්නා හෙයින් සිතට ද සතන් යනු යෙදේ.

5. **සඟනිමින්** – සංග්‍රහ කෙරෙමින්.

6. **තිත්** – දෙසැට මිථ්‍යා වාදයෝ තීර්ථ නම්. ඒ මිථ්‍යාවාද ඇත්තෝ තීර්ථකයෝ යි.

7. **සකුස්** – ශීඝ්‍ර ව.

8. **පාමුල්** – පාද මූලයන්.

6. **මුදුන්මල්** – මුදුන්හි වූ මල් (= මාලාදමය) මුදුන් මල් නම්.

10. **කොට්ටින් –** 'කර' ධාතුවෙන් සිද්ධ පූර්ව ක්‍රියා රූපයෙකි. මෙ 'කත්වාන' ගත පූර්ව ක්‍රියා රූපයාගේ ආශ්‍රයෙන් නිපාතනා විධියෙන් පැමිණිය කැ යි ද සිතිය හැකි යි.

**සංලක්ෂ්‍යය :**

1. **වෘත්තය – ශාර්දූල වික්‍රීඩිත** නමි.

2. **පද්‍ය විභාගය –** මේ පූර්ව පද්‍යය හා සම්බන්ධ හෙයින් යුගමක නමි. කියන ලද මැ යි :-

"ද්වාභ්‍යාං තු යුගමකං ශ්‍රෙයම්" යි.

**41. මේ තුන් ලෝ නරඹා මහත් විනෙ දනා දක්මින්**
**ඔවුන් සෙත් නිසා**
**සත් සෙත් සිත් එවියත් සුගත් ගඩඹ රුක් මුල්හි**
**සැවැත්හි එකල්**
**දක්වම්හ යි තෙපලි යමා පෙළහරක් ඒ බස් එතිත්**
**රැස් අසා**
**කජ්වා නන් අඹ රුක් මුලින් ම * උපුරා දැම්මූ**
**සැවැත්හි වහා.**

**අන්වය හා පදාර්ථ :** **එකල්හි** – රජු එසේ දූත් වූ කල්හි; **මේ තුන්ලෝ** – මේ ලොකත්‍රය, **නරඹා** – නිරීක්ෂණය කොට, **මහත් විනෙදනා** – බොහෝ වූ වෛනෙය ජනයන්, **දක්මින්** – දර්ශනය කොට, **ඔවුන්** – ඒ වෛනෙය ජනයන්ට, **සෙත් නිසා** – උභය ලොකාර්ථය පිණිස, **සත් සෙත් සිත්** – සත්වයන්ගේ අභිවෘද්ධියෙහි සිත් ඇති, **එ වියත්** – ඒ ව්‍යක්ත වූ, **සුගත්** – සර්වඥයන් වහන්සේ, **සැවැත්හි** – ශ්‍රාවස්ති නගරයෙහි, **ගඩඹ රුක් මුල්හි** – ගණ්ඩම්බ වෘක්ෂ මූලයෙහි දී, **යමා පෙළහරක්** – යමල (මහා) ප්‍රාතිහාර්‍ය්‍යයක්, **දක්වම්හ යි** – දර්ශනය කරවම්හ යි, **තෙපලි** – වදාළසේක. **ඒ බස්** – ඒ වචනයන්, **එතිත් රැස්** – ඒ තීර්ථක සමූහයා, **අසා** – ශ්‍රවණය කොට, **සැවැත්හි** – ශ්‍රාවස්තී නගරයෙහි වූ, **නන් අඹ රුක්** – නොයෙක් ආම්‍ර ද්‍රැම, **වහා** – ශීඝ්‍ර ව, **මුලින් ම** – මුල් සහිත ව ම, **උපුරා දැම්මූ** – උත්පාටනය කරවූහ.

**විස්තර :**

i මේ තුන්ලෝ නරඹා මහත් විනෙදනා දක්මින් ඔවුන් සෙත් නිසා,

බුදුහු මහාකරුණාඥානයෙන් ලොව බලා හෙතු සම්පන්න වෛනෙය ජනයන්ට වන අභිවෘද්ධි දැක ධර්මදෙශනාදිය කරණ සේක. ගණ්ඩම්බ වෘක්ෂ මූලයෙහි යමල ප්‍රාතිහාර්‍ය්‍යය දක්වීම ද ලොකයාට හිත පිණිස ම කළ බව හැඟවීමට මෙසේ කීහ.

* උපුටා, මුද්‍රිත පොත්.

ii දක්වම්හ යි තෙපලී යමාපෙළහරක්,

යමක නම් දෙක යි. සිය සිරුරෙහි සියලු තැනින් දියකඳ හා ගිනිකඳ විහිදුවමින් බුදුරජාණන් වහන්සේ විසින් දෙඅසුරකින් දක්වන පෙළහර ද යමක ප්‍රාතිහාර්ය (= යමා පෙළහර) නම්. එ බඳු පෙළහරක් දක්වම්හ යි බුදුහු වදාළහ.

**ටිප්පනී:**

1. **නරඹා** – 'නරඹ' යන නිෂ්පන්න ධාතුවෙන් සිද්ධ පූර්ව ක්‍රියා යි.

2. **විනෙනදනා** – වෛනෙය ජනයා. ධර්ම දේශනාවෙන් හික්මවිය හැකි හෙතු සම්පන්න ජනයා.

3. **ගඩඹරුක්** – ගණ්ඩම්බ නම් වෘක්ෂය. ඒ වනාහි, කොසොල් රජහුගේ උයන් පල්ලා මිගුල් අඹරුකේ දිවිකුඩුවක අකල් මහ අඹයක් දැක 'රජුට දෙමි' යි ගෙන යද්දී මාර්ගයෙහි දී බුදුන් දැක උන්වහන්සේට පිදූයෙන් එය වැළඳූ තථාගතයන් වහන්සේ විසින් දෙන ලද අඹ ඇටය රෝපණය කිරීමෙන් එකෙණෙහි පැන නැඟි මහා ආම්‍ර වෘක්ෂයකි. 'ගණ්ඩම්බ' ශබ්දයෙන් 'ගඩඹ' යි ගත යුතු වුවත් සුඛොච්චාරණය පිණිස එක් ඌනමාත්‍රයක් ම ගන්නා ලැබේ. 'ගණ්ඩබ' යන්නෙන් 'ගඳඹ' යි පැමිණියාක් මෙනි.

4. **තෙපලී** – 'තෙපල' ධාතුවෙන් 'ඊ' ප්‍රත්‍යය ව සිද්ධ අතීත කාලික ප්‍රථම පුරුෂ එකවචන ක්‍රියා යි.

5. **යමා පෙළහරක්** – 'යමක පාටිහාරිය' ශබ්දයෙන් 'යමාපෙළහර' යි සිද්ධ යි. ජලකඳ හා ගිනිකඳ විහිදුවමින් දෙඅසුරකින් දක්වන ලද හෙයින් 'යමල ප්‍රාතිහාර්ය' නම් වී.

6. **කප්වා** – 'කප' ධාතුවෙන් සිද්ධ ප්‍රයෝජ්‍ය පූර්ව ක්‍රියා යි.

7. **උපුරා** – 'උපුර' ධාතුවෙන් 'ආ' ප්‍රත්‍යය ව සිද්ධ පූර්ව ක්‍රියා යි. මෙය 'මර' ආදි ධාතූන් මෙන් වරනැගේ. කෘදන්ත විෂයෙහි 'උපුල' ආදි වශයෙන් රූප ලැබේ.

8. **දැම්මූ** – දැම්මෙහි 'දම' ධාතු කෙරෙන් 'ඌ' ප්‍රත්‍යය හා ප්‍රයෝජ්‍ය 'ව' ප්‍රත්‍යය ද ධාත්වන්ත ලොප හා මත් වැඩි ද වී සිද්ධ යි.

9. **වහා** – ශීඝ්‍ර ව යන අර්ථයෙහි නිපාතයෙකි.

**42.** නංවා ගොස් මඩුවක් සඳ ඉඳුවරින් සැසි ම වාසි කියා
දක්වම්හ යි කියමින් අපින් පෙළහරක් හුන් කල්හි
ඒ තින් ගණ්ඩා
දක්මින් එක් පෙදෙසෙක්හි උන් ගජ කැලක් තොස්මින්
නිකුත් සෙල් කුලෙන්
දක්වා යි විලසක් *නිකුත් ය වෙහෙරින් දේනා
එතුන් ලෝතුමා.

---

* නිකුත් මැ. ඇතැම් මුද්‍රිත පොත්.

**අන්වය හා පදාර්ථ:** **ඒ තින් ගණා** - ඒ තීර්ථක සමූහයා, **සැසි ම** - සාහසික ව ම, **වාසි කියා** - වහසිබස් කියා, **ගොස්** - බුදුන් 'අසුවල් තැන දී පෙළහර පාම්හ' යි වදාළ ස්ථානයට ගොසින්, **මඩුවක්** - මණ්ඩපයක්, **නංවා** - තනවා, **ඉඳුවරින්** - ඉන්දීවර පුෂ්ප පත්‍රයෙන්, **සද** - සජ්ජිත කොට, **අපිත්** - අපි ද, **පෙළහරක්** - ප්‍රාතිහාර්යයක්, **දක්වම්හ යි** - දක්වන්නාමු ය යි, **කියමින්** - කථනය කෙරෙමින්, **හුන් කල්හි** - හුන්නා වූ කාලයෙහි, **එක් පෙදෙසෙක්හි** - එක් ප්‍රදේශයෙක්හි, **උන්** - හුන්නා වූ, **ගජ කැලක්** - හස්ති සමූහයක්, **දක්මින්** - දර්ශනය කොට, **තොස්මින්** - සන්තොෂ වෙමින්, **සෙල් කුළෙන්** - පර්වත කූටයෙකින්, **නිකුත්** - නිෂ්ක්‍රාන්ත වූ, **සි විලසක්** - සිංහ විලාසයක්, **දක්වා** - දර්ශනය කරවා, **එතුන් ලෝතුමා** - ඒ තුන්ලොවට උත්තම සර්වඥයන් වහන්සේ, **දෙනා වෙහෙරින්** - ජේතවන විහාරයෙන්, **නිකුත් ය** - නිෂ්ක්‍රාන්ත වූහ.

**විස්තර.**

i දක්වා සි විලසක් නිකුත් ය,

සිංහ රාජ තෙම හස්ති සමූහයක් දැක සතුටු ව අභීත ව ඔවුන් නැසීම පිණිස හුදකලා ව නික්මෙයි. තථාගතයන් වහන්සේ එ මෙන් තීර්ථකයන් දැක අභීත ව ඔවුන්ගේ මත් බිඳීම පිණිස නික්මුණු බව හැඟවීමට 'සි විලස් දක්වා' යි කීහ.

**ටිප්පනී :**

1. **නංවා** - 'නග' ධාතුවෙන් 'අං' ප්‍රත්‍යය හා ප්‍රයෝජ්‍ය 'ව' ප්‍රත්‍යය ව සිද්ධ පූර්ව ක්‍රියා යි. ධාතුහුගේ 'ග' කාරයට ලොප් කිරීමෙන් හා ඌනමාත්‍රයට මත් වැඩීමෙන් 'නංවා' යි සිද්ධ යි.

2. **මඩුවක්** - මණ්ඩපයක්, බොහෝ ජනයන්ට රැස් විය හැකි සේ තනන ශාලාවක්.

3. **ඉඳුවරින්** - ඉන්දීවර, මහනෙල්. මෙහි මහනෙල් මල්පෙති වලින් යි අරුත් ගත යුතු.

4. **වාසි** - 'මෙසේ පරදවම්හ, මෙසේ ජය ගනුම්හ' ආදි වශයෙන් තම සමර්ථකම් ප්‍රකාශ කරන වචන.

5. **පෙළහරක්** - ප්‍රාතිහාර්යයක්. සෘද්ධිබලයෙන් කරනු ලබන ආශ්චර්ය ක්‍රියා විධි පෙළහර නම්.

6. **සෙල්කුළෙන්** - සෙල්කුළු + එන්. සෙල්හුගේ කුළු = සෙල්කුළු. කුළු නම් මුදුන් පෙදෙස යි.

7. **නිකුත් ය** - 'නිකුත්' යන කෘදන්ත රූපයා කෙරෙන් ව්‍යාඛ්‍යාව සෑත ය නිපාතය යෙදී සිද්ධ යි.

43. දක්මින් ඒ උතුමා ගෙනා අඹ පලක් දුන්නේ උයන්පල්
එකල්
ගන්මින් ඒ බුදිමින් බිජුත් බගු ලවා ඉන්දු ම හුන්කල්හි
කල්
දිස්නා ලෙස් එවිගස් නැගෙත් ගඩඹ රුක් නන් දික්
නිකුත් සාඛියෙන්
මල් පල්ලෙන් සසිරි දකිමිනි දනරැස් රැස් වූ අවුත්
නන් දෙසින්.

**අන්වය හා පදාර්ථ:** **එකල්** – එසමයෙහි, **උයන් පල්** – කොසොල රජහුගේ උද්‍යාන පාලතෙම, **ඒ උතුමා** – මාර්ගයෙහි වඩනා මුනීන්ද්‍රොත්තමයා, **දක්මින්** – දර්ශනය කොට, **ගෙනා** – තමා විසින් ගෙනෙන ලද, **අඹපලක්** – ආම්‍ර ඵලයක්, **දුන්නේ** – දානය කෙළේය. **ඒ** – ඒ ආම්‍ර ඵලය, **ගන්මින්** – ග්‍රහණය කොට, **බුදිමින්** – වළඳා, **බිජුත්** – අඹඇටයත්, **බගු ලවා** – ඒ උද්‍යාන පාලයා ලවා, **ඉන්දු ම** – ඉඳුවා ම, **හුන් කල්හි** – වැඩ සිටි කල්හි, **එවිගස්** – ඒ ක්ෂණයෙහි, **නන් දික් නිකුත්** – නානා දිශාවන්ට නික්මුණු, **කල්** – මනොඥ වූ, **සාඛියෙන්** – සියගණන් ශාඛාවන් ගෙන් උපලක්ෂිත වූ, **මල් පල් ලෙන් සසිරි** – පුෂ්ප හා පල්ලවයෙන් සශ්‍රීක වූ, **ගඩඹ රුක්** – ගණ්ඩම්බ නම් වෘක්ෂය, **දිස්නා ලෙස්** – දෘශ්‍යමානාකාරයෙන්, **නැගෙත්** – උද්ගත වත් ම, **දකිමිනි** – ඒ දකිමින්, **දන රැස්** – ජන සමූහයා, **නන්දෙසින්** – අනෙක දිශාවෙන්, **අවුත්** – ආගමනය කොට, **රැස් වූ** – රාශිභූත වූහ.

**විස්තර:**

**රජගහ** නගරයෙහි සිට **ශ්‍රාවස්ති** නගරයට වැඩි තථාගතයන් වහන්සේ වෙත එළඹ පෙළහර පාන්නට 'මම මඩුවක් කරවන්නෙමැ' යි කියා ඊට අවසර ඉල්වූ **කොසොල්** රජුට 'මහරජ, කම්නැත. මට මඩු සදන්නෝ ඇතැ' යි වැලකූ තථාගතයන් වහන්සේට මහා මාර්ගයේ දී හමු වූ කොසොල් රජුගේ **ගණ්ඩ** නම් උද්‍යාන පාල තෙම, රජුට දෙමැ යි තමා ගෙන ආ අඹ ඵලය උන්වහන්සේට පිදී.

**ආනන්ද** ස්ථවිරයන් වහන්සේ විසින් ඒ අඹ ඵලයෙන් සකස් කොට පිළි ගැන්වූ පානය බුදුහු වැළඳූහ. ඉක්බිති අඹ ඇටය ඒ උද්‍යාන පාලයා ලවා ම රෝපණය කරවා ඒ මත අත දෙවූහ. එකෙණෙහි පංචමහා ශාඛාවකින් හා පුෂ්ප ඵලාදීන් ගෙබි පනස් රියන් අඹරුකක් පැන නැංගේ ය. භික්ෂූන් හා මහජනයා එයින් ම ඉදුණු අඹ ඵල අනුභව කළහ. ඒ ආම්‍ර වෘක්ෂය දකිමින් බොහෝ ජනයා රැස්වූහ. කොසොල් රජ ආරක්ෂා සංවිධානය කෙළේය. ගණ්ඩ නම් උද්‍යාන පාලයා විසින් රෝපණය කරන ලද හෙයින් 'ගණ්ඩම්බ' නම් වී.

මේ වෘත්තාන්තය ඉතා සැකෙවින් දක්වනු කැමැති ආචාර්ය පාදයෝ "දක්මින් ඒ උතුමා" යනාදි පද්‍යය කීහ.

**විපසනී :**

1. **දුන්නේ** – දීමෙහි ‘ද’ ධාතුවෙන් කර්තෘ කර්ම කාරකාදියට සම ව සිද්ධ ‘දුන්’ යන කෘදන්තයා කෙරෙන් ප්‍රථමා විභක්ති එකවචන ‘ඒ’ ප්‍රත්‍යය යෙදී ‘න’ කාරයට ද්විත්ව වීමෙන් සිද්ධ යි. මෙහි ‘දුන්’ යනු කර්තෘ කාරක යෙහි යි.

2. **බිජුත්** – ඇටයත්. මෙහි ‘ත්’ යනු ‘ද’ නිපාතය ස්වර රහිත වූ විට උච්චාරණය දුෂ්කර හෙයින් ඝොෂ වූ ඒ වර්ණයට අඝොෂ ‘ත්’ ආදේශ යෙන් සිද්ධ යි.

3. **ඉන්දු** – ‘සිඳ’ ධාතුවෙන් සිද්ධ ප්‍රයොජ්‍ය පූර්වක්‍රියා රූපය යි. මෙ අරුත් පැවසීමට හකාරලොපයෙන් ‘ඉඳුවා – ඉඳවා – ඉන්දු’ යන මෙයින් අන්‍යතර රූපයක් යෙදිය හැකි යි. මෙහි ‘ඉන්දු’ යනු ව්‍යංජනය ද රහිත හෙයින් මැනවි. ප්‍රයොජ්‍ය ‘ව’ ප්‍රත්‍යය ලොපයෙන් මේ රූපය ලැබේ. ධාත්වවයව වශයෙන් ‘ද’ කාරය ඇතිවිට ප්‍රයොජ්‍ය ‘ව’ ප්‍රත්‍යයාගේ ලොපය දක්නා ලැබේ.

**ගුත්තිලයෙහි :–**

“ මුනිසඳු නිවන් ද – බඹ සුරනරන් වන් දු ”

‘වන්දු’ යනු ‘වඳ වැඳීමෙහි’ ධාතුවෙන් සිද්ධ ප්‍රයොජ්‍ය පූර්ව ක්‍රියා යි.
‘ඉන්දු’ යනු ද මෙසෙයින් ම සිද්ධ වේ.

4. **ගඩඹ රුක්** – ගඩඹයා විසින් රොපණය කළ රුක් = ගඩඹරුක්. කතු විබත් සමස්. මධ්‍ය පද ලොපයෙන් සිද්ධ යි.

5. **සසිරි** – සිරි සහ වූයේ = සසිරි. අන් අරුත් සමස්.

6. **දකිමිනි** – ‘දිස්’ ධාතු කෙරෙන් ‘මිනි’ පස යෙදී සිද්ධ මිශ්‍ර ක්‍රියා යි. ‘දිස්’ හට ‘දක්’ ආදෙශාදිය උක්තප්‍රකාරයෙන් දත්යුත් ය.

**44. දසැස් ගොස් මඩුවක් රුවන්මුව මවා නංවා කසුන්**
**කේලි නන්**
**පන්වා හෙම් සිහසුන් මලෝලඹු දු දී නන් නන්හි**
**දල්වා වැමුප්**
**දූන්වී ඒ වරසුන් සුගත් සුලකළෙල් සක්දෙව් දෙදෙව්**
**ලෝ සුරන්**
**ගෙන්වා ගොස් නුබකුස් පුරමිනි එසිරි දක්නා ම වස්**
**රැස් කෙළේ.**

**අන්වය හා පදරු :** **දසැස්** – ශක්‍ර දෙවේන්ද්‍රයා, **ගොස්** – ඒ ස්ථානයට පැමිණ, **රුවන්මුවා** – ස්වර්ණමය වූ, **මඩුවක්** – මණ්ඩප යක්, **මවා** – නිර්මිත කොට, **කසුන් කේලි නන්** – රන්කම් කළ බොහෝ ධ්වජ, **නංවා** – උද්ගත කරවා, **හෙම්සිහසුන්** – ස්වර්ණ

මය සිංහාසනයක්, **පන්වා** – ප්‍රඥප්ත කරවා (=පනවා), **මලෝලඹු දු** – අවලම්බ පුෂ්ප ද, **දී** – දත්තය කොට, **තන් තන්හි** – ඒ ඒ ස්ථානයන්හි, **වැබුජ්** – ප්‍රදීපයන්, **දල්වා** – ජ්වලිත කොට, **දුන්වී**– (එබැවි) ජනනය කරවී, **සුගන්** – සජ්ඣ තෙම, **ඒ වරසුන්** – ඒ උත්තමාසනය, **සුලකළේ** – මැනවින් අලඞ්කාර කෙළේය. **සක් දෙව්** – ශක්‍ර දෙවයා, **සදෙව්ලෝ සුරන්** – දිව්‍ය ලොක ඨායෙහි දෙවියන්, **ගෙන්වා** – කැඳවා, **තොස්** – ප්‍රීති ඝොෂයෙන්, **නුබකුස්** – ආකාශ කුක්ෂිය, **පුරමිනි** – පූරණය කෙරෙමින්, **එ සිරි** – ඒ ශ්‍රිය, **දක්නාම වස්** – දකිම පිණිස, **රැස් කෙළේ** – රාශිභූත කෙළේ යි.

**විස්තර :**

i පන්වා හෙම් සිහසුනක්,

සිංහ රූපයක් මත තනනු ලබන ආසනය සිංහාසන නම්, ශ්‍රෙෂ්ඨ ආසනය හෝ සිංහාසන නම්. එබඳු අස්නක් රනින් කරවා;

ii මලෝලඹු දු දී,

එල්බෙන මල් හෝ මල්දම් යොදා ය කී අපුරු යි.

iii ඒ වරසුන් සුගන් සුලකළේ,

උත්තමයකු යම් අසුනක හිඳ ගැනීමෙන්, මැණිකක් බැඳීමෙන් වලල්ලක් මෙන්, ඒ අසුන අලඞ්කෘත වේ. මෙසෙයින් බුදුන් වැඩ හිඳීමෙන් සක්රද මැවූ අස්න අලඞ්කෘත වී. ඒ උත්තමාසනයෙහි බුදුහු වැඩ උන්හ යි කී අපුරු යි.

**පිපසනී :**

1. **දසැස්** – දහසක් ඇස් ඇත්තේ යමකුහට ද හේ = දසැස්. ශක්‍රදෙවෙනු යි. ශක්‍රයා දහසක් අරුත් එකවිට දැනීමෙහි සමර්ථ හෙයින් 'සහස්ස නෙත්ත' ය යි කියනු ලැබේ ය යි ධම්මයෙහි සඳහන් වේ.

පුරාණ කථාවන්හි වනාහි ගෞතම සෘෂිහුගේ ශාපයෙන් හටගත් ඇස් දහසක් ඇති හෙයින් ම එනම් විය යි දක්නා ලැබේ.

2. **නංවා** – 'නග' ධාතු සොනරත් පූර්ව ක්‍රියා ආ ප්‍රත්‍යය හා ප්‍රයොජ්‍ය ව ප්‍රත්‍යය යෙදී 'ග' කාර ලොපයෙන් හා උගත මාත්‍රයට මත් වැඩීමෙන් සිඬ යි.

3. **කසුන් කේලි නන්** – කාපුනින් කළ කේලි = කපුන් කේලි. ධ්වජ වාචි 'කදලී' ශබ්දයෙන් 'කෙහෙළි' යි බිඳී හ කාර ලොපයෙන් 'කේලි' යි සිඬ යි.

4. **පන්වා** – 'පනවා' යනු වර්තමාන ව්‍යවහාර යි. බොහෝ ගත්කරුවෝ ද එය ම ගත්හ. එහෙත් ගුරුළුගෝමීන් විසින් අමාවතුරෙහි දී 'පන්වා' ඈ විසින් යෙදීම බෙහෙවින් ආශ්‍රිත යි.

5. **මලෙලෝලඹු** – ඔලඹු (= එල්ලෙන) මල් හෝ මල්දම් මලෝලඹු නම්.

6. **දැක්වි** – 'දක්' ධාතුවෙන් සිද්ධ ප්‍රයෝජ්‍ය අතීත කාලික ප්‍රථම පුරුෂ එකවචන ක්‍රියා යි.

7. **සුලකළේ** – සු පූර්ව 'ලකර' ධාතුවෙන් සිද්ධ අතීත කාලික ප්‍රථම පුරුෂ එකවචන ක්‍රියා යි. ඒ ධාතුවෙන් ම කර්තෘකාරකයෙහි සිද්ධ 'සුලකළ' යන කෘදන්තය ද පෙර විබත් එකබස් ගැන්මෙන් ද මෙ බඳු ම රූපයක් ලැබේ.

8. **දෙදෙව්ලෝ** – දෙවියන්ගේ ලෝ = දෙව්ලෝ. දෙව්ලෝ දෙකක් එක් කොට සලකන ලද්දේ = දෙදෙව්ලෝ. එනම් '**චාතුර්මහාරාජික, ත්‍රයස්ත්‍රිංශත්**' දෙක යි.

9. **ගොස්** – ඝොෂය මෙයින් වාච්‍ය වේ. උත්සව අවස්ථාවක් පිළිබඳ ව යොදන ලද බැවින් ප්‍රීති ඝොෂයෙන් ය යි ගැන්ම ස්ථානොචිත යි.

**45. දසනුදෙස නිකුත් රැස් රැස් සහස්රැස්හු දක්මින්**
**දිගළු කළ *කදෙණ ගින් මේ ගොයුම් ගොත්හු දැක්වූ**
**පෙළහර පැවසුම් වස් රැස් ව හුන් තිත් දනා රැස්**
**දැක නො සහනා සක්දෙව් වා මැවී ඒ සකුස් ගොස්.**

**අන්වය හා පදාර්ථ:** **දසනු දෙස** – දිශානුදිශාවන්හි, **නිකුත්** – නිෂ්ක්‍රාන්ත වූ, **රැස් රැස්** – රශ්මි සමූහ ඇති, **දිගළු කළ** – දිශාවන් ආලෝක කළා වූ, **සහස් රැස්හු** – සූර්යයා, **දක්මින්** – දර්ශනය කොට, **කදෙණ ගින්** – ඛද්‍යෝත ක්‍රිමීන් මෙන්, **මේ ගොයුම් ගොත්හු** – මේ ගෞතම ගොත්‍ර ඇති තථාගතයන් වහන්සේ විසින්, **දැක්වූ** – දක්වන ලද, **පෙළහර** – ප්‍රාතිහාර්යය, **පැවසුම් වස්** – ප්‍රකාශ කිරීම පිණිස (යයි), **රැස් ව හුන්** – රාශිභූතව හුන්නා වූ, **තිත් දනා රැස්** – තීර්ථක ජන සමූහයා, **දැක** – දර්ශනය කොට, **නො සහනා** – නො ඉවසන්නා වූ; **සක්දෙව්** – ශක්‍ර දෙව තෙම, **වා මැවී** – (චණ්ඩ) මාරුතයක් මැවූයේ ය. **ඒ** – එ ම මාරුතය, **සකුස්** – වහා, **ගොස්** – ගමනය කොට, (අනන්තර පද්‍යය හා සම්බන්ධයි.)

**විස්තර:**

දිශාවන් ආලෝක කොට සූර්යයා උදා වූ විට කදෙණිම්හු ප්‍රභා රහිත වෙති. එ මෙන් තථාගතයන් වහන්සේ ඉදිරියෙහි ප්‍රභා රහිත වූ, "බුදුන් දක් වූ පෙළහර අපිත් දක්වම්හ" යි කියමින් රැස් ව හුන් තීර්ථකයන් දැක ඉවසිය නො හැකි වූ සක් දෙව් රජ චණ්ඩ මාරුතයක් මැවී ය. ඒ වාතය ගොස් තීර්ථකයන්ට කළ විප්‍රකාර අනන්තර පද්‍යයෙන් විස්තර වේ.

* කදෙසින් – මුද්‍රිත පොත්.

**ටිප්පනි:**

1. **කද්‍යෝත** – ඛද්‍යෝත ක්‍රිමීහු (= කණාමැදිරියෝ) කද්‍යෝත නම්.

2. **ගින්** – මෙ ද 'ගි' සද මෙන් ම තුල්‍යත්වය හඟවන ශබ්දයෙකි. කියන ලද මැ යි **සියබස් ලකරෙහි**:–

"අසුරු වැනි වලා - පලඟ හරණ **ගින්** මෙන්" යි.

3. **මැව්** – 'මව මැවීමෙහි' ධාතුවෙන් සිද්ධ අතීත කාලික ප්‍රථම පුරුෂ එකවචන ක්‍රියා යි.

**46. විසුරුවමිනුපුල් මල් ඒ නිවෙස් නන් දිගත්හි**
**විහිද නොමඳ මී රෙණ් රැස් ඔවුන් ගත්හි ගැල්වී**
**දල දල බිඳු වස්වා ලා වලා දෙව් සදුල් වෙස්**
**හරණ කරන තිත් රැස් වල් හිසෝනන් කෙළේ ගොස්.**

**අන්වය හා පදාර්ථ:** **උපුල් මල්** – මණ්ඩපයෙහි වූ උත්පල පුෂ්පයන්, **විසුරුවමින්** – විකීර්ණ කෙරෙමින්, **ඒ නිවෙස්** – ඒ (තීර්ථකයන්ගේ) ගෘහය, **නන් දිගත්හි** – අනෙක දිගන්තයන්හි, **විහිද** – විසුරුවා, **නොමඳ** – බොහෝ වූ, **මී රෙණ් රැස්** – ධූලි රාශිය **ඔවුන් ගත්හි** – ඒ තීර්ථකයන්ගේ ශරීරයන්හි, **ගැල්වී** – ලිම්පනය කෙළේ යි. **දල දල** – මහත් මහත්, **බිඳු** – වැසි බිඳුන්, **වස් වා ලා** – වර්ෂණය කොට, **සදුල් වෙස්** – (තීර්ථකයන්) ශාර්දූලයන් ගේ වේශයට, **හරණ කරන** – සමාන කරන්නා වූ, **වලා දෙව්** – වලාහක දෙව් තෙම, **තිත් රැස්** – තීර්ථක සමූහයා, **ගොස්** – ගමනය කොට, **වල් හිසෝනන්** – අරණ්‍යයන්හි ශීඝ්‍රප්‍රවේශය කොට ගන්නන්, **කෙළේ** – කෙළේ යි.

**විස්තර:**

ශක්‍ර දෙවේන්ද්‍ර තෙම 'තීර්ථකයන්ගේ ඡත්‍රය උගුළුවා කසළ ගොඩ හෙළව' යි වාතවලාහකයාට ද, 'රශ්මි දැඩි කොට තවව' යි සූර්යයාට ද, 'වාතමණ්ඩල ඇති කෙරෙමින් යව' යි නැවත වාතවලාහකයාට ද නියම කෙළේ ය. ඔහු ද එ සේ ම කළහ. සූර්ය රශ්මියෙන් පීඩිත ව ඩහදිය සහිත වූ තීර්ථකයන්ගේ සිරුරු පසු ව හැමූ වාතයෙන් ධූලි තැවරීමෙන් තුඹස් බඳු විය. ඉක්බිති වස්සවලාහකයාහට 'මහත් මහත් පොද වස්වව' යි අණ කෙළේ යි. හේ එ සෙයින් ම කෙළේ ය. එයින් තීර්ථකයෝ 'කබර (එළ) දෙනුන්' බඳු වූහ. 'මෙසේ පැරදුණු තීර්ථකයෝ හිස් ලූ ලූ අත පලා ගොස් කැලයට වන්හ'. යනු මේ ප්‍රවෘත්තිය ධර්ම ග්‍රන්ථයන්හි එන අයුරු යි. මෙහි වනාහි වස්සවලාහකයා තීර්ථකයන් ශාර්දූලයන් (= කොටියන්) බඳු කළ බව කියන ලදී. කොටියන්ගේ සිරුර ද පැල්ලම් සහිත හෙයින් එසේ කීමට කවීන්ට නිදහස නැත්තේ නො වේ.

i වල් හිසෝනන්,

අරණ්‍යයෙහි හිස් ප්‍රවේශ කරගැන්ම නම් වල්වැදීම යි,

**විපසනි:**

1. **විකිද** – ' විකිද ' ධාතුවෙන් සිද්ධ පූර්ව ක්‍රියා යි.

2. **මිණරුන්** – මහිරේණු. ධූලි.

3. **දළ දළ** – මහත් මහත්. විනිශ්‍ය වනාහි මෙහි අතිශයාර්ථය සඳහා ය. ' ඉතා මහත් ' යනු අර්ථ යි.

4. **වලාදෙව්** – වර්ෂවලාහක දෙවියා. මේ හයට අධිපතිත්‍ව යි සලකනු ලබන දෙවියෙක්.

5. **සදුල්** – ශාර්දූල. දිවි.

6. **හරණ** – මේ ' සමාන ' යන අර්ථ වාචී වෙයි.

**කාව්‍යශෙඛරයෙහි :–**

" නො වන හිමි **හර** ණෝ
දරු වැදූ ගැහැනි නුගු ණෝ " යි.

7. **කරන** – ' කර ' ධාතු කෙරෙන් ' ත ' ප්‍රත්‍යය ව කර්තෘ කර්ම කාරක ද්වයට සම ව සිද්ධ කෘදන්ත යි. මෙහි කර්තෘ කාරකයෙහි වේ.

8. **හිසෝනන්** – හිස් ඔනේ = හිසෝන. හිසෝන + අන් = හිසෝනන්. ' ඔන ' යනු ' ඕ ' ප්‍රවේශ කිරීමෙහි ධාතුවෙන් කර්තෘ කාරකයෙහි සිද්ධ කෘදන්ත යි.

**47. සමුඩු එමඩු මේ ලෙස් වත් තමන්බස් නො බස් වත්
යන මග මගමින් උන් ගත් නොයෙක් වෙස් එතින් රුස්
ඔසල කසල පස් රුස් රුස් ව හුන් ඒ සිවල් රුස්
සිරිසර ඇර පාමින් නන් දිගන්හි ම යත් යත්.**

අන්වය හා පදාර්‍ථ: **සමුඩු** – සමෘද්ධ වූ, **එ මඩු** – තීර්ථකයන් ගේ ඒ මණ්ඩපය, **මේ ලෙස් වත්** – උක්තප්‍රකාරයෙන් වත් ම, **තමන් බස්** – ස්වකීය වචනයන්, **නො බස් වත්** – නො බස් හෙවත් අසත්‍ය වචන වන කල්හි, **යන මග** – (පලා) යන්නා වූ මාර්ගය, **මගමින් උන්** – අවලෝකනය කරමින් හුන්නා වූ, **නොයෙක් වෙස් ගත්** – අනෙක වෙශ ග්‍රහණය කළ, **එතින් රුස්** – ඒ තීර්ථක සමූහයා, **ඔසල කසල** – රුස් වූ කවවර ඇති, **පස් රුස්** – පාංශු රාශිය කට, **රුස් ව හුන්** – රාශිභූත ව හුන්නා වූ, **ඒ සිවල් රුස්** – ඒ ශෘගාල සමූහයක්හුගේ, **සිරිසර** – ශ්‍රී සාරය, **ඇර පාමින්** – ගෙන හැර දක්වමින්, **නන් දිගන්හි ම** – අනෙක දිශාවන්හි, **යත් යත්** – පලා යන කල්හි;

**විසතර:**

i ඔසල කසළ පස්රුස් රුස් ව හුන් ඒ සිවල් රුස්
සිරිසර හැර පාමින් නන් දිගන්හි ම යත් යත්.

කසල සහිත පස් ගොඩක රැස් ව සිටිත සිවල් රැළ කිය වීමට සුදුසු සුළු කාරණයක් වුව ද හිස් ලූ ලූ අත පැන දුවති. ඔවුන්ගේ ආකාරය දක්වමින් තීර්ථකයන් පැන යන කල්හි,

**විපසනි:**

1. **සමුඩු** – 'සම්ද්ධ' ශබ්දයෙන් 'සමුද්ධ' යි සිද්ධ ව, ද කාරයට ඩ කාරාදේශ වීමෙන් 'සමුඩු' යි සිද්ධ යි. 'උද්ධ - උද - උඩ' යයි සිද්ධ අයුරිනි.

2. **වත්** – කාලාර්ථයෙහි අසම්භාව්‍ය ක්‍රියා යි. 'වූ' ධාතුවෙන් සිද්ධ යි.

3. **නො බස්** – මෙහි 'නොබස්' නම් අසත්‍ය වචන යි.

4. **උන්** – 'හිඳ' ධාතුවෙන් සිද්ධ 'හුන්' යන කෘදන්ත පදයාගේ හකාර ලොපයෙන් සිද්ධ රූපය යි.

5. **ඔසළ** – 'ඔසට' ශබ්දයෙන් සිද්ධ හෙයින් මූර්ධන්‍ය ළකාරවත් වේ.

6. **කසළ** – කුණු රොඩු ආදි අපවිත්‍ර දේ. 'කසල' යි ව්‍යවහාරයෙහි ද පවතී.

7. **සිරිසර** – සිරියෙහිසර (= සාරය) = සිරිසර. මෙහි සිරිසද ප්‍රකාරාර්ථයෙහි යි.

8. **දිගත්** – දිග් ම දිගත්. අත් සද සමාර්ථයෙහි යි.

**48. දිගඹර ඇදුරා ගොස් කී එවාසි ම සැහි**
**පුලින කල ගෙලේ දී වන් එවල් විල් සිලිල්හි**
**පවිටු නිවටුනෙක් වූ නන් දිගත් යත් මෙලෙස් පෑ**
**පෙළහර පැවසුම් වස් සක් යදුත් පා මුදුන් දී.**

**අන්වය හා පදාර්ථ:** **සැහි** – සාහසික ව; **එවාසි ම** – ඒ වහසි බස්, **කී** – කථනය කළා වූ, **දිගඹර ඇදුරා** – දිගම්බරාචාර්යයා, **ගොස්** – ගමනය කොට, **පුලින කල** – වාලුකා ඝටයක්, **ගෙලේ දී** – ග්‍රීවායෙහි දානය කොට, **එවල්** – ඒ අරණ්‍යයෙහි වූ, **විල් සිලිල්හි** – තටාක ජලයෙහි, **වන්** – ප්‍රවිෂ්ට වී. **එක් වූ** – රාශිභූත වූ, **පවිටු** – පාපිෂ්ඨ වූ, **නිවටුන්** – නිගණ්ඨයන්, **මෙලෙස් පෑ** – මේ ආකාර දක්වා, **නන්දිගත්** – නොයෙක් දිශාන්තයට, **යත්** – ගිය කල්හි, **පෙළහර පැවසුම් වස්** – ප්‍රාතිහාර්ය ප්‍රකාශය කරනු පිණිස, **සක්** – ශක්‍ර, **පා** – ශ්‍රීපාදයන්ට, **මුදුන් දී** – මස්තකය දානය කොට, **යදුත්** – යාච්ඤා කරන කල්හි;

**විස්තර:**

i පෙළහර පැවසුම් වස් සක් යදුත් පා මුදුන් දී

පාදයන්ට මුදුන් දීම නම් හිසින් වැඳීම යි. එහෙයින් හිසින් වැඳ පෙළහර පෑමට යදින කල්හි ය යන අර්ථ යි.

**විපසනි :**

1. **දිගඹර ඇදුරා** – දිගඹරුන්ගේ ඇදුරා = දිගඹර ඇදුරා. දිගම්බර යෝ නම් දිශා ම වස්ත්‍ර ලෙස සලකා නග්න ව වසන තීර්ථකයෝ යි. දිගම්බරයන් ගේ ඇදුරා නම් **නිගණ්ඨනාතපුත්‍ර** නමැත්තා යි. එහෙත් මෙහි කී ක්‍රියාව කෙළේ **පූරණකාශ්‍යපයා** විසිනි. ඒ බව **ධම්මපදට්ඨකථා, පූජාවලි, බුත්සරණ** ආදි ග්‍රන්ථයන්ගෙන් පැහැදිලි වේ.

2. **වාසි ම** – වාසි කීම නම් සමච් සම් කීම යි. මෙහි ‘ම’ කාරය පාද පූරණය ම ප්‍රයෝජන කොට ඇත්තේ යි.

3. **පුලින කල** – පුලිනෙන් (=වැලිවලින්) යුත් කල - පුලිනකල.

4. **ගෙලේ දී** – ග්‍රීවායෙහි දෘනය කොට. ‘ග්‍රීවායෙහි බැඳ ගෙන ය’ යි කී අයුරු යි.

5. **වන්** – ‘වද - පිවිසීමෙහි’ ධාතුවෙන් සිද්ධ කෘදන්ත පද යි.

6. **පවිටු** – අතිශයින් පාපී වූයේ පවිටු. මෙ අරුත්හි පාලියෙහි ‘පාපිට්ඨ’ සද යෙදේ. ඒ අතිශයාර්ථයෙහි ‘ඉට්ඨ’ ප්‍රත්‍යය යෙදී සිද්ධ තද්ධිත නාමයෙකි. මෙ ද ‘පව්’ සද කෙරෙන් අතිශයාර්ථයෙහි ‘ඉටු’ ප්‍රත්‍යය යෙදී සිද්ධ තද්ධිත පදයෙකි. ‘දූම්ටු’ ආදි ශබ්දයන්හි ද දක්නා ලැබෙන්නේ මේ ‘ඉටු’ ප්‍රත්‍යය යි.

7. **නිවටුන්** – නිගණ්ඨයන්. “මාගේ ලෙයි කෙලෙස් ගැටත් නැත. මට නොදූනෙන ශාස්ත්‍රගැටයකුත් නැත. එසේ හෙයින් **නිගණ්ඨ** වීමි” යි **නාත පුත්‍රයා** නිගණ්ඨ නාමය තමහට ආරෝපණය කොට ගත්තේ ය. එහෙයින් ඔහු පිරිවර ද නිගණ්ඨ නම් වූහ. ‘යන්’ යන කාලාර්ථයෙහි අසම්භාව්‍ය ක්‍රියාවට කතෘත්වයෙන් සම්බන්ධ වන හෙයින් නිවටුන් යි නැබූහ. මෙ බඳු තැන්හි අදර අරුත්හි කම් විබත් යෙදෙතැ යි සිදතෙහි කියන ලදී.

8. **පෑ** – ‘පා’ ධාතුවෙන් සිද්ධ පූර්ව ක්‍රියා යි. 37 වන පද්‍යයේ 2 වන විපසනිය බලනු.

9. **පෑවසුම්** – පෑවසීම පෑවසුම් නම්. භාවයෙහි ‘උම්’ ප්‍රත්‍යය යි. මේ ශබ්දය මෙහි ප්‍රකට කිරීම් අර්ථයෙහි යෙදිණ.

10. **යදුත්** – ‘යද’ ධාතුවෙන් සිද්ධ කාලාර්ථයෙහි අසම්භාව්‍ය ක්‍රියා යි. ‘ගනුතු’ ආදිය මෙන් ‘යදුතු’ යි සිද්ධ ව උ කාර ලොපයෙන් ‘යදුත්’ යි සිද්ධ යි. යදිතු යි පද රූපය ලැබිය යුතු වුවත් පර උ කාර නිමිත්තෙන් පිළිපෙරළි ව ‘යදුතු’ යි වී. යදුත් යන තන්හි නිමිත්ත වූ උ කාරයාගේ අභාවයෙහි ද නෛමිත්තික උ කාරයාගේ අභාවය නො වී.

**සංලක්ෂ්‍යය.**

i දිගම්බරවාසීයා වැලි කළ ගෙලේ බැඳ ගෙන සම්පවනයෙහි විලක නිමග්න වූ බව හා ශක්‍රයා ප්‍රාතිහාර්‍ය පෑමට ආරම්භ කළ බව ද මෙහි කියන ලදී. එහෙත් මේ ප්‍රවෘත්තිය **ධම්මපදට්ඨකථා, පූජාවලි** ආදියෙහි සඳහන් වන්නේ මෙලෙසිනි :- “සෙට්ඨයන් හා පූරණ කාශ්‍යපයා ද පලා යන

කල්හි සිහාමින් සිට 'දූත් ආශීගත් පෙළහර දක්වන වේලාව ය, ඒ දක්නට යෙමි' යි කෑද ගෙනා කළස හා යොතන් රැගෙන ආ ඔහුගේ ම දායකයෙක්, හමු විය. පූර්ණ තෙම ඔහු අතින් කළය හා රැහැන ඉල්වා ගෙන ගඞ්ගාතීරයට ගොස් කළය රැහැනින් බැඳ ගෙලේ එල්වා ගෙන ගැඹුරු ජලප්‍රවාහයට පැන දිවි නසා ගත්තේ ය. ශක්‍රයා රුවන් සක්මනක් මැවී. බුදුහු සවස් කාලයෙහි 'දූත් පෙළහර කිරීමට සුදුසු කාලය ය' යි ගඳකිළියෙන් නික්ම ඉදිරියෙහි වැඩ උන්සේක."

එහෙත් "පූර්ණකාශ්‍යපයා කර වැලිකළයක් බැඳ දියෙහි ගැලී" ආදි ධර්මප්‍රදීපිකා පාඨයෙහි වැලි කළයක් බැඳ ගෙන දියෙහි ගිලී මළ බව සඳහන් වේ. "සක්කො ආකාසෙ රතන චඞ්කමං මාපෙසි" යි ධම්මපදට්ඨ කථාවෙහි ඇතත් 'ශක්‍රයා මැවූයේ රුවන් මඩුවකැ' යි පිළිගත යුතු. කොසොල් රජු මඩුවක් කරවමැ යි කී විට 'මහරජ, මඩුවක් ශක්‍රයෝ මවති, එහෙයින් කම් නැතැ' යි බුදුන් වදාළ හෙයිනි. ධර්මප්‍රදීපිකාවෙහි ද "සක්දෙව් රජහු විසින් මවන ලද දෙලොස් යොදුන් රුවන් මඩුයෙහි" ආදි පාඨයෙන් ද ඒ වැටහේ.

49. පර වැඩ ඇදුරා ණෝ ලෝ සියල් එක් නෙතා ණෝ
දියමෙක වියනා ණෝ මොක් පුරේ එක් රජා ණෝ
බව සිඳු පසු රා ණෝ තින් නලන් මත් ගජා ණෝ
සුර නර ඉසු රා ණෝ සව් සැපත් කප් රුකා ණෝ

**අන්වය හා පදාර්ථ:** පරවැඩ – පරාර්ථ කාරණයෙහි, ඇදුරාණෝ – ආචාර්ය වූ, ලෝ සියල් – ලොකවාසි සියල්ලන්ට, එක් නෙතාණෝ – අසහාය නෙත්‍රයක් වූ, දියම – ලොකයට, එක වියනාණෝ – අසහාය විතාන වූ, මොක් පුරේ – මොක්ෂ පුරයෙහි, එක් රජාණෝ – අසහාය රාජ ශ්‍රේෂ්ඨයා වූ, බව සිඳු – භව නමැති සාගරයට, පසුරාණෝ – උතුම් උඩුපයක් වූ, තින් නලන් – තීර්ථක නමැති බට වනයට, මත් ගජාණෝ – මත්ත හස්ති රාජ වූ, සුර නර – දිව්‍ය මනුෂ්‍යයන්ට, ඉසුරාණෝ – ඊශ්වර වූ, සව්සැපත් – සියලු සම්පත්තියට, කප්රුකාණෝ – කල්පද්‍රැම වූ;

**විස්තර:**

i පර වැඩ ඇදුරාණෝ,

බුදුහු සුමෙධාත්මභාවයෙන් පසු පරොපකාරය පිණිස ම සියලු දේ කළහ. පරාර්ථය කිරීමට අවශ්‍ය බුද්ධත්වය ලැබීම පිණිස බාහිර වස්තු හා ආධ්‍යාත්මික මාංස ලොහිතාදිය ද දෙමින් පරොපකාරය කළහ. අන්තිමාත්මභාවය මුළු මනින් ම පරාර්ථය පිණිස යෙදූහ. එහි අනුසස් දෙශනා කළහ. එ හෙයින් බුදුහු පරාර්ථචර්‍යාවෙහි ආචාර්‍ය වෙති.

ii ලෝ සියල් එක්නෙතාණෝ,

ඇසින් තොර වූයේ කිසිවක් නොදකී. මැණිකත් ගලත් සම ව ගනී. අන්ධයන් මෙන් හැසිරෙන ලොකයාට බුදුහු ඇසක් මෙන් මාර්ගාමාර්ග දක්වූ හෙයින් උන්වහන්සේ සියලු ලොකයාට නෙත්‍රයක් ම වූහ,

iii දියවෙක වියනාණෝ,

චතුවෛශාරද්‍යඥානාදියෙන් යුත් හෙයින් බුදුහු අෂ්ට පර්ෂත්හි ම අකම්ප්‍ය වෙති. එහෙයින් ලොවට උන්වහන්සේ බඳු විතානයක් නැත.

iv මොක් පුරේ එක් රජාණෝ,

අනන්‍යාපදේශයෙන් තොර ව නිර්වාණය අවබෝධ කොට ගත සත්ත්වයන් ඊට පැමිණවූ හෙයින් නිර්වාණයෙහි අධිපතිත්වාදි විශේෂයක් නැතත් නිර්වාණ මාර්ගය දැක්වීමෙහි ප්‍රමුඛත්වය සලකා නිර්වාණපුරයෙහි අසහාය රාජයා ය යි කීහ.

v බවසිඳු පසුරාණෝ,

සාගරයෙන් ක්ෂේම වූ තීරයකට යා ගැනීමට පහුර උපකාරි වේ. සාගරයක් මෙන් භයානක වූ භවයෙන් පරතෙර වූ නිර්වාණයට යා හැක්මට බුදුහු ම අසහායාධාර හෙයින් උන්වහන්සේ භවසාගරයට උතුම් පසුර වෙති.

vi නිත් නලත් මත් ගජාණෝ,

මත්තහස්ති රාජයා බට වනයක් නිරුත්සාහයෙන් සිඳ බිඳ ලැමෙහි සමර්ථ වෙයි. එසෙයින් බුදුහු ද තීර්ථකයන්ගේ මානය සිඳ බිඳ ලන හෙයින් තීර්ථක නමැති බට වනයට මත්තහස්තිරාජ වූහ.

vii සුර නර ඉසුරාණෝ,

දිව්‍ය මනුෂ්‍යයන් විසින් කරන ආමිෂ ප්‍රතිපත්ති පූජාවන් ලැබීමට සුදුසු හෙයින් බුදුහු ඔවුන්ට ඊශ්වරය. 'සුරනර' යි මේ ශ්‍රේෂ්ඨයන්ගේ වශයෙන් ගැන්ම යි. සෙස්සෝ ද මෙයින් ම ගන්නා ලදහ.

viii සව්සැපත් කප්රුකාණෝ,

කල්පවෘක්ෂය ඉෂ්ටසම්පත්ති ප්‍රදානය කෙරෙයි. එසෙයින් බුදුහු ස්වර්ගාපවර්ගාදි හැම සම්පත් දෙන හෙයින් සකල සම්පත්තියට කල්පවෘක්ෂ වූ ය යි කීහ.

**ටිප්පනි:**

1. **ඈදුරාණෝ** – ඇදුරු ශබ්දයා කෙරෙන් ගෞරවාර්ථයෙහි 'ආණ' ප්‍රත්‍යය යෙදී සිද්ධ යි.

2. **ලෝ** – ලොක වාචි ලෝ සඳින් ම එහි නිවාසී සත්ත්වයෝ ද ගන්නා ලැබෙති.

3. **එක්නෙතාණෝ** – මෙහි එක් සද සංඛ්‍යාදි අර්ථයන් හි නොව අසහාය යන අර්ථයෙහි වැටේ. මෙහි නෙත් සද නෙත්‍රයක් බඳු බුදුන් කෙරෙහි වැටෙන හෙයින් 'ආණ' ප්‍රත්‍යය යොදා නෙතාණෝ ය යි කීහ.

4. **පසුරාණෝ** – පසුර නම් ජලය තරණය කිරීමට ඉවහල් ඉල්පෙන පුලු දෙයින් තනනු ලබන්නකි. මේ ම 'පහුර' ය යි ව්‍යවහාර කරනු ලැබේ. එයින් පර ව ආණ ප්‍රත්‍යය යෙදීමට හෙතු 'නෙතාණෝ' යන තන්හි මෙන් දත්තේ ය. 'කප්රුකාණෝ' යන්න ද මෙසෙයින් ම දත යුතු.

**50. අවිදු සකර පස් ඈ මින් කිඹුල් ඈ කැලන් සත්**
**බව ඝොර සයුරේ ලූ ගේ විලස් සෙත් තෙරේ නිව්**
**දෙපසිනි අග පත් වූ පා සෙලින් යුත් මෙරින් වූ**
**මැවු මුනිඳු රුවන් නන් සක්මනක් සක්වලේ සි.**

**අන්වය හා පදාර්ථ:** **අවිදු සඞර පස් ඇ** – අවිද්‍යා සංස්කාර ප්‍රත්‍යයාදි, **මින් කිඹුල් ඇ කැලන්** – මීන කුම්භීලාදි සමූහයන්ගෙන්, **සන්** – ගැවසී ගත්තා වූ, **බව ඝෝර සයුරේ** – භව නමැති ඝෝර සාගරයෙහි, **සෙත් තෙරේ හිමි** – ශාන්ති (=නිර්වාණ) නමැති තීරය සීමා කොට, **ලූ** – ලන ලද, **හේ විලස්** – සේතුවක් බඳු වූ, **දෙපසිනි** – උභය පාර්ශ්වයෙන්, **අග පත් වූ** – (චක්‍රවාල) පර්වතයන්ට පැමිණි, **මෙරින් වූ** – මේරු පර්වතයෙන් වූ, **පා සෙලින් යුත්** – පාද ශෛලයන්ගෙන් යුක්ත වූ, **නන්රුවන්** – අනේක රත්නයෙන් යුක්ත වූ, **සක්මනක්** – චංක්‍රමණයක්, **මුනිඳු** – සර්වඥයන්වහන්සේ, **සක්වළේහි** – චක්‍රවාටයෙහි, **මැවූ** – නිර්මාණය කළසේක.

**විස්තර:**

බුදුහු චක්‍රවාටයෙහි රුවන්සක්මනක් මැවූහ. ඒ නිර්වාණ නමැති තීරය සීමා කොට ඇති, භව නමැති ඝෝර සාගරයට ලූ හෙයක් වැනි ය. රුවන් සක්මන මැවීමේ ප්‍රාතිහාර්ය්‍ය දැකීමෙන් හා එහි සිට දෙසූ දහම් ඇසීමෙන් ද බොහෝ දෙනා සසරින් එතෙර වූ හෙයිනි. කොබඳු බව සයුරකින් එතෙර වීමට ද යත් :- අවිද්‍යා සංස්කාරාදි ප්‍රත්‍යය නමැති මත්ස්‍ය කුම්භිලාදීන්ගෙන් ගැවසී ගත් ඝෝර වූ බව සයුරින් ය. අවිද්‍යා සංස්කාරාදි ප්‍රත්‍යය හේතුවෙන් සත්වයන්ගේ ඉපදෙමින් මැරෙමින් හැසිරීම් සංඛ්‍යාත භවය ඇති වෙයි. එහෙයින් අවිද්‍යා සංස්කාරාදි ප්‍රත්‍යයාදිය මීන කුම්භිලාදීන් ලෙස ගත්හ. රුවන් සක්මන මේරු මස්තකයෙහි උභය පාර්ශ්වයෙන් සක්වළ ගල හිමි කොට අහස් කුස මවන ලදී. එහෙයින් මේරු පර්වතයෙහි අග්‍රභාගයෙහි කොටස් ඊට හැඟිමට වූ පාදශෛල (=පියගැට) මෙන් විය.

**විපසනි:**

1. **අවිදු** – අවිද්‍යාව – දුඃඛසත්‍යාදි අටතන්හි නො දැනීම.

2. **සඞර** – සංස්කාර; පුණ්‍යාභිසංඛාර, අපුණ්‍යාභිසංඛාර, ආනෙඤ්ජාභිසංඛාර ය යි ඒ ත්‍රිවිධ යි. මේ ප්‍රත්‍යයාගේ හේතුවෙන් විඥානය ඇති වේ.

3. **පස්ඇ** – ඵලයන්ගේ හටගැනීමට කරණු වන්නේ ප්‍රත්‍යය නම්. මෙහි ‘පස්’ ශබ්දයා කෙරෙන් ඇ සදක් ප්‍රයෝග කළ හෙයින් ප්‍රත්‍යය ධර්ම පමණක් නො ව ප්‍රත්‍යය සමුත්පන්න ධර්මයෝ ද සංග්‍රහ වෙති. සංස්කාරාදීහු පූර්ව ප්‍රත්‍යයකින් හටගත්තා හෙයින් ප්‍රත්‍යය සමුත්පන්නයෝ වෙති. විඥානාදියට හේතු වන හෙයින් ප්‍රත්‍යයත් වෙති.

4. **සෙත් තෙරේ හිමි** – ‘සෙත් තෙර හිමි’ යි කිය යුතු තන්හි ඡන්දය රැකීම පිණිස ‘සෙත් තෙරේ හිමි’ යි කීහ.

5. **අග පත් වූ** – ‘අග’ සද පර්වතවාචී ද වෙයි. මෙහි කියන ලද ‘අග’ නම් චක්‍රවාල පර්වතය යි. රත්නචංක්‍රමණයෙහි දෙකෙළවර නැගෙනහිර බටහිර සක්වළපවු මතුයෙහි පිහිටියේ ය.

6. **පා සෙලින්** – පාද ශෛල නම් පියගැට යි.

7. **මැවූ** – ‘මව’ මැවීමෙහි – ධාතුවෙන් සිද්ධ අතීත කාලික කර්තෘ කාරක ප්‍රථම පුරුෂ බහුවචනාඛ්‍යාත ක්‍රියා යි. ඡන්දය රැකීමට ‘මැවූ’ යි ගන්නා ලදී.

8. **මුනිහු** – මුනි ශබ්දයාගේ ප්‍රථමාවිභක්ති බහු වචන යි. පූර්ව පද්‍යෙයහි 'පරවෑඩ ඇදුරාණෝ' යනාදි 'ආණ' ප්‍රත්‍යයාන්ත බහුවචන විශෙෂණ පද යෙදූ හෙයින් මෙසේ යෙදීම මැනවි.

**සංලක්‍ෂ්‍යය:**

i බුදුන් ම රුවන් සක්මන මැවූ බව මෙහි කියන ලදී. ඒ ශක්‍රයා විසින් මවන ලදූ යි **ධම්මපදට්ඨ කථාවෙහි** කියන ලද බව 49 වන පද්‍යෙයහි i සංලක්‍ෂ්‍යයෙන් දත යුතු.

**51. සුරිඳු සරසුනෙක්හල් වක් නො වත් ඒ විලස් වන්**
**රුවනුදුල එ සක්මන් පත් එ සක්මන් තිලෝනා**
**ඔසල ගුණ රුවන් රැස් ගත්සිරි නිඳු ගබ්හි**
**එසඳ වැජඹි යා ගත් සක්රුවන් මෙන් පසස්නා.**

**අන්වය හා පදාර්ථ:** **සුරිඳු සරසුන්** – ඉන්ද්‍රචාපය, **වක් නො වත්** – වක්‍ර නොවත් හොත් – හෙවත් ඍජු ව පවතිතොත්, **ඒ විලස් වන්** – එහි විලාසයට බඳු ආකාර ඇති, **රුවනුදුල** – රත්නයන් ගෙන් බබළන්නා වූ, **එ සක්මන්** – ඒ චඞ්ක්‍රමණයෙහි, **එ සක්මන්** – ප්‍රසිද්ධ සක්මන් කිරීමට, **පත්** – පැමිණියා වූ, **තිලෝනා** – සර්වඥ තෙම, **ඔසල** – රාශිභූත වූ, **ගුණ රුවන් රැස්** – ගුණ නමැති රත්න රාශි ඇති, **ගත් සිරි** – ශරීර ශොභා නමැති, **නිඳු ගබ්හි** – සාගරාභ්‍යන්තරයෙහි, **යා ගත්** – යාත්‍රා ග්‍රහණය කළ, **පසස්නා** – පසසනු ලබන්නා වූ, **සක් රුවන් මෙන්** – ශංඛරත්නයක් හෝ චක්‍රරත්නයක් මෙන්, **එ සඳ** – එකල්හි, **වැජඹි** – විජෘම්භමාණ වී.

**විස්තර :**

රක්තනීලාදි මාණික්‍ය රත්නයන්ගෙන් බබළන ඒ සක්මන, ඉන්ද්‍රචාපය (=දේදුන්න) චාපාකාර නො ව ඍජුව අහසෙහි දක්නා ලැබෙතොත් එ මෙනි. අනෙක වර්ණ රත්නයන්ගේ විවිධ කාන්තියෙන් යුක්ත හෙයිනි. දේදුන්න ද නීල රක්තාදි වර්ණයන්ගෙන් බබළ යි. එහි සක්මන් ඇරඹූ තථාගතයන් වහන්සේ මෛත්‍රී ක්‍ෂමොපශමාදි ගුණ නමැති රත්න ඇති, ශරීර ශොභා නමැති සාගරයෙහි ගමන් ගත් ශඞ්ඛයක් හෝ චක්‍රරත්නයක් වැනි වෙති. සාගරයෙහි රත්නයෝ ඇත. මෙහි බුදුන්ගේ ගුණ ම රත්න කොට ගත්හ. උන්වහන්සේගේ ශරීර ශොභාව ම සාගරය ලෙස සැලකූහ. ශරීර ශොභාව උඩ යට ආදි හැම දික්හි පැතිර පවතී. එහෙයින් එ මැද හැසිරෙන බුදුරුව ශරීර ශොභා සාගරයෙහි හැසිරෙන ශංඛයක් (=සක්බෙල්ලකු) මෙනි. චක්‍රරත්නයක් හැසිරෙතොත් එ මෙනැ යි කියා හෝ ගත හැකි ය.

**විසඳුම් :**

1. **සුරිඳු සරසුන්** – සුරිඳුගේ සරසුන් = සුරිඳුසරසුන්. දේදුන්න. පෞරාණිකයෝ දුන්නක ආකාරයෙන් පෙනෙන හෙයින් ඒ ශක්‍රයාගේ දුන්න ය යි සලකා මෙ නාම තැබූහ. එහෙත් ඒ වාෂ්පයන්ට හිරුරැස් ආදි

ආලෝකයක් වැටුණු විට ඇති වන දර්ශනයෙකි. ශක්‍රයාගේ දුන්න ය යනු නො අදහනත් මංගබි සිංහල වශයෙන් ද මේ පද්‍යයෙහි 'ඉන්ද්‍රධනු, ඉඳුසැව' ආදී ශබ්දයන්ගෙන් හඳුන්වනු ලැබේ.

2. **වක් නොවත් –** වඞ්ක නොවත් හොත්, ඍජු ව පවතිතොත් යන අර්ථ යි. නො වත් යනු නො පූර්ව 'වූ' ධාතුවෙන් සිද්ධ අසම්භාව්‍ය ක්‍රියා යි.

3. **සක්මන් –** සක්මන් කිරීමට ආධාර වන, ඒ පිණිස තැනූ පෙදෙස ද, 'සක්මන්' නමින් ම ව්‍යවහාර කරනු ලැබේ.

4. **නිඳු –** නීන්ගේ ඉඳු = නිඳු. සාගරය යි. සමුද්‍ර ගඞ්ගාවන්ගේ අධිපතියා හෙවත් ස්වාමියා ලෙස සලකනු ලැබේ.

5. **වැජඹි –** 'වජඹ' ධාතුවෙන් සිද්ධ අතීතකාලික ප්‍රථම පුරුෂ ඒකවචන ක්‍රියා යි.

6. **සක්රුවන් –** ශඞ්ඛරත්නයක්; 'චක්‍රරත්නයක්' ය යි සන්නයෙහි දක්නා ලැබේ. එසේ ගැනීමට ද නො බැරි යි. එහෙත් මෙ තරම් නො යෙදේ. උතුම් සක සක්රුවන් නමින් දන්නා ලැබේ. එ නම් දක්ෂිණාවර්ත වූයේ යි. මේ, මෙන් යොගයෙහි කම් විබත්.

7. **පසස්නා –** 1 වන පද්‍යයේ 11 වන විපපත්තිය බලනු.

**52. පෙළහර පැවසුම් වස් දැන්හි සිත් ලත් සුගත් ඒ**
**අඟ පසඟතුරෙන් යත් යත් හුනැස් රැස් සිලිල් හා**
**විදු කලඹ සහස්නෙන් සන් විලස්නෙන් ගුවන් වි**
**සුගතනල වෙසින් යුත් නිඳු ලෙස්නෙන් දිගත් වි.**

අන්වය හා පදාර්ථ: **පෙළහර පැවසුම් වස් –** ප්‍රාතිහාර්ය දැක්වීම පිණිස, **ඒ සුගත් –** ඒ තථාගතයන්වහන්සේ, **දැන්හි –** ධ්‍යාන යෙහි, **සිත් ලත් –** චිත්තය ලූ කල්හි, **අඟපසඟතුරෙන් –** අඞ්ග ප්‍රත්‍යඞ්ගයන් අතුරෙන්, **සිලිල් හා –** ජලය හා, **හුනැස් රැස් –** වහ්නි රශ්මීන්, **යත් යත් –** යන කල්හි, **ගුවන් –** ආකාශය, **විදුකලඹ සහස්නෙන් –** විද්‍යුත් කලාප සහස්‍රයන්ගෙන්, **සන් විලස්නෙන් –** සංජනන වූ ආකාරයෙන්, **වි –** වූයේ ය. **දිගත් –** දිගන්ත, **සුගතනල වෙසින් –** යුගාන්ත මාරුතවේගයෙන්, **යුත් –** යුක්ත වූ, **නිඳු ලෙස්නෙන් –** සාගරයාගේ ආකාරයෙන්, **වි –** වූයේ ය. හෙවත් අතිශයින් සඝෝෂ වී.

**විස්තර:**

i පෙළහර පැවසුම් වස් දැන්හි සිත් ලත් සුගත් ඒ
අඟ පසඟ තුරෙන් යත් යත් හුනැස් රැස් සිලිල් හා
විදු කලඹ සහස්නෙන් සන් විලස්නෙන් ගුවන් වී.

ප්‍රාතිහාර්ය දක්වනු කැමැත්තන් ඒ ඒ කසිණ පිළිබඳ චතුර්ථ ධ්‍යානයන්ට සමවැද එයින් නැඟිට පරිකර්මචිත්තයෙන් මෙසේ වේව යි ඉටූ විට අභිඥාධ්‍යාන හා සමකාලයෙහි එසේ වෙ යි. මෙසේ හෙයින් ඒ තථාගතයන්වහන්සේ

පාදකධ්‍යානයන්ට සමවැද එයින් නැඟිට පරිකම් කොට අධිෂ්ඨාන කළ කල්හි පූර්වකායයෙන් ගිනි කඳ ද, අධඃකායයෙන් ජල කඳ ද නැවත ගිනි කඳ නැඟි පෙදෙසින් ජල කඳ ද ජල කඳ නැඟි පෙදෙසින් ගිනි කඳ ද යන ක්‍රමයෙන් රෝමකූප දක්වා අඞ්ගප්‍රත්‍යඞ්ගයන්ගෙන් ගිනි කඳ හා දිය කඳ නික්මිණ. තෙජෝ කසිණයෙහි පාදක ධ්‍යානයට සම වැද පරිකම් කොට අධිෂ්ඨාන කළ විට ගිනි කඳ ද ආපො කසිණයෙහි පාදක ධ්‍යානයට සම වැද පරිකම් කොට අධිෂ්ඨාන කළ විට දිය කඳ ද පවතී. මෙසෙයින් බුදුන් සිරුරින් ගිනි කඳ හා දිය කඳ අතිශයින් ශීඝ්‍ර ව නික්මෙත් ම ආකාශය විද්‍යුත් කලාප සහස්‍රයන් ගෙන් ගැවසුණාක් මෙන් වී.

(වාක්විෂයාතික්‍රාන්ත ව ශීඝ්‍ර ව පැවති ගිනි කඳ හා දිය කඳ විහිදීමට මේ උවම "මත් ගජරජුට තඹුලිස සදිසි කිරිමක්" මෙනි. එහෙත් අනන්‍ය සාධාරණ තථාගතයන් වහන්සේගේ ප්‍රාතිහාර්‍ය වර්ණනයෙහි දී සියලු කිවීන් ගොළුවන් වැනි වන හෙයින් මේ, කිවිවරයාණන්ට අගෞරව පිණිස නො වෙ යි.)

ii යුගනනල වෙයින් යුත් නිඳු ලෙස්නෙන් දිගන් වී.

යුගාන්ත මාරුතයෙන් යුක්ත වූ සාගරය සර්වප්‍රකාරයෙන් ඇලළී මහා ඝොෂයෙන් යුක්ත ව ගොඩබිම් යට කර ගෙන යෙ යි. එ සඳ ඇති වන ඝොෂය අතිමහත් වේ. ප්‍රාතිහාර්‍ය සමයෙහි දිගන්න ද එසෙයින් ම සඝොෂ වී, ඒ රැස් ව හුන් දිව්‍යමනුෂ්‍යාදි මහපිරිසෙහි සාධුකාර නාදදියෙනි.

**විපසනි :**

1. **අඟපසඟ** – ශරීරයෙහි ප්‍රධාන කොටස් හා අනු කොටස්.

2. **හුනැස්** - හුනැස් නම් ගිනි යි.

3. **කලඹ** – කලාප. 'කලප්' යි සිටි විට ප කාරයට බ කාර ව කලබ් යි වේ. ඒ සවර සහිත වූ විට කලබ යි ද මකාරාගමයක් පැමිණීමෙන් කලඹ යි ද සිද්ධ වේ.

4. **යුගනනල** – යුගන්හි නල = යුගන්නල. එය ම ව්‍යත්‍යය රැකීමට 'යුගනනල' යි වී. යුගාන්ත නම් කල්පයාගේ අන්තය හෙවත් නස්නා කාලය යි. ලොකය සත් සත් වරක් ගින්නෙන් ද අට වන අට වන වර ජලයෙන් ද නසී. ඉක්බිති එක් වරක් වාතයෙන් නසී.

5. **වී** – අතීත කාලික ප්‍රථම පුරුෂ එකවචන ක්‍රියා යි. දිගන් යි කර්තෘ පදය බහුබස් වුවත් අප්‍රාණ වාචක හෙයින් ක්‍රියාව එකවචන වී.

"සොඳ රන් රිදී දද බබලයි පුරවරෙහි" යනාදියෙහි මෙනි.

**53. නළල නෙත හුනැස්නෙන් දෙව් ගඟුල්ලේ වැටිමෙන්**
**පැහැසර ඉසුරු මෙන් අත් නො දිස්නා නැමීමෙන්**
**මමන ඇලි හිමයෙන් හා රක්දඹින් හෙම් කුළක් මෙන්**
**වනති දද සදෙව්ලෝ තෝ හුනැස් යුත් එ දම්නා.**

**අන්වය හා පදාර්ථ: නළල නෙත** – ලලාටනෙත්‍රයෙහි, **හුනැස් නෙන්** – වහ්නියෙන් ද, **දෙව් ගඟුල්ලේ** – දිව්‍ය ගඞ්ගා ජලයෙහි, **වැඩිමෙන්** – පැවැත්මෙන් (හා), **නැවිමෙන්** – නර්තනයෙන් ද, **අත් නොදිස්නා** – හස්තයන් දර්ශනය නො වන්නා වූ නොහොත් කෙළවරක් දර්ශනය නො වන්නා වූ, **පැහැසර** – ප්‍රභාවෙන් සාර වූ, **ඉසුරු මෙන්** – ඊශ්වරයා මෙනැයි ද, **මමන** – වැගිරෙන්නා වූ, **ඇලි සියෙන් හා** – නිර්ඣර ශතයෙන් හා, **රක්දරින්** – ගෛරික ධාරාවන්ගෙන් ද යුක්ත වූ, **හෙම් කුළක් මෙන්** – සුවර්ණ (පර්වත) කූටයක් මෙනැයි ද, **දද** – දග්ධ වූ, **සදෙව්ලෝ** – දෙවියන් සහිත ලොකවාසීහු, **නෝ හුනැස් යුත්** – ජලයෙන් හා වහ්නියෙන් ද යුක්ත වූ, **ඒ දමිනා** – ඒ ධර්ම ස්වාමීන්වහන්සේ, **වනති** – වර්ණනා කෙරෙත්.

**විස්තර :**

i තළල නෙත හුනැස්නෙත් දෙව් ගඟුල්ලේ වැඩිමෙන්
පැහැසර ඉසුරා මෙන් අත් නො දිස්නා නැවිමෙන්.

ඊශ්වරයාගේ නළලෙහි ද නෙත්‍රයක් ඇත්තේ ය. එය කොපයෙන් විවෘත කළ විට ගිනි විහිදෙ යි. ආකාශ ගඞ්ගා ප්‍රවාහය ඉසුරාගේ දළ මඩුල්ලට ගලා බසී. එහෙයින් හේ ජලයෙන් හා වහ්නියෙන් යුක්ත ය. ඊශ්වරයාට අත් සතරක් ඇතත් ශීඝ්‍ර ව නර්තනය කරන විට ඒ නො දක්නා ලැබෙයි. එහෙයින් ශරීරයෙන් ගිනි කඳ හා දිය කඳ විහිදුවමින් යමාමහපෙළහර දක්වන බුදුන් පූර්වොක්ත ලක්‍ෂණ ඇති ඉසුරා මෙනැ යි මුග්ධ දිව්‍ය මනුෂ්‍යයෝ එසඳ වර්ණනා කෙරෙති.

ii මමන ඇලි සියෙන් හා රක්දරින් හෙම් කුළක් මෙන්.

වැගිරෙන සියගණන් ජලධාරාවෙන් හා ගෛරික ධාරාවන්ගෙන් ද යුක්ත වූ පර්වත කූටයක් මෙනැ යි ද එසඳ වනති. බුදුන්ගේ ශ්‍රී ශරීරයෙන් නික්මෙන ජලධාරාවන් හා ගිනි දළු, පර්වතයෙන් වැගිරෙන ජලධාරාවන් හා ගෛරික ධාරාවන් හා ද සම ය. ගෛරික ධාරාවන් ගිනි කඳන් මෙන් රක්ත වර්ණ හෙයිනි. ගිනි කඳ හා දිය කඳ නික්මෙන බුදු සිරුර රන්වන් ය. එහෙයින් සුවර්ණ පර්වත කූටයක් මෙනැ යි ගැන්ම ද යෙදේ.

**විප්‍රසනී :**

1. **නළල** – 'නිටිල' ශබ්දයෙන් බුත් හෙයින් මධ්‍ය ළ කාරය මූර්ධන්‍ය වී. 'ලලාට' සඳින් 'නළළ' යි පැමිණේ.

2. **දෙව්ගඟුල්ලේ** – දෙව්ගඟ නම් විෂ්ණු දිව්‍යරාජයාගේ පාදාඞ්ගුෂ්ඨයෙන් පටන් ගෙන සැටදහසක් යොදුන් අහස්හි අවුත් කෛලාස වාසි මෙහෙසුරුගේ දළ මඩුල්ලට ගලාබසිතැ යි සලකනු ලබන ආකාශ ගඞ්ගාව යි. එහි ජලය 'දෙව්ගඟුල්' නමි. 'උගුල්' සද ප්‍රස්‍රවණ වාචි වුව ද මෙහි සාමාන්‍යයෙන් ජලවාචක වේ.

3. **වැටිමෙන්** – පැවැත්මෙන්; ආකාශ ගඞ්ගාව හිස මත ගලා බස්නෙන් ආකාශ ගඞ්ගා ජලයෙහි පැවතෙන්නේ (= වාසය කරන්නේ) නම් වේ. 'වට' ධාතුවෙන් භාවයෙහි සිද්ධ 'වැටිම' යන නාමයට 'එන්' විබත් ගත්සේ යි.

4. **වනති** – 'වන' ධාතුවෙන් සිද්ධ වර්‍තමාන කාලික ප්‍රථම පුරුෂ බහුවචන ක්‍රියා යි. මේ තත්කාල වර්‍තමාන යි. එනම් ඒ ක්‍රියාව පැවැති කාලය එලවා වර්‍ණිත ක්‍රියාවෙන් කීම යි.

5. **සදෙව්ලෝ** – දෙවියන් සහ වූයේ = සදෙව්, සදෙව් ද එ ම ලෝ ද = සදෙව්ලෝ.

6. **දම්නා** – ධර්‍මයට නායක හෙවත් ස්වාමි හෙයින් 'දම්නා' යනු බුදුන්ට නම්.

**54. එ මුනි යුවලැසින් හා *නෑ සිඳුම් කන් බිලෙන් හා**
**අඟ පසඟතුරෙන් හා ලොම්කුයෙන් ලොම්කුයෙන් හා**
**මමන දලදරින් හා පත් හුනැස් රැස් සියෙන් හා**
**සිය යස තෙද දැක්වී නන් දිගත් කුස් පුරා වන්.**

**අන්වය හා පදාර්‍ථ:** **එ මුනි** – ඒ සර්‍වඥ තෙම, **යුවලැසින් හා** – නෙත්‍ර යුගමයෙන් ද, **නෑ සිඳුම් කන්බිලෙන් හා** – නාසිකාච්ඡිද්‍ර කර්‍ණ බිලයන්ගෙන් ද, **අඟ පසඟතුරෙන් හා** – අඞ්ග ප්‍රත්‍යඞ්ග යන්ගේ අන්තරයෙන් ද, **ලොම්කුයෙන් ලොම්කුයෙන් හා** – රොමකූපයෙන් රොමකූපයෙන් ද, **මමන** – වැගිරෙන්නා වූ, **දලදරින් හා** – ජල ධාරාවන්ගෙන් ද, **පත්** – ප්‍රාප්ත වූ, **හුනැස් රැස් සියෙන් හා** – ශතසංඛ්‍යාත වහ්නිස්කන්ධයන් කරණ කොට ගෙන ද, **නන් දිගත් කුස්** – නොයෙක් දිශා කුක්ෂිය, **පුරා** – පූරණය කොට, **වන්** – ප්‍රවිෂ්ට වූ, **සිය** – ස්වකීය වූ, **යස තෙද** – යශස හා තෙජස, **දැක්වී** – දර්‍ශනය කරවී.

**විස්තර:**

i සිය යස තෙද දැක්වී නන් දිගත් කුස් පුරා වන්.

(පද්‍යයේ පූර්‍ව පාදත්‍රයෙන් කී නෙත්‍ර යුගමාදි ස්ථානයන්ගෙන් නික්මුත් දිය කඳින් හා ගිනි කඳින්) බුදුහු ලොක කුක්ෂිය පුරා පැතිර පැවති ස්වකීය කීර්‍තිය හා තෙජස දැක්වූහ. 'කීර්‍තිය ශුභ්‍රවර්‍ණය, තෙජස රක්ත වර්‍ණ ය'යි කිවිහු සලකති. එහෙයින් ශුභ්‍රවර්‍ණ ජලධාරාවන්ගෙන් කීර්‍තිය ද රක්තවර්‍ණ ගිනි කඳින් තෙජස ද දැක්වූහ යි කී අයුරැ යි.

**විපසනී:**

1. **යුවලැසින්** – යුවල ද එ ම ඇස් ද = යුවලැස්. එයින් යුවලැසින්.

2. **නෑ සිඳුම් කන් බිලෙන්** – නැහැයේ සිදුම් = නැසිදුම්; කන්හි බිල = කන්බිල; නැසිදුම් ද කන් බිල ද = නැසිදුම් කන්බිල. එයින් නෑ සිදුම් කන් බිලෙන්.

නාසිකා වාචී නැහැ ශබ්දයාගේ හ කාරාලොපයෙන් හා ඒ නිමිත්තෙන් වූ දීර්‍ඝයෙන් ද නෑ යි විය. සිඳුම් නම් සිදුර යි. කියන ලද මැ යි.

* නා දෙසින් - මුද්‍රිත පොත්.

**රුවන් මලෙහි :-**

"බිඟුරු, සිදුරු, සිල්, පුසුරු
විවර, **සිදුම්**, ‍ෙව් සම අත්" යි.

3. **ලොම්කුයෙන්** – ලොම්කු+එන්; ය කාරාගම වූ විට මින් අඩු වී සිද්ධ යි. රෝමකූප නම් රෝම මූලයෙහි වූ සියින් සිල් ය. මෙහි කූප ශබ්දය 'කූ' යි හෙළ බසට ගත් බව පෙනේ.

4. **මමන** – 'මම - වැගිරීමෙහි' ධාතු කෙරෙන් න ප්‍රත්‍යය ව සිද්ධ කෘදන්ත යි.

5. **දක්වී** – 'දිස්' ධාතු කෙරෙන් ඊ විබත් යෙදී සිද්ධ ක්‍රියා යි. දිස් ධාතුහට 'දක්' ආදේශ ද ප්‍රයෝජ්‍ය 'ව' ප්‍රත්‍යය හා මත් වැඩි ද වීමෙන් සිද්ධ යි.

**55. මිණි බිත සිය සේ සේ රූ විලස්නෙන් නුවන් ගත්**
**මුනි නිමවි සුගත් ඒ දම් දෙසුම් වස් ගුවන්හී**
**මමන අමරනී මෙන් දම් දෙසා සව් සැපත්ද**
**මුනිරජ පුළුවුත් දම් ඒ සුගත් වි අරුත් පෑ.**

**අන්වය හා පදාර්ථ: ඒ සුගත්** – ඒ තථාගත තෙම, **මිණිබිත** – මාණික්‍ය භිත්තියෙක්හි, **සියසේ සේ** – ස්වකීය ඡායාව බඳු වූ, **රූ විලස්නෙන්** – රූප විලාසයෙන්, **නුවන් ගත්** – නෙත්‍ර ග්‍රහණය කළා වූ, **මුනි** – බුදු කෙනෙකුන්, **දම් දෙසුම් වස්** – ධර්ම දේශනා කිරීම පිණිස, **ගුවන්හි** – ආකාශයෙහි, **නිමවි** – නිර්මාණය කෙළේ ය. **මුනිරජ** – මුනිරාජයන්, **මමන** – වැහෙන්නා වූ, **අමරනී මෙන්** – ආකාශ ගඞ්ගාව මෙන්, **සව් සැපත්ද** – සියලු සම්පත්ති දායක වූ, **දම්** – ධර්මය, **දෙසා** – දේශනා කොට, **පුළුවුත්** – ප්‍රශ්න වශයෙන් විචාරන ලද, **දම්** – ධර්මය, **ඒ සුගත්** – ඒ නිර්මිත සර්වඥ තෙම, **අරුත් පෑ** – අර්ථයන් දක්වා, **වි** – කථනය කෙළේ ය.

**විස්තර :**

i මිණිබිත සියසේ සේ රූ විලස්නෙන් නුවන් ගත්
මුනි නිමවි සුගත් ඒ දම් දෙසුම් වස් ගුවන්හි.

මාණික්‍ය භිත්තියක දක්නා ලැබෙන ස්වකීය ඡායාව තමා බඳු ම වෙයි. එහෙයින් තථාගතයන් වහන්සේ තමන් බඳු වූ ම රම්‍ය බුදුරුවක් ධර්මදේශනා කිරීම පිණිස අහසෙහි මැවූහ යි කී අයුරු යි.

ii මමන අමරනී මෙන් දම් දෙසා සව් සැපත්ද.

ආකාශ ගඞ්ගාව අවිච්ඡින්න ව ගලා බසී. එ මෙන් අතරක් නැති ව සියලු ලෞකික ලෝකෝත්තර සම්පත්ති දායක දහම් දෙසා ය යි කී අයුරු යි.

**විපසනී :**

1, **මිණිබිත** – මිණියෙන් කළ බිත = මිණිබිත,

2. **නුවන් ගත්** - නුවන් ගැන්ම නම් සතුටු කොට අවනත කර ගැන්ම යි. එසේ කළ හැක්කේ සුරූප වූ විට ය.

3. **අමරනි** - අමරයන්ගේ නී = අමරනී. ආකාශ ගඞ්ගාව යි.

4. **මුනිරජ** - අගාරියමුනි, අනගාරියමුනි, සෙඛමුනි, අසෙඛමුනි, පච්චෙකමුනි යන මුනීන්ට ප්‍රධාන හෙයින් බුදුන්වහන්සේට නමි.

5. **පුළුවුත්** - 'පරිපුච්ඡිත' ශබ්දශ්‍රයෙන් පැමිණි නිපාතන කෘදන්ත රූප යි.

**56. පබළ දලනිදන්හි හෙම්මුවා නැව් විලස්නෙන්**
**සතුරෙන රජ හස් වන් රත් සහස් සත් වෙනේහි**
**නොමඳ සඳ වලා රැස් පත් සහස් රැස්හු දප් බුන්**
**සවැනිය කො වනද්ද සත් රුවන් සක්මනේහි.**

**අන්වය හා පදාර්ථ: පබළ දලනිදන්හි** - ප්‍රවාල සාගරයෙක්හි, **හෙම් මුවා නැව් විලස්නෙන්** - සුවර්ණමය නෞකා විලාසයෙන් ද, **රත් සහස් පත් වෙනේහි** - රක්ත පද්මවනයෙක්හි, **ගමනොන** - ගමනට ප්‍රවෙශ වූ (= ගමන් ගත්), **රජ හස් වන්** - රාජ හංසයකු බඳු වූ ද, **නොමඳ** - බොහෝ වූ, **සඳ වලා රැස්** - සන්ධ්‍යාවලාහක රාශියකට, **පත්** - පැමිණියා වූ, **සහස්රැස්හු** - සූර්‍ය්‍යයාගේ, **දප්** - දර්පය, **බුන්** - භග්න කළා වූ, **සත්රුවන් සක්මනේහි** - සප්ත රත්නමය චඞ්ක්‍රමණයෙහි වූ, **සවැනිය** - සර්වඥයන් වහන්සේ, **කො** - කවර කෙනෙක්, **වනද්ද** - වර්ණනා කෙරෙත් ද?

**විස්තර:**

සප්තරත්නමය වූ චඞ්ක්‍රමණයෙහි සක්මන් කරන්නා වූ එහෙයින් ම ප්‍රවාල සාගරයෙහි වූ සුවර්ණමය නෞකාවක් වැනි වූ ද, රත්නෙළුම් වනයක ගමන් ගත් රාජ හංසයකු වැනි වූ ද, සන්ධ්‍යා වලාපටලයන්ට පැමිණි සූර්‍ය්‍යයා වැනි වූ ද මුනින්ද්‍රයන් වහන්සේ කවුරු වර්ණනා කෙරෙත් ද? මෙ කී උපමානයෝ බිඳුමාත්‍ර වූ තුල්‍යත්වයක් හඟවති. තත්වාකාරයෙන් කිසිවකු විසින් වර්ණනා නො කළ හැකි ය යනු කිවිඳුගේ අදහස යි. රත්නයන් රක්තවර්ණ විශෙෂයෙන් සලකනු ලබන හෙයින් සත්රුවන් සක්මන ප්‍රවාල සාගරයක් මෙනැ යි ද, රත් නෙළුම් වනයක් මෙනැ යි ද සැඳෑ වලා මෙනැ යි ද ගන්නා ලදී.

එහි වූ රන්වන් බුදුන් රන් නැවක් මෙනැ යි ද, රාජහංසයකු මෙනැ යි ද, සන්ධ්‍යාසූර්‍ය්‍යයා මෙනැ යි ද ගන්නා ලදහ. එ කී පදාර්ථ ද සුවර්ණවර්ණයෙන් යුක්ත හෙයිනි. රාජහංසයා වනාහි ශ්වෙතවර්ණ ය. මෙහි 4 වන පිටපතිය බලනු. සන්ධ්‍යා සූර්‍ය්‍යයා රක්තවර්ණයෙන් දක්නා ලැබේ. කවි සමයෙහි සුවර්ණවර්ණ රක්තවර්ණයන්ගේ වෙනසක් නො සැලකේ.

**ටිප්පනී :**

1. **පබල දලනිදන්හි** – දල නිදන් නම් සාගරය යි. පබළ වන් දලනිදන් = බබළදලනිදන්. පබළු වන් පැහැයෙන් යුත් (= රක්තවර්ණ) දිය ඇති සයුරක් ඇති බව **සුප්පාරකජාතකයෙහි** ද කියන ලදී.

2. **විලස්නෙන්** – විලාසයෙන් යුක්ත වූ; උපලක්ෂණාර්ථයෙහි කරණ විබත්.

3. **යතුරෝත** – යතුර + ඔත, යතුර නම් යාත්‍රාව (= ගමන) යි. යතුරට ඔත් (= ප්‍රවේශ වූයේ) යතුරෝත් නම්. ඔත් යනු 'ඔ - පිවිසීමෙහි' ධාතුවෙන් සිද්ධ කෘදන්ත යි.

4. **රජහස්** – රත්වන් පා තුඩු ඇති ශ්වේතවර්ණ හංසයෝ රාජහංස නම් වෙත්. එහෙයින් මෙහි ගත යුතු වූයේ 'රණහස් වන්' කියා යි. 'රණහස්' නම් ස්වර්ණවර්ණ හංසයෝ යි.

5. **දප්** – දපී නම් එඬිය යි.

6. **බුන්** – 'බිඳ' ධාතුවෙන් කර්ම කර්තෘ කාරකද්වයට සම ව සිද්ධ කෘදන්ත යි. මෙහි කර්තෘකාරකයෙහි වේ.

7. **සවැනිය** – සර්වඥයන් වහන්සේට නමකි. කියන ලද මැ යි

**රුවන්මලෙහි :–**

"මොකැදුරු, සිදු, දිනිඳු
ලොවිඳු, සවනා, සවැනිය" යි.

8. **කො** – කවුරු හෝ කවර දෙයක් යන අරුත්හි යෙදේ. මෙහි පලමු කී අර්ථයෙහි යි. ප්‍රකෘතියෙන් සිට පෙරවිබත් බුහුබස් අරුත් පැවසූ සේ යි. මෙහි 'කො' යනු ම ප්‍රකෘතිය ලෙස සැලකිය යුතු ව තිබේ. මෙසේ යෙදීම ඡේක ප්‍රයෝගානුකූල යි.

**කව්සිළුමිණෙහි :–**

"කිබිසි කල රන් තුතු – සුදුසු කිරා තරාදි
මද රස රූ තිවට වට – යුගදන මඬුලු **කො වනත්**" යි.

මෙය ප්‍රකෘතියෙන් සිට එකවචනාර්ථය ද පවස යි.

**කුසජාතකයෙහි :–**

"නතනා විනා **කො වනා** සොබන එ උය නා" යි.

'කොතෙක් – කෝතෙක්, කොපමණ – කෝපමණ' ආදි ව්‍යවහාර දක්නා ලැබෙන හෙයින් පිළිපෙරළියෙන් 'කෝ' යි සිටින බව ද පෙනේ.

9. **වනද්ද** – 'වනත් ද' යි කිය යුතු තන්හි වෘත්තය පිණිස ද කාරස්ථ අකාරයට මත්වැඩි හා 'ත්' වර්ණයට පරරූප වීමෙන් ද සිද්ධ යි.

10. **සත්රුවන්** – රන්, රිදී, මුතු, මැණික්, වයිරෝඩි, දියමන්ති, පබළු, මේ සත ම දක්වූහ

අභිධානප්‍රදීපිකාවෙහි:-

"සුවණ්ණං රජතං මුත්තා - මණිවේළුරියානි ච
වජිරං ච පවාළන්ති - සත්තාහු රතනානිමෙ" යි.

**57.** **ඉති පෙළහර සිත් සේ නන් විලස්නෙන් ම දක්වා**
**එමුනිරජ සරකල් පත් ගුවන් සේකැලුම් මෙන්**
**මුළුදිය මහවිල්හි සවු විනේ නේ දනා සිත්**
**කොඳ කුමුදු වෙනේ හස් බින්නෙ තුස්වා දනා රැස්.**

**අන්වය හා පදාර්ථ:** **එ මුනි රජ** – ඒ සර්වඥරාජ තෙමේ, **ඉති** – මෙසේ, **පෙළහර** – ප්‍රාතිහාර්‍ය්‍ය, **සිත් සේ** – අභිප්‍රාය පරිද්දෙන්, **නන් විලස්නෙන් ම** – අනේකාකාරයෙන් ම, **දක්වා** – දර්ශනය කරවා, **දනා රැස්** – ජන සමූහයා, **තුස්වා** – සන්තොෂ කොට, **සරකල්** – ශරත් කාලයෙහි, **ගුවන්** – ආකාශයට, **පත්** – පැමිණි යා වූ, **සේකැලුම් මෙන්** – චන්ද්‍රයා පරිද්දෙන්, **මුළුදිය** – සමස්ත ලොක නමැති, **මහවිල්හි** – මහා තඩාගයෙහි, **සවු විනේ නේ දනා** – ශ්‍රාවකය, අනේක වෛනෙය ජනය යන මොවුන්ගේ, **සිත්** – චිත්ත නමැති, **කොඳ කුමුදු වෙනේ** – කුඳ කුමුද වනය, **හස් බින්නෙ** – ප්‍රබොධ කෙළේ යි.

**විස්තර:**

ඒ සර්වඥයන් වහන්සේ මෙසේ පෙළහර දක්වා ජනයා සන්තොෂ කොට ශරච්චන්ද්‍රයකු මෙන් ලොක නමැති විල්හි වූ ශ්‍රාවකය, වෛනෙය ජනය යන මොවුන්ගේ චිත්ත නමැති කුඳ කුමුද වනය ප්‍රබොධ කළසේක. මෙහි ශ්‍රාවකයන්ගේ සිත් කුඳ කුසුම් යයි ද සෙසු වෛනෙය ජනයන්ගේ සිත් කුමුද යයි ද රූපක වශයෙන් ගන්නා ලදී. හස් බිඳීම නම් විවෘත කිරීම හෝ විකසිත කිරීම යි. මෙහි ශ්‍රාවකයන්ගේ හා වෛනෙය ජනයන්ගේ සිත් ප්‍රබොධ කිරීම නම් මාර්ග ඵලයන්ට පැමිණවීම යි. ශරත් කල්හි චන්ද්‍රයා බාධා රහිත ව බබළන හෙයින් කුඳුදීන් පුබුදුවීමෙහි විශෙෂයෙන් සමර්ථ වෙයි. එ මෙනැයි හීමෙන් මාර්ග ඵලාවබොධය බාධාරහිත ව මැනවින් ම කළ බව හඟවති. සිත් ගුණධර්මයන්ගෙන් ක්‍රමයෙන් වර්ධනය වීම කුඳුදීන්ගේ මුහුකුරා යෑමක් වැන්න. ගුණධර්මයන්ගේ කොළවර වූ මාර්ග ඵල ලැබීම පුබුදුවීමක් වැන්න. කුඳුදීන්ගේ ප්‍රබොධයට වැඩි වර්ධනයෙක් නැත. එ මෙන් ඉන් උසස් අග්‍රයක් නැති ලෙස චිත්තයන්ගේ වර්ධනය නම් මගපල පිළිලැබීම යි.

**ටිප්පනී:**

1. **සරකල්** – සර ද එ ම කල් ද = සරකල්. එනම් වප් හිල් දෙ මස යි. විස්තර 20 වන පද්‍යයේ 6 වන ටිප්පනියෙන් දත යුතු.

2. **සවු** – සසුන්හි ලදි පැවිදි වූවෝ ශ්‍රාවක නම් වෙති. සර්වඥයන්ගේ පුත්‍රත්වයට පැමිණි හෙයිනි.

3. **විනේ** – බුදුන් වහන්සේගේ ධර්මදෙශනාවෙන් හික්මෙනසුලු, මාර්ග ඵලාදියක් ලැබිය හැකි, හෙතු සම්පන්නයෝ වෛනෙය ජනයෝ යි. මෙහිත්

ශ්‍රාවකයන් අතුරත වූ වෛනෙය ජනයෝ ද වාච්‍ය වෙති. එහෙත් 'සවු' යි ශ්‍රාවකයන් මෙන් කොට ගත් හෙයින් මෙහි දී ශ්‍රාවකත්වයට නො පැමිණි සිරි හික්මවිය යුතු ජනයෝ ම ගන්නා ලැබෙති.

4. **කොඳ** – චන්ද්‍රරශ්මීන් විකසිත වන කුමුද නම් ජලජ කුඩා මල් වෙසෙස.

5. **කුමුදු** – කුමුදු සඳ සුදු උපුල් සුදු ඕලු ආදිය වාචක ය. මෙහි රාත්‍රිකාලයෙහි විකසිත වන, කුමුද නම් පුෂ්ප විශෙෂ වාචි වේ. කුමුදකුසුම් චන්ද්‍රකාන්තියෙන් විකසිත වන බව කීහ **ශ්‍රීරාහුල** මාහිමියෝ ද

**ශාරිකා සන්දේශයෙහි :-**

"පෙරව **සඳකිරණ** පිපි **කුමුදු** මල් වවින්" යි.

6. **හස් බුන්නෙ** – හස් බිඳීම නම් ලාඤ්ඡන බිඳීම යි - හෙවත් විවෘත කිරීම යි. යමක් විවෘත කරන විට එහි තබන ලද ලාඤ්ඡන කැඩිය යුතු හෙයිනි. කුමුදීන්ගේ විවෘත කිරීම නම් ප්‍රබොධ කිරීම යි. 'බිඳ' ධාතුවෙන් සිද්ධ බුන් යන කෘදන්තයා කෙරෙන් ප්‍රථමා විභක්ති එකවචන 'ඒ' පස යෙදීමෙන් 'බුන්නේ' යි සිද්ධ යි. ඇතැම් විට වාක්‍යාවසාන ය කාරය හා යෙදීමෙන් 'බුන්නේය' යි ද යෙදේ. මෙහි වෘත්තය රැකීම පිණිස 'ඒ' ප්‍රත්‍යයට මත් අඩු වී.

**58. සුරිඳු බඹ වසම්නෙත් ඈ මහත් දෙව් පිරිස් රැස්**
**නෙත * පෙණෙලි තබා බි රුසිරි පුල් අමාවිල්**
**ගැලෙමිනොහු පියුම් පා නී කැලුම් දෙව් ගඟුල්ලේ**
**සැණකෙළිය අවුත් පා † බැන්දෙ සිත් සේ සතොස්මින්.**

**අන්වය හා පදාර්ථ :** **සුරිඳු** – ශක්‍රය, **බඹ** – බ්‍රහ්මය, **වසම් නෙත්** – ඊශ්වරය, (යන) **ඈ** – මේ ආදි, **මහත්** – විශාල වූ, **දෙව් පිරිස් රැස්** – දිව්‍ය පර්ෂත් සමූහයා, **රුසිරි** – (බුදුන්ගේ) රූපශ්‍රී නමැති, **පුල් අමා විල්** – පුෂ්පිත අමෘත තඩාගය, **නෙත පෙණෙලි** – නෙත්‍ර නමැති ප්‍රණාලිකාවන්, **තබා** – ස්ථාපනය කොට, **බි** – පානය කොට, **ඔහු** – ඒ සර්වඥයන් වහන්සේගේ, **පියුම් පා** – පද්මයන් බඳු පාදයන්ගේ, **නී කැලුම්** – නව කාන්ති නමැති, **දෙව් ගඟුල්ලේ** – ස්වර්ණදී ජලයෙහි, **ගැලෙමින්** – නිමග්න ව, **සතොස් මින්** – සන්තුෂ්ට ව, **අවුත්** – (සමීපයට) පැමිණ, **සැණ කෙළිය** – උත්සව ක්‍රීඩාවෙහි, **සිත් සේ** – රුචි වූ පරිද්දෙන්, **පා බැන්දේ** – පාදබන්ධනය කෙළේ – හෙවත් නෘත්‍යාරම්භ කෙළේ යි.

**විස්තර:**

i නෙත පෙණෙලි තබා බී රුසිරි පුල් අමාවිල්,

නෙත්‍ර ප්‍රණාලිකා තබා රූපශ්‍රී නමැයි විකසිත අමෘත තඩාගය බීම නම් නෙතින් රූප ශ්‍රිය නැරඹීම යි. දූරස්ථානයෙක වූ ද විලින් ජලය ගෙන බීමට ප්‍රණාලිකා (= පීලි) ඉවහල් වෙයි. එ මෙන් දූරයෙහි වූ බුදුසිරි නෙත්‍රයන්ගෙන් සිත් සේ දැක ගත්හ යි කී අයුරු යි.

---

* පෙණෙල - ඇතැම. † වැන්ද - මුද්‍රා.

ii ගැලෙම්තොසු පියුම් පා නී කැලුම් දෙව්ගඟුල්ලේ,

ඒ බුදුන්ගේ පියුම් බඳු ශ්‍රීපාදයන්හි ශ්වෙත නඛ පඞ්ක්තියක් ඇත්තේ ය. එයින් ධවල වූ කාන්තිය විහිදෙයි. එ ද ශ්වෙත වර්ණහෙයින් හා අහස් කුස සිට ගලා බස්නා හෙයින් ද ආකාශගඞ්ගා ජලයක් වැන්න.

iii සැණකෙළිය අවුත් පා බැන්දෙ සිත් සේ සතොස්මින්,

සැණකෙළියෙහි පා බැඳීම නම් නෘත්‍ය කිරීම යි. දිව්‍ය බ්‍රහ්ම සමූහයා උත්සව ක්‍රීඩා කෙළේය යි කී අයුරු යි,

**විපසනී :**

1. **සුරිඳු** – සුරන්ගේ ඉඳු = සුරිඳු. ශක්‍රයා යි.

2. **වසම්නෙත්** – වසම් නෙත් ඇත්තේ යමකුහට ද ඒ = වසම්නෙත්. ඊශ්වරයා යි. ඔහට නෙත් තුනක් ඇති හෙයිනි. වසම් නම් 1, 3 ආදි විෂම සඞ්ඛ්‍යාවෝ යි.

3. **පෙණෙලි** – ප්‍රණාලිකා හෙවත් පීලි.

4. **පුල් අමාවිල්** – මෙහි පුල් යි යෙදීම උපමෙය වස්තුව හා තුල්‍යත්ව යක් දැක්වමත් නො ව උපමානයාගේ ශොභාවෙන් ගුරුත්වය කීමෙන් උප මෙය වූ රූපශ්‍රියෙහි ආධික්‍යය හැඟවීම පිණිස යි.

5. **නි කැලුම්** – නඛයන්ගේ කාන්තිය නීකැලුම් නම්. නී නම් නිය යි.

6. **සැණකෙළිය** – උත්සව ක්‍රීඩාව සැණකෙළි නම්. සැණසද පම ණක් මෙහි ඉෂ්ටාර්ථය දීමට සමර්ථ ය. එහෙත් අර්ථය ප්‍රකට වනු වස් කෙළි සදක් ලං කරන ලදී.

7. **බැන්දෙ** – 'බඳ - බැඳීමෙහි' ධාතුකෙරෙන් 'ඒ' විබත් යෙදී සිද්ධ අතීත කාලික ප්‍රථම පුරුෂ එක වචන ක්‍රියා යි. 'දෙව් පිරිස් රැස්' යි සමූ හාර්ථ වාචි පදයක් උක්ත වුව ද, එක වචන හෙයින් ක්‍රියාව එකවචනයෙන් සිටීම නිදොස.

**ගුත්තිලයෙහි :-**

"**ගජසෙන්** සිහියම් ගජසිරි **කියෙලි**" යි.

සිංහලයෙහි දී මෙ බඳු තන්හි ක්‍රියාව බහු වචනයෙන් තැබීම ද නිදොසි.

**59. සව්ලෝ එකැස් බඳු සුපුල් දසඹුල් පියුම්හී**
**සිත් සේ ගනුත් රුසිරි රෙන් සියනෙත් බිඟුන් කැන්**
**දසැස් නමා නෙතුපුලන් නො පියා ම දක්නා**
**දෙවියොන් *දිනුම් පල ලදින් රිසි සේ සතොස් වී.**

**අන්වය හා පදර්ථ:** **දසැස්** – ශක්‍ර තෙම, **සිය නෙත්** – ස්වකීය නෙත්‍ර නමැති, **බිඟුන් කැන්** – භෘඞ්ග සමූහයා, **සව්ලෝ** – සකල ලොකයට, **එකැස් බඳු** – අසහාය නෙත්‍රයක් වැනි වූ, **සුපුල්** – මනා ව විකසිත වූ, **දසඹුල් පියුම්හී** – සජීඥ නමැති පද්මයෙහි,

---

* නිපන් - ඇතැම්.

**රූසිරි රොන්** – රූපශ්‍රී නමැති රේණූන්, **සිත් සේ** – අභිමත ආකාරයෙන්, **ගනුත්** – ගන්නා කල්හි, **තමා** – තමාගේ, **නෙතුපුලන්** – නෙත්‍රොත්පලයන්, **නො පියා ම** – නිමීලනය නො කොට ම, **දක්නා** – දර්ශනය කරන්නා වූ, **දෙව්යොන්** – දිව්‍ය යොනියෙහි, **දිනුම්පල** – ඉපදීමෙහි ඵලය, **ලදින්** – ලද්දෙන්, **රිසි සේ** – අභිමත පරිද්දෙන්, **සතොස් වී** – සන්තොෂ වී.

**විස්තර :**

දිව්‍යයෝනීන්හි ජාත වූවෝ ඇසිපිය නො හෙළති. එ හෙයින් ඔහු ඇසිපිය හෙළනා කලක් පමණකුදු අතර නො තබා කැමැති දෙයක් දැකිය හැකි වෙති.

ශක්‍රයා, ස්වකීය නෙත්‍රභෘංගයන් බුදුන්ගේ රූපශ්‍රී නමැති රේණූන් ගන්නා කල්හි හෙවත් තම නෙත්‍රයන් බුදු සිරි බැලීමෙහි ආසක්ත වූ කල්හි ඇසිපිය හෙළීමෙන් ද අතරක් නැති ව දැකිය හැකි හෙයින් දිව්‍යාත්මභාවය ලැබීමෙහි ඵලය ලද්දේ ය.

කුතුහල භාවයෙන් බුදුසිරි නැරඹීමෙහි අත්‍යන්තයෙන් ආසක්ත වූ බව කී සේ යි.

**පිපසනී :**

1. **දසබූල්** – 'දසබල' ශබ්දයෙන් වහරට ගත් සේ යි. 'දසබුල්' යි කිය යුතු තන්හි සුඛොච්චාරණීය පිණිස ඌන මාත්‍රයක් පැමිණීමෙන් 'දස බූල්' යි විය. 'සහබල - සුහුබුල් - සුහුබූල්' ආදිය මෙනි.

2. **රොන්** – රේණු හෙවත් පරාග. පුෂ්ප කෙශරයන්හි ඇති රත් වන් සුණු.

3. **නෙත් බිගුන් සැත්** – ශක්‍රයාට ඇස් දහසක් ඇතැ යි කියන හෙයින් 'නෙත් බිගුන් සැත්' යි කීහ. ධර්මයෙහි වනාහි 'දහසක් අරුත් එක විට දැකිය හැකි නැණැසක් ඇති හෙයින් සහසැස් යයි කියනු ලැබේ' යයි දක්නා ලැබේ. කිවිහු තමන් නො අදහන, කවිසමයෙහි එන, සෙදුම් ස්වකීය කාව්‍යය රසවත් කිරීම පිණිස යොදති.

4. **තමා** – සබද විබති. 'දෙව්යොන් දිනුම්' යන තන්හි දිනුම් යන භාව කෘදන්ත පදය හා මේ සම්බන්ධ වේ.

5. **නෙතු පුලන් නො පියා ම දක්නා** – මේ දෙව්යොන් යන්නට විශෙෂණ යි.

**'උපුලන්'** – 'උපුල්' යි යෙදිය යුතු තැන පුංලිඞ්ග වශයෙන් නෙණ මෙසේ යොදන ලදී. 'ඇඟිල්ලෝ, නියපොත්තෝ, කුසුමන්' යනාදිය මෙනි.

**සංලක්ෂ්‍යය :**

1. **වෘත්තය – වසන්ත තිලකා** යි. ලක්ෂණ පෙර කී හෙයින් දත්නේ ය. (65 වන පද්‍යය තෙක් මේ වෘත්තින් ම නිබද්ධ යි.)

60. ස ක් ම න් සුරන් මග සුගත් පිනිපා දහම් රැස්
ම ත් ව ත් බි බි සියසවන් සියුරන් වෙසෙස්නෙන්
තො ස් නෙ න් අනත් ගුණ වනත් මඳ බැවුනි සිව්වත්
ග න් මි න් එසත් * නට නටා තිවටා වටා යත්,

**අන්වය හා පදාර්ථ :** **සක්මන් සුරන් මග** – චඞ්ක්‍රමණ නමැති ආකාශයෙහි වූ, **සුගත් පිනිපා** – සර්වඥ නමැති චන්ද්‍රයාගේ, **දහම් රැස්** – ධර්ම නමැති රශ්මිය, **සිය සවන්** – ස්වකීය ශ්‍රවණ නමැති, **සියුරන්** – චකෝරයන්, **බි බි** – පානය කෙරෙමින්, **වෙසෙස්නෙන්** – විශෙෂයෙන්, **මත් වත්** – මත්තභාවයට පැමිණෙන කල්හි, **තොස් නෙන්** – සන්තොෂයෙන්, **අනත් ගුණ වනත්** – අනන්තගුණ වර්ණනය කරත් හොත්, **සිව්වත්** – චතුර්මුඛය, **මඳබැවුනි** – මන්දභාවයෙන් (නොපොහොනා බැවින්), දෙසෝ නොහොත් **අනත්** – අනන්ත නාගරාජයා, **ගුණ වනත්** – ගුණ වර්ණනා කරණ කල්හි, **සිව්වත්** – මුඛචතුෂ්කය, **මඳ බැවුනි** – (වර්ණනාවට) මන්දභාවයෙන්, **තිවටා** – බ්‍රහ්මයා, **එ සත්** – ඒ ඡත්‍රය, **ගන්මින්** – ග්‍රහණය කොට, **නට නටා** – නෘත්‍ය කෙරෙමින්, **වටා** – හාත්පස්හි, **යත්** – යන කල්හි;

**විස්තර :**

තථාගතයන් වහන්සේගේ ධර්මය අසමින් ශ්‍රවණයන් සතුටු වන කල්හි, අනන්ත ගුණ වැනීමට මුඛ සතර මඳ හෙයින් හෝ දහසක් මුව ඇති අනන්ත නාගරාජයා ගුණවර්ණනා කරන කල්හි, එබඳු වර්ණනයකට තම මුව සතර ප්‍රමාණ නො වන හෙයින් බ්‍රහ්මයා ඡත්‍රය ගෙන නෘත්‍ය කෙරෙමින් තථාගතයන් වහන්සේගේ හාත්පස යන කල්හි;

මෙහි කර්ණයන් චකෝරයන් (= ඇටිඹුලන්) ය යි රූපක කොට ගත් හෙයින් ධර්මය සඳරැසැයි ද තථාගතයන්වහන්සේ චන්ද්‍රයා ය යි ද චඞ්ක්‍රමණය ආකාශයය යි ද රූපක කොට ගත්හ.

**ටිප්පනී :**

1. **සුරන් මග** – අහසට නමි. දෙවියන්ට මාර්ගය වන හෙයිනි.

2. **පිනිපා** – චන්ද්‍රයා. පිනි (= හිම) එව් පා (= කිරණ) වන්නේ යමකු හට ද හේ = පිනිපා.

3. **වත්** – කාලාර්ථයෙහි අසමාප්‍ය ක්‍රියා යි.

4. **බි බි** – 'පා - බීමෙහි' ධාතුවෙන් පර ව 'ඊ' ප්‍රත්‍යය ව ධාතු ප කාරයහට බ කාරාදෙශ වීමෙන් හා පූර්වස්වර ලොපයෙන් 'බි' යි පූර්වක්‍රියා රූපය ලැබේ. ඔහුගේ ද්විත්වයෙහි 'බී බී' යි ලැබේ. මෙ බඳු තන්හි පූර්ව පදයාගේ අන්ත්‍යස්වරයට මත් අඩු වීම ශබ්ද ධර්මයක් හෙයින් 'බි බි' යි සිද්ධ යි. පූර්වක්‍රියාව ද්විත්ව වූ විට මිශ්‍ර ක්‍රියාර්ථය ලැබේ. 'පා' ධාතුවට පො, බො යන ආදෙශයෝ ද වෙත්.

---

* වට වටා තිව්වා නටා ගොස් – ඇතැම්.

5. **සියුරන්** – සියුරු + අන්. මෙහි සියුරු යනු ඇවිතුලත්ව නම්.

6. **අනත්** – අනන්ත (= අප්‍රමාණ) හෝ අනන්ත නම් නාගරාජයා. අනන්ත නාගරාජයා මුව දහසක් ඇති හෙයින් වර්ණනා කිරීමෙහි අතිසමර්ථ තෙක් ල.

7. **ගත්මින්** – 'ගත්' ධාතුවෙන් සිද්ධ මිශ්‍ර ක්‍රියා කෘදන්ත යි. මෙහි පූර්ව ක්‍රියාර්ථයෙහි වේ.

8. **එසත්** – මෙහි 'එ' සද ප්‍රසිද්ධාර්ථයෙහි ය. බ්‍රහ්මයාගේ අතෙහි සුදු කුඩයක් ඇති බව ප්‍රසිද්ධ ය.

9. **නට නටා** – 'නටා' යනු 'නට' ධාතුවෙන් ආ ප්‍රත්‍යය යෙදී සිද්ධ පූර්ව ක්‍රියා යි. සෙස්ස මෙහි ම 4 වන ටිප්පණියෙන් දත යුතු.

10. **තිවටා** – තිවට + අං. 'තිවට' යි බ්‍රහ්මයාට නම්.

**61. නෙත්කල්හු රූ රුසිරු මී නුවනත්පුටෙන් බි**
**මත් වූ එ පන්සිළු තමා වෙණ ලා * සදත්හි**
**ගාමින් අමින් ගුණමුවා ලියනු ගගා ගී**
**සුන්නත් නො දත් නටමිනත් වටමින් එකල්හි.**

**අන්වය හා පදාර්ථ : එ කල්හි** – තත් කාලයෙහි, **නෙත්කල්හු** – නෙත්‍ර කාන්තයන් (= සර්වඥයන්) වහන්සේගේ, **රූ රුසිරු මී** – රූප ශ්‍රී නමැති රුචිර වූ මධුව, **නුවන්** – නෙත්‍ර නමැති, **අත්පුටෙන්** – හස්තපුටයෙන්, **බී** – පානය කොට, **මත් වූ** – මත්තභාවයට පැමිණියා වූ, **එ පන්සිළු** – ඒ පඤ්චශිඛ තෙම, **තමා** – තමාගේ, **වෙණ** – වීණාව, **සදත්හි** – සවජත්‍රුවෙහි, **ලා** – තබා, **ගාමින්** – වාදනය කරමින්, **අමින් ගුණමුවා** – අපරිමිත ගුණමය වූ, **ලියනු ගී** – ලයාන්විත ගීතයන්, **ගගා** – ගායනා කෙරෙමින්, **අත් වටමින්** – හස්තයන් සිසාරමින්, **නටමින්** – නෘත්‍ය කෙරෙමින්, **සුන් තත්** – ඡින්න වූ තන්ත්‍රීන්, **නො දත්** – ජානනය නො කෙළේය.

**විස්තර :**

**පන්සිළු** තෙම බුදුරජාණන් වහන්සේගේ රූපශ්‍රී නමැති මධුව නෙත්‍ර නමැති හස්තපුටයෙන් බී මත් විය. ඒ රූපශ්‍රිය දැකීමෙන් ප්‍රීතීන් මත් වූ බැව් කී සේ යි. ඉක්බිති '**බෙළුව පණ්ඩු**' නම් ස්වකීය වීණාව ජත්‍රුවෙහි (= උරහිසෙහි) තබා ගෙන වයමින් ගයමින් අත් සිසාරමින් නටමින් වීණාවෙහි කැඩුණු තන්ත්‍රීන් ද ජානනය නො කෙළේය. මෙයින් අතිශයින් ම මත් වූ බව හඟවති.

**ටිප්පනී :**

1. **නෙත්කල්හු** – නෙතට කල් = නෙත්කල්. මේ ශබ්දය අත්‍යන්තයෙන් දර්ශනීය වූ තථාගතයන් වහන්සේ හැඳින්වීම පිණිස යොදන ලදී.

* සෙදත්හි – ඇතැම්.

2. මී – මබු – සුරා. ' රුසිරු ' සඳ මධුරාර්ථයෙහි ද යෙදෙන හෙයින් මීට විශේෂණ ලෙස යෙදීම මැනවි.

3. අත්පුටෙන් – එක් කොට අඩක් හකුළ වන ලද අත්, අත්පුට නම් වේ. ඒ යම් යම් දේ පානය කිරීමට උපකාරී වේ.

4. පන්සිළු – එනම් ශක්‍රයාගේ ගන්ධර්වයා. සිඛා (= කොණ්ඩ) පසක් ඇති හෙයින් ' පඤ්චසිඛ ' නම් වී ය යෙති.

5. නමා වෙණ – මොහුගේ වීණාව නම් ' බෙළුව පණ්ඩු ' නම් මහා වීණාව යි.

6. සදත්හි – සවකීය ජත්‍රුවෙහි. ජත්‍රු නම් අංශ සන්ධිය යි. සමීපෝපචාර වශයෙන් උරහිස කීම පිණිස ද මේ ශබ්දය ව්‍යවහාර කරනු ලැබේ. මෙහි උරහිස යන අරුත්හි වේ.

7. ලියනු – ලයාන්විත. තාන, වාද්‍ය දචන හා සම භාවයට පමුණුවන ලද ගීතස්වරය ලය නම්. ඉන් යුක්ත වූයේ ලයාන්විත නම්. ' ලියනු ' යනු ද ඒ ම ය.

8. ගගා – ' ගා - ගැයුමෙහි ' දයින් සිද්ධ ' ගං ' යන පූර්ව ක්‍රියාව ද්විරූප ව පූර්වසහට මත් අඩු වීමෙන් සිද්ධ යි. මෙසේ පූර්වක්‍රියාවට ද්විරූපය වූ විට මිශ්‍රක්‍රියාර්ථය ලැබේ.

9. සුන්තත් – සුන් වූ තත් = සුන්තත්.

10. නො දත් – නො පූර්ව ' දන් - දැනීමෙහි ' ධාතුවෙන් කර්තෘ කාරකයෙහි සිද්ධ අතීත කාලික කෘදන්ත පද යි.

11. වටමින් – ' වට - සිසැරීමෙහි ' ධාතුවෙන් සිද්ධ මිශ්‍ර ක්‍රියා යි.

සංලක්ෂ්‍යය:

1. මේ (60, 61) පද්‍යද්වය එක් සම්බන්ධයකින් යුක්ත හෙයින් යුගමක නම්.

**62. නැංවූ සුපුල් සපුමුවා හිව් නන් ඇගැහි**
**මිලොල් ව මිලොලුනවුත් බමමින් ගුවන් යත්**
**දැල්වූ වැටුප් වග ඇගැ අගදෙස්හි දිස්නා**
**දුම්රුස් ය යි දද සරක් ලුව නෙත් එ දෙස්හී.**

**අන්වය හා පදාර්ථ :** **නැංවූ** – නගන ලද, **සුපුල්** – සුපුෂ්පිත වූ, **සපුමුවා** – චම්පක පුෂ්පමය වූ, **හිව්** – උස් වූ, **නන්ඇගැහි** – අනේක අග්නිකාවන්හි, **මිලොල් ව** – (පුෂ්ප) මධුවට ලොල ව, **මිලොලුන්** – භෘඞ්ගයන්, **අවුත්** – ආගමනය කොට, **බමමින්** – භ්‍රමණය කෙරෙමින්, **ගුවන්** – අහසට, **යත්** – යන කල්හි, **දැල්වූ** – දල්වන ලද, **වැටුප් වග** – ප්‍රදීප සමූහ ඇති, **ඇගැ** – අග්නිකාවන්හි, **අගදෙස්හි** – අග්‍ර ප්‍රදේශයෙහි, **දිස්නා** – දර්ශනය වන්නා වූ, **දුම්රුස් ය යි** – ධූමරාශියක් ය යි (සිතා) **දද අසරක්** – මුග්ධ වනිතාවක්, **එදෙස්හි** – ඒ වැටුප්දෙස, **නෙත්** – නෙත්‍ර, **ලුව** – ලූවා ය.

**විස්තර:**

එහි පූජා පිණිස තංවන ලද සපුමලින් කළ ඇගෑ නම් තොරණ විශේෂයක් වෙයි. එහි වූ මල්සුවඳින් බමරු එහි පැමිණ සිසාරා බැහැර යෙති. සපුමල් ඇගෑ පහන් ඇගෑ වැනි වෙයි. සපුමල් පහන් මෙන් දක්නා ලැබෙන හෙයිනි. සපුමල් රොන් ගෙන යන භ්‍රමර සමූහයා පහන්හි දුම් මෙන් දක්නා ලැබේ. බමරුන් ද දුම් මෙන් කාල වර්ණයෙන් යුක්ත හෙයිනි. මේ තුලනාව යෙන් පහන් ඇගෑයකැයි සිතා මුග්ධ වනිතාවක් එ දෙස බැලුවා ය.

මෙහිත් සියුම් ලෙස කරුණු විවෙචනයෙහි අදක්ෂයන් මුළා වන තරම් සපුමල්ඇගෑ පහන්ඇගෑ හා සම වූ බැව් කියන ලදී.

**ටිප්පණී :**

1. **නැංවූ** – 'නඟ' ධාතුවෙන් සිද්ධ අතීතකාලිකකර්මකාරක ප්‍රයෝජ්‍ය කෘදන්ත යි. ග කාරලෝපයෙන් පසු ඌනමාත්‍රයට මත්වැඩි ව සිද්ධ යි.

2. **සපු** – එනම් දීප්තිමත් පීත (=කහ) වර්ණයෙන් යුත් විසිදෙන මිහිරි සුවඳැති මල් වෙසෙස. සපු යනු වෘක්ෂ විශෙෂයකට නමි. අභෙදොපචාර යෙන් ඒ රුක්හි මල් ද එ නම් ම වී.

3. **ඇගෑ** – මල් හෝ පහන් ආදිය යොදා තනනු ලබන කුඩා තොරණ විශෙෂයක්.

4. **මී** – මවු - මල්පැනි.

5. **බමමින්** – සිසාරා හැසිරෙමින්. 'බම' ධාතුවෙන් සිද්ධ මිශ්‍ර ක්‍රියා යි.

6. **දැල්වූ** – 'දල්' ධාතු කෙරෙන් 'උ' ප්‍රත්‍යය හා ප්‍රයෝජ්‍ය 'ව' ප්‍රත්‍යය ද යෙදී කර්ම කාරකයෙහි සිද්ධ කෘදන්ත පද යි.

7. **වග** – වර්ග - සමූහ.

8. **දදසරක්** – දද + අසරක්. දගඩයෝ නම් යමක් ශීඝ්‍ර ව අවබොධ කරගැන්මෙහි අසමර්ථ මන්දබුද්ධිකයෝ යි. 'අසර' සද අප්සරා (= දිව්‍යස්ත්‍රීන්) වාචක වෙයි. මෙහි වනාහි සාමාන්‍යයෙන් ස්ත්‍රීවාචක ව යෙදිණ. මුඛ්‍ය වශ යෙන් 'අප්සරස්' ශබ්දය 'උර්වශී' ආදී දෙව් වෙසඟුවන්ට නම් වුව ද සාමාන්‍ය දෙවඟනන්ට නම් වශයෙන් යෙදුණු ජනප්‍රයොග දක්නා ලැබේ. එ මෙන් මෙකී සාමාන්‍ය ස්ත්‍රීන් අපෙක්ෂාවෙන් 'අසර' සද යෙදූ බව පෙනේ. සෙසු කවීන් පිළිනුදූ මෙය මෙසේ නො යොදන ලද්දේ නො වේ.

**සැමුල් අස්නෙහි :–**

"පුරසර වනඟරන් මෙන් සරනී එනුව – ර" යි.

9 **ලුව** – 'ලා - ලීමෙහි' ධාතුවෙන් සිද්ධ අතීත කාලික ප්‍රථම පුරුෂ බහු වචන ක්‍රියා යි. නොහොත් අතීත කෘදන්ත පද යි. –

මේ ක්‍රියා පදයට උක්ත කර්තෘත්වයෙන් ස්ත්‍රීවාචක 'දදසරක්' යනු සම්බන්ධ වන හෙයින් ක්‍රියාව මෙසේ යොදන ලදී.

මෙ බඳු තන්හි ක්‍රියාව බහුවචනාන්ත වීම හෝ ක්‍රියාස්ථානයෙහි කෘදන්ත පදය යෙදීම ස්වභාෂානුකූල ය.

කව්සිළුමිණෙහි :-

"මං පියත් පියදූ - දුදනහද කිඹියා
සිදෙරෙහි රුඳියා බැවි - පිළිහැරි එතර දුන්වූ" යි.

කාව්‍යශෙඛරයෙහි :-

"යෙහෙළි මහ කුමු දූ - පුබුදු කරවන සිහි ළු
මෙරජ බඳු තරි ළු - දූරූ දෙළදුක් ලකුණු දද දූ" යි.

63. නැංගේ සරා නිසයුරා කිම මේ ගුවන්හි
දිස්නේ සරා දිවයුරා අයුරා කිනම් මේ
නෙවුනා විලස් නරඟ මේ රඟ ලෙව් නුවන් ගත්
දක්මින් දදෙක් සොඳුරූ වෙස් ඉඳුරෙක් ද මේ වී.

**අන්වය හා පදාර්ථ :** **දදෙක්** – මූඪ ජනයෙක්, **දක්මින්** – (තථාගතයන්වහන්සේ) දර්‍ශනය කරමින්, **මේ ගුවන්හි** – මේ ආකාශයෙහි, **සරා නිසයුරා** – ශරච්චන්ද්‍රයා, **නැංගේ** – උද්ගත වූයේ, **කිම** – කුමක් හෙයින් ද? **සරා දිවයුරා අයුරා** – ශරත්කාලයෙහි සූර්‍ය්‍යයා මෙන්, **මේ දිස්නේ** – මේ දර්‍ශනය වන්නේ, **කිනම්** – කවරෙක් ද? **මේ** – මෙතෙම, **නෙවුනා විලස්** – බබළන රූප විලාස ඇති, **රඟ** – නෘත්‍යයෙන්, **ලෙව්** – ලොකවාසීන්ගේ, **නුවන් ගත්** – නෙත්‍ර ග්‍රහණය කළා වූ, **නරඟ** – අනඞ්ගයා ද? **සොඳුරූ වෙස්** – සුන්දර වෙශ ඇති, **ඉඳුරෙක් ද** – ශක්‍රයෙක් ද? (යන), **මේ** – මෙය, **වී** – කථනය කෙළේය.

**විස්තර :**

මුගධවූ පුරුෂයෙක්, පෙළහර කරන බුදුන් දුක ශරච්චන්ද්‍රයා දූන් උද්ගත වූයේ කුමක් හෙයින් ද? ශරද් දිවාකරයා මෙන් මේ සිටින්නේ කවරෙක් ද? මේ ශොභන විලාස ඇති අනඞ්ගයා ද? සුන්දර වූ වෙශ ඇති ශක්‍රයෙක් ද? යන බස් පැවසී ය. ශරච්චන්ද්‍ර දිවාකර දෙදෙන අතිශයින් දීප්තිමත් ය. එමෙනැ යි කීමෙන් බුදුන් අත්‍යන්තදීප්තින් හෙබි බැව් හඟවති. අනඞ්ගයා අතිශයින් සුරූප ය. ඔහුගේ ගැන්මෙන් සුරූපත්වය හඟවති. ශක්‍රයා සුරූප ය. සොඳුරූ වෙස් ඉඳුරෙක්දැ යි ගැන්මෙන් ඔහුටත් වඩා ශොභන බැව් හැඟවූහ.

**විසඳුම් :**

1. **නැංගේ** – 'නඟ' ධාතුවෙන් සිද්ධ අතීතකාලික කර්තෘ කාරක කෘදන්ත පද යි.

2. **සරා** – ශරත් ඍතුව. "වප්, ඉල් - සරාකල් වේ".

3. **නිසයුරා** – නිසයුරු + ආ. නිස කරනුයේ නිසයුරු. නිස නම් රැය යි.

4. **දිවයුරා** – දිවා කරනුයේ දිවයුරු. ක හට ය ආදේශ යි. දිවා නම් දවල් කාලය යි.

5. **නරඟ** – අනඞ්ගයා.

6. **ඉඳුරෙක් ද** – ඉඳුරු+එක්. 'ද' නිපාතය ප්‍රශ්නාර්ථයෙහි යි. ඉන්ද්‍ර ශබ්දයෙන් ඉඳුරු යි පැමිණියේ යි. 'දසදහසක් සක්වළ දසදහසක් ශක්‍රයෝ' ආදි ප්‍රයෝගයන්හි බොහෝ ශක්‍රයන් ඇති බව හැඟෙන හෙයින් 'ඉඳුරෙක්දූ' යි කීම යෙදේ. ඉන්ද්‍රයා හා සාමාන්‍යයෙන් සාම්‍යය ඇත්තේය. එහෙත් ඔහුට වඩා සුරූප ය. එහෙයින් 'සොඳුරු වෙස් ඉඳුරෙක්දූ' යි කීම යෙදේ.

64. * ව ත් ව ත් නෙතැන් රඟ සුරන් අසුරන් ගුවන්හි
දෙත් දෙත් සුරන් අසුරු සන් තුරු රැව් විසෙස් නූ
ග ත් ග ත් වෙසෙස් සැණ විලස් දනරැස් සතුස් ගොස්
ම ත් ම ත් ව වත් වටමිනිස් සිය ඇස් එ දෙස් ලූ.

අන්වය හා පදාර්ථ: **ගුවන්හි** - ආකාශයෙහි, **නෙතැන්** - අනෙක ස්ථානයන්හි, **සුරන් අසුරන්** - දෙවියන් හා අසුරයන් ද, **රඟ** - නෘත්‍ය, **වත්වත්** - පවත්වන කල්හි, **සුරන්** - දෙවියන්, **තුරු රැව්** - තූර්යාරාවය හා, **විසෙස් නූ** - විශේෂ නො වූ, (=එකාකාර වූ ය යන අර්ථයි) **අසුරු සන්** - අසුරු ගැසීම් නාදයන්, **දෙත් දෙත්** - දනය කරත් ම, **ගත්** - ශරීරයෙන්, **වෙසෙස් සැණ විලස්** - විශේෂ උත්සව විලාසයන්, **ගත්** - ග්‍රහණය කළා වූ, **දනරැස්** - ජනසමූහයා, **සතුස්** - වහා, **ගොස්** - ගමනය කොට, **මත් මත් ව** - මත්ත මත්ත ව, **වත්** - වස්ත්‍රයන්, **ඉස් වටමින්** - ඉස සිසාරමින්, **සිය ඇස්** - ස්ව නෙත්‍රයන්, **එදෙස් ලූ** - එදෙසට යොමු කළෝ.

**විස්තර :**

දිව්‍ය අසුරයෝ තන්තන්හි නෘත්‍ය කෙරෙති. දෙවියෝ තූර්යාවයක් වැනි වූ ම අසුරුසන් නද කෙරෙත්. එවිට ඒ ස්ථානය නෘත්‍ය ගීත ද්වනියෙන් ශ්‍රැකාන වේ. සැණකෙළියට සැරසුණු මනුෂ්‍යයෝ පිළී ඉස සිසාරවිත් එ දෙස බැලූහ.

**විපසනී :**

1. **වත්වත්** – පැවැත්මෙහි 'වත්' ධාතු කෙරෙන් 'ත්' ප්‍රත්‍යය හා ප්‍රයෝජ්‍ය 'ව' ප්‍රත්‍යය යෙදී සිද්ධ කාලාර්ථ අසම්භාව්‍ය ක්‍රියා යි.

2. **අසුරුසන්** – මහපටැඟිල්ල හා මධ්‍යාඞ්ගුලිය එක් කොට ඇති කරන ශබ්දය අසුරුසන් නම්. මෙහි සන් සද ශබ්දාර්ථයෙහි ය.

3. **තුරු රැව්** – තූර්ය නාද ය. තුරෙහි රැව් = තුරුරැව්.

4. **නූ** – නො+වූ. පිළිපෙරළීමෙන් 'නුවූ' යි සිටි විට න කාරස්ථ උ කාරය, ව කාරලෝපයෙන් ශේෂ වූ ඌ කාරය හා එක් ව එක ම දීර්ඝයක් ව 'නූ' යි සිද්ධ යි.

5. **මත් මත් ව** – දන රැස් මත් ව එ දෙසට ඇස් ලූය යි කීමෙන් සියල්ලන් එක විට මත් ව එක විට ම ඇස් යොමු කළ බවක් නො හැඟේ. මෙසේ ජනරාශීන්ගේ වෙන්වෙන් මත් වීම සලකා මත් මත් ව ය යි කීහ.

---

* තත්තන්හි වත්.

6. **වත් වටමිනිස්** – වත් ඉස් වටමින්. පිළී ඉස සිහාරම්භා යි කී අයුරු යි.

7. **ලූ** – 'ලා - ලිමෙහි' ධාතුවෙන් සිද්ධ අතීත කාලික ප්‍රථම පුරුෂ බහු වචන ක්‍රියා පද යි. මෙයින් උක්ත කර්තෘ 'දනරැස්' යනු යි. මෙහි 'රැස්' සද පියවියෙන් සිට අවිද්‍යමාන විධියෙන් බහුවචනය පවසන්නේ ය. එහෙයින් ක්‍රියා පදය බහුවචන විය යි ගත හැකිය. 'දනරැස්' යනු ඒකවචන වුව ද ක්‍රියාව බහුවචනයෙන් සිටීම නො යෙදෙන්නේ නො වේ. උක්ත කර්තෘත්වයට පැමිණි සමූහාර්ථවාචක ශබ්දය ඒකවචනාන්ත ව සිටිය ද ක්‍රියාව බහුවචනාන්ත වීමට බාධාවක් සියබසෙහි නැති හෙයිනි.

**ගුත්තිල කාව්‍යයෙහි :–**

"අමාරස සුදු සු - කුලුණු නුවණින් සුමු සු
දසබල බස් ඇ සු - **ඒ සඟගණ** මෙලෙසින් **පැව** සූ" යි.

**65. නන් තන් හි දුන් රන දෙදෙසි නල වෙසිනි යත් යන්**
**රන් වන් වියන් බැඳි ලෙසින් දිසි වි ගුවන් කුස්**
**වස් වත් සුරන් දිව කුසුම් පුරමින් තිලෝකුස්**
**සිව් වත් මැවූ දිව කුසුම් සුමුගෙව් බිජී ලෝ.**

**අන්වය හා පදාර්ථ : එසී** – ඒ උත්සව ප්‍රදේශයෙහි, **නන් තන්හි** – නා නා ස්ථානයන්හි, **දුන්** – දානය කරන ලද (=නංවන ලද), **රනදද** – ස්වර්ණධ්වජයන්, **නල වෙසිනි** – මාරුත වේගයෙන්, **යත් යත්** – යන කල්හි, **ගුවන් කුස්** – ආකාශ කුක්ෂිය, **රන්වන් වියන් බැඳි ලෙසින්** – ස්වර්ණවර්ණ විතානයන් බඳනා ලද්දක් මෙන්, **දිසි වි** – දර්ශනය විය. **සුරන්** – දෙවියන්, **තිලෝ කුස්** – ත්‍රෛලෝක්‍ය කුක්ෂිය, **පුරමින්** – පූරණය කරමින්, **දිව කුසුම්** – දිව්‍ය පුෂ්පයන්, **වස්වත්** – වර්ෂණය කරන කල්හි, **ලෝ** – ලෝකය, **සිව් වත්** – චතුර්මුඛයා විසින්, **මැවූ** – මවන ලද, **දිව කුසුම් සුමුගෙව්** – දිව්‍ය පුෂ්ප සමුද්ග (=කරඬු) යක් මෙන්, **බිජී** – භ්‍රාජමාන වී.

**විස්තර :**

i නන් තන්හි දුන් රන දෙදෙසි නලවෙසිනි යත් යත්
රන්වන් වියන් බැඳි ලෙසින් දිසි වී ගුවන් කුස්

ඒ උත්සව ස්ථානයෙහි නොයෙක් තන්හි නඟන ලද බොහෝ රන් දද (=කොඩි) විය. මාරුත වේගයෙන් ඒ ධ්වජයන්ගේ දික් රෙදි ගුවන්හි පැතුරුණු විට ආකාශ කුක්ෂිය රන් වන් වියන් බඳිනා ලද්දක් මෙන් දෘශ්‍යමාන විය.

ii වස්වත් සුරන් දිවකුසුම් පුරමින් තිලෝකුස්
සිව්වත් මැවූ දිවකුසුම් සුමුගෙව් බිජී ලෝ.

දෙවියෝ දිව්‍ය පුෂ්පයන් වර්ෂණය කරවූහ. එවිට ලොව බ්‍රහ්මයා විසින් මවන ලද මල්කරඬුවක් වැනි වී. මේ, අත්‍යන්තයෙන් පුෂ්පයන්ගෙන් පූර්ණ ව ශෝභාසම්පන්න වූ බව කියූ සේ යි,

**ටිප්පනී :**

1. **දෙදෙයි** – දද + එයි. මෙබඳු තන්හි හ කාරයට ය කාරාදේශ වීම ස්වභාෂාවෙහි බෙහෙවින් දක්නා ලැබේ.

**හංස සන්දේශයෙහි :-**

“නැ වී සඳුල් බිඳ නැඟි ගිනි කා දේ සි දි
පෙ වී පණසිපත මදුතුත් බ දේ සි දී
ලැ වී ඔප කාගින් කාගවත් සු දේ සි දි
නි වී රුපුන් විජයාගිත් සුර මැ දේ සි දී” යි.

2. **බැඳි** – ‘බඳ’ ධාතුවෙන් ‘ඉ’ ප්‍රත්‍යය වී කර්මකාරකයෙහි සිද්ධ කෘදන්ත යි. බඳන ලද්දේ = බැඳි.

3. **සිව්වත් මැවූ** – බ්‍රහ්මයා චතුර්මුඛ (= සිව්වත්) නමි. මුව සතරක් ඇති හෙයින් ල. ‘බ්‍රහ්මයා විසින් මවන ලද්ද’ යි ගැනීමට හේතුව සියලු දේ ම මවන්නේ බ්‍රහ්මයා ය යි පෞරාණිකයන්ගේ කථනයක් පවත්නා හෙයිනි. බෞද්ධාචාර්යයන් මේ නො අදහතත් කිසිවක් විචිත්‍ර කොට දක්වනු කැමති විට කවි සමයෙහි එන එබඳු කීම් ආශ්‍රය කළ බව පෙනේ.

4. **සුමුගෙව්** – සුමුගු + එව්. සුමුග (= සමුග්ග) නම් කරඬුව යි.

5. **බිජී** – ‘බජ - දිලුම්හි’ ධාතුවෙන් සිද්ධ අතීත කාලික එකවචන ක්‍රියා යි.

**66. තු ඩ තු ඩ තිශු ගී වී තන්හි තන්හි නැටුම් වි
වෙත වෙත තුරු රැව් වී අත්තලෙන් සත් තෙපුල් වි
සි ත සි ත දළපෙම් වි සිස් වටා සෙල් *වැටුම් වි
අ ත අ ත දිව මල් වි නන් දිගන් දෙව් පුදෙන් වී.**

**අන්වය හා පදාර්ථ:** **තුඩ තුඩ** - මුඛයක් පාසා, **තිශු ගී** - ස්තුති ගීත, **වි** - වූයේය. **තන්හි තන්හි** - ඒ ඒ ස්ථානයන්හි, **නැටුම්** - නෘත්‍ය, **වී** - වූයේය. **වෙත වෙත** - සමීප සමීප ස්ථානයන්හි, **තුරු රැව්** - තූර්යරාවය, **වී** - වූයේය. **අත් තෙලෙන්** - හස්ත තාලයෙන්, **සත්** - යුක්ත වූ, **තෙපුල්** - (ප්‍රිය) වචන, **වී** - වූයේය. **සිත සිත** - චිත්තයක් පාසා, **දළ පෙම්** - දැඩි ප්‍රේමය, **වි** - වූයේය. **සිස් වටා** - ශීර්ෂයන් හාත්පස, **සෙල් වැටුම්** - වස්ත්‍රාවතීනය(= පිළී ඉස සිසැරීම), **වි** - වූයේය. **අත අත** - හස්තයක් පාසා, **දිව මල්** - දිව්‍ය පුෂ්ප, **වි** - වූයේය. **නන් දිගත්** - අනේක දිගන්ත, **දෙව් පුදෙන්** - දිව්‍ය පූජාවෙන් උපලක්ෂිත, **වී** - වූයේ ය.

**විස්තර :**

i අත අත දිව මල් වී,

දෙවියන් දිවමල් වස්වන සඳ මනුෂ්‍යාදීහු ද බුදුන් පුදනු පිණිස අහස්හි බස්නා මල් අතින් ගත්හ. එහෙයින් අතක් පාසා දිවමල් වී.

* නැටුම් - මුද්‍රිත.

ii තත් දිගත් දෙව් පුදෙන් වී,

සියලු දිශාවෙහි දිව්‍ය පූජාවෙන් උපලක්‍ෂිත (=යුක්ත) වූහ. සියලු දිශාවන්හි පිරී සිටි දෙවියන් විසින් විවිධ දිව්‍යමය පූජාවන් පැවැත්වූ හෙයිනි.

**විපසනි :**

1. **තුඩ තුඩ** – මූඛ වාචී 'තුණ්ඩ' ශබ්දයෙන් 'තුඬ' යි වහර විය යුතු වුවත් 'මඩු' ආදි ශබ්දයන් මෙන් උෟන මාත්‍ර රහිත ව උච්චාරණය කිරීම ශිෂ්ට යන්ට අභිමත යි. 'තුඩ තුඩ' යි වීප්සාවෙහි ද්විත්වය යි. **ක්‍රියා, ගුණ, ද්‍රව්‍ය යන්ගෙන් වෙන් වෙන් වස්තූන් සම්බන්ධ කරනු කැමැත්ත වීප්සාව යි.** මෙහි ශී කීම් සඞ්ඛ්‍යාත ක්‍රියාවෙන් වීප්සාව යි. මේ පද්‍යයෙහි එන සෙසු තැන් ද උක්ත ක්‍රමයෙන් යොග්‍ය පරිද්දෙන් සලකනු.

2. **වී** – අතීත කාලික එකවචන ක්‍රියා යි. 'ශී' යි කර්තෘ පදය බහු වචනාන්ත වුව ද අප්‍රාණ වාචක හෙයින් ක්‍රියාව එකවචන වී. සෙස්ස ද මෙසේ යින් සලකනු.

3. **නැමුම්** – 'නට' ධාතු කෙරෙන් භාවයෙහි 'උම්' පස යෙදී සිද්ධ යි. පියවියෙන් සිට බුහුබස් අරුත් පවස යි.

4. **අත්තලෙන්** – හස්තතාලයෙන්. ප්‍රීතිමත් අවස්ථාවන්හි අත්ලෙන් අත්ල ගසා නගන ශබ්දය අත්තල නම්.

5. **සෙල් වැටුම් වී** – සෙල් නම් වස්ත්‍ර යි. සිසැරීම්, එහීම් ආදි අර්ථයන්හි වූ 'වට' ධාතු කෙරෙන් භාවයෙහි 'උම්' පස යෙදී 'වැටුම්' යි සිද්ධ යි.

6. **දිගත්** – දිශා. අත් සද ස්වාර්ථ යි. දික් ම = දිගත්.

7. **පුදෙන්** – උපලක්‍ෂණාර්ථයෙහි කරණ විබත්.

**සංලක්‍ෂ්‍යය :**

1. වෘත්තය – **මාලිනී** නම්.

**67. ලළනා කත දෙදෙ න් හා නන් බෙරින් නන් ගොසි න් හා**
**දිමුතු මුතු ලැලි න් හා ලූ සඳුන් දුම් රැසි න් හා**
**දිනිය විදුලියෙ න් හා උන් එතැන් මේ ගොසි න් හා**
**දිගත කොක වැලෙ න් හා සන් එ මේ මේ කුලෙ න් හා.**

**අන්වය හා පදාර්ථ : ලළනා** – ලලිත වන්තා වූ, **කත දෙදෙන් හා** – කනක ධවජයන් කරණ කොට ගෙන ද, **නන් බෙරින්** – අනෙක භෙරී වර්‍ගයාගේ ඝොෂයෙන් හා, **නන් ගොසින් හා** – අනෙක (ප්‍රීති) ඝොෂයෙන් ද, **දිමුතු** – දීප්තිමත් වූ, **මුතු ලැලින් හා** – මුක්තා ලතාවන් කරණ කොට ගෙන ද, **ලූ** – පූජා පිණිස ලන ලද, **සඳුන් දුම් රැසින් හා** – චන්දන ධූම රාශියෙන් ද යුක්ත වූ, **උන් එ තැන්** – ඒ සර්‍වඥයන් වහන්සේ වැඩ හුන් ස්ථානය, **විදුලියෙන් හා** – විද්‍යුල්ලතාවෙන් ද, **මේ ගොසින් හා** – මෙඝ

**ඝෝෂයෙන් ද, දිගත** - දිගන්තයෙහි වූ, **කොකවැලෙන් හා** - බලාකා ශ්‍රේණියෙන් ද, **මේ කුළෙන් හා** - මේඝකූටයෙන් ද, **සන්** - ගැවසී ගත්තා වූ, **එ මේ** - ඒ මේඝ යුක්ත කාලය, **දිනිය** - ජය ගත්තේය.

**විස්තර :**

වර්ෂා කාලයෙහි විදුලි, මේඝ ගර්ජනා, දිශාවන්හි පැතුරුණු බලාකා (=කොක්) පඞ්ක්ති, මේඝ කූට යන මේ දේ විද්‍යමාන ය. එ සඳ බුදුන් වැඩ හුන් තැන, පූර්වෝක්ත ලක්ෂණ යුක්ත වර්ෂා කාලය ජය ගත්තේය. වර්ෂා කාලයට වඩා අතිශ්‍රියක් ඉසිලී ය යි යු සේ යි. කෙසේයින් ද යත් :- එහි වූ රත් දෙදෙන් මේඝ කාලයෙහි විදුලි සිරිය ද, නන් බෙරින් හා නන් ඝොසින් මේඝ නාදය ද, මුතුලැලින් ලොව පැතිර සිටි කොක වැල ද, සඳුන් දුම් රැසින් මේඝකූටයන් ද ජය ගැනීමෙනි.

මෙහි 'රත් දෙදෙන් විදුලිය ද' ආදි වශයෙන් ගැන්මෙහි යෝග්‍යත්වය වර්ණ, ස්වරූපාදීන්ගේ සාම්‍යයෙන් දත්තේ ය.

**විපසනී :**

1. **ලලන** - 'ලල' ධාතුවෙන් කර්තෘකාරකයෙහි සිද්ධ කෘදන්ත පද යි.
2. **කනදෙදෙන්** - 'කනක' ශබ්දයෙන් එන 'කනා' යන ප්‍රකෘතිය වෘත්ත ලක්ෂණ රැකිනු සඳහා හ්‍රස්ව කොට යොදන ලදී. ස්වර්ණවාචී 'කන' ශබ්දයක් ද කෝෂ ග්‍රන්ථයන්හි දක්වන ලදී.
3. **නන් බෙරින්** - මෙහි 'බෙර' සදින් බෙර හඬ ම ගත යුතු යි.
4. **දිමුතු** - දිප ඇඟියේ = දිමුත්. උ කාරය වෘත්තයාගේ අභේදය පිණිස ගන්නා ලදී. "දිප යන ප්‍රකෘතිය කෙරෙන් අස්ත්‍යර්ථයෙහි 'මත්' ප්‍රත්‍යය කොට විභක්තියට හා ප කාරයට ලොප් ද ම කාරස්ථ අ කාරයට පිළිපෙරැළි උ කාර ද කිරීමෙන් 'දිමුත්' යනු වේ" මේ, සිදත් මතයෙන් පද සිද්ධිය වන අයුරු යි.
5. **හා** - 'ද' නිපාතයාගේ අර්ථයෙහි යි. 4 වන පද්‍යයේ 2 වන විපසනිය බලනු.
6. **දිනිය** - 'දින - ජය ගැනීමෙහි' ධාතුවෙන් 'ඊ' ප්‍රත්‍යය ව සිද්ධ 'දිනී' යන අතීත කාලික ප්‍රථම පුරුෂ එකවචන ක්‍රියාපදයෙන් පර ව 'ය' නිපාතය යෙදී සිද්ධ යි. වෘත්තය පිණිස ඊ කාරය හ්‍රස්ව වී. 'දින' ධාතුව 'ජි - ජයෙ' යන ධාතුවෙන් සිද්ධ 'ජිනාති' යන ක්‍රියා රූපයෙන් නිපන්න යි. මාතෘ භාෂා වල ක්‍රියා රූපයන්ගෙන් ද සිංහලයට ධාතුප්‍රකෘති තද්භව වශයෙන් ලැබේ. 'සිටු' සිටීමෙහි ආදි ධාතූන් මෙසේයින් දත යුතු.
7. **දිගත** - මෙහි ද අත් සද ස්වාර්ථයෙහි ය යි ගැන්ම උචිත යි.
8. **එ මේ** - ඒ වර්ෂා කාලය. මෙහි 'එ' සද ප්‍රසිද්ධාර්ථයෙහි යි. 'මේ' නම් මේඝය යි - නොහොත් වැසි වලාකුළු යි. මෙහි ඒ මේඝයන් බෙහෙවින් ඇති වර්ෂා කාලය කීම පිණිස යොදන ලදී. වර්ෂා කාලය නම් නිකිණි, බිනර දෙමස යි. එහෙයින් කියන ලදී

**රුවන්මලෙහි :-**

"වසරේ, නිකිණි බිනර" යි.

9. **මේ කුළෙන්** - මේ කුළු + එන්. මේ කුළු නම් වැසි වලාකුළු යි.

68. තරඟ වැල දෙදෙන් පෑ මින් අමින් දෙව් රැසින් පෑ
ගැඹුර කදුරතින් පෑ *කෝමලි සේසතින් පෑ
සංඛොබ තුරුඝොසින් පෑ නන් රුවන් නන් මලින් පෑ
ගිරිඳු †මුනි වෙසින් පෑ නිඳු සිව්වත් පුදෙන් පෑ.

**අන්වය හා පදාර්ථ:** **සිව්වත්** – මහාබ්‍රහ්ම තෙම, **තරඟ වැල** – තරඞ්ගාවලිය, **දෙදෙන්** – ධ්වජයන්ගෙන්, **පෑ** – දක්වා, **මින්** – මත්ස්‍යයන්, **අමින් දෙව් රැසින්** – අපරිමිත වූ දිව්‍ය සමූහයාගෙන්, **පෑ** – දක්වා, **ගැඹුර** – ගම්භීරත්වය, **ක + දුරු + අතින්** – ආකාශ පෘථිවි පර්යන්තයෙන්, **පෑ** – දක්වා, **කෝමලි** – පෙණ, **සේසතින්** – ශ්වේතච්ඡත්‍රයන්ගෙන්, **පෑ** – දක්වා, **සංඛොබ** – සංක්ෂෝභය, **තුරු ඝොසින්** – තූර්යඝෝෂයෙන්, **පෑ** – දක්වා, **නන්රුවන්** – අනේක රත්නයන්, **නන් මලින්** – අනේක පුෂ්පයන්ගෙන්, **පෑ** – දක්වා, **ගිරිඳු** – මේරු පර්වත රාජයා, **මුනිවෙසින්** – සර්වඥයන් වහන්සේගේ ශරීරයෙන්, **පෑ** – දක්වා, **පුදෙන්** – මේ කී සියලු පූජාවන්ගෙන්, **නිඳු** – සාගරය, **පෑ** – දක් වී.

**විස්තර:**

බ්‍රහ්මතෙම සාගරයෙහි සිරි උපුලන පූජාවක් කෙළේය. සාගරයෙහි තරඞ්ග, මත්ස්‍ය, ගැඹුර, පෙණ, ඝෝෂය, රත්න යන මේකී ද ඇත. පූජා සමයෙහි වූ ධ්වජ, දිව්‍ය සමූහයා, අහස් පොළෝ අන්තයන්ගේ අන්තරය, සේසත්, තූර්යඝෝෂය, නන්මල් යන මොවුහු ක්‍රමයෙන් තරඞ්ගාදිය බඳු ය. එහි වූ බුදුන්ගේ ශ්‍රීශරීරය සාගරයෙහි වූ සවණ්ණ මේරු විලාසය ඉසිලී. එහෙයින් මෙ කී සියල්ල එක් වූ විට සයුර බඳු ම වෙයි. 'සිව්වත් නිඳු පෑ' යි කීමෙන් මෙහි කී පූජාවන් බ්‍රහ්මයා කළ බව හඟවයි.

**විපසනී:**

1. **තරඟ** – රළ. 'තරඞ්ග' සදින් පැමිණියේ යි.

2. **පෑ** – 'පා' ධාතුවෙන් සිද්ධ පූර්වක්‍රියා යි.

3. **කදුරතින්** – ක + දුරු + අතින්. ක සද ආකාශ වාචී යි. 'ධ' ශබ්දයෙන් සිහාන ය. 'දුරු' යි පොළොවට නමි. 'ධරා' ශබ්දයෙන් සිහානය යි සිතිය හැකි යි. ඔවුන්ගේ අන්තය 'කදුරත්' නමි. එයින් කදුරතින්. අහස් පොළෝ දෙක්හි අන්තය ගැන්මෙන් ඔවුන්ගේ මුළු අතර ගන්නා ලදී. අහස් පොළෝ අතරින් ගැඹුර දක්වා ය යි අරුත් දත යුතු.

4. **කෝමලි** – 'කොමලි' යනු පෙණවලට නමි. මෙහි වෘත්තය පිණිස මත් වැඩි යි.

5. **සේසතින්** – සේසත් + ඉන්. කරණ විභක්ති එකවචන බහුවචන රූපයන්ගේ භේදයක් නැති හෙයින් බහුවචනාර්ථ ගත යුතු. සේසත් නම් සුදු කුඩ යි. පෙණ ද සුදු හෙයින් සේසතින් පෙණ දක්විය යි ගැන්ම යෙදේ යි.

---

* කෝමලින් – ඇතැම්, † මොකැදුරෙන් – හැම,

6. **සඞ්ඛොභ** – සංක්ෂොභය හෙවත් කැලඹීම. සයුර නිරන්තරයෙන් ම රළ බිඳීම ආදියෙන් වූ සංක්ෂොභයෙන් ඝොෂ සහිත ව පවතී.

7. **ගිරිඳු** – ගිරිනට ඉඳු = ගිරිඳු. මහාමේරු පර්වතය. එය සාගර මධ්‍යයෙහි පිහිටියේය. 168000 යොදුන් උස ය. ඉන් අඩක් සමුද්‍රයෙහි ගැලී සිටී. අඩක් සමුදුරින් මත්තෙහි උද්ගත ව සිටී. එහි ප්‍රාචීන, දක්ෂිණ, පශ්චිම, උත්තර දිශා ක්‍රමයෙන් රජත, ඉන්ද්‍රනීල, ස්ඵටික, සුවර්ණ යන මෙයින් නිමියේ ය. එහෙයින් මහාමෙර ඒ ඒ පාර්ශ්වයෙහි ඇති රජතාදි වර්ණයන්ගෙන් බබළයි. මේ ග්‍රන්ථයන්හි එන, මහමෙර පිළිබඳ විස්තරයෙන් ස්වල්පයකි.

8. **මුනිවෙරින්** – මුනිවෙර + ඉන්. මුනිහුගේ වෙර = මුනිවෙර. මුනි සිරුර ද නීලාදි වර්ණයන්ගෙන් බබළන හෙයින් සුවර්ණමෙරුව බඳු වේ යි.

9. **නීඳු** – සයුර. නීනට ඉඳු = නීඳු. නී නම් නදීහු යි.

10. **පෑ** – 'පා' ධාතුවෙන් සිද්ධ අතීත කෘදන්ත යි.

**69.** **විහිදි පෙණ සහස්පත් කැන් උමාතින් පුද මෙන්**
**හෙළ පුලින දළින් යුත් නීඳු ඇත් මත් නදන් දින්**
**අසලිඳු නල සත්වස් පවු නළන් හා රඟොත්තේ**
**අනත සහසවත් පෑ රූ පසස්නේ මෙලෙස් වී.**

**අන්වය හා පදාර්ථ:** **විහිදි** – ඒ ඒ තන්හි විහිදුණා වූ, **පෙණ** – ඵේන නමැති, **සහස්පත් කැන්** – පද්ම සමූහයන්, **උමාතින්** – තරඞ්ග නමැති හස්තයෙන්, **පුද මෙන්** – පූජා කොට මෙන්, **හෙළ** – ධවල වූ, **පුලින දළින් යුත්** – වාලුකාතීර නමැති දංෂ්ට්‍රාවන්ගෙන් යුක්ත වූ, **නීඳු ඇත්** – සාගර නමැති හස්ති තෙම, **මත් නදන්** – මත්ත නාදයන්, **දින්** – දුනය කෙළේය. **අසලිඳු නල** – මේරු පර්වත නමැති නාටක තෙම, **සත් වස් පවු නළන් හා** – සප්තකුල පර්වත නමැති නළුවන් හා, **රඟොත්තේ** – නෘත්‍යාරම්භ කෙළේය. **අනත** – අනන්ත තෙම, **සහස වත් පෑ** – දහසක් වක්ත්‍ර දක්වා, **රූ පසස්නේ** – රූපයට ප්‍රශංසා කරන්නේ, **මෙසේ වී** – මෙසේ කථනය කෙළේය.

**විස්තර:**

i විහිදි පෙණ සහස්පත් කැන් උමාතින් පුද මෙන්
හෙළ පුලින දළින් යුත් නීඳු ඇත් මත් නදන් දින්,

ඒ උත්සවාවස්ථාවෙහි සයුර බෙහෙවින් පෙණ සහිත ව අතිශයින් ඝොෂ වී. නීඳු නමැති හස්ති තෙම මත්තරාව දිනෑ යි එබැවි පැවසූහ. සයුර ඇතකු කොට තකත් ම වෙරළෙහි දෙපසට විහිදි සුදු වැලිතලා දෙක ඇතුගේ දෙ දළ ය යි ගත යුතු වේ, තරඞ්ග ම හස්තය (= සොඬය) කොට ගන්නා ලදි. ඒ තරඞ්ගයන් විසින් තැන තැන විසුරුවන ලද සුදු පෙණපිඬු තරඞ්ග හස්තයෙන් ගෙන පිදූ (හෙළ) නෙළුම් මල් කොට තැකූහ.

ii අසලිඳු නල සත්වස්පවුනළන් හා රඟොත්තේ.

මහමෙර ක්‍රීඩකයෙකු මෙන් අතිශයින් කම්පිත වී.

"යුග ඳුර පටන් අඩකින් එකිනෙකට මි පි
මනහර රුවන් සත්කුලපවු වලලු දි පි" යයි

ගුත්තිල කාව්‍යයෙහි වැනූ පරිදි මහමෙර වටා අඩකින් එකිනෙකට මිපි ව සිටි සත්කුල පවු ද වෙසෙසින් වලනය වී. එහෙයින් මෙරු පර්වත නමැති ක්‍රීඩක තෙම සත්කුල පවු නමැති නළුවන් හා ක්‍රීඩා කෙළේය යි කීහ.

**විපසනි :**

1. **විසිදි** – 'විසිදු' ධාතුවෙන් ඉ ප්‍රත්‍යය ව කර්තෘකාරකයෙහි සිද්ධ කෘදන්ත පද යි. පිළිපෙරළි ඉ කාර වීමෙන් 'විසිදි' යි සිද්ධ යි. වි පූර්ව සද ධාතු ය යි ද ගත හැකි යි. එහෙත් සිංහලයෙහි දී බොහෝ විට උපසර්ග හා ධාතු වෙන් නො කළ හැකි යි.

2. **සහස් පත්** – දහසක් පත් වන්නේ යමෙක්හි ද ඒ = සහස්පත්. පද්ම යි. මෙහි 'සුදු, නෙළ' ආදි සදකින් නො වෙසෙසුව ද පෙණ නමැති සහස් පත් ය යි කී හෙයින් සුදු පියුම් ම කැමති විය යුතු.

3. **උමාතින්** – උමා + අතින්. උමා නම් රළ යි.

4. **දින්** – 'ද' ධාතුවෙන් සිද්ධ අතීත කාලික කෘදන්ත පද යි.

5. **අසලිඳු** – අසලනට ඉඳු = අසලිඳු. 'අසල' නම් 'අචල' හෙවත් පර්වත යි. මහමෙර පර්වතයන්ට ප්‍රධාන හෙයින් අසලිඳු නම් වේ.

6. **සත්වස් පවු** – සත්කුල පවු. යුගන්ධර, ඊසධර, කරවීක, සුදස්සන, නෙමින්ධර, විනතක, අස්සකණ්ණ යන මෙර වටා සිටි පර්වත සත. මෙහි 'සත්කුල පවු' යි කිවහොත් වෘත්ත භංගය වන හෙයින් කුල ශබ්දයා හා පර්‍යාය වූ 'වංශ' ශබ්දයෙන් 'වස්' ය යි ගෙන යොදා තිබේ.

7. **රඟොත්තේ** – රඟ + ඔත්තේ. 'ඔ - පිවිසීමෙහි' ධාතුවෙන් සිද්ධ 'ඔත්' යන කෘදන්ත පදයා කෙරෙන් පෙර විබත් 'ඒ' පස ගැලපෙන සඳ ත කාරයාහට ද්විත්ව වීමෙන් 'ඔත්තේ' යි සිද්ධ යි. රඟ (= නෘත්‍යය) ට පිවිසීම නම් රඟ ඇරඹීම යි.

8. **අනත** – අනන්ත නම් නා රජ. හේ පාතාල ලොක වාසි ය. දහසක් මුව ඇත්තේය. ධවල දීර්ඝ ශරීර ඇත්තේය.

9. **සහස වත් පෑ** – දහසක් වක්ත්‍ර. අනන්ත තෙමේ හැම විට ම මුව දහසක් මවා ගෙන සිටින්නේ නො වේ. මෙ සඳ බුදුගුණ වැනීම පිණිස මවා ගත්තේය යි භගවතු පිණිස "සහසවත් පෑ" ය යි කීහ.

10. **පසස්නේ** – පසස්න + ඒ. 'පසස්' ධාතු කෙරෙන් න ප්‍රත්‍යය ව 'පසස්න' ශබ්දය සිද්ධ යි.

**70. ශිරිසරවත මේ නා රූ විලස් ලෝ ඉකුත් වූ**
**අනත වණත සිත් සේ මා වදන් මා වදන් හිමි;**
**ඉතිඳු දළ පෙමින් මා රූවිලස් රැස් වැණුම් දූන්**
*** අඹ එවෙනි මැනුම් වන් නෝ නිදන්ගී සිලිල් රැස්.**

---

* සිදු - හෑ

**අන්වය හා පදාර්ථ:** **සිරිසර වත** – ශෝභාවෙන් සාර වූ වක්ත්‍ර ඇති සර්වඥයන්වහන්ස, **මේ තා** – මේ ඔබගේ, **ලෝ ඉකුත් වූ** – ලෝකවිෂය ඉක්ම වූ, **රූ විලස්** – රූපවිලාසය, **සිත් සේ** – අභිමත පරිද්දෙන්, **වණනා** – වර්ණනා කරත්හොත්, **අනත** – අනන්තය. (එහෙත්) **මා වදන්** – මාගේ ගුණවචන, **මා වදන් හිමි** – මාගේ මුඛ සීමා කොට ඇත්තේය. **ඉති දු** – එසේ වුවත්, **මා දළ පෙමින්** – මාගේ දෘඪ ප්‍රේමය කාරණ කොට ගෙන, **දූන්** – මෙකල්හි, **රූ විලස් රැස් වැණුම්** – රූපවිලාස රාශිය වර්ණනය කිරීම, **තෝනිදන්හි** – (සතරමහා) සාගරයන්හි, **සිලිල් රැස්** – ජලරාශිය, **අබළුවෙනි** – සණ්පයෙන් කළ සැන්දකින්, **මැනුම් වන්** – මැනීමක් (=ප්‍රමාණ කිරීමක්) වැන්න.

**විස්තර :**

i සිරිසරවත මේ තා රූවිලස් ලෝ ඉකුත් වූ
අනත වනත සිත් සේ මා වදන් මා වදන් හිමි,

බුදුන්ගේ රූප විලාසය ලොක විෂය(=ලෝවැසිසෙස්සත්ත්වයන්ගේ රූපවිලාසය) ඉක්ම පවත්නේ ය. එය අභිප්‍රාය පරිද්දෙන් වර්ණනය කරත් හොත් අනන්ත ය. (මෙයින් භක්ත්‍යතිශය හා අත්‍යධික රූපශ්‍රිය හඟව යි) අනන්තයාගේ වර්ණනය ඔහුගේ මුඛ සීමා කොට ඇත්තේ ය. අනන්තයාහට මුඛ දහසෙකි. එහෙයින් ම විසින් වැණිය හැක්කේ රූපවිලාසය පිළිබඳ ගුණ දහසෙකි. ඔබගේ වනාහි ඒ ගුණ අනන්ත ය යි දහසක් මුව ඇති තමා ද බුදුහුගේ රූ විලස් වැණීමෙහි අසමර්ථ බව කීසේ යි.

ii අබළුවෙනි මැනුම් වන් තෝනිදන්හි සිලිල් රැස්.

සතර මහා සාගරයන්ගේ ජලය ප්‍රමාණාතික්‍රාන්ත ය. එය මුළුමනින් අබළුවකින් මැනිම කළ නො හැක්කකි. මැනිය හැකි වුවහොත් ඉතා සවල්ප යෙකි. මුවදහසකින් බුදුන් වහන්සේගේ අප්‍රමෙය බුදුගුණ වැණීම ද එ මෙ තැ යි කී සේ යි.

**ටිප්පණි :**

1. **සිරිසර වත** – සිරින් සර = සිරිසර. සිරිසර වත යමෙකුගේ ද හේ = සිරිසරවත්. 'සිරිසරවත' යනු අලප් විබත්. ශ්‍රීයෙන් සාර වක්ත්‍රයක් ඇති හෙයින් බුදුන්වහන්සේට ආමන්ත්‍රණය පිණිස ප්‍රයුක්ත යි.

2. **ලෝ ඉකුත්** – ලොව ඉක්මුණේ = ලෝඉකුත්. මෙහි 'ලෝ' නම් අභෙදෝපචාරයෙන් ලොකවාසීහු ය. එහෙයින් ලොකවාසීන්ගේ විෂය ඉක්ම පවත්නා යන අර්ථ යි.

3. **වදන්** – ක්‍රමයෙන් වචන, වදන (=මුඛ) වාචී 'වදන්' ශබ්ද ද්වයෙකි. මේ පද්‍යයෙහි ක්‍රමයෙන් ඒ ශබ්දද්වය දක්නා ලැබේ.

4. **අබළුවෙනි** – අබ+අළු+එනි. ව කාරාගමයෙන් සිද්ධ යි. අළු නම් සැන්දෙහි ජලාදිය බරන කොටස යි. 'අළු' සදින් අවිශෙෂයෙන් සැන්ද ද වාච්‍ය වේ. මෙය පූර්ව අකාර ලොපයෙන් 'ළු' යි ද සිටී.

**ධම්පියා අටුවා ගැටපදයෙහි :-**

"අනෙක් ඇජරක්හට අතවැසි වීමෙන් සැලකට එ වීමක් වැන්න යි සේ යි."

**ගුත්තිල කාව්‍යයෙහි :-**

"අබළුවකින් පම ණ - නො කලැකි දිය සෙ සතර ණ" යි.

5. **මැනුම්** – 'මන' ධාතුවෙන් 'උම්' ප්‍රත්‍යය ව භාවයෙහි සිද්ධ කෘදන්ත යි.

6. **නෝනිදන්හී** – පද සිද්ධිය 33 වන පද්‍යයේ 5 වන විපසනියෙන් දත යුතු. සාගර සතරෙක, සමන්තකැයි ද සලකනු ලබන හෙයින් බහුවචන යොදන ලදී.

**71. * ඉති දු මගෙ තෙපුල් හු ලැවුණු රූවිලස් තා**
**හරවැල නො ලෙළේ කිම් ලෙයි වියත් ලෝ සියල්ලන්**
**තද අදර එබැවිනෙන් රූවිලස් නෝනිදන් වූ**
**තා රූසිරි පැවසුම්හී දූන් කෙළේ මා යුහු සිත්.**

**අන්වය හා පදාර්ථ :** **ඉති දු** – එසේ – වුවත්, **මගෙ තෙපුල්** – මාගේ වචන නමැති, **හු** – සූත්‍රය (= නූල), **ලා** – බහා, **ඇවුණු** – අවුණන ලද, **තා** – ඔබවහන්සේගේ, **රූවිලස්** – රූපවිලාස නමැති, **හරවැල** – මුක්තාහාරය, **වියත් ලෝ සියල්ලන්** – ව්‍යක්ත වූ ලොකවාසී සියල්ලන්ගේ, **ලෙයි** – හෘදයෙහි (= උරඃප්‍රදෙශයෙහි), **නො ලෙළේ කිම්** – කිම ලාලනය නො වේද?, (වන්නේ ම ය) **එ බැවිනෙන්** – එසේ හෙයින්, **තද අදර** – දෘඪ වූ ආදරය, **රූවිලස්** – රූපවිලාසයට, **නෝනිදන් වූ** – සාගරයක් බඳු වූ, **තා රූසිරි** - ඔබවහන්සේගේ රූපශ්‍රිය, **පැවසුම්හී** – ප්‍රකාශ කිරීමෙහි, **දූන්** – මෙකල්හි, **මා සිත්** - මාගේ චිත්තය, **යුහු කෙළේ** – යුහුසුලු කෙළේ යි.

**විස්තර :**

i ඉතිදු මගෙ තෙපුල් හු ලැවුණු රූ විලස් තා
හරවැල නො ලෙළේ කිම් ලෙයි වියත් ලෝ සියල්ලන්,

පූර්ව පද්‍යයෙන් කී ලෙස බුද්ධශ්‍රිය තත්ත්වාකාරයෙන් වර්ණනය නො කට හැකි ය. එහෙත් බුදුගුණ මුතු බඳු ය. තමාගේ වචන මුතු අවුණන හුයක් බඳු ය. හුයකින් අවුණන ලද මුතු හෙවත් මුතුවැල කවර නමුත් ව්‍යක්ත යකුගේ හෘදය මත නො බැබලීමට කාරණක් නො මැති යි. කවුරුන් විසිනුත් පැලඳීමට සුදුසු ය. එසෙයින් තම වර්ණනය කවර ව්‍යක්තයකු විසින් වුවත් සෙවනාහී බව කී අයුරු යි.

**විපසනී :**

1. **ඉතිදු** – මෙසේ වුවත්. ඉති යන නිපාතයා කෙරෙන් 'ද' නිපාතය ව එහි වූ අකාරයට පිළිපෙරැළි 'උ' කාර ව සිද්ධ යි.

* නොඉති.

2. **හූ** – ' සූත්‍ර ' ශබ්දයෙන් ' සූ ' යි සිදී සකරට හකර වීමෙන් සිද්ධ යි.

3. **රූ විලස්** – දෙතිස් මහ පුරිස් ලකුණු ආදි ලක්‍ෂණ.

4. **හරවැල** – ' හර ' නම් මුක්තාදාමය (= මුතුවැල) යි. ' හාර ' ශබ්දයෙන් සිත්‍ත යි. එහෙයින් මෙහි වැල ශබ්දයෙන් ලැබෙන විශෙෂාර්ථයක් නො මැති යි. එහෙත් මේ සදෙස් නො වේ. ' කලල්මඩ ' ආදි ව්‍යවහාර මෙනි. සංස්කෘතයෙහි ද " කරිකලභ " ආදි ශබ්ද මෙහෙයින් යෙදේ. ' කලභ ' නම් හස්ති පොතක යි විශෙෂාර්ථයක් නැතත් හස්ති වාචි ' කරි ' ශබ්දය ද ඒ හා යොදනු ලැබේ. අර්ථය නිරායාසයෙන් ප්‍රකට ව හැඟීම මෙහි ප්‍රයොජනය යි.

5. **ලෙයි** – ල + එහි. මෙහි ල සදින් උරය (= පපුව) වාච්‍ය වේ. ල ශබ්දයාගේ අර්ථ දක්වුහ.

**රුවන්මලෙහි :–**

" ල සද සිත **උරෙහි** – තුරුණු බැව්හි ද වනුයේ " යි.

හ කාරයට ය කාරදෙශය විම 27 වන පද්‍යයේ 12 වන ටිප්පනියෙන් දත යුතු. ලෝවැසි සියල්ලන්ට එක් හෘදයක් නො විය හැකිය. එහෙත් ' ලෝසියල් ලන් ලෙයි ' කියා ල සද එකවචන විම නිදෙසි. වෙන් වෙන් ව කෙනකු පාසා සම්බන්ධ වන බව හැඟෙන හෙයිනි. මෙය ජෙසාප්‍රයොගයන්හි බොහෙවින් දක්නා ලැබේ.

**හංසසන්දෙශයෙහි :–**

" නු ව න් පුරා දකිමින් දෙක ම එක තැ න
**ලෙවන් සිත** සතුටු වෙයි උවමට කිය නා " යි.

6. **සියල්ලන්** – සියලු + අන්.

7. **පැවසුම්හී** – ' පවස ' දයින් භාවයෙහි ' උම් ' පස යෙදී පැවසුම් යි සිද්ධ යි.

8. **සුහු** – ' යුහු ' සද ශීඝ්‍රාර්ථයෙහි වෙයි. මෙහි ශීඝ්‍රභාවයෙන් යුක්ත වූවක් කියවේ. මෙය ' තදඅදර සිත් යුහු කෙළේ ' යි සම්බන්ධ වන හෙයින් අනුක්ත විකෘති කර්ම යි. සිත් යනු ප්‍රකෘති කර්ම යි.

අනතුරු ව **අනන්ත** නාගරාජයා කෙශධාතුවෙහි පටන් බුදුරජාණන් වහන්සේගේ රූපවිලාසය වණ්නා කළ අයුරු දක්වනුවෝ ' අසුර සුර නරන් ' ආදිය කියති.

**72. අසුර සුර නරන් හිස් පා පියුම් දුන් තිලෝනා**
**මෙමුනිරදු මුදුන්පත් බැව් ම වි ලෝතුකුන් බැව්**
*** ඝනකලස මුදුන් දුන් නිල් උපුල් කැන් විලස් ය යි**
**පවසති ඉති කෙස්දු ඒ වැණුම් ද උවම් ද.**

**අන්වය හා පදාර්ථ: අසුර සුර නරන්** – අසුර දිව්‍ය මනුෂ්‍යයන්ගේ, **හිස්** – ශීර්ෂයන්හි, **පාපියුම්** – පාද පද්මයන්, **දුන්** – දනය කළා වූ (= තැබූ), **තිලෝනා** – ත්‍රෛලොක්‍ය නායක වූ, **මෙ මුනිරදු** –

---

* ඉති කලස - කැම.

මේ මුනීන්ද්‍රයන් වහන්සේගේ, **මුදුන්පත් බැව ම** - මස්තකයට පැමිණි බව ම, **ලෝ ඉකුත් බැව්** - (තමා) ලොක විෂය ඉක්ම වූ බව, **වී** - ප්‍රකාශ කෙළේය (= හැඟවී). **ඉති** - මෙසේ වුවත්, **කෙස්දා** - (මෙබඳු වූ) කෙශධාතූන් වහන්සේ, **කනකලස මුදුන් දුන්** - ස්වර්ණ කලස මස්තකයෙහි දානය කරන ලද, **නිල් උපුල් කැන් විලස් ය යි** - නීලොත්පල සමූහයක් වැනි ය යි, **පවසති** - (ඇතැම්හු) ප්‍රකාශ කෙරෙත්. **ඒ වැණුම් ද** - ඒ වර්ණනයෙක් ද? **උවම් ද** - උපමා කිරීමක් ද?

**විස්තර :**

i අසුර සුර නරන් හිස් පාපියුම් දුන් තිලෝනා
මෙමුනිරදු මුදුන්පත් බැව් ම වී ලෝඉකුත් බැව්,

අසුර සුර නරයන මොවුහු ශ්‍රෙෂ්ඨයෝ ය. ඔවුන්ගේ ද උත්තමාඞ්ග නම් වූ හිස් ශ්‍රෙෂ්ඨ ය. කවුරුන්ගේ වුවත් පා සෙසු අවයවයන්ට වඩා නීචත්වයෙන් සලකනු ලැබේ. බුදුන්ගේ සිරිපා අසුරාදීන්ගේ මස්තකයෙහි දුන් බව ( මේ වැඳුම් ලැබූ බව කී අයුරු යි ) කීමෙන් බුදුන්ගේ ශ්‍රෙෂ්ඨතමත්වය සූචිත යි. කෙශධාතුව වනාහි එබඳු බුදුන්ගේ උත්තමාඞ්ගය වූ මස්තකයෙහි වෙයි. එසේ වීමෙන් ම තමන් ලොක විෂය ඉක්ම වූ බව හඟවයි. 'එසේ වුවත්' යනු ශෙෂ යි.

ii කනකලස මුදුන් දුන් නිල් උපුල් කැන් විලස් ය යි
පවසති ඉති කෙස්දා ඒ වැණුම් දා උවම් දා.

බුදුරජාණන් වහන්සේගේ රන්වන් ශීර්ෂය ස්වර්ණමය කලසක් වැන්න, ශීර්ෂය මත වූ කෙශධාතුව කලසක් මත්තෙහි වූ නීලොත්පල සමූහයක් වැන්න, පිරිසුදු නීලවර්ණයෙන් බබලන හෙයිනි. මේ සාම්‍යය බලා ලෝවැඩසඟරා පද්‍යයෙහි 3 වන පාදයෙන් කී සේ වර්ණති. එහෙත් ඒ වර්ණනයෙක් ද? සමානත්වය හඟවන වස්තුවක් ගෙන හැර දැක්වීමක් ද? නො වන්නේ ම ය යි යු සේ යි.

මේ කෙශධාතූන් වහන්සේ වර්ණනා විෂය ඉක්ම වූ බව කී සේ යි.

**විපසනී :**

1. **අසුර** - දෙවියන් හා මුළුමනින් අසමාන නො වූ සෘද්ධියකින් යුත් පිරිසක්.

2. **දුන්** - 'දා' දයින් කතෘකර්මකාරකද්වයට සම ව සිද්ධ කෘදන්ත රූප යි.

3. **වී** - 'විය - කීමෙහි' ධාතුවෙන් සිද්ධ අතීත කාලික ප්‍රථම පුරුෂ එකවචන ක්‍රියා යි. ඊ විබත් යෙදී 'වියි' යි සිද්ධ කල්හි ය කාර ලොපයෙන් ස්වර්ණස්වරයන් එක් ව එක ම දීර්ඝයක් වීමෙන් 'වී' යි සිද්ධ යි.

4. **ලෝ ඉකුත් බැව්** - ලොකයෙහි ශ්‍රෙෂ්ඨත්වය පිළිබඳ යම් සීමාවක් පවතී නම් එය ද ඉක්ම වූ බව කී අයුරු යි.

5. **කනකලස** - කනායෙන් (= ස්වර්ණයෙන්) කළ කලස; කනා සද කනක ශබ්දයෙන් පැමිණියේ යි. ස්වර්ණ වාචී 'කනා, කන' යන දෙසදක් කොෂග්‍රන්ථයන්හි දක්නා ලැබේ. කලස් සද 'කලශ' ශබ්දයෙන් නිපන්න යි.

6. **කොස්දු** – කෙස් වූයේ ද එ ම දු වූයේ ද = කොස්දු.

7. **වැණුම් දු** – 'වණ' ධාතුකෙරෙන් 'උම්' පස යෙදී සිද්ධ භාව කෘදන්තයා කෙරෙන් 'ද' නිපාත යි. මත් වැඩි වීම ව්‍යංගය පිණිස යි.

8. **උවම්** – විස්තර කරනු කැමති දෙයක තත්වය හැඟවීම පිණිස ප්‍රසිද්ධාර්ථයක් ගෙන අභිප්‍රායාර්ථය හා ගළපා සාම්‍යය දැක්වීම.

**73.** **සමර සමර සෙන් මන් ගිම්කැලුම් මෙන් තමස්රැස්**
**බිඳ * නො දක රුපුන් අන් දන් පැරුම් ඇ බලන් ලූ**
**මඬලග ද මුදුන් දුන් සේරුවන් රන් පලක් පෑ**
**බැමලිය උණුලොම්දු යුත් නළල් දික් පුළුල් වූ.**

**අන්වය හා පදාර්ථ:** **බැමලිය උණුලොම්දු යුත්** – භ්‍රෑලතා ය ඌර්ණාරෝමධාතුව ය යන මෙයින් යුක්ත වූ, **දික් පුළුල් වූ** – දීර්ඝ හා පෘථුල වූ, **නළල්** – (තථාගතයන් වහන්සේගේ) ලලාටය, **සමර** – යුද්ධයෙහි දී, **සමර සෙන්** – මාරයා සහිත සේනාවගේ, **මන්** – මානය, **ගිම්කැලුම්** – සූර්යයා, **තමස්රැස් මෙන්** – අන්ධකාර රාශි යක් මෙන්, **බිඳ** – භග්න කොට, **අන්රුපුන්** – අන්‍ය ශත්‍රූන්, **නො දක** – දර්ශනය නො කොට, **දන් පැරුම් ඇ** – දානපාරමිතාදි, **බලන්** – භටයන් විසින්, **ලූ** – ලන ලද, **මඬලග ද** – ඛඩ්ග ද, **මුදුන් දුන්** – මස්තකයෙහි දානය කරන ලද (මුදුනෙහි ඔබ්බන ලද), **සේ රුවන්** – ශ්වෙතරත්න (= ස්ඵටික මාණික්‍ය) යක් ද ඇති, **රන් පලක්** – ස්වර්ණ ඵලකායුධයක්, **පෑ** – දැක්වී.

**විස්තර:**

බුදුරජාණන් වහන්සේගේ රන්වන් දිගුපුළුල් නළල් තලයාගේ යටපෙදෙසෙහි සිත්කලු බැම්සඟලෙක් වෙයි. ලලාටතල මධ්‍යයෙහි දක්ෂිණාවර්ත ව සිටි අතිශයින් ධවල වූ ඌර්ණාරෝම ධාතුවක් වෙයි. දෙබැම උණුලොම්ද යුත් නළල් තලය, යුද්ධයෙහි දී මාරයා සහිත සේනාවන්ගේ මානය, සූර්යයා අන්ධකාර රාශි යක් මෙන්, (= නිරවශේෂයෙන්) බිඳ අන්සතුරන් නො දක දශපාරමිතා නමැති යොධභටයන් විසින් හෙලන ලද කඩු ඇති මධ්‍යයෙහි බඳනා ලද පළිඟු මැණිකක් ඇති රන් පුවරුවක් (= ඵලකායුධයක්) වැන්නැ යි කිවිහු සලකති.

**විපසනී:**

1. **සමර** – 'සමර' සද යුද්ධ, අනඞ්ග, සිහි කිරීම ආදි අර්ථයන්හි වෙයි. මෙහි පළමු කී අර්ථයෙහි යි.

2. **සමර** – මර සහ වූයේ = සමර. 'සෙන්' යන්නට විශේෂණ යි. **මාරයා** නම් පරනිර්මිතවශවර්තී නම් දෙව්ලොව වැසි හැමවිට ම බුදුරජාණන්වහන්සේට ප්‍රතිපක්ෂ වූ දෙවියෙකි. හෙතෙම අතිශයින් ඝොරතර සේනාවක් ගෙනවුත් බුදුන් හා යුද කොට පැරද පලා ගියේය යි ධර්මග්‍රන්ථයන්හි සඳහන් වේ.

* තොංදිය – හැම,

3. **තමස්** - සංස්කෘතයෙහි 'තමස්' සද හා සම හෙයින් තත්සම යි.

4. **දන්පැරුම් අෑ** - බොධිය ප්‍රත්‍යක්‍ෂ කර ගනු කැමැත්තන් විසින් පිරිය යුතු පැරුම් දශයෙකි. එනම්:- 'දන, සිල, නෙක්ඛම්ම, පඤ්ඤා, විරිය, ඛන්ති, සච්ච, අධිට්ඨාන, මෙත්තා, උපෙක්ඛා' යනු යි,
එහෙයින් කියන ලදි.

" දනං සීලඤ්ච නෙක්ඛම්මං - පඤ්ඤා විරියෙන පඤ්චමං
ඛන්ති සච්චමධිට්ඨානං - මෙත්තුපෙක්ඛාතිමෙ දස " යි,

මොවුනට දනය ආදි වන හෙයින් 'දන්පැරුම් අෑ' යි කීහ.

5. **මඬලග** - මෙද කඩුවට නමෙකි. 'මණ්ඩලාග්‍ර' ශබ්දයෙන් සිද්ධ යි.

**රුවන්මෙලෙහි :-**

" හොනෙවත් අසි, දු **මඬලග** - කග, කඩු, එකත් වනුයේ " යි.

6. **සේරුවන්** - සේ සද මෙහි ධවලාර්ථයෙහි වෙයි. ධවල වූ රත්න නම් පළිඟු මිණි යි.

7. **පලක්** - යුද්ධයෙහි දී කඩුපහර ආදිය වැළැකීම පිණිස ප්‍රයෝජනවත් වූ පුවරුකඩකි. 'ඵලක' ශබ්දයෙන් 'පලක්' යි සිද්ධ යි. 'පලිහ' යයි කථා ව්‍යවහාරයෙහි යෙදේ.

8. **බැමලිය** - ලිය එව් = ලිය. බැම ම ලිය = බැමලිය. ලතාවක් මෙන් කොමල වූ සුඳර බැම යයි කී සේ යි.

9. **උණුලොම්ද** - උෂ්ණීෂරොම ධාතුව; ඒ මෙ සෙයින් වැණුන ගුරුළුගෝමිහු " උෂ්ණීෂරෙම නම් කවර? යත්:- එ ලොම් නලල් මැද වූයේය. ඉතා පිරිසුදු දවහත් තරු වැන්න. පහන් ශීතල ගලා තුබූ සියක් වට පෙළු පුලුන් පෙදක් සෙයින් මෙලෙක. සිඹුල් පුලුන් ලිය පුලුන් හා සමාන ය. ඒ රෝමයෝ කෙලවර ගෙන අදනා ලද්දහු අඩිබාහු ප්‍රමාණ වෙති. විහිදුනා ලද්දහු දක්‍ෂිණාවර්ත විසින් ආවර්තිත වැ ඌර්ධ්වාග්‍ර වැ සිටිති. සවණී ඵලක මධ්‍යයෙහි තුබූ රජත බුද්බුදයක් සෙයින් සවණී කලසයකින් නික්මෙන ක්‍ෂීරධාරා සෙයින් අරුණ ප්‍රභාරඤ්ජිත ගගනතලයෙහි ඔෂධීතාරකා සෙයින් අතිමනොහර වැ දිස්නි. මේ ය 'උෂ්ණීෂරෙම' නම් " යි.

**74. දිවකුරු මුනි පාමුල් හිමි මෙඅත්බැව් දු දක්වා**
**මෙ මුනිඳුහු දෙසෙක්හී ලෙස් දු * මම් නම් † නො දක්නෙම්**
**§ සවන පරපුරෙන් නා ‡ දත් දෙයක් හෝ ‡‡ කිමැද්ද යි**
**යළි දු පිළිවිසුම් වස් මෙන් නුවන් පත් සවන්මුල්.**

**අන්වය හා පදාර්ථ : දිවකුරු මුනි පාමුල් හිමි** - දීපඞ්කර සර්වඥයන් වහන්සේගේ පාදමූල නමැති සීමාවේ පටන්, **මෙ අත් බැව් දු දක්වා** - මේ ආත්මභාවය දක්වා ද, **මෙමුනිඳුහු** - මේ මුනීන්ද්‍රයන්වහන්සේගේ, **දෙසෙක්හි** - දෙශයෙක්හි, **ලෙස් දු** - ලෙශ

* මම් කල් - ඇතැම්. † නොදිස්නෙම් - හැම. § සවනපරපුරේ - මුද්‍රිත.
‡ දත්දෙයක් නා - මුද්‍රිත. ‡‡ සො ඇද්ද යි - හැම.

මාත්‍රයකුත්, **මම් නම්** - මම නම්, **නො දක්නෙම්** - දර්ශනය නො කරමි. **සවන පරපුරෙන්** - ශ්‍රවණ පරම්පරාවෙන්, **තා** - තා විසින්, **දත් දෙයක් හෝ** - (දෙශවශයෙන්) දන්නා ලද දෙයක් හෝ, **කිම ඇද්දැයි** - කිමෙක් ද ? ඇත්තේ දැයි, **යළි දු** - නැවත ද, **පිළිවිසුම් බස්** - පිළිවිසීම පිණිස (මෙන්), **නුවන්** - නෙත්‍ර (ද්වය), **සවන් මුල්** - කර්ණමූලාන්තය, **පත්** - පැමිණියේ යි.

**විස්තර :**

බුදුරජාණන් වහන්සේගේ නෙත් සකල කර්ණ මූලයන් දක්වා දික් ව පිහිටියේ ය ඒ, 'දීපඞ්කර පාද මූලයෙහි දී නියත විවරණ ලත් තැන් පටන් මේ මුනීන්ද්‍රයන් වහන්සේගේ කිසි දෙයක් මම නො දකිමි. යුෂ්මතුන් විසින් කර්ණ පරම්පරාවෙන් හෙවත් ආරංචියෙන් දැන ගන්නා ලද දෙයක් හෝ ඇද්ද ' යි අසා දැන ගනු පිණිස කර්ණමූලය වෙත එළඹීමක් මෙනැයි උත්ප්‍රේක්‍ෂා කළ අයුරු යි.

ඇස දර්ශන ක්‍රියාව පමණක් කළ හෙ යි. ශ්‍රවණය කිරීමට භව්‍ය කර්ණය යි. එහෙයින් නෙත්‍රය ශ්‍රැතිමාත්‍ර (= ආරංචි) යෙන් දන්නා ලද යමක් දනු කැමති විට කර්ණයෙන් ඇසිය යුතු ය යන ඉන්ද්‍රිය පිළිබඳ කාර්ය නියමය මෙසෙයින් තැකීමට හේතු විය.

මෙයින් නෙත්‍ර යුගමයෙහි දීර්ඝත්වාදි ගුණ හා බුදුන් වහන්සේගේ චරිතයෙහි අතිශයනිර්මලභාවය ද සූචිත යි.

**ටිප්පනී :**

1. **දිවකුරු මුනි පාමුල් හිමි** – දිවකුරු ද එ ම මුනි ද = දිවකුරු මුනි. පාවල මුල් = පාමුල්, දිවකුරු මුනිහුගේ පාමුල් = දිවකුරුමුනි පාමුල්. දිවකුරුමුනිහුගේ පාමුල් ම හිමි = දිවකුරුමුනිපාමුල් හිමි. සාරාසඞ්ඛ්‍ය කල්ප ලක්‍ෂය කට පූර්වයෙහි **දීපඞ්කර** නම් බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ සේක. එකල අප මහබෝසතාණන් වහන්සේ සුමේධ නම් පණ්ඩිත ව ඒ තථාගතයන් වහන්සේගේ පාද මූලයෙහි දී බුද්ධත්වය පිළිබඳ නියත විවරණය ලැබ එතැන් පටන් අකුසලින් වෙන් ව දශපාරමී ධර්මයන් පූරණයෙහි නිරත වූහ.

මෙහි 'හිමි' යනු 'සීමා' ශබ්දයෙන් සිද්ධ යි. පියවියෙන් සිට අවදි අරුත් පවස යි. මෙ සේ ගත් විට කැමැති වූ අර්ථය නො ලැබෙන්නේ නො වේ. 'නියත විවරණ ලත් තැන් පටන් ය' යි හැඟවීමට යෙදූ සේ යි.

2. **දක්වා** – සීමාව හැඟවීමෙහි යෙදෙන අව්‍යයෙකි. මෙය මර්යාදාව (= හරිනු ලබන සීමාව) හැඟවීමෙහි යෙදෙතැ යි ඇතැම්හු සලකති. සිදතෙහි මෙ බඳු විභාගයක් නො කළ ද 'පැළලුප නුවර දක්වා වසරේ වට' යන උදාහරණයෙහි දක්වා යනු හරිනු ලබන සීමාව හැඟවීමෙහි යොදා තිබේ. "මපුත් මෙනුවර එන තැන් දක්වා මොබින් බත් ගෙන එව" ආදි වශයෙන් 'ගුරුළුගෝමි' ආදී ආචාර්ය වරයෝ ද එ අරුත්හි 'දක්වා' යනු යෙදූහ. මෙහි 'දක්වා' යි යෙදුව ද අභිවිධි (= සීමාව ඇතුළත් කොට) අර්ථය ගත යුතු යි. 'තෙක්' යි යොදනු ලද නම් මැනවි. මෙවුන්ගේ භේදය නොසැලකීමෙන් හෝ වෘත්තය පුරවා ගැන්ම පිණිස මෙසේ යොදන ලදී.

3. **ලෙස්** – සවල්පය. 'ලෙස' ශබ්දයෙන් නිපන්න යි.

4. **මම් නම්** – මම් යන ප්‍රථමාන්තයා කෙරෙන් 'නම්' යන නිපාතයාගේ යෙදීම යි. 'මම් කල්' යන පාඨය ගත හොත් 'මම් වනාහි' යි අරුත් ගත යුතු. 'කල්' යනු 'කලි' යනු වෘත්තාභෙදය පිණිස විකෘත කොට ගත් අයුරු යි.

5. **සවන පරපුරෙන්** – කර්ණපරම්පරාවෙන් (= ආරංචියෙන්); ඔවුනොවුන්ගේ කනින් කනට යෙමින් පැමිණි වාර්තාව කර්ණපරම්පරාවෙන් පැමිණියේ නම් වේ.

6. **දත් දෙයක්** – දත් ද එ ම දේ ද = දත් දේ. 'දත්' යනු 'දත් - දැනීමෙහි' දයින් කර්මකාරකයෙහි සිද්ධ අතීත කාලික කෘදන්ත යි. කර්තෘකාරකයෙහි ද මෙබඳු ම රූපයක් ලැබේ. 'දෙයක්' යනු 'දෘෂ්ට පක්ෂයෙහි වූ කිසිවක්' යන අරුත් දේ. දෙස් බලා නො දුටු දෙස් පිළිබඳ ශ්‍රැතියක් (= ආරංචියක්) වත් ඇද්ද යි අසන තැන යෙදුණෙන් ප්‍රකරණ වශයෙහි.

7. **කිමැද්දූයි** – කිම + ඇද්දූ යි. කිම යනු ප්‍රශ්නාර්ථයෙහි වෙයි. 'ඇත් ද' යන තන්හි පරරූපයෙන් 'ඇද්ද' යි සිද්ධ යි.

**75. * නිලමිණි යුවළැස්නෙන් බුන් මහත් දප් එමිලොල්**
**බියෙනැලළි ගොසින් වන් මෙන් සුපුල් මල් † ගැබෙක්හී**
**කාල අපහස දක්මින් නිල් උපුල් විල් සිලිල්හී**
**කිමිද ‡ විළිබරින් මෙන් හිස් නගා දික් බැලී එව.**

**අන්වය හා පදාර්ථ:** **නිලමිණි යුවළැස්නෙන්** – (මුනීන්ද්‍රයන් වහන්සේගේ) ඉන්ද්‍රනීල මාණික්‍ය බඳු යුගලාක්ෂියෙන්, **බුන් මහත් දප්** – භග්න වූ මහත් දර්ප ඇති, **එ මිලොල්** – ඒ භෘඞ්ග තෙම, **බියෙන්** – භීතියෙන්, **ඇලළි** – ක්ෂුභිත ව, **ගොසින්** – ගමනය කොට, **සුපුල් මල් ගැබෙක්හි** – සුපුෂ්පිත පුෂ්ප ගර්භයෙක්හි, **වන් මෙන්** – ප්‍රවිෂ්ට වූවකු මෙන්, (වී - වූයේය.) **නිල් උපුල්** – නීලොත්පල, **කාල අපහස** – (තමන්ට) කළ අවමානය, **දක්මින්** – දර්ශනය කොට, **විල් සිලිල්හි** – තටාක ජලයෙහි, **විළිබරින්** – ව්‍රීඩාභාරයෙන්, **කිමිද** මෙන් – නිමග්න ව මෙන්, (පසු ව) **හිස් නගා** – ශීර්ෂයන් උද්ගත කොට, **දික්** – දිශාවන්, **බැලී එව** – අවලොකනය කළාක් වැනි වී.

**විස්තර:**

භ්‍රමර තෙම නීලවර්ණ ය. එයින් මහත් දර්ප ඇත්තේ ද වෙයි. හේ ස්වභාවයෙන් ම සුපිපි කුසුම් ඇතුළත පිවිස වෙසෙ යි; මල් පැණි ගනු රිසියෙනි. තථාගතයන් වහන්සේගේ නෙත්‍රද්වන්ද්වය ඉඳුනිල්මිණි සෙයින් නීල වර්ණ ය. එහෙයින් බමර තෙම පරාජිත වෙයි. බමරාගේ මල්ගැබ්හි පිවිසීම නීලවර්ණය පිළිබඳ තම දර්පය භග්න වූ හෙයින් මෙනැ යි සැලකූ අයුරු යි.

* ඉඳුමිණි - හැම, † ගබක්හි - මුද්‍රිත. ‡ විළිබියෙන් - මුද්‍රිත.

නෙත්‍ර යුගමය නීලෝත්පලයන්ගේ සෞන්දර්යය ද ඉක්ම පවතී. ජලාභ්‍යන්තරයෙහි සිට උදගත ව පිපී පවත්නා නිලුපුල් පලමු කොට ලජ්ජා භාරය කරණ කොට ගෙන හැඟෙවනු පිණිස ජලාභ්‍යන්තරයට පිවිසියාක් මෙනැයි ද පසු ව හිස් නගා දිශාවන් බලන්නාක් මෙනැයි ද කීසේ හි. පරාජය වූවන් පළමු ව හැඟවීම ද පසුව සෙමෙන් සෙමෙන් ඔබ මොබ බලා එළියට පැමිණීම ද සිරිති.

**ටිප්පනී:**

1. **නිලමිණි** – ඉන්ද්‍රනීලමාණික්‍ය - යම්කිසි කිරෙහි ලූ කල කිරි නීල වර්ණයට පමුණුවා නම් එබඳු මැණික්.

2. **එම්ලොල්** – 'ඒ' සද ප්‍රසිද්ධාර්ථයෙහි යි. නීලවර්ණයෙන් ප්‍රසිද්ධ වූ යනු හැඟවුව මනා අර්ථය යි. 'මීලොල්' නම් බමර යි. මී නම් වූ මල් පැණියට ලොල් හෙයින් මීලොල් ය යි කියනු ලැබේ.

3. **ඇලළි** – ඇලළුණේ - ඇලළී, 'අලළ - කැලඹීමෙහි' ධාතු කෙරෙන් 'ඉ' ප්‍රත්‍යය ව අකාරයට මාත්‍රාංශ වෘද්ධි ව සිද්ධ කර්තෘකාරක අතීත කෘදන්ත යි.

4. **හෙළ අපහස** – නීලොත්පල අතිශයින් දර්ශනීය ය යි ලොකසම්මත ව පැවැත්තේ ය. බුදුන්ගේ නෙත්‍රයන් පිරිසුදු නීලවර්ණත්වාදීන් ඔවුන්ගේ භාවය ජය ගැනීම ඔවුනට අපහස කිරීමකි.

5. **කිමිද** – 'කුමුදු - ගැලීමෙහි' ධාතු කෙරෙන් 'අ' ප්‍රත්‍යය ව සිද්ධ පූර්ව ක්‍රියා යි. උකාරද්වයට පිළිපෙරළි ඉකාරද්වයෙක් වී.

6. **බැලී එව්** – 'බල' ධාතු කෙරෙන් 'ඊ' ප්‍රත්‍යය ව සිද්ධ අතීත කාලික ප්‍රථම පුරුෂ එකවචන ක්‍රියාව කෙරෙන් එව් යන නිපාතයාගේ ප්‍රයොගය යි.

**සංලක්ෂ්‍යය:**

1. මේ පද්‍යයෙන් තථාගතයන් වහන්සේගේ නෙත්‍රද්වන්ද්වයෙහි නීල වර්ණය වර්ණිත යි. නෙත්‍ර නීලවර්ණ හෙයින් ම බුදුහු **'අභිනීලනෙත්ත'** නමුදු වෙති. **'ගුරුළුගෝමි ආචාර්යයෝ'** තථාගතයන් වහන්සේගේ නෙත්‍රයෙහි නීලවර්ණය ඇති පරිදි වැනූහ **ධර්මප්‍රදීපිකාවෙහි**:-

"**අභිනීලනෙත්තො** යන තැන්හි ඔවුන් අභිනීලනෙත්‍ර පරිදි කිසේ ය? යත් - බුදුන් සියලු නුවන් ම නිල්වන් නො වෙයි. නිල් වුව මනා තන්හි දියමෙරලිය මල් සුදුසු ඉතා පිරිසුදු නිල් පැහැ ය. රත්වන් වුව මනා තැන්හි කිණිහිරි මල් සුදුසු රත්වන් පැහැ ය. රත් වුව මනා තන්හි බඳුවද මල් සුදුසු රත් පැහැ ය. සුදු වුව මනා තන්හි දවහත්තරු සුදුසු සුදු පැහැ ය. කළු වුව මනා තන්හි රුක්පෙණෙල ඇට සුදුසු ඉතා පිරිසුදු කළු පැහැ ය. නෙත්‍ර යුගලයෝ රත් විමනෙක්හි හැරූ මිණිසිවුමැඳුරක් සෙයින් වැටහෙති. මෙ සෙයින් අභිනීල වූ නෙත්‍රයන් ඇතිවන බැවින් 'අභිනීලනෙත්‍ර' නම් වෙත්."

නෙත්‍රයන්හි සෙසු වර්ණ මද වශයෙන් ඇතත් බෙහෙවින් නීල වර්ණය ම ඇති හෙයින් බාහුල්‍යොපචාරයෙන් 'අභිනීලනෙත්‍ර' ය යි කියනු ලැබෙති.

76. තනෙත සිකිනිඳුන් වස් දික් ව වක් වූ සුනිල් වූ
බැම උඟුලුයටෙසි බත් * රන්පසෙව් දික් මොළොක් වූ
මෙ තොප සවන එක්දෙස් ලෙව් වනත් තා ම සිත්කල්
කුලුණු මෙත කලුන්ගේ හෙම්මුවා හෝවිලි ගිත්.

**අන්වය හා පදරු:** **තනෙත** - තුඹවහන්සේගේ නෙත්‍ර නමැති, **සිකිනිඳුන් වස්** - මයූරේන්ද්‍රයන් පිණිස, **දික් ව වක් වූ** - දීර්ඝ ව වක්‍ර වූ, **සුනිල් වූ** - අතිශයින් නීලවර්ණ වූ, **බැම** - භ්‍රෑ නමැති, **උඟුලුයටෙසි** - උඟුලු යෂ්ටියෙහි, **බත්** - බඳනා ලද, **දික්** - දීර්ඝ වූ, **මොළොක් වූ** - කොමල වූ, **රන්පසෙව්** - සුවර්ණපාශයක් මෙනැයි ද, **තා ම** - ඔබවහන්සේගේ ම, **සිත්කල්** - මනොඥ වූ, **කුලුණු මෙත කලුන්ගේ** - කරුණා මෛත්‍රී නමැති කාන්තාවන්ගේ, **හෙම්මුවා** - සුවර්ණමය වූ, **හෝවිලි ගිත්** - දෙලාවක් බඳු ය යි ද, **මෙ තොප** - මේ ඔබවහන්සේගේ, **සවන** - ශ්‍රවණයෙහි, **එක් දෙස්** - එකදෙශයක්, **ලෙව්** - ලොකවාසීහු, **වනත්** - වර්ණනා කෙරෙත්.

**විස්තර:**

තථාගතයන් වහන්සේගේ කන්වැල නමින් හඳුන්වනු ලබන, කර්ණයෙහි එල්බෙනසුලු යට පෙදෙස මින් වර්ණිත යි. ප්‍රතිමාවන්හි දක්වා ඇති පරිදි මැදින් විදින ලද, කර්ණයන්ගේ අධඃ ප්‍රදේශයන් පැවති බැව් සලකනු ලබන හෙයින් මෙ කී වර්ණනය යෙදෙ යි.

i තනෙත සිකිනිඳුන් වස් දික් ව වක් වූ සුනිල් වූ
බැම උඟුලුයටෙසි බත් රන් පසෙව් දික් මොළොක් වූ,

නෙත්‍රය සමීපයෙහි පාශයක් (=මලයක්) මෙන් කන්වැල බබල යි. ඒ නෙත්‍ර නමැති මයූරයන් අල්වා ගනු පිණිස යොදන ලද රනින් කළ පාශයක් මෙනැ යි ගනිති. මයූරයන් ඇල්ලීම පිණිස යොදන පාශය උඟුලු ලීයක බඳිනු ලැබෙ යි. මෙහි වනාහි තථාගතයන් වහන්සේගේ දීර්ඝ ව වක්‍ර වූ නිල් බැම ම උඟුලු යෂ්ටිය බඳු වෙයි. ලීය නවා උගුල අවුළුවා තබන හෙයිනි. බැම අග පෙදෙස ළඟ ම කන්වැල ඇති හෙයින් භ්‍රෑ නමැති යෂ්ටියෙහි බඳින ලද පාශයක් මෙනැ යි ගැන්ම උචිත ම ය. 'රන්, දික්, මොළොක්' යි පාශය වෙසෙසූයේ උපමේය වූ කර්ණපාශයෙහි ඇති ගුණ උපමානයෙන් හැඟෙන පිණිස යි. බුදුන් වහන්සේගේ කන්වැල සුවර්ණ ම ය නො වේ, රන්වන් ය.

ii ... ... ... ... තා ම සිත්කල්
කුලුණු මෙත කලුන්ගේ හෙම්මුවා හෝවිලි ගිත්.

ස්ත්‍රීන්ට ක්‍රීඩා කිරීම පිණිස හෝවිලි (=උංචිලි) වෙ යි. බුදුන්ගේ කරුණා මෛත්‍රීධර්ම ස්ත්‍රීහු ය යි ගෙන කර්ණපාශය ඔවුන්ට ක්‍රීඩා කිරීම පිණිස වූ හෝවිලියක් මෙනැ යි සැලකූ අයුරු යි.

---

* රන් පසින් පත් විලස් වත් - හැම.

රන් පසින් - සුවර්ණ පාශයෙකින්, පත් - පැණි, විලස් වත් - විලාසයක් මෙනැ යි ද,

**පිපසනී:**

1. **තනෙත සිකිනිඳුන්** – සිකිනට ඉඳු - සිකිනිඳු. උන් - සිකිනිඳුන්; අලුක් සමස්. තගේ නෙත් - තනෙත්; තනෙත් ම සිකිනිඳු - තනෙත්සිකිනිඳු. නෙත්‍රයන් නීලවර්ණ හෙයින් සිකිනිඳු ය යි රූපණය මැනවි.

2. **උගුලුයමෙයි** – උගුල් සඳහා අටවනු ලබන ලීය 'උගුලුයට' නම් වේ. පාලි 'අදූහල' ශබ්දය උගුලු සදට සමානාර්ථ ය.

3. **පසෙසව්** – පස්+එව්. 'පස්' සද මලය යන අරුත්හි එවි. 'පාස' ශබ්දයෙන් බිඳුනා යි.

4. **මොළොක්** – 'කෝමල' ශබ්දයෙන් 'කොමළ්' යි බිඳුනා යි. පිළිපෙරලියෙන් 'කොමොළ්' යි ද වර්ණපෙරලියෙන් 'මොළොක්' ය යි ද සිද්ධ යි.

5. **කුලුණු මෙත කලුන්ගේ** – කුලුණු ද මෙත් ද = කුලුණුමෙත්; කුලුණු මෙත් ම කල් = කුලුණුමෙත්කල්; උන්ගේ = කලුණු මෙත් කලුන්ගේ. වෘත්තය පිණිස 'මෙත කලුන්ගේ' යි විය. කුලුණු නම් කරුණාව යි. එනම් දුකින් පීඩිතයන් දැක ඉන් මුදලීමට ඇති වන අදහස යි.

'මෙත්' නම් මෛත්‍රිය යි; හෙවත් සියලු සත්ත්වයන්ට සමාන සිතින් හිත සුව පැතීම යි.

6. **හෝවිලි** – ඇලා හෙවත් උංවිලි.

7. **ශින්** – 'සිත්' යනු උපමාද්‍යෝතක යි.

**77. වැටුපගිනුදුහු දුම් වා වෙයින් යත් දෙ අත්හි**
**එහි තරපතරෙක්හි පත් විලස් දික් සුනිල් වූ**
**බැම ලිය ගහනත්හි නා එකල්දෙව් දිනූ කල්**
**සතමුව පුඩු නිල්සත් මෙන් වනත් ලෙව් සුරන් ලූ.**

**අන්වය හා පදාර්ථ :** **වැටුපගිනි** – ප්‍රදීපාග්‍රයෙකින්, **උදුහුදුම්** – උද්ගත වූ ධූමරාජියක්, **වාවෙයින්** – වාතවේගයෙන්, **දෙ අත්හි** – උභයපාර්ශ්වයට, **යත්** – යන කල්හි, **එහි** – ඒ මධ්‍යප්‍රදේශයෙහි, **තරපතරෙක්හි විලස් පත්** – රශ්මි මණ්ඩලයක විලාශයට පැමිණියා වූ, **ගහනත්හි** – නාසිකා සමීපයෙහි වූ, **දික්** – දීර්ඝ වූ, **සුනිල් වූ** – අතිශයින් නීලවර්ණ වූ, **බැමලිය** – භ්‍රෑලතාව, **නා** – ඔබවහන්සේ, **එ කල්දෙව්** – ඒ මාර දිව්‍යපුත්‍රයා, **දිනූ කල්** – ජයගත් කල්හි, **සුරන්** – දෙවියන් විසින්, **ලූ** – (පූජාවශයෙන්) නඟන ලද, **සතමුවා පුඩු** – රතින් කළ පුඩු ඇති, **නිල් සත් මෙන්** – නීලවර්ණ වූ ඡත්‍රයක් මෙන් යි, **ලෙව්** – ලෝකවාසීහු, **වනත්** – වර්ණනා කෙරෙත්.

**විස්තර :**

i වැටුපගිනුදුහු දුම් වාවෙයින් යත් දෙඅත්හි
එයි තරපතරෙක්හි පත් විලස් දික් සුනිල් වූ
බැමලිය ගහනත්හි,

තථාගතයන් වහන්සේගේ දික් සුනිල් බැම යුවල ඔවුනොවුන් නො පැහැසී අතර තබා පිහිටියේ ය. ඒ අතුරෙහි වූ තලල් පෙදෙස රන්වන් ව දෘශ්‍යමාන වේ. එ හෙයින් ඒ ප්‍රදීපයකින් නැඟි ධූම රාජියක් වාතයෙන් දෙ අතට යන විට මධ්‍යයෙහි ශොභාමණ්ඩලයක් ඇති වුව හොත් එ මෙහි. සුනිල් බැම යුවල දෙ අතට ගිය ධූමරේඛාද්වය මෙහි. එ මැද වූ තලල් පෙදෙස රශ්මිමණ්ඩලය බඳු වේ.

ii ... ... ... ... තා එකල් දෙව් දිනූකල්
කනමුව පබු නිල්සත් මෙන් වනත් ලෙව් සුරත් දු.

(පුවෙංකත බැම යුවල) ඔබවහන්සේ මාරයා දිනූ කල්හි දෙවියන් විසින් පූජා කරන ලද ස්වර්ණමය පුබු (කර්ණිකා) වක් ඇති නීලවර්ණ වූ ඡත්‍රයක් වැනි ය යි ලොකවාසීහු වර්ණනා කොරෙති යි අනත් නාරද කී සේ යි. කවර සාම්‍යයෙකින් ද යත් :- දෙපසට විහිදී බැම යුවල විහිදවූ නිල් කුඩයක ආකාරයෙන් වක්‍ර ව පෙනේ. එවිට එමැද වූ රන්වන් තලල් පෙදෙස හැසුගම නමැති ඡත්‍රයෙහි ස්වර්ණමය කර්ණිකාවක සිරි උසුල යි.

**විපසනී :**

1. **උදුහු** – උද්භූත - උදගත කොට හරින ලද. 'උදහ - නැඟීමෙහි' ධාතුවෙන් 'උ' ප්‍රත්‍යය ව කර්තෘකාරකයෙහි සිද්ධ අතීත කෘදන්ත යි.

**මුවදෙව්දාහි :-**

"රෙදෙ සත්හිනෙපුරේ - තුරඟ කුරඟසිනුදුහු
ගජමේඝුවලත් වස්නා - පබඳමදපොදවැස්සෙන්" යි.

2. **යත්** – 'යා' ධාතු කෙරෙන් 'ත්' පස යෙදී සිද්ධ කාලාර්ථයෙහි කෘදන්ත යි.

3. **දෙ අත්හි** – උභයාන්තයට. උභයපාර්ශ්වයට යන අර්ථ යි. මේ නාමි අරුත්හි අදර විබති.

4. **තරපතරෙක්හි** – මෙහි තර ශබ්දය රශ්මි වාචක ද පතර ශබ්දය මණ්ඩල වාචක ද වෙයි.

5. **බැමලිය** – ලිය එව් ලිය. බැම වූයේ ද එ ම ලිය වූයේ ද - බැම ලිය.

6. **ගහනත්හි** – ගහනෙහි අත් - ගහනත්, එහි ගහනත්හි. නාසිකා වාචී 'ඝාන' ශබ්දයෙන් 'ගහන්' ය යි නිපන් යි. 'අන්ත' ශබ්දයෙන් නිපන් 'අත්' සද මෙහි සමීපාර්ථ වාචී යි 'අතැවැසි' යන තන්හි සෙයින්.

7. **එ කල්දෙව්** – 'එ' සද ප්‍රසිද්ධාර්ථයෙහි යි. කල්දෙව් නම් මාර දිව්‍ය පුත්‍ර යි. මාර වාචී 'කාල' ශබ්දයෙන් 'කල්' යි නිපන් යි.

8. **දිනූ** – 'දින' ධාතු කෙරෙන් 'ඌ' ප්‍රත්‍යය ව කර්ම කර්තෘ කාරක ද්වයට සම ව සිද්ධ කෘදන්ත යි, මෙහි කර්තෘකාරකයෙහි යි. 'කල්' යන කාලාර්ථ සප්තමිය හා සම්බන්ධ හෙයින් 'තා' යි ප්‍රයුක්ත යි.

9. **කනමුව** – කනමුවා - කනකමය. කන ශබ්දයා කෙරෙන් එයින් කරන ලද්දේ ය යන අර්ථයෙහි 'මුවා' ප්‍රත්‍යය යෙදී සිද්ධ යි.

10. **පුඩු** – පිණ්ඩනය (=එක්රැස් කිරීම) පුඩු නම්. ඡත්‍රයෙහි අවයව පුඩු කළ තැන නම් කර්ණිකාව යි. එහෙයින් මෙහි පුඩු සද කර්ණිකා වාචි යි.

11. **නිල්සත්** – නිල් වූ සත් - නිල්සත්. උපමෙය වූ බැමලිය නිල් හෙයින් නිල් සදින් වෙසෙසන ලදි.

12. **ලූ** – 'ලා' ධාතු කෙරෙන් 'උණ' පස යෙදී කර්ම කර්තෘ කාරක දෙකට සම ව සිද්ධ කෘදන්ත යි. මෙහි කර්ම කාරකයෙහි යි.

**78. නැඟි නිසයුරු හව්වෙන් හෙම්මුවා සෙල් මුදුන්හි**
**ගහන වෙනෙහි නෙවුනා ලොම්වැලෙන් පත් පහන් පෑ**
**වුවනත සිරි නෙත් කල් කල් දූරූ හෙම්මිටෙයි ලූ**
**පිළිමිණි දපණේ පෑ පැරගත්න යි හඟිම් මම්.**

**අන්වය හා පදාර්ථ:** **හෙම්මුවා** - සවර්ණමය වූ, **සෙල් මුදුන්හි** - පර්වත මස්තකයෙක්හි, **නැඟි** - උද්ගත වූ, **නිසයුරු හව්වෙන්** - චන්ද්‍රයාගේ විලාසයෙන්, **ගහන වෙනෙහි** - නාසිකා සමීපයෙහි, **නෙවුනා** - බබලන්නා වූ, **ලොම් වැලෙන්** - (ඌර්ණා) රොමාවලි යෙන්, **පත්** - පැමිණි, **පහන්** - ප්‍රසන්න වූ, **පෑ** - ප්‍රභාව, **වුවනත සිරි** - වක්ත්‍ර ශ්‍රී නමැති, **නෙත් කල්** - නෙත්‍ර ප්‍රිය වූ, **කල්** - කාන්තාව විසින්, **දූරූ** - දරන ලද, **හෙම්මිටෙයි** - සවර්ණමය මිටෙහි, **ලූ** - ලන ලද, (=යොදන ලද) **පිළිමිණි දපණේ** - සඵටික මාණික්‍යමය වූ දර්පණයෙක්හි, **පෑ** - ප්‍රභාව, **පැර ගත්න යි** - පැහැර ගත්තේය යි, **මම්** - මම, **හඟිම්** - සිතමි.

**විස්තර:**

මුනීන්ද්‍රයන් වහන්සේගේ නාසිකාවෙහි මුල් පෙදෙස සමීපයෙහි **ඌර්ණා රොමාවලිය** වෙයි. එය සවර්ණමය පර්වතමුදුනකින් නැඟි චන්ද්‍රමණ්ඩලය මෙන් බැබලෙ යි. රන්වන් නාසිකාව සවර්ණ පර්වතයක් බඳු ද, මණ්ඩලාකාර වූ ධවල ඌර්ණාරෝම ධාතුව චන්ද්‍රමණ්ඩලයක් බඳු ද, වන හෙයිනි. ඒ ඌර්ණා රෝම ධාතුවෙන් ඇති වූ ප්‍රභාව, මුඛ ශොභා නමැති කාන්තාව විසින් දරන ලද රන්මිටක යොදන ලද සඵටික දර්පණයක ප්‍රභාව බඳු ය යි කී සේ යි. ඌර්ණා රෝම ධාතුව පළිඟුයෙන් කළ දර්පණ තලයක (=කන්නාඩි වීදුරුවක) ද, ඉන් යට පෙදෙසෙහි පිහිටි නාසිකාව එහි මිටක ද, සිරිය ගන්නා හෙයිනි.

**විපසනී:**

1. **නැඟී** – 'නග' ධාතු කෙරෙන් 'ඉ' ප්‍රත්‍යය ව කර්තෘකාරකයෙහි සිද්ධ කෘදන්ත යි.

2. **නිසයුරු** – නිස (=රැය) කරනුයේ - නිසයුරු. චන්ද්‍ර යි.

3. **හව්වෙන්** – හවු + එන්. 'භාව' ශබ්දයෙන් 'හවු' යි සිද්ධ යි.

4. **ලොම්වැලෙන්** – ලොම් වූයේ ද එ ම වැල වූයේ ද - ලොම්වැල. එයින් - ලොම්වැලෙන්. ඌර්ණාරෝම ධාතුවෙහි යි සර්වාභොවිත වශයෙන්

අරුත් ගත යුතු. මෙහි ‘ වැල ’ සද පෙල යන අරුත්හි හො වේ. ‘ උණ්ණා ’ නම් එක් රෝමයක් ම හෙයිනි. වැලක් (= ලතාවක්) බඳු දීර්ඝ වූ කිසිවක් ඉන් වාච්‍ය වේ. “ දරනවැල ” ආදියෙහි මෙනි. ඌර්ණාරෝමයෙහි අයුරු 73 වන පද්‍යයේ 9 වන ටිප්පනියෙන් දත යුතු.

5. **පහන්** – ‘ ප්‍රසන්න ’ ශබ්දයෙන් ‘ පසන් ’ යි සිතා ව ස කාරයට හ කාරාදේශවීමෙන් සිද්ධ යි.

6. **වුවනත සිරි** – වුවන ම - වුවනත්, වුවනත්හි සිරි - වුවනත්සිරි. ව්‍යත්‍යය රැකීමට ‘ වුවනතසිරි ’ යි ගන්නා ලදී. අලුක් සමාසයෙන් සිද්ධය යි ද කිය හැකි යි.

7. **දුරූ** – ‘ දර ’ ධාතු කෙරෙන් ‘ උ ’ ප්‍රත්‍යය ව කර්ම කර්තෘ කාරක ද්වයට සම ව සිද්ධ කෘදන්ත යි. මෙහි කර්මකාරකයෙහි ය.

8. **හෙම්මිටෙයි** – හෙමින්(=රනින්)කළ මිට - හෙම්මිට; එහි - හෙම්මි ටෙහි. ‘ හ ’ කාරයට ‘ ය ’ කාරාදේශ වූ අයුරු 65 වන පද්‍යයේ 1 වන ටිප්ප නියෙන් දන්නේ ය. ‘ මිට ’ නම් මුෂ්ටි ය යි. හෙවත් ඇඟිලි සහිත ව හකුළු වන ලද අත්ල යි. ඒ මිටින් ගත යුතු දෙය ද මිට ය යි අභෙදෝපචාරයෙන් ව්‍යවහාර කරනු ලැබේ. ‘ කුඩමිට ’ ආදි වශයෙන් එ ව්‍යවහාරයෙහි ඉතා සුලභ ය.

9. **පිළිමිණිදපණේ** – පිළිමිණින් කළ දපණ (=කන්නාඩිය) - පිළි මිණිදපණ. ‘ පිළිමිණි ’ සදින් වෙසෙසන ලද්දේ දීප්තියෙන් හා ධවලත්ව යෙන් උපමෙය වූ ඌර්ණාරෝම ධාතුව හා සම වන පිණිස යි.

10. **පැර ගත්ත යි** – සමාන විය යි කී සේ යි. ‘ තස්‍ය මුෂ්ණාති සෞභාග්‍යං ’ - ‘ ඔහුගේ ශොභාව පැහැර ගනි යි ’ යනු සාදෘශ්‍ය සූචක වාක්‍යයෙකි. එසේ ම මෙහි ද ‘ පිළිමිණි දපණේ පෑ පැර ගත්ත ’ යනු පිළිමිණි දපණෙහි පැහැ බඳු විය යන අරුත් දෙයි.

‘ පහර ’ ධාතුකෙරෙන් ‘ පැහැර ’ ය යි සිද්ධ පූර්වක්‍රියාව උපපද කොට ඇති ‘ ගත් ’ ධාතුවෙන් සිද්ධ අතීතකාලික ප්‍රථම පුරුෂ බහුවචන ක්‍රියා යි. ‘ පැහැර ’ යන තන්හි හකාර ලොපයෙන් ඇ කාර ද්වය එක් ව එක ම දීර්ඝ යක් වීමෙන් ‘ පැර ’ යි සිද්ධ යි. ‘ ගත් ’ යන කර්තෘ කාරක කෘදන්තයා කෙරෙන් වාක්‍යාවසාන අ කාරය වූ විට ත කාරයට ද්විත්ව වීමෙන් ‘ ගත්ත ’ යි සිද්ධ යි.

11. **හගිම්** – ‘ හග - සිතීමෙහි ’ ධාතුකෙරෙන් ‘ ඉම් ’ පස යෙදී සිද්ධ වර්තමාන කාලික උත්තම පුරුෂ එකවචන ක්‍රියා යි.

**සංලක්ෂ්‍යය :**

බැමලිය ඌර්ණාරෝම ධාතුව හා නලල් තලය ද 73 වන පද්‍යයෙන් වර්ණිත යි. නැවත 77 න් ද බැමලිය වර්ණිත ය. **මේ පද්‍යයෙන් නැවත ඌර්ණාරෝමධාතුව වනති.** 74 - 75 දෙකින් නෙත්‍රයන්ගේ දීර්ඝත්වය හා නීලත්වය ද වර්ණනා කොට 76 හි ද නෙත්‍ර, නම් වශයෙන් දක්වන ලදි. මෙසේහින් පළමු වර්ණනා කරන ලද දේ ම නැවත නැවත කීම කාව්‍ය රසික යන්ට උද්වෙගජනක යි.

79. යදි දන මන තුස්වූ තා ම සිත් සේ පුළුල් වූ
සග * මග මොහු පත් † වෙත් තා බැලුම් සේ ම දික් වූ
§ දුදුනි ලසර දන්නා තා නිසෙක්ලෙස් සියුම් වූ
ලෙළ කොමළ සුරත් වූ දිව සදෙව් ලෝ වනා ද.

අන්වය හා පදාර්ථ: යදි දන - යාචක ජනයන්ගේ, මන - චිත්ත යන්, තුස්වූ - සන්තොෂ කළා වූ, තා ම - ඔබ වහන්සේගේ ම, සිත් සේ - ත්‍යාග චිත්තය සේ, පුළුල් වූ - පෘථුල වූ, මොහු - මේ ජනයෝ, සග පත් වෙත් - (මරණින් පසු) ස්වර්ගයට පැමිණෙත්, මග පත් වෙත් - (මොවුහු) මාර්ගයට පැමිණෙත් (යන), තා - ඔබගේ, බැලුම්සේ ම - (නුවණින්) බැලීම සේ ම, දික් වූ - දීර්ඝ වූ, දුදුනි - දුසා සේ දත යුතු, ල සර - (සත්වයන්ගේ) චිත්තාචාරය, දන්නා - ජානනය කරන්නා වූ, තා - ඔබ වහන්සේගේ, නිය + එක්ලෙස් - ඥානය පරිද්දෙන්, සියුම් වූ - සූක්ෂම වූ, ලෙළ - ලීලා සහිත වූ, කොමළ - කොමල වූ, සුරත් වූ - අතිශයින් රක්ත වර්ණ වූ, දිව - ජිහ්වා ධාතුව, සදෙව්ලෝ - දෙවියන් සහිත ලෝවැසි තෙම, වනා ද - වර්ණනා කෙරේ ද? (නො කළ හැක්කේ ම ය.)

විස්තර:

මින් ශාක්‍යසිංහයන් වහන්සේගේ 'ප්‍රභූතජිහ්වත්ව' ගුණය වර්ණිත සි. 'ප්‍රභූත ජිහ්වා' නම් මෙළෙක්, දික්, පළල් යන ලක්ෂණත්‍රයෙන් යුක්ත ජිහ්වා සි. එයින් පුළුල්, දික් ගුණ මෙහි ප්‍රථම පාදද්වයෙන් වර්ණනා කෙරෙත්.

i යදිදන මන තුස්වූ තා ම සිත් සේ පුළුල් වූ,

බුදුහු බෝධිසත්ව කාලයෙහි සුමේධ විශ්වන්තර ආදි ආත්මභාවශතයන් හි දී යාචකයන්ගේ සිත් පුරා දන් දුන්හ. එ සඳ උන්වහන්සේ තුළ පැවති පරිත්‍යාග චිත්තය අතිශයින් පෘථුල (= පළල්) ය. නැත හොත් යදිදනන් සිත් සතුටු කළ නො හැක්ක. කියන ලද මැ යි සුභාෂිතයෙහි ද :-

"සුරතුරු වන් උතුමකු දෙන දනින් මි ස
යදිකාලි මන් කො සෙ දුරු වෙ ද ? මුලින් පි ස" යි.

එහෙයින් තථාගතයන් වහන්සේගේ පරිත්‍යාග චිත්තය සේ පුළුල් ය යි කීමෙන් ජිහ්වා ධාතුවෙහි ඉතා පළල් බව හඟවති.

ii සග මග මොහු පත් වෙත් තා බැලුම් මෙන් ම දික් වූ,

බුදුහු, ආවර්ජනා කළ විට 'මොහු මරණින්' මතු ස්වර්ගයෙහි උපදිති, මොහු මාර්ගඵලාධිගමයට උපනිශ්‍රය සම්පන්නයහ. යනාදිවශයෙන් දැකිය හෙති. මෙබඳු දූරදර්ශි භාවය නිසා ම මට්ටකුණ්ඩලී, සොපාක, ආදි අසරණයන්ට පිහිට වූහ. බුදුන් වඩින විට මට්ටකුණ්ඩලී තෙම ගෙපිලෙක හොවා සිටි මරණාසන්න බාලයෙකි. උන්වහන්සේගේ එළඹීමෙන් දෙව්ලොව උපන්

---

* වන - හැම. † වෙයි - ඇතැම්.

§ දුදුනිය රස දන්නා තා නියෙන් ලස් සියුම් වූ - මුද්‍රිත
දුදුනිය රස දන්නා ......... ...................... - ඇතැම්.

ඔහු **කාරණ** කොට ගෙන ලෝකශාසනයට මහත් අභිවෘද්ධියක් විය. **සෝපාක** අමුසොහොනක බැඳ දමන ලද අසරණ සැඩොල් දරුවෙකි. ඔහු තථාගතයන් වහන්සේගේ අනුග්‍රහය ලැබ දීප්තිමත් ක්ෂීණාශ්‍රවයන් වහන්සේ නමක් වූහ. මෙ සෙයින් බුදුන්ගේ බැලුම් ඉතා දිග ය. එ මෙන් දික් ය යි කීමෙන් ජිහ්වා ධාතුවෙහි අතිශය දීර්ඝත්වය හඟවති.

iii දුදුනි ලසර දන්නා නා තිසෙයක් ලෙස් සියුම් වූ
ලෙල කොමල සුරත් වූ,

සත්ත්වයන්ගේ චිත්තාචාරය දැනීම දුෂ්කර ය. බුදුහු සූක්ෂ්ම වූ සර්වඥීය 'පර චිත්ත විජානන' ඥානයෙන් ඒ සිත් සරාගාදි වශයෙන් සොළොස් ආකාරයෙකින් පිරිසිඳ දනිති. ඒ ඥානය මෙන් ජිහ්වාධාතුව ද සියුම් බැව් පවසති. සියුම් වූ ජිහ්වා ඇති හෙයින් බුදුහු ශීඝ්‍ර වූ වචන ගති ඇති සේක. එහෙයින් ම, සෙසු භික්ෂූන් එක් අකුරක් කියන සඳ ආනන්ද ස්ථවිරයන් වහන්සේ අකුරු අටක් උසුරුවති. උන්වහන්සේ එකකුරක් උසුරුවන සඳ ශාරීපුත්‍ර ක්ෂීණාශ්‍රවයන් වහන්සේ අකුරු අටක් උසුරුවති. උන්වහන්සේ එකකුරක් කියන සඳ බුදුහු අක්ෂර ශුද්ධි ඇති ව අටකුරක් දෙසිය හෙති. තව ද ලීලා සහිත සුරත් වූ ජිහ්වාධාතුව කොමල ය හෙවත් මෘදු ය. එහෙයින් බුදුහු ජිහ්වා අග්‍ර භාගය සිහින් කොට නාසිකාවිජිද්‍ර පිරිමැදිය හෙති. මෙහි වර්ණනා කළ යුතු ප්‍රධාන ගුණය මෙළෙක් බව යි. සියුම්, සුරත් යනු අප්‍රධාන ගුණ යි,

**පිළසනි:**

1. **තුස්වූ** – 'තුස්' ධාතු සොරෙන් 'උණ' ප්‍රත්‍යය හා ද්‍රයොජ්‍ය ව ප්‍රත්‍යය ව කතෘකාරකයෙහි සිද්ධ කෘදන්ත යි.

2. **සග** – සවර්ගය. හෙවත් චාතුර්මහාරාජික, ත්‍රයස්ත්‍රිංශත්, යාම, තුෂිත නිර්මාණරති, පරනිර්මිතවශවර්ති යන සදෙව් ලොව,

3. **මග** – මාර්ගය. ඒ ශ්‍රොතාපත්ති, සකෘදාගාමි, අනාගාමි, අර්හත් ය යි චතුර්විධ යි.

4. **බැලුම්** – 'බල' ධාතු කෙරෙන් භාවයෙහි 'උම්' පස යෙදී සිද්ධ යි.

5. **දුදුනි** – දුක සේ දත යුතු දෙය දුදුනි නම්. 'දුර්ජානීය' ශබ්දයෙන් 'දුදුනි' යි ගිතතා යි. 'කාරණී' යනු මෙනි. වෘත්තය පිණිස මාත්‍රාහානිය වී.

6. **සදෙව්ලෝ** – දෙවියන් සහිත ලෝ - සදෙව්ලෝ.

**සංලක්ෂ්‍යය :**

මෙහි 'ප්‍රභූත ජිහ්වා' ලක්ෂණය වර්ණනා කරන අතර ම අන්‍ය සියුම් ගුණයක් ද හුවා ගෙන තිබේ. ප්‍රධාන ගුණ කියා අප්‍රධාන ගුණ පසු ව කියන ලද නම් මැනවි. මෙහි පාදත්‍රයක ම 'නා' යි දක්නා ලැබේ. එ ද පද්‍යය නීරස කෙරෙ යි. පූජ්‍ය **ගුරුළුගෝමි**, විදගම **මෛත්‍රෙය** සවාමිපාද යන මහකිවිවරයෝ ජිහ්වා ධාතුවෙහි ප්‍රධාන ලක්ෂණත්‍රය මෙසෙයින් වැනූහ

**ධර්මප්‍රදීපිකාවෙහි :–**

"ඔවුන් ප්‍රභූත ජිහ්වා ඇති පරිදි කිසේ ය? යත් - සෙස්සන් දිව් ස්ථූල වේ ම ය, කෘශ වේ ම ය, ලුහුඬු වේ ම ය, බද දිව් වේ ම ය, විෂම දිව් වේ මය.

බුදුනට වූ කල **මෙලෙක්** වූ **දික්** වූ **පලල්** වූ වර්ණසම්පන්න වූ දිව වෙයි. බුදුහු ඒ ලක්ෂණය නිශ්චය කරනු සඳහා ආවුන්ගේ කාඞ්ක්ෂා හරනා සඳහා මෙලෙක් වන බැවින් දිව කෙළින් හිදක් සෙයින් වටා ගෙන නාසිකාච්ඡිද්‍ර පිරිමදිති. දික් වන බැවින් දෙකර්ණච්ඡිද්‍ර පිරිමදිති. පලල් වන බැවින් කේශාන්ත පර්යන්තය කොට ඇති සියලු ලලාටය ප්‍රච්ඡාදනා කෙරෙත්.............. ...... මෙසෙයින් ත්‍රිලක්ෂණ සම්පන්න ජිව්හා ඇති වන බැවින් "ප්‍රභූතජිහ්ව" නම් වෙත්."

**බුදුගුණාලංකාරෙහි:-**

"**දිග** පෑ දෙකන් සිල - **මොලොකා** දක්වා නැහැ තු ළ
**පලලින්** මුළු නලල - වසන දිව මුනිඳුගෙ පැහැදු ළ" යි.

**80. ළද කොඳවැල හව්වෙන් ලෝනුවන් ගත් දසන්හි**
**මෙරජරජ වටා යත් වත් වටා යත් මෙ නා වත්**
**සමඬුලු පිනිපා හා පත් සරාකල් වනත් ලෙව්**
**නලවෙසිනි වටාවන් කෝමලින් යුත් කමල් හා.**

**අන්වය හා පදාර්ථ:** **ළද** - අභිනව වූ, **කොඳවැල හව්වෙන්** - කුන්දමාලාවක ලීලාවෙන්, **ලෝ නුවන්** - ලොකවාසීන්ගේ නෙත්‍රයන්, **ගත්** - ග්‍රහණය කළා වූ, **දසන්හි** - දන්තයන්හි, **මෙරජ රජ** - මරීචිරාජිය, **වත්** - වක්ත්‍රය, **වටා යත් වටා යත්** - සිසාරා යන කල්හි, **මෙ නා වත්** - මේ ඔබවහන්සේගේ වක්ත්‍රය, **සරාකල් පත්** - ශරත් කාලයෙහි පැමිණි (= උදා වූ), **සමඬුලු** - පරිවේශ හෙවත් මණ්ඩල සහිත වූ, **පිනිපා හා** - චන්ද්‍රයා හා (සමාන කොට ද,) **නලවෙසිනි** - වාතවේගයෙන්, **වටා වන්** - හාත්පස පැමිණි, **කෝමලින් යුත්** - පෙණින් යුක්ත වූ, **කමල් හා** - පද්මයක් හා (සමාන කොට ද) **ලෙව්** - ලොකයා, **වනත්** - වර්ණනා කෙරෙත්.

**විස්තර:**

බුදුරජාණන් වහන්සේගේ දත් කොඳ කැකුළු පෙළක් මෙන් ශුභ්‍රවර්ණාදි ගුණයන්ගෙන් ලෝවැසියන්ගේ සිත් සතුටු කෙරෙයි. ඒ දන්ත පඞ්ක්තියෙහි මරීචි (= රශ්මි) රාජිය උන්වහන්සේගේ වක්ත්‍රය සිසාරා යෙයි. ඒ රශ්මිමණ්ඩලයෙන් යුක්ත වූ වක්ත්‍රය පරිවේශ (= මණ්ඩල) සහිත වූ ශරච්චන්ද්‍රයා මෙනැයි ලෝකවාසීහු වර්ණනා කෙරෙත්. තථාගත වක්ත්‍රය ශරච්චන්ද්‍රයා මෙන් ශොභා සම්පන්න ද, සිසාරා පවත්නා දන්තකාන්තිය පරිවේශ (මණ්ඩල) ය බඳු ද වන හෙයිනි. යළි, සුළඟින් අවට විසුරුණු පෙණ ඇති පියුමක් මෙනැයි ද වනත්. වක්ත්‍රය පද්මයක් බඳු ද දන්තකාන්තිය විසුරුණු පෙණ රැසක් මෙන් ද වන හෙයිනි.

**ටිප්පනී:**

1. **ළද** - බාල යන අර්ථවත් නිෂ්පන්න ශබ්දයෙකි.

2. **කොඳ** - කුන්ද නම් වූ රාත්‍රිකාලයෙහි විකසිත වන පුෂ්ප විශෙෂයෙකි. කොඳ කැකුළු වර්ණයෙන් හා සටහනින් ද ශොභන දන්තයන් හා සමාන වන හෙයින් දන්තයන්ට උපමාන වශයෙන් ගනු ලැබේ.

3. **දසන්හි** – 'දසන' ශබ්දයෙන් දසන් යි සිද්ධ යි.

4. **මෙරජ රජ** – 'මරීචි, රාජී' යනු 'මෙරජ රජ' යි සිංහලයෙහි ව්‍යවහෘත යි.

5. **සමබුලු** – මබුලු සහ වූයේ - සමබුලු. මෙහි මබුලු නම් මේඝපටලා දිය ලං වීමෙන් චන්ද්‍ර සූර්‍ය්‍යයන්ගේ හුදුරෙහි ඇතිවන වළල්ලක් මෙන් දක්නා ලැබෙන රශ්මිමාලාව යි. මේ 'චන්ද්‍රමණ්ඩලය, සූර්‍ය්‍යමණ්ඩලය' ය යි ව්‍යවහාරයෙහි ද පවතී.

6. **පිනිපා** – චන්ද්‍රයා. මේ 'හිමරංසි' යනු පර්‍ය්‍යාය වචනයන්ගෙන් ගත් සේ යි. පිනි සද හිම වාචි යි. 'පා' සද රශ්මිවාචක ය.

7. **සරාකල්** – ශරත් කාලය, වප්, ඉල් දෙමස.

8. **වෙසිනි** – වේගයෙන්; වේ ශබ්දයා කෙරෙන් 'ඉනි' ප්‍රත්‍යය හා ය කාරාගම ද කොට ඒ කාරයට මත් අඩු කිරීමෙන් සිද්ධ යි.

**සංලක්ෂ්‍යය:**

1. බුදුන්ගේ දත් සම සතලිසෙකි, උස් මිටි ඇ විසින් විෂම නො ව පිහිටියේ ය, අතරතුර විවර රහිත ය, සියල්ල ම මුතුපෙළක් මෙන් ප්‍රභාස්වර ය. එහෙත් සතර දළදා ම අතිශයින් ශුභ්‍රරශ්මි ඇත්තේ ය. එහෙයින් බුදුහු 'සුසුක්කදාඨ' නම් වෙති.

කියන ලද මැයි බුදුගුණාලංකාරෙහි :–

> "සුදු රස් මතර ගේ - ලෙසින් සුරගහ තර ගේ
> විහිදෙන දස දි ගේ - සතර දළදා ය මුනි සඳු ගේ" යි.

**81. අලවන හැම නෙත්හිත් මේ ලෙවන් මේ ලවන්හි**
**මෙරජ රජ දිගත් යත් යත් සැඳෑ රැස් වලා මෙන්**
**බිඹුවැල ගෙලෙ වැල් ලී ගොස් බියෙන් මෙන් එ වල්හි**
**බඳුවද දූසා පැල්වන් වන් එවල් රුක් සුවාසැන්.**

**අන්වය හා පදාර්ථ:** **හැම මේ ලෙවන්** – සියලු මේ ලොකවාසින්ගේ, **නෙත් හිත්** – නෙත්‍ර හා චිත්තයන්, **අලවන** – ආසක්ත කරන්නා වූ, **මේ ලවන්හි** – මේ අධරයෙහි, **මෙරජරජ** – මරීචි රාජිය, **සැඳෑවලා රැස් මෙන්** – සන්ධ්‍යාවලාපටලයක කාන්තියක් මෙන්, **දිගත්** – දිගන්තයට, **යත් යත්** – යන කල්හි, **බිඹුවැල** – පක්ව බිම්බ ඵල, **බියෙන් මෙන්** – භීතියෙන්මෙන්, **ගොස්** – (පලා) ගොසින්, **එවල්හි** – ඒ වනයෙහි දී, **ගෙලෙ** – ස්වකීය ග්‍රීවායෙහි, **වැල් ලී** –වැල්ලා ගති, **පැල් වන්** – විහාර කුටීන්හි ප්‍රවේශ වූ, **බඳු වද දූසා** – බන්ධුජීවක කුසුමයන් දශ්නය කොට, **සුවාසැන්** – කීර (=ගිරා) පක්ෂි සමූහයා; **එවල් රුක්** – ඒ අරණ්‍යයෙහි වෘක්ෂයන්ට; **වන්** – පැමිණියහ.

**විස්තර:**

බුදුරජාණන් වහන්සේගේ අධර යුගමය (= දෙතොල්) සුරක්ත ය. එ හෙයින් එහි කාන්තිය සන්ධ්‍යාවලාපටලයන්ගේ කාන්තියක් මෙන් දිගත පැතිරෙයි. බිම්බ ඵලයෝ අතිශයින් රක්ත වර්ණ ය. ශෝභා සම්පන්න ය. එහෙත් ඔහු අධරකාන්තියෙන් පැරදුණහ. එහෙයින් වල් වැදී ගෙලෙ වැල් ලා ගත්හ. ලතාවන්ගේ අග්‍රයෙහි හටගත්තා බිඹු ඵල ගෙල වැල් ලා ගත්තන් මෙන් දක්නා ලැබෙන හෙයින් අධරයෙහි ශෝභාතිශය හැඟවීමට අධරකාන්තියෙන් පැරද ගෙලෙ වැල් ලා ගති යි කීහ.

බඳුවද මල් අතිශයින් රක්ත වර්ණ ය. තෙලා පූජා කරන ලද හෙයින් ගන්ධකුටිය ඇතුලත දක්නා ලැබේ. එ බැවි දූක ගිරව් අරණ්‍යයෙහි ගස් වලට වන්හ. "බඳුවද ඉතා රක්තවර්ණ ය. එබඳු බඳුවදත් අධර කාන්තියෙන් පැරද කුටින්හි සැඟවී ගත. එහෙයින් අප තුඹුවල මද රක්තවර්ණයක් ඇතත් ඉන් කෙසේ ජය ගත හෙමු ද" යි සලකා කීරපක්ෂීහු වෘක්ෂාන්තරයට පැමිණ සැඟවුණහ යනු ආශය යි.

මෙ හැම අයුරින් ම අධර කාන්තියෙහි ආධික්‍යය ප්‍රකාශිත යි.

**ටිප්පනී:**

1. **අලවන** – 'අල = ඇලීමෙහි' ධාතු කෙරෙන් 'න' ප්‍රත්‍යය හා ප්‍රයෝජ්‍ය 'ව' ප්‍රත්‍යය ව කර්තෘ කාරකයෙහි සිද්ධ කෘදන්ත යි.

2. **ලවන්හි** – 'ලපන' ශබ්දයෙන් 'ලවන්' යි සිද්ධ යි.

3. **සඳැ රැස් වලා මෙන්** – 'සැඳැ වලා රැස් මෙන්' යි සම්බන්ධ කොට ගත යුතු. සන්ධ්‍යාවලාපටල රක්තවර්ණ ය. ඔහුගේ කාන්තිය ද එසේ ම නු? සන්ධ්‍යාවලා සමූහයක් මෙනැ යි ද අරුත් ගත හැකි යි.

4. **බිඹු වැල** – බිඹු ද එ ම වැල ද ඒ ම නු යි = බිඹුවැල. බිඹු නම් කොවක්කා යි. පක්ව සියලු ඵලයන්ට 'වැල' යනු නම්. එහෙයින් ඉදුණු කොවක්කා ඵලය යන අර්ථ යි. බිඹුපල ඉදුණු විට ම රත්වන් වන හෙයින් 'වැල' සද යෙදූහ.

5. **බඳුවද** – එනම් මල්; බන්ධුජීවක.

6. **පැල්** - කුඩා කුටින්හි පැල් සද වැටේ. මෙහි බුදුරජාණන් වහන්සේගේ වාසස්ථානය වූ 'ගඳකිළි' යෙහි වැටේ.

7. **වන්** – 'වද = පිවිසීමෙහි' ධාතුවෙන් කර්තෘකාරකයෙහි සිද්ධ කෘදන්ත යි.

8. **සුවා කැන්** – 'සුව' යනු ගිරවුන්ට නම් වූ තත්සම ශබ්දයෙකි. 'කැන්' සද සමූහාර්ථයෙහි වේ. 'සුවකැන්' යි කිය යුතු තන්හි ව්‍යත්‍යය පිණිස මන් වැඩි වී.

**සංලක්ෂ්‍යය:**

මේ පද්‍යය පෙරෙවි අස්නෙහි 63 වන පද්‍යයෙන් උවදෙස් ලැබ රචිත ය යි සිතේ.

**82.** අසුරසුර නරන් කැන් මත් ගජන් බුන් මගත් දප්
බුදුකුරු ව එ සිගොස් නන් දිගත්කුස් පුරා දුන්
අසමිනැලළි මේ ගොස් ගොස් ගුවන් වන් බියෙන් මෙන්
ගැඹුරු සිදු හදක් වන් නා නෙපුල් දැන් වනම් දැ.

**අන්වය හා පදාර්ථ:** **බුදුකුරු ව** - (සිද්ධාර්ථ) බුද්ධාඞ්කුර ව, **දිගත් කුස්** - දිගන්ත කුක්ෂිය, **පුරා** - පූරණය කොට, **දුන්** - දානය කරන ලද, **අසුරසුර නරන් කැන්** - අසුර දිව්‍ය මනුෂ්‍ය සමූහ නමැති, **මත් ගජන්** - මත්තහස්තීන්ගේ, **මහත් දප්** - මහත් වූ දර්පය, **බුන්** - භග්න කළා වූ, **එ සිංගොස්** - ඒ අභීත නාදය, **අසමින්** - ශ්‍රවණය කොට, **ඇලෙළි** - ක්ෂුභිත වූ, **මේ ගොස්** - මේඝ ඝෝෂය, **බියෙන් මෙන්** - භීතියෙන් මෙන්, **ගොස්** - ගමනය කොට, **ගුවන් වන්** - ආකාශයට ප්‍රවිෂ්ට විය, **දැන්** - මෙ කල්හි, **ගැඹුරු** - ගම්භීර වූ, **සිඳු නදක් වන්** - සමුද්‍ර නාදයක් බඳු වූ, **තා** - ඔබ වහන්සේගේ, **තෙපුල්** - වචනයන්, **වනම් ද** - වර්ණනා කෙරෙම් ද ?

**විස්තර:**

අප බුදුහු සිද්ධාර්ථ කුමාර ව උපන් කෙණෙහි අසුර දිව්‍ය මනුෂ්‍ය නමැති හස්තීන්ගේ මානය භග්න කරන්නා වූ "අග්ගොහමස්මි ලොකස්ස" යනාදි අභීත සිංහනාදයක් පැවැත්වූහ. ඒ අසා මේඝ ඝෝෂය බියෙන් අහස් කුසට පිවිසියාක් මෙනි. මේඝ ඝෝෂය ඉතා ගැඹුරු ය. එ ද උපන් කෙණෙහි බෝසතුන් විසින් දෙන ලද අභීත නාදයෙන් පැරදිනි. එසේ ඇති කල්හි දැන් බුද්ධත්වයට පැමිණි ඔබවහන්සේගේ සමුද්‍ර නාදයක් මෙන් ගැඹුරු තෙපුල් කෙ සේ වර්ණනා කෙරෙම් ද? වර්ණනා කළ නො හැකි ම ය.

**විපසනි:**

1. **බුන්** - 'බිද' ධාතුවෙන් කර්තෘ කර්ම කාරකාදියට සම ව සිද්ධ කෘදන්ත යි. මෙහි කර්තෘකාරකයෙහි යි.

2. **දප්** - එඩිය.

3. **බුදුකුරු** - බෝසත්හු බුද්ධ නමැති වෘක්ෂත්වයට අඞ්කුරත්වයෙන් සිටිනා හෙයින් බුද්ධාඞ්කුර (= බුදුකුරු) නම් වෙත්.

4. **සිංගොස්** - සිංහ නාදය.- සිංහයකුගේ බඳු අභීත නාදය.

5. **අසමින්** - 'අස' ධාතුකෙරෙන් 'මින්' ප්‍රත්‍යය ව සිද්ධ මිශ්‍ර ක්‍රියා යි. මෙහි පූර්වක්‍රියාර්ථයෙහි පවතී.

6. **ඇලෙළි** - ඇලළුණේ = ඇලළී. 'අලළ' ධාතුකෙරෙන් 'ඉ' ප්‍රත්‍යය ව සිද්ධ අතීත කෘදන්ත යි.

7. **ගැඹුරු** - 'ගම්භීර' ශබ්දයෙන් නිපන්න යි. ගම්භීර බව ද ස්වරයෙහි එක් අඞ්ගයෙකි.

**83.** **රොනිනවල පියුම් ගබ් මත් බිඟුන් පා නිගා ලත්**
**නිසයුරු තඹෙග දස් බැව් සා ලෙසින් දුන් සනින් වී.**
**පැහැසර දපණත් වේ කල් සුලා යත් මලින් යත්**
**සොමිවත, කිම යෙම් මම් තා විනා අන් තිලෝහී.**

**අන්වය හා පදාර්ථ:** **රොනිනවල** - රේණූන්ගෙන් ආකුල වූ, **පියුම් ගබ්** - පද්ම ගර්භය, **මත් බිඟුන්** - මත්තභෘඞ්ගයන්ගේ, **පා-**

පාදයෙන්, **නිගා ලත්** – නිග්‍රහ ලද්දේ ය. **නිසයුරු** – චන්ද්‍රයා, **තමගෙ දස් බැව්** – ඔබගේ ම දාස බව, **සා ලෙසින්** – ශශ ව්‍යාජයෙන්, **දුන්** – දෙන ලද, **සනින්** – ලාඤ්ඡනයෙන්, **වී** – (ප්‍රකට) විය. **පැහැසර** – ප්‍රභාවෙන් සාර වූ, **දපණක්** – දර්පණය ද, **සුලා කල් යත්** – මඳ කලක් යත කල්හි, **මලින්** – මලයෙන්, **සත් වේ** – සඤ්ඡන්න වෙයි. **සොම්වත** – සෞම්‍ය වූ වක්ත්‍රය, **තා විනා** – ඔබ ය යි මිස හෙවත් 'බුදුන්ගේ වක්ත්‍රය බුදුන්ගේ වක්ත්‍රය ම ය' යි කියා මිස, **තිලෝහි** – ලොකත්‍රයෙහි, **අන් කිම** – අන්‍ය කවර වස්තුවකැයි, **මම** – මම, **යෙමි** – කියමි ද?

**විස්තර :**

වක්ත්‍රයක ශොභාතිශය හඟවනු කැමැති කල්හි 'වක්ත්‍රය පද්මයකි, වක්ත්‍රය චන්ද්‍රමණ්ඩලයකි' යි කීම කිවීන් විසින් පුරුදු කරන ලද්දකි. එහෙත් 'තථාගතයන් වහන්සේගේ සෞම්‍ය වක්ත්‍රය පද්මයෙකි. නැත හොත් චන්ද්‍රමණ්ඩලයෙකි' යි කිව හොත් ඒ සෞම්‍ය වක්ත්‍රයට නිසි පිණිස නොවෙයි. කුමක් හෙයින් ද? ඇත් - පද්මය බමරුන්ගේ පාදප්‍රහාර ලැබීමෙන් නිග්‍රහ ලැබූ දෙයකි. චන්ද්‍රයා තථාගත වක්ත්‍රයට දාසබව පෙර ශශ ජාතියෙහි උපන් බොධිසත්ත්වයන්ගේ රූ සටහනින් සූචිත ව පැවතීමෙන් ම හැඟේ.

තථාගත වක්ත්‍රය දර්පණ තලයකැයි කිව හොත් එ ද නො යෙදේ. දර්පණ තලය මඳකලක් යත විට මලින වන හෙයිනි.

එහෙයින් තථාගත වක්ත්‍රය තථාගත වක්ත්‍රය ම ය යි මිස අසවල් වස්තුව බඳු ය යි කීමට සුදුසු කිසි ම වස්තුවක් තුන්ලොව ම නැත.

මේ **නිරෞපම්‍ය අනන්වය** අලඞ්කාරයන්ගෙන් වක්ත්‍රයාගේ අසදෘශත්වය කී සේ යි.

**විපසනී :**

1. **රෙණිනවල** – රෙණින්+අවල. රෙණ් නම් පුෂ්ප පරාග යි. 'රේණු' ශබ්දයෙන් සිද්ධ යි. 'ආකුල' ශබ්දයෙන් 'අවුල - අවල' යි සිද්ධ යි.

2. **සා ලෙසින් දුන් සනින් වී** – ශශ ව්‍යාජයෙන් දෙන ලද සටහනින් දාසභාවය ප්‍රකට වේ. ශශ ආත්මයෙහි උපන් බෝසතුන්ගේ රූ සටහන සඳෙහි අඳින ලදී. එයින් චන්ද්‍රයාගේ දාසභාවය හැඟේ, මේ ද්‍රව්‍යාත්මිය සැකෙවින් දක්වූහ. **සසද** කාව්‍යපාදයෝ :-

"දුටු සා බමුණා - මුනිවිරු එ සස කල්හි
දල මැද අරා සිසි දිසි - සියමස්හි පුස්තා ලෙත්" යි.

මුනි වීර තෙම ශශ ව උපන් කල්හි බඩ සා සහිත (ඒ) බ්‍රාහ්මණයා දුටු ස්වකීය මාංසයෙන් ඔහු පොෂණය කරන අදහසින් වහ්නි මධ්‍යයට පැන චන්ද්‍රමණ්ඩලයෙහි දෘශ්‍යමාන විය. (අනුන්ට ආහාරය පිණිස ගිනි මැදට පැනීමෙන් පැහැදුණු සක්දෙව් රජු විසින් චන්ද්‍රමණ්ඩලයෙහි සටහන අඳිනු ලැබී.)

3. **පැහැසර** – පැහැයෙන් සර (= සාර) වූයේ = පැහැසර.

4. **සුලා** – ස්වල්පයක් යන අර්ථයෙහි වූ ශබ්දයෙකි.

5. **සොම්වන** – සොම් වූ වන = සොම්වන, වෙසෙසුන් සමස්. එහෙයින් ආමන්ත්‍රණය වක්‍ත්‍රයට ම ය. වක්‍ත්‍රය ඇත්හඬුට නො වේ.

**85. ල තමල ලියවත් වූ රන් එ තෝතැන්න වැන්නැ යි**
**මුනිරජ එ මඟුල්හි දන්පැරුම් ඈ දසුන් ලූ**
**කළුවැලිනුදුහු දුම් හෙම් මලා ය සි දු දක්වත්**
**ගැඹුරු නැබ වසාවන් උන් වදන් දූන් සිනා වන්.**

**අන්වය හා පදාර්ථ:** **වසාවන්** – ප්‍රවිෂ්ට වූ වසා රාජියක් ඇති, **ගැඹුරු නැබ** – මුනීන්ද්‍රයන් වහන්සේගේ ගම්භීර නාභිය, **ල තමල ලිය වත් වූ** – බාල තමාල ලතාවක් ඇත්තා වූ, **රන් එ තෝතැන්න වැන්නැ යි** – ස්වර්ණමය ආලවාලයක් වැනිය යි ද, **මුනිරජ** – මුනීන්ද්‍රයන් වහන්සේගේ, **එ මඟුල්හි** – ඒ මඞ්ගල සමයෙහි, **දන් පැරුම් ඈ** – දාන පාරමිතාදි වූ, **දසුන් ලූ** – දසයන් විසින් පූජා පිණිස ලන ලද, **කළුවැලින්** – එනම් වැල් විශේෂය කාරණකොට, **උදුහු දුම්** – උද්ගත වූ දුම් ඇති, **හෙම් මලා ය සි** – ස්වර්ණමය සරාවයකැයි ද, **දක්වත්** –(ඇතැම්හු වර්ණනා කිරීම් වශයෙන්) දක්වති, **උන් වදන්** – ඔවුන්ගේ (ඒ) වචනය, **දූන්** – මෙකල්හි, **සිනා** – උපහාසයට, **වන්** – පැමිණියේ ය.

**විස්තර :**

අභ්‍යන්තරයට පිවිසි වස්‍රාරාජි ඇති තථාගතයන් වහන්සේගේ නාභිය බාල තමාල ලතාවක් සහිත රන්තෝතැන්නකැ යි ඇතැම්හු වර්ණනා කොරෙත්. තමල නිල් ය. වාසා රෝද ද නිල් හෙයින් එ බඳු ය. නාභිය රන්වන් හෙයින් රන්තෝතැන්නකැ යි ගත්හ.

බුදුන්ගේ ඒ මඞ්ගලාවස්ථාවෙහි (=බුදු බැව් ලැබූ අවස්ථාවෙහි) දානාදි දස පාරමී නමැති දසයන් විසින් පූජා පිණිස ලන ලද කළුවැල් කාරණකොට නැඟුණු දුම් ඇති ස්වර්ණමය මලාවක් බඳු ය යි ද ඇතැම්හු වනත්. එහි ද සාම්‍යය පෙර සෙයින් සලකනු. ඒ වැනුම් දෙක ම මෙකල උපහාසයට සුදුසු බවට පැමිණියේ ය යි කී සේ යි. .

**පිළිසිනී :**

1. **ල තමල ලියවත්** – ල (=බාල) තමල ලිය ඇතියේ = ල තමල ලියවත්. 'ල තමලලිය' ශබ්දයා කෙරෙන් අස්ත්‍යර්ථයෙහි 'වත්' පස යෙදී සිද්ධ යි.

2. **තෝතැන්න** – තෝතැනි නම් ආලවාලය යි. හෙවත් ගස් අවට ඉසිනු ලබන දිය පිටත ගලා නො යනු සඳහා කනිනා ලද ඇල යි.

3. **දන් පැරුම් ඈ දසුන්** – දන් පැරුම් ඈ (=ආදි) වූයේ යමකට ද ඒ = දන් පැරුම් ඈ. **දශ පාරමිතා** යි. දන්පැරුම් ඈ ම දස් = දන් පැරුම් ඈ දස්. දාන, සීල, නෙක්ඛම්ම, පඤ්ඤා, විරිය, ඛන්ති, සච්ච, අධිට්ඨාන, මෙත්තා, උපෙක්ඛා යනු දානාදි දශපාරමිතා යි. ...

4. **කළුවැලිනි** – කළුවැල් නම් 'කාලාගුරු' = අගිල් නම් වූ ගින්නෙහි ලූ විට සුවඳ හමන වැල් විශෙෂයකි.

5. **හෙම්මලා** – හෙම්න් (= රහිත්) කළු මලා = හෙම්මලා. 'මලා' නම් බදුන් විශෙෂයකි. 'මල්ලක' ශබ්දයෙන් සිද්ධ යි.

**86. මියුරඹතුරු සාඛී උන් එ තා සෙන් බියෙන් ගොස්**
**වලඟ වැලඟ බන්ද ගේ විලස් පෑ එ තා ගත්**
**මෙ තොප කපි ව වල්හි ලා දුබුල් වූ මැදුම් දෙස්**
**හඟිමි නො ම හළ සි දුන් * දූ දුබුල් බැව් තමාගේ.**

**අන්වය හා පදාර්ථ:** **මෙ තොප** – මේ ඔබවහන්සේ, **කපි ව** – කපි රජ ව, **වලඟ** – ඉඟෙහි, **වැලඟ** – ලතාත්‍රයක්, **බන්ද** – බන්ධනය කරවා, **එ තා ගත්** – ඒ ඔබවහන්සේගේ ශරීරය, **ගේ විලස් පෑ** – ගෙයක් බඳු කොට, **බියෙන් ගොස්** – (දුනුවායන් කෙරෙන් වූ) භීතියෙන් ගොස්, **මියුරඹතුරු සාඛී** – මියුරු (= මී) අඹ වෘක්ෂ ශාඛාවන්හි, **උන්** – සිටියා වූ, **එ තා සෙන්** – ඒ ඔබවහන්සේගේ සෙනාව, **වල්හි** – වනයෙහි, **ලා** – දමා, **දුබුල් වූ** – දුර්වල වූ, **මැදුම් දෙස්** – මධ්‍ය දෙශය, **දුන් දූ** – මෙ කල්හි ද, **තමාගේ** – ස්වකීය වූ, **දුබුල් බැව්** – දුර්වල භාවය, **නො ම හළ සි** – නො හැරියේය යි, **හඟිමි** – සිතමි.

**විස්තර:**

බොධිසත්ත්වයන් වහන්සේ **මහාකපි** ව ඉපිද නදියක් සමීපයෙහි මහ මී අඹ රුක්ක සපිරි වරින් උන්හු. බරණැස් රජ ගඞ්ගා ජලයෙන් ගිය මී අඹයක් දැක අඹරසෙහි ලොබ බැඳ උඩු ගං බලා ගොස් සවස අඹරුක දැක සිසාර දහස් ගණන් දුනුවායන් රැකවල් ලවා උදෑසන ම ගසේ සිටි සියලු වඳුරන් නසන්නට නියොග කොළේ ය. බොධිසත්ත්වයෝ සිය පිරිසට වනසුලු විපත දැක ගඞ්ගාතෙර පැන වැලක් කඩා කොණක් තෙරෙහි හා කොණක් ඉඟ බැඳ ගෙන නැවත ගසට පිනූහ. අඹ අත්ත යම්තම් දතින් අල්වා ගැනීමට වඩා පොහොනා සේ වැල දික් නො විය. ඒ මහාවීරයෝ සිය සිරුර පිටින් හොස් වැල දිගේ බැස ගැලවී යන ලෙස සෙසු වඳුරන්ට නියම කොට එසේ කරවූහ. බොහෝ වඳුරන් ශරීරයෙහි පසු පස බදින ලද ලනු වෙහි එල්බ බසිත් ම ඇදීමෙන් ඉඟ සිහින් වේ. දුර්වල වේ. එ සඳ වූ ඒ දුර්වලත්වය දැනුදු නො හළ වනැයි කීමෙන් තථාගතයන් වහන්සේගේ මධ්‍ය ප්‍රදෙශයෙහි (= ඉඟෙහි) සිහින් බව හා මෘදුත්වය වැනූ සේ යි.

එහෙත් මේ රම්‍ය වර්ණනායක් නො වේ. දශ හස්තිබලධාරී වූ මහා පුරුෂයාණන් වහන්සේගේ ඉඟ දුර්වල ය යි කීම නො මැනවි. මෙහි 'දුබුල්' සද වෙනුවට 'සිහින්' සද යොදන ලද නම් මදක් ගැළපෙයි.

**ටිප්පනී:**

1. **මියුරඹතුරු සාඛී** – මියුරු වූ අඹතුර = මියුරඹතුර. වඳුරන් සිටිහයි මී අඹ තුරක ය. එහෙයින මියුරු යි කීයේ.

* ඒ,

2. **වලග** – ඉඟ. රුවන්මලෙහි:- "වලග, මැද දෙස්, ඉඟ වේ" යි.

3. **ගේ විලස් පෑ එ නා ගත්** – ශරීරයෙහි පසු පස බැඳි වැල තෙක් ගේයක මෙන් ශරීරය මත ගෘ යුතු ව පැවති හෙයින් මෙසේ කීහ.

4. **දුබුල්** – දුර්වල. 'දුබ්බල' ශබ්දයෙන් භින්න යි. 'දුබුල්' යි සිටි විට 'දසබුල්, කලඹ, කළඹ' ශබ්දයන්හි සෙයින් සුඛොච්චාරණය පිණිස බ කාරය හා ඉකාරාගමයක් සංයෝග වීමෙන් 'දුබුල්' යි සිද්ධ යි.

5. **නො ම හළ යි** – 'හර' ධාතුවෙන් කර්තෘ කර්ම කාරකද්වයට සම ව සිද්ධ යි. මෙහි කර්තෘකාරකයෙහි පවත්නා 'හළ' යන කෘදන්ත පදය යෙදූ හෙයින් සන්දෙහභාවී විෂයෙහි වන විශේෂ ප්‍රයෝගය මෙහි නො වී.

87. **කනරඹගබ හව්වෙන් මත් ගජන් අත් විලස්නෙන්**
**වටොරසිරි වනත් වත් දෙස් නිදෙස් බැව් නො දිස්නෙන්**
**නිසරු සිදුරු ඒ දෙක් මේ විලස් ලෝ ඉකුත් වත්**
**මම කලි උවමක් අන් මේ තිලෝහි නො දක්නෙම්.**

අන්වය හා පදාර්ථ: **වටොර සිරි** – (තථාගතයන් වහන්සේගේ) වෘත්තොරුයුගමයෙහි විලාසය, **කනරඹගබහව්වෙන්** – කනකරම්භාගර්භයෙක විලාසයෙන් ද, **මත් ගජන් අත් විලස්නෙන්** – මත්තහස්තීන්ගේ හස්ත (= ශුණ්ඩා) විලාසයෙන් ද, **වත් දෙස් නිදෙස් බැව්** – වස්තූන්ගේ සදෝෂ නිර්දෝෂ භාවය, **නො දිස්නෙන්** – අදර්ශනයෙන්, **වනත්** – (ලොකවාසීහු) වර්ණනා කෙරෙත්. **ඒ දෙක්** – ඒ උපමාන වස්තුද්වය, **නිසරු** – නිස්සාර ය. **සිදුරු** – රන්ධ්‍ර සහිත ය. **මේ විලස්** – මේ ආකාරයෙන්, **ලෝ ඉකුත් වත්** – ලොකාතික්‍රාන්ත වස්තුවකට, **මම කලි** – මම වනාහි, **අන් උවමක්** – අන්‍ය උපමාවක්, **මේ තිලෝහි** – මේ ලොකත්‍රයෙහි, **නො දක්නෙම්** – දර්ශනය නො කරමි.

**විස්තර:**

මුනීන්ද්‍රයන් වහන්සේගේ වෘත්තොරුද්වය රන් රඹ කඳ බඳු ය යි ද මත්ත හස්තීන්ගේ සොඬ බඳු ය යි ද උපමාන වස්තූන්ගේ සදෝෂ නිර්දෝෂ භාවය නො දන්නා ලොකවාසීහු වර්ණනා කෙරෙත්. මම වනාහි එම වෘත්තොරුද්වයට එය ම මිස සමභාවයට නැඟිය හැකි අන් කිසිවස්තුවක් නො දක්නෙමි යි කී සේ යි. මින් අසදෘශ ශොභාව වර්ණිත යි.

**විපසනී:**

1. **ගජන් අත්** – හස්තීන්ගේ අත නම් සොඬය යි.

2. **වටොර** – 'ඌරු' ශබ්දයෙන් 'උරු' යි බිඳේ. කළවා යි, මේ ශබ්දය වට ශබ්දයා හා සමාස වූ විට 'වටොර' යි සිටී.

3. **වත් දෙස් නිදෙස්** – උපමාන වස්තූන්ගේ සදෝෂ නිර්දෝෂ භාවය. උපමාන නම් වැනියට් යම් වස්තුවක ස්වභාවය හැඟවීම පිණිස දක්වනු ලබන අන්‍ය වස්තුවකි.

4. **නිසරු** – හර රහිත වූයේ නිසරු. රඹකඳ ඇත්සොඬ යන දෙක ම එක සේ නිසරු ය.

5. **සිදුරු** – රඹකඳ ඇත්සොඬ යන දෙකෙහි ම සිදුරු ද ඇත්.

6. **උවමක්** – උපමාන වස්තුවට ‘උවම්’ යනු යෙදේ. කියන ලද මැයි සිදතෙහි:–

“සම්භවියට නැතු - කිසි වත් උවම් නම් වේ” යි.

88. **මහරු රුසිරු තා රූ රැස් සිලිල් රැස්හි නෙවුනා**
**බුබුළු දෙදණ සිත්කල් තා ම පින්කම් සිපිගු**
**මෙ තුනු කරනු වස් තා හෙම්රැසින් දෙස් දවා ලූ**
**කිබිසි තුනු විලස් ය සි යෙත් එ මා සිත් නුරුස්නේ.**

**අන්වය හා පදාර්ථ:** **තා** – ඔබවහන්සේගේ, **මහරු** – මහාර්ඝ වූ, **රුසිරු** – රුචිර වූ, **රූ රැස්** – රූපලාවණ්‍ය නමැති, **සිලිල් රැස්හි** – සාගරයෙහි, **නෙවුනා** – බබළුන්නා වූ, **සිත්කල්** – මනොඥ වූ, **බුබුළු දෙදණ** – බුද්බුදද්වයකට බඳු ජානුද්වය, **තා ම** – ඔබවහන්සේ ගේ ම, **පින්කම් සිපිගු** – පුණ්‍යකාමී නමැති ශිල්පියා විසින්, **තා** – ඔබවහන්සේගේ, **මෙ තුනු** – මේ ශරීරය, **කරනු වස්** – නිර්මාණය කරනු පිණිස, **හෙම් රැසින්** – ස්වර්ණ රාශියෙන්, **දෙස්** – දෙෂ, **දවා ලූ** – දවනු ලැබීමට ආධාර වූ, **කිබිසි** – අධොමුඛ වූ, **තුනු විලස් ය සි** – මූෂා (=කෝව) ද්වයක් බඳු ය යි, **යෙත්** – (ලෝවැස්සෝ) කියත්, **එ** – ඒ කීම, **මා සිත්** – මාගේ චිත්තයට, **නුරුස්නේ** – රුචි නො වන්නේ ය.

**විස්තර:**

බුදුන්ගේ දෙදණ මඬල උන්වහන්සේගේ ශරීර ශොභා නමැති සාගර යෙහි ඇති වූ බුබුළු දෙකක් බඳු ය. එය, රන්වන් සිරුර තනනු පිණිස පුණ්‍ය කාමී නමැති ශිල්පියා විසින් රන් හුණු කොට මුණින් නැමූ මූෂා (=කෝව) දෙකක් බඳු ය යි ඇතැම්හු වර්ණනා කෙරෙත්. ඒ දෙදණ මඬලට සරි වන වර්ණනාවක් නො වනුයෙන් මට අනභිමත ය යනු ආශය යි.

**ටිප්පනී:**

1. **මහරු** – ‘මහාර්ඝ’ ශබ්දයෙන් ‘මහරු’ යි සිතනා යි. මෙහි ‘උතුම්’ යන අර්ථයෙහි පවතී.

2. **රූ රැස්** – රූපයෙහි කාන්තිය හෙවත් ලාවණ්‍යය. මෙහි ‘රැස්’ සද කාන්ති යන අර්ථයෙහි යි.

3. **බුබුළු** – ‘බුබ්බුල’ ශබ්දයෙන් පැමිණියේ යි.

4. **දෙදණ** – දෙ දණක් එක් කොට සලකන ලද්දේ=දෙදණ. පාලි ‘ජාණු’ ශබ්දයෙන් දණ යි සිතනා යි.

4. **දවා ලූ** – දවාලූයේ යමෙක්හි ද ඒ = දවාලූ. ‘උ’ පසින් සිද්ධ යි. මින් ආධාර කාරකය උක්ත යි.

5. **කිබිසි** – අඬොමුඛ. (= යටිකුරු කළ)

6. **තුතු** – භාජන වාචි ශබ්දයෙකි.

7. **නුරුස්නේ** – 'නො' පූර්ව 'රුස්' ධාතු කෙරෙන් 'ත' ප්‍රත්‍යය ව 'ඔ' කාරයට පිළිපෙරළී 'උ' කාර ව සිද්ධ 'නුරුස්ත' ශබ්දය පෙර විබත් 'ඒ' පස ගත් සේ යි.

**සංලක්ෂ්‍යය.**

මේ පද්‍යය **කාව්‍යශේඛරයෙහි:–**

"කිබිසි කළ රන් තුතු - සුදුසු කිරා නාරඳි
මද රස රූ තිවට වට - සුග දණ මඩුලු සෙ වනත්"

යන පද්‍යය ඇසුරු කොට රචිත ය යි හැගේ.

89. කිරුළු කුළු රඟා වන් නන් සුරන් හිස් ලඟා වන්
මෙ දඟ සුග ලඟා වන් ලෝ නුවන් සිත් දඟා වන්
එ එණි මුව නි ගා වන් ගොස් බියෙන් සෙත් මඟා වන්
එ වෙත දූහැ රඟා වන් වල් හිමව් පවු ලඟා වන්.

**අන්වය හා පදාර්ථ:** **ලඟා වන්** – සමීපයට ප්‍රවිෂ්ට වූ, **නන් සුරන්** – නොයෙක් දෙවියන්ගේ, **කිරුළු** – කිරීටයන්හි, **කුළු රඟා** – කූටයන්ගේ (= මුදුන්වල) ආකාරයට, **වන්** – පැමිණියා වූ, **ලෝ නුවන් සිත්** – ලොකයාගේ නෙත්‍ර චිත්තයන්ට, **දඟා වන්** – බන්ධනයක් බඳු වූ, **මෙ දඟ සුග** – මේ ජඞ්ඝායුගමයාගේ, **ලඟා වන්** – සමීපයට පැමිණියා වූ (එයින්), **නිගා වන්** – නිග්‍රහයට පැමිණි, **එ එණ්මුව** – ඒ එණිමෘග තෙම, **රඟා වන්** – ක්‍රීඩා පිණිස පිවිසි, **එවෙත** – ඒ සමීපයෙහි වූ, **වල්** – අරණ්‍යය, **දූහැ** – හැර, **බියෙන්** – භීතියෙන්, **සෙත්** – ශාන්තියක්, **මඟා** – අවලොකනය කොට, **ගොස් වන්** – ගොසින් මෙන්, **හිමව් පවු ලඟා** – හිමාලය පර්වත සමීපයට, **වන්** – ප්‍රවිෂ්ට වී.

**විස්තර:**

i කිරුළුකුළු රඟා වන් නන් සුරන් හිස් ලඟා වන්,

තථාගතයන් වහන්සේ වෙත එළඹෙන දෙවියෝ ශ්‍රී පාදයන් නමදිති. එ සඳ ඔවුන්ගේ කිරුළු සිරිපා ලඟ වෙයි. එවිට තථාගතයන් වහන්සේගේ ජඞ්ඝා (= කෙන්ඩා) යුගමය කිරීටයන්ගේ කූටයන් (= මුදුන්) මෙන් දක්නා ලැබේ.

ii ලෝනුවන් සිත් දඟා වන්,

බන්ධනය තම විෂය ඉක්මවිය නො දෙයි. තම වෙතට ආකර්ෂණය කෙරෙයි. එ මෙන් ලොකවාසීන්ගේ නෙත් හා සිත් ශොභාතිශයයන් තම වෙතට ඇද ගන්නා වූ ය යි යු සේ යි.

iii එ එණි මුව නිගා වන්,

එණි මෘගයන්ගේ ජඞ්ඝා සම ව වට ව අනුක්‍රමයෙන් සිහින් ව පිහිටියේය. එ මෙන් බුදුන්ගේ ජඞ්ඝා ද හාත්පස්හි සම ව සිටි ඔසින් පරික්ෂිපත වන

බැවින් බුදුහු 'එණිජඞ්ඝ' නම් වෙති. එණිමෘගයන්ගේ ජඞ්ඝා ශෝභන ය. බුදුන්ගේ ජඞ්ඝා ඉතුත් අධික ශෝභා ඇති හෙයින් එණිමෘගයෝ නිග්‍රහයට පැමිණෙති.

**ටිප්පණී:**

1. **දඟ** – දඟ නම් දණින් යට හොප් ඇටයෙන් උඩ පෙදෙස යි. 'ජඞ්ඝං' ශබ්දයෙන් 'දඟ' යි ගිනතා යි.

2. **එණිමුව** – එණි නම් වූ ශෝභන ජඞ්ඝා ඇති මෘග විශේෂයෙකි.

3. **සෙත්** – 'සන්ති' ශබ්දයෙන් සෙත් යි ගිනතා යි. මෙහි සෙත් යි සැනසී විසීම අභිමත යි.

**සංලක්ෂ්‍යය:**

1. හිමව්පව්ව ළඟ බොහෝ එණි මුවෝ වෙසෙති. ඒ තථාගතයන් වහන්සේගේ ජඞ්ඝා ශෝභාවෙන් පැරද නිසියස්ථාන සොයා යනසින් මෙතැ යි උත්ප්‍රේක්ෂා කිරීමෙන් තථාගතයන් වහන්සේගේ ජඞ්ඝාවන්හි ශෝභාතිශය සූචිත යි.

**90.** **ලෙළ පබළ දෙලෙන් සන් හෙම්මුවා පුල්ලියෙක්හි**
**මිණිදූදිරි කුසුම්හි පත් විලස් රැස් මෙ නාගේ**
**සරණතුල * තලන්හි නි කැළුම් ලෙව් වනත් පත්**
**තුසර පනර හව්වෙන් පුල් සගස් පත්හි පත්හි.**

**අන්වය හා පදාර්ථ:** **ලෙළ** – ලීලෝපේත වූ, **පබළ දෙලෙන්** – ප්‍රවාල පත්‍රයන්ගෙන්, **සන්** – ගැවසී ගත්තා වූ, **හෙම් මුවා** – ස්වර්ණ මය වූ, **පුල්ලියෙක්හි** – විකසිත ලතාවක වූ, **මිණි දූදිරි** – මණි මූකත (=පිපියා) වූ, **කුසුම්හි** – පුෂ්පයෙක්හි වූ, **විලස් රැස්** – ලීලා රශ්මියට, **පත්** – පැමිණියා වූ, **මෙ නාගේ** – මේ ඔබවහන්සේගේ, **සරණතුල තලන්හි** – පාද පාණි තලයන්හි වූ, **නී** – නඛයන්ගේ, **කැළුම්** – කාන්තිය, **පුල් සගස් පත්හි** – විකසිත පද්මයෙක්හි, **පත්හි** – පත්‍රයන්හි (=පත්‍රයන්ට), **පත්** – පැමිණි, **තුසර පනර හව් වෙන්** – තුෂාර බින්දු පඞ්ක්තියක ලීලාවෙන් (=පිනිබිඳු පඞ්ක්තියක් මෙනැයි), **ලෙව්** – ලෝකවාසීහු, **වනත්** – වර්ණනා කෙරෙත්.

**විස්තර:**

තථාගතයන් වහන්සේගේ හස්තපාදතල රන් ලියක වූ විකසිත පුෂ්ප බඳු ය. හස්ත පාදයන් ස්වර්ණමය ලතා බඳු වන හෙයිනි. ඒ හස්ත පාද තලයන්ගේ අඞ්ගුලීන්හි වූ බවළ නඛයෝ ශෝභන කාන්තියෙන් යුක්ත වෙති. ඒ නඛ කාන්තිය පුෂ්පිත පද්ම පත්‍රයන්හි වූ තුෂාර (=පිනි) බිඳුන්ගේ ශෝභාව මෙනැ යි ලෝකවාසීහු වර්ණනා කෙරෙත්. හස්තපාද තල පියුම් බඳු ය. එහි වූ අඞ්ගුලීහු පියුම් පත් බඳු වෙති. එහි වූ නිය පිනි බිඳු බඳු ය. මේ සාම්‍යය බලා මෙසේ කීහ.

**ටිප්පණී:**

1. **දෙලෙන්** – දල+එන්. 'දල' නම් පත යි.

---

* තෙළල්හි - කැම,

2. **සරණතුල තලන්හි** – සරණ ද අතුල් ද = සරණතුල්. සරණ තුල්හි තල = සරණතුල්තල. වෘත්තයාගේ අපේක්ෂාව පිණිස 'සරණතුල' යි යොදන ලදී. 'සරණ' නම් පාදය යි. 'චරණ' ශබ්දයෙන් සිද්ධ යි. 'හස්තතල' යන්නෙන් 'අතුල්' යි සිද්ධ යි. එහෙත් මෙහි 'අතුල්' සදින් 'පාණි' = අත්ල යන අර්ථය පමණක් ලැබේ. 'තල' ශබ්දයාගේ විශේෂාර්ථයක් නො ලැබේ. 'යකඩ' ආදි ව්‍යවහාරයන්හි මෙනි. කාලලෝහ වාචි 'අය' ශබ්දය 'නත්' යන තන්හි මෙන් අකාර ලොපයෙන් 'ය' යි සිටි ඉන් පර ව 'ඛණ්ඩ' යන අර්ථ වාචි 'කඩ' සද යොදා ව්‍යවහාර කරනු ලැබේ. යකඩ කැබැල්ලක් යන අර්ථය නො ව සාමාන්‍යයෙන් කාලලෝහය යන අර්ථය ඉන් ලැබේ. ශබ්දයාගේ සිද්ධිය කෙ සේ වුවත් 'අතුල්' සද මෙහි 'පාණි' වාචක හෙයින් 'පාණිතල' යන ව්‍යවහාරය නිවැරදි සේ ම 'අතුල් තල' යනු ද නිවරද ය. 'දීකිරි' ආදි ව්‍යවහාර ද මීට සාධක යි. මිදි කිරි වාචි 'දධි' ශබ්දයෙන් 'දිහි' යි සිද්ධ යි. හකාර ලොපයෙන් 'දී' යි සිටි. ඔහු සොරෙන් නැවත 'කිරි' ශබ්දයාගේ ප්‍රයොගය කරනු ලැබේ.

3. **තුසර** – පිනි. 'තුසාර' ශබ්දයෙන් සිද්ධ යි.

4. **පතර** – ප්‍රසිද්ධ, මහත් ආදි අර්ථ වාචි ශබ්දයෙකි. මෙහි පඞ්ක්ති හෝ මණ්ඩල යන අරුත්හි වේ.

**91. උළිඳු මෙරජ නෙත් වූ පත් සැඳෑකල් වලාහි**
**දප හල සරණත් පෑ නිකැලුම් හා නො වෙන් වූ**
**කෙළිනු හැලෙම්නෙක්වන් දෙව්කලුන් දෙව් ගඟුල්ලේ**
**ඉපිලි එ අගරා හා මම් වනම් එක් දෙසින් දූන්.**

**අන්වය හා පදාර්ථ: උළිඳු මෙරජ නෙත් වූ** – චන්ද්‍රමරීචීන් ආර්ද්‍ර වූ, **සැඳෑකල් පත්** – සන්ධ්‍යා කාලයෙහි ප්‍රාප්ත වූ, **වලාහි** – වලාපටලයක, **දප** – දපිය, **හල** – පහ කළා වූ, **නිකැලුම් හා** – නඛකාන්තිය හා, **නො වෙන් වූ** – සම්මිශ්‍ර වූ, **සරණත් පෑ** – චරණ යෙහි ශොභාව, **දෙව් ගඟුල්ලේ** – සුරනදී ජලයෙහි, **දෙව් කලුන්** – දිව්‍යාප්සරාවන්, **හැලෙමින්** – නිමග්න වෙමින්, **එක්වන්** – නිරන්තර යෙන්, **කෙළිනු** – ක්‍රීඩා කරන කල්හි, **ඉපිලි** – ඉල්පුණා වූ, **එ අගරා හා** – ඒ අඞ්ගරාග හා සම ය යි, **මම්** – මම, **දූන්** – මෙ කල්හි, **එක් දෙසින්** – එකදෙශයෙකින්, **වනම්** – වර්ණනා කෙරෙම්.

**විස්තර:**

තථාගතයන් වහන්සේගේ නඛකාන්තියෙන් යුක්ත වූ පාදතලයෙහි ශොභාව චන්ද්‍රකිරණයෙන් මිශ්‍ර වූ සන්ධ්‍යාවලාපටලයක් බඳු ය. නඛ කාන්තිය ධවල හෙයින් සඳ රැස් වැනි ද, පාදතල රක්ත වර්ණ හෙයින් සන්ධ්‍යා වලාවක් බඳු ද වන හෙයිනි. 'දප හල' යනු ද තුල්‍යත්වය හඟවන වාක්‍යයෙකි.

ආකාශගඞ්ගාජලය ධවල ය. එහි දෙවඟනන් නිමග්න වන කල්හි ඉල්පෙන අඞ්ගරාග රක්ත වර්ණ ය. නඛයන්ගේ ශුභ්‍රකාන්ති මධ්‍යයෙහි වූ පාදයාගේ රක්ත වර්ණ ය මීට උපමා කොට කිම එකදෙශයෙකින් හැළපේ. මින් පාද ශොභාවෙහි ආධික්‍යය හඟවති.

**ටිප්පණි:**

1. **උළිඳු** – චන්ද්‍රයා. උළුනට ඉඳු = උළිඳු. 'උළු' යනු තාරකා වාචී නාමශබ්දයෙකි. ඔවුනට ඉන්දු හෙයින් 'උළිඳු' යි කියනු ලැබේ. මේ අරුත්හි පාලියෙහි 'උළුරාජ' සද යෙදෙයි.

2. **නො වෙන් වූ** – 'යුක්ත වූ' යන අරුත් පැවසූ සේ යි.

3. **කෙළිනු** – ක්‍රිඩායෙහි වූ 'කෙළ' ධාතුවකරෙන් කාලාර්ථයෙහි 'ත' ප්‍රත්‍යය යෙදේ. එවිට 'කෙළත' යි සිටිය යුතු වුවත් ජෙකප්‍රයෝගානුකූල ව පූර්වාපර අකාරද්වය ක්‍රමයෙන් ඉකාර උකාර බවට පෙරළීමෙන් 'කෙළිනු' යි සිද්ධ යි.

4. **එක්වන්**– 'නිරන්තරයෙන්' යන අරුත්හි වූ ක්‍රියා විශෙෂණ ශබ්දයෙකි. 'එකුවන්' යි ද යෙදේ.

කාව්‍යශෙඛරයෙහි :–

"දෙරණ ලිය දුනු ඔහුට එකුවන්" යි.

5. **දෙව් ගඟුල්ලේ** – දෙව්ගඟුල් + ඒ. දෙව් ගඟෙහි උල් = දෙව් ගඟුල්. 'උල්' සද ජලය යන අරුත්හි දක්නා ලැබේ.

6. **ඉපිලි** – ඉල්පුණේ = ඉපිලි. 'උපුල්' ධාතුවකෙරෙන් 'ඉ' ප්‍රත්‍යය ව සිද්ධ කෘදන්ත යි.

7. **අගරැ** – ශරීරයෙහි පැහැ ඇති කිරීම පිණිස ආලෙප කරන ද්‍රව්‍ය අඩගරුග (= අගරු) නම්. මෙහි රසනාවණී අඩගරුග කැමැති විය යුතු.

92\. **පියගඳ කුසුමෙක් මැයි මා මුදුන්හි මෙ නා පා**
**සිදඳුන සිසිරැස් මැයි මා නුවන්හි මෙ නා රූ**
**මිණිකොඩල අමා මැයි නා වදන් මා සවන්හි**
**දිමුතු හරවැලෙක් මැයි මා උරේ ලූ මෙ නා කිත්.**

**අන්වය හා පදාර්ථ:** **මෙ නා පා** – (සර්වඥයන් වහන්ස), මේ ඔබවහන්සේගේ ශ්‍රී පාදය, **මා මුදුන්හි** – මාගේ මස්තකයෙහි, **පිය ගඳ** – ප්‍රිය වූ ගන්ධ ඇති, **කුසුමෙක් මැ යි** – කුසුමයෙක් ම ය, **මෙ නා රූ** – මේ ඔබවහන්සේගේ රූපය, **මා නුවන්හි** – මාගේ නෙත්‍රයන්හි, **සිදඳුන** – සිද්ධාඤ්ජනයෙකි, **සිසි රැස් මැයි** – චන්ද්‍රකාන්තියක් ම ය, **නා වදන්** – ඔබ වහන්සේගේ වචන, **මා සවන්හි** – මාගේ ශ්‍රවණයෙහි, **මිණිකොඩල** – මාණික්‍ය කුණ්ඩලයෙකි, **අමා මැ යි** – අමෘතයෙක් ම ය, **මෙ නා කිත්** – මේ ඔබවහන්සේගේ කීර්තිය, **මා උරේ** – මාගේ වක්ෂසෙහි, **ලූ** – ලන ලද, **දිමුතු** – දීප්තිමත් වූ, **හර වැලෙක් මැයි** – මුක්තාදාමයෙක් මැ යි.

**විස්තර:**

මෙයින් ගෞරවාතිශය හා භක්ත්‍යතිශය ද සූචිත යි. කුසුම් මුදුනෙහි පලඳිනු ලබන හෙයින් ශ්‍රීපාද යුගමය කුසුමැයි ද, සිදඳුන, සිසිරැස් නෙතට සුබදයක හෙයින් බුදුරුව ඒ දේ ය යි ද ශ්‍රවණයට ඉෂ්ට බැවින් බුදු වදන්

මිණිකොඩල ය අමා ය සි ද ගන්නා ලදී. කීර්තිය ධවල හෙයින් මුක්තාදාම යක් බඳු ය. මුක්තා දාමයෙක් නම් උර පෙදෙස පලඳිනු ලැබෙයි. ඔබ වහන්සේගේ කීර්තියෙන් සරසන ලද්දෙක් වෙමි යි කී අයුරු යි.

**විසඳුම් :**

1. **පිය ගඳ** – පිය වූ ගඳ = පියගඳ. එනම් සුවඳ යි.

2. **සිදඳුන** – හෑ කොණෙහි ප්‍රතිඵල ලැබෙන සේ සම්ප්‍රකාරයෙන් සිද්ධ කළ හෙවත් සම්පූර්ණ කළ අඳුන; නොහොත් සිද්ධයන්ගේ අඳුන. සිද්ධයෝ නම් මන්ත්‍රෞෂධ බලයෙන් අහසින් යෑම් ආදී ආශ්චර්‍ය ක්‍රියාවන්හි දක්ෂ දෙව ජාතියෙකි. 'අඳුන්' නම් නෙත්‍රසුඛය පිණිස ගානු ලබන ඖෂධ සංයෝගයකි.

3. **මිණි කොඩල** – මිණින් යුත් කොඩල = මිණිකොඩල. 'කුණ්ඩල' ශබ්දයෙන් 'කොඩල' යි පැමිණියේ යි. 'කුණ්ඩල' නම් කර්ණාභරණ විශේෂයෙකි.

5. **උරේ** – 'උර' නම් වක්ෂඃස්ථලය යි. 'උර' යනු 'මාගධී' භාෂාව හා තත්සම ශබ්දයෙකි.

**93.** **බැමලිය සරසුන්හි තාගෙ වක් බැව් සදිස්නේ**
**බිඹුවැල ලවනත්හි තා නුරා බැව් දු නෙවුනේ**
**මෙ තොප සලගුණෙක් නම් තා සවන් වැල්හි දිස්නේ**
**මෙනෙ කළි මනකල් මම් තා නො දක්නෙම් සදොස් බැව්.**

**අන්වය හා පදාර්ථ :** **තාගෙ** – ඔබවහන්සේගේ, **වක් බැව්** – වඞ්ක භාවයක්, **සදිස්නේ** – දෘශ්‍යමාන වන්නේ, **බැමලිය සර සුන්හි** – භ්‍රෑලතා නමැති ශරාසනයෙහි ය. **තා** – ඔබවහන්සේගේ, **නුරා බැව් දු** – අනුරාගී භාවයක් ද, **නෙවුනේ** – බබළුන්නේ, **බිඹු වැල ලවනත්හි** – පක්වබිම්බ ඵල බඳු අධරයෙහි ය. **මෙ තොප** – මේ ඔබවහන්සේගේ, **සල ගුණෙක් නම්** – චපල ගුණයෙක් නම්, **දිස්නේ** – දර්ශිතය වන්නේ, **තා සවන් වැල්හි** – ඔබවහන්සේගේ කර්ණපාශයන්හි ය. **තා** – ඔබවහන්සේගේ, **මනකල්** – මනොඥ වූ, **මෙනෙ කළි** – සිතෙහි වනාහි, **සදොස් බැව්** – සදොෂ භාවයක්, **මම්** – මම, **නො දක්නෙම්** – දර්ශිතය නො කෙරෙමි.

**විස්තර :**

ඔබ වහන්සේගේ වඞ්ක භාවයක් දක්නා ලැබෙන්නේ බැමලියෙහි ය. බැම ලිය වක් හෙයිනි. අනුරාගී බවක් දක්නට ලැබෙන්නේ ඉදුණු බිඹු පල බඳු තොල්හි ය. තොල් රක්ත වර්ණ හෙයිනි. චපල ගුණයක් දක්නට ලැබෙන්නේ කර්ණ පාශයන්හි ය. කර්ණ පාශ සෙලවෙනසුලු හෙයිනි. සිතෙහි වනාහි වඞ්කත්ව, අනුරාගිත්ව, චපලත්ව යන කිසි දෙයෙක් නැත.

සදොස් වූ කිසි ගුණයක් තථාගතයන් වහන්සේ තුළ නැතැ යි කී සේ යි.

**විපසනී :**

1. **බැම ලිය සරසුන්හි** – බැම දුනුලීයක් මෙන් වක හෙයින් 'බැම ලිය සරසුන්' යි කීහ. 'සරසුන්' නම් දුන්න යි, ශර (= ඊතල) යන්ට ආසන වන හෙයිනි.

2. **කලි** – වාක්‍යාලඞ්කාරයෙහි නිපාතයෙකි. "බුදුනට වූ කල" ආදි තන්හි සෙයින්, 'වූ කල' යි ද 'වූ කලි' යි ද ඇතැම් විට යෙදේ.

**94. මුළු දිය දියසත් වූ තා ම සිත් සේ නිමල් ව**
**තද තෙද රහසල්හි නාමෙණි පෑ තුමුල් වී**
**දිගඟන අඟරාගින් ගොස් බිජී සේරුවන්හි**
**තර පතර සුරත් වී සිව්මුවා ලෙව් විමන් හී.**

**අන්වය හා පදාර්ථ :** **මුළු දිය** – සමස්ත ලෝකයට, **දියසත් වූ** – විජයඡත්‍රයක් වූ, **තා ම** – ඔබවහන්සේගේ ම, **සිත් සේ** – චිත්තය මෙන්, **නිමල් වූ** – නිර්මල වූ, **තදතෙද** – දෘඪ වූ තේජස කරණ කොටගෙන, **රහසල්හි** – රසාතලයෙහි, **නා මෙණි** – නාගමාණික්‍යයෙහි, **පෑ** – ප්‍රභාව, **තුමුල් වී** – මහත් විය. **ගොස්** – (ඒ තේජස) ගොසින්, **දිගඟන** – දිශා නමැති අඞ්ගනාවන්ගේ, **අඟරාගින්** – අඞ්ගරාගයක් පරිද්දෙන්, **බිජී** – භ්‍රාජමාන විය. (ඒ තේජස කරණ කොටගෙන) **සිව්මුවා ලෙව්** – බ්‍රහ්ම ලෝකයෙහි, **විමන්හි** – විමාන යන්හි, **සේරුවන්හි** – ශ්වේතරත්නයන්හි, **තරපතර** - රශ්මි සමූහය, **සුරත් වී** – අතිශයින් රක්තවර්ණ විය.

**විස්තර :**

i තදතෙද රහසල්හි නාමෙණේ පෑ තුමුල් වී,

සර්වඥයන් වහන්සේගේ නිර්මල තේජස කරණ කොට ගෙන නා ලෝ වැසි නාගයන්ගේ (කෘෂ්ණ) මාණික්‍යයන්හි වර්ණය අධික විය. යම් තද වර්ණයක් පැතුරුණු විට සෙසු වස්තූන් ද එ ම වර්ණ වීම ස්වභාවයෙකි. තේජස රක්ත වර්ණය යි කිවිහු සලකති. එහෙයින් රක්ත වර්ණ තේජස පැතුරුණු විට ස්වභාව යෙන් රක්ත වූ නාගයන්ගේ මාණික්‍යයන්හි පැහැය අධික විය හැකි යි. මේ නාලොව තෙක් තේජස පැතුරුණු බැව් කී සේ යි.

ii දිගඟන අඟරා ගින් ගොස් බිජී.

තේජස දිගඞ්ගනාවන්ගේ අඞ්ගරාග (= විලෙවුන්) ලෙස බැබළිණ. මේ දිශාන්තය දක්වා අවට පැතුරුණු බැව් කී සේ යි.

iii ... ... ... ... සේ රුවන්හි
තරපතර සුරත් වී සිව්මුවා ලෙව් විමන්හි.

තේජසින් බඹලොව විමානයන්හි ස්ඵටික මාණික්‍ය ස්වාභාවික රක්ත වර්ණ විය. මේ බ්‍රහ්මලෝකය තෙක් මත්තෙහි (= උඩ) තේජස පැතුරුණු බැව් කී සේ යි.

**ටිප්පනී:**

1. **දියසක්** – විජයවජ්‍රය නම් බුද්ධාදීන් ජය ගත් විට නගන ජත්‍රය යි. ඒ අතිශයින් තෙදවත් ය.

2. **රහසල්හි** – රසාතලයෙහි. 'රසාතල' නම් නාගලොකය යි. 'රසා' නම් වූ පෘථිවියෙහි තලය (= අධොභාගය) රසාතල නම්.

3. **නාමෙමෙණි** – නයින්ගේ මෙණ = නාමෙණ, නාගයන්ගේ කණ්ඨයෙහි මිණිරුවන් ඇතැයි ද නාලොව බොහෝ මැණික් ඇතැයි ද ග්‍රන්ථයන්හි වර්ණිත යි. 'මිණ' යනු ඇතැම් විට 'මෙණ' යි ද යෙදේ. "**ඇති ව වැජඹෙන සේඛ මුනි මෙණ**" යනාදියෙහි සෙයින්.

**95. දිය ඉසුරු ත කිත් රැස් නන් දිගත් කුස් පුරා යත්**
**කිරිසිඳු හිමරැස් ලෙස් ගිම්සැලුම් පෑ ගුවන්හි**
**කෙලෙස විලස දැක්වී සව් විසල් සෙල් දිගන්හි**
**නනත ද තෙනෙතින් වී නිල්බඳ නිල්කමා හා.**

**අන්වය හා පදාර්ථ:** **දිය ඉසුරු** – ජගදීශ්වර වූ, **ත කිත් රැස්** – ඔබ වහන්සේගේ කීර්තිරශ්මිය, **නන් දිගත් කුස්** – නා නා දිශා කුක්ෂිය, **පුරා** – පූරණය කොට, **යත්** – යන කල්හි, **ගිම් සැලුම්** – සූර්‍ය්‍ය තෙම, **කිරි සිඳු** – ක්ෂීර සාගරයෙහි වූ, **හිමරැස් ලෙස්** – චන්ද්‍රයාගේ ශොභාව, **ගුවන්හි** – ආකාශයෙහි, **පෑ** – දැක්වී. **දිගන්හි** – දිශාන්තයෙහි වූ, **සව් විසල් සෙල්** – සියලු විශාල පර්වත, **කෙලෙස විලස** – කෛලාස පර්වතයාගේ විලාසය, **දැක්වී** – දක්වූයේ ය. **නිල් කමා හා** – ඊශ්වරයාගේ හා, **නිල්බඳ** – විෂ්ණුහුගේ, **නනත ද** – නානාත්වය ද, **තෙනෙතින් වී** – නෙත්‍රත්‍රයෙන් වී.

**විස්තර:**

මුනීන්ද්‍රයන් වහන්සේගේ කීර්ති රාශියෙහි ප්‍රබලත්වය මින් වර්ණිත යි.

i කිරිසිඳු හිමරැස් ලෙස් ගිම්සැලුම් පෑ ගුවන්හි,

චන්ද්‍රයා සෞම්‍ය ය. කිරිසයුරෙහි පවතින විට අතිශයින් ම සෞම්‍ය ය. මුනීන්ද්‍රයාගේ කීර්තිය පැතුරුණු කල්හි අහස්හි වූ සූර්‍ය්‍යයා එ බඳු අතිසෞම්‍ය චන්ද්‍රයාගේ සිරිගත්. කීර්තිය ශුභ්‍ර ය යි කවිකල්පිත යි. ශුභ්‍රවර්ණයාගේ ආධික්‍යයෙන් සූර්‍ය්‍යයාගේ චණ්ඩත්වය මර්දනය විය යි කී සේ යි.

ii කෙලෙස විලස දැක්වී සව් විසල් සෙල් දිගන්හි,

පර්වත නීලවර්ණයෙන් දක්නා ලැබේ. කෛලාස පර්වතය අතිශයින් ම ධවල ය. නීලවර්ණ පර්වත ද කීර්තිය පැතිරෙත් ම ධවල විය යි කී සේ යි.

iii නනත ද තෙනෙතින් වී නිල්බඳ නිල්කමා හා,

විෂ්ණු නීලවර්ණ ය. ඊශ්වරයා ධවල ය. විෂ්ණු ද කීර්තිය පැතිරෙත් ම ධවලවර්ණ විය. එහෙයින් ඊශ්වරයාට සම ය. එහෙත් ඔහුට ඇස් දෙකකි, ඊශ්වරයාහට තෙනෙතක් ඇත. වෙනස දත හැකි වූයේ මෙයිනි.

ටිප්පනි:

1. **කිරිසිඳු** – කිරි වන් දිය ඇති සිඳු = කිරිසිඳු.

2. **හිමරැස්** – චන්ද්‍රයා, හිම බඳු ධවල රැස් ඇති හෙයිනි.

3. **නනත** – නානාත්වය. 'නානත්ත' ශබ්දයෙන් 'නනත්' යි සිද්ධ යි.

4. **නිල්බඳ** – නිල් වූ බඳ (=ශරීරය) ඇත්තේ යමකුහට ද හේ = නිල්බඳ, විෂ්ණු යි.

5. **නිල්කටා** – නිල් වූ කට (=කණ්ඨය) ඇත්තේ යමකුගේ ද හේ = නිල්කට, ඊශ්වර යි. ඔහු සමුද්‍ර මථනයෙහි දී උදගත වූ '**කාලකූට**' නම් මහා විෂය ලොකානුකම්පාවෙන් පී හෙයින් ගෙල කළු වි ල.

**96. මෙ තොප යස දිගත් හිම් තා ම මෙත් සව් සතුන් හිම්**
**කුලුණු පරදුකත් හිම් තා විකුම් ලෝ සැපත් හිම්**
**තනුවණ මුළුනේ හිම් තා වදන් මොක් වැදුම් හිම්**
**තෙද රුපු වැනසුම් හිම් තා වැනුම් කා කියුම් හිම්.**

**අන්වය හා පදාර්ථ:** **මෙ තොප** – මේ නුඹවහන්සේගේ, **යස** – කීර්තිය, **දිගත් හිම්** – දිගන්තය අවධි කොට ඇත්තේ ය. **තා ම** – ඔබවහන්සේගේ ම, **මෙත්** – මෛත්‍රිය, **සව් සතුන්** – සකල සත්ත්වයන්, **හිම්** – සීමා කොට ඇත්තේ ය. **කුලුණු** – කරුණාව, **පර දුකත්** – අන්‍යයන්ගේ දුඃඛයෙහි අන්තය, **හිම්** – සීමා කොට ඇත්තේ ය. (සෙසු තන්හි ද හිම් ශබ්දයාගේ අර්ථ මෙසේ මැ යි.) **තා විකුම්** – ඔබගේ වික්‍රමය, **ලෝ සැපත්** – ලොකයාගේ සම්පත්හිය, **හිම්** –. **තා නුවණ** – ඔබගේ ප්‍රඥාව, **මුළුනේ** – සකල ඥෙය මණ්ඩලය, **හිම්** –. **තා වදන්** – ඔබගේ වචන, **මොක් වැදුම්** – මොක්ෂයට ප්‍රවේශ වීම, **හිම්** –. **තෙද** – තෙජස, **රුපු වැනසුම්** – සතුරන්ගේ විනාශය, **හිම්** –. **තා වැනුම්** – ඔබගේ වර්ණනය, **කා කියුම්** – කවරෙකුගේ වර්ණ කථනයක්, **හිම්** – සීමා කොට ඇත්තේ ද?

**විස්තර:**

i **මෙ තොප යස දිගත් හිම්,**

ඔබවහන්සේගේ කීර්තිය දිශාවන්ගේ කෙළවර දක්වා පැතිර ඇතැ යි කී අයුරැ යි.

ii **කුලුණු පරදුකත් හිම්,**

ලොක ස්වාමීන්ගේ කරුණාව දුඃඛිත වූවන්ට මඳ උපකාරයක් කොට සෑහෙනසුලු නො වෙයි. සත්ත්වයන් මුළුමනින් දුක් නැති කරන තෙක් මහා කරුණාව පවත්නේ වෙයි.

iii තනුවණ මුළුනේ හිමි,

ලොකයෙහි දත යුතු දේ යම් පමණ ද, ලෝ හිමියන්ගේ නුවණ එ තෙක් පවතී. ලෝහිමියන්ගේ නුවණ යම් තාක් ඇත් නම් ඥෙයධර්ම ද එ පමණ ම ය.

iv තං වදන් මොක් වැදුම් හිමි,

බුදුන්ගේ අමදහම, සතුන් මොක් පුරට පැමිණ වීම අවසාන ඵලය කොට ඇත්තේ ය.

v තෙද රුපු වැනසුම් හිමි,

බුදුන්ගේ තෙදින් සතුරන්ගේ මානය වැනසෙයි. ඔවුන්ගේ මානය යම් තාක් පවතී නම් ඒ තාක් තෙද පවතී. මෙහි සතුරන්ගේ ජීවිත විනාශය නො ව මාන නාශය ගත යුතු. ධර්මානුකූල වන පිණිස යි.

vi තා වැනුම් කා කියුම් හිමි,

යථාතත්වයෙන් ඔබගේ ගුණ වර්ණනය කිසිවකු විසින් නො කළ හැකි ය යි කී අයුරු යි.

**විපසනි :**

1. **මුළුනේ** – සියලු දත යුතු දේ. **සංස්කාර, විකාර, නිර්වාණ, ලක්ෂණ, ප්‍රඥප්ති** යන පස සියලු දත යුතු දේ අන්තර්ගත කොට ඇති හෙයින් සකලඥෙයමණ්ඩල නම්.

**97. සසරසිඳු කිමි න්ද සව් සතුන් දුක් විසි න්ද**
*** දිගු බිතැ යස අ න්ද සක් එ දෙව් වන්ද ව න්ද**
**ඔහු දෙල රස වි න්ද සා ව දුන් දන් ම ස න්ද**
**එ සඳ එ සඳ අ න්ද දැන් මෙ තා කුම් වන මි ද.**

**අන්වය හා පදාර්ථ:** **සා ව** – ශශ ආත්මයෙහි ඉපිද, **සසරසිඳු** – සංසාර සාගරයෙහි, **කිමින්ද** – නිමගන වූ, **සව් සතුන්** – සකල සත්වයන්ගේ, **දුක්** – දුඃඛය, **විසින්ද** – විච්ඡේදනය කරවා, **දිගුබිතැ** – දිශා නමැති භිත්තියෙහි, **යස** – කීර්තිය, **අන්ද** – අන්දවා, **සක් එ දෙව්** – (බමුණු වෙසින් ආ) ඒ ශක්‍ර දෙවේන්ද්‍රයා ලවා, **වන්ද වන්ද** – වන්දවමින්, **ඔහු දෙල** – ඔහුගේ දෞහෘදය, **රස වින්ද** – රසය විඳනය කරවා, **දුන් දන් ම** – දෙන ලද දානය ම, **සන්ද** – නිසා, **එ සඳ** – එ කල්හි, **එ සඳ** – ඒ චන්ද්‍ර මණ්ඩලයෙහි, **අන්ද** – සිය රුව අන්දව යි. **දැන්** – මෙ කල්හි, **මෙ තා** – මේ ඔබවහන්සේ, **කුම් වනම් ද** – කිම වර්ණනා කෙරෙම් ද?

**විස්තර :**

බොධිසත්වයන් වහන්සේ සසර සැරිසරමින් සා ව උපන්හ. දිනක් පෙහෙවස් සමාදන් ව හුන් ඒ සා පඬිතුමන් පරීක්‍ෂා කරනු පිණිස ශක්‍ර තෙම බමුණු වෙසකින් අවුත් අහරක් ඉල්වූයේ ය. සා බෝසත් තෙම අන් අහරක් නැත්

* දිසබිතැ,

තොත් සිය මසින් ඔහු සතපනු වස් ගිහි මැදට පැන්නේය. එයින් තුෂ්ට වූ සක්රජ බෝසත් රුව සඳමඬලේ ඇන්දේ ය. තිරිසන්ව ඉපිද ත් මෙ බඳු අංශවගී කම් කරවූ ඔබවහන්සේගේ වණ්ණනය කරන්නට සමර්ථ වෙම් ද?

**ටිප්පනි :**

1. **කිමින්ද** – 'කුමුදු - ගැලීමෙහි' ධාතුවෙන් 'කිමින්ද' යි කතෘ කාරක අතීත කෘදන්ත රූපය ලැබේ. දීඝය වූ අයුරු දත්තේ ය.

2. **විසින්ද** – 'වි' පූර්ව 'සිඳු' ධාතුවෙන් සිද්ධ ප්‍රයෝජ්‍ය පූර්ව ක්‍රියා යි. 'ව' ප්‍රත්‍යයාගේ අභාවය සලකන්නේ ය.

3. **අන්ද** – 'අඳ' දැයින් සිද්ධ අයුරු කී නියායෙන් දත යුතු.

4. **දෙළ** – දූසි ආශාව. 'දෙහල' ශබ්දයෙන් සිද්ධ යි.

5. **සන්ද** – නිසා යන අර්ථවත් නිපාතයෙකි. 'සන්ධාය' යන්නෙන් සිද්ධ යි. 'හන්ද' යි කථා ව්‍යවහාරයෙහි පවතී.

6. **අන්ද** – 'අඳ' ධාතුවෙන් සිද්ධ වර්තමානකාලික ප්‍රථම පුරුෂ එක වචන ප්‍රයෝජ්‍ය ක්‍රියාපද යි. ඒ 'අන්දවා, අන්දවත්, - අන්ද, අන්දත්' යන රූප ලබයි. මෙය තනකාල වශයෙන් යෙදිණ. 'එ සඳ' යනු එ බැව් ප්‍රකට කෙරේ.

98. **උදෙසිනි කිවදේතා රූ විලස් ලෝ ඉකුත් වූ**
**නිදෙසිනි පැවසිම් මැ යි නන් විලස්නෙන් මෙනෙන් මා**
**ගැඹුරු ද ඉමහත් වූ ඒ සිලිල් ආර තෝයෙන්**
**බිඳු විඳ රස දත් ලෙව් ඉන් නො වෙන් සව් පෙදෙස්හි.**

**අන්වය හා පදාර්ථ:** **උදෙසිනි** – උද්දේශ වශයෙන්, **කිව ද** – කථනය කරන ලද නමුත්, **ඒ තා** – ඒ ඔබවහන්සේගේ, **ලෝ ඉකුත් වූ** – ලොක විෂය ඉක්ම වූ, **රූ විලස්** – රූප විලාසය, **මා මෙනෙන්** – මාගේ චිත්තයෙන්, **නිදෙසිනි** – නිර්දේශ කිරීම් වශයෙන්, **නන් විලස්නෙන්** – අනෙකාකාරයෙන්, **පැවසිම් මැ යි** – ප්‍රකාශ කොළෙම් ම ය. (ඒ එසේ ම ය) **ගැඹුරු ද** – ගම්භීර වූ, **ඉමහත් වූ** – ඉතා විශාල වූ, **ඒ සිලිල් ආර** – ඒ සාගරයෙහි, **තෝයෙන්** – ජලයෙන්, **බිඳු** – බින්දුවක්, **විඳ** – විඳනය කොට, **ලෙව්** – ලෝ වැසි තෙම, **ඉන් නො වෙන් වූ** – ඒ සාගරජලයෙන් පහ නො වූ, **සව් පෙදෙස්හි** – සකල ප්‍රදේශයෙහි, **රස** – රසය, **දත්** – ජානනය කොළේ ය.

**විස්තර :**

ලොකස්වාමීන්ගේ රූප විලාසය මා කීයේ උද්දේශ (= මාත්‍රකාවෙන් දක්වීම්) වශයෙන් පමණෙකි, එහෙත් සිතින් අනෙකාකාරයෙන් නිර්දේශ (= සවිස්තර ව දක්වීම) කොළෙම් ම ය. ඒ කෙසේයින් ද යත් - යම් සේ ලෝ වැසි තෙම මහ සයුරින් බිඳක් මුව තබා මුළු සයුරෙහි රස දන්නේ ද, එසේයිනි.

**විසඳුම්:**

1. **උදෙසිනි** – උදෙස් + ඉනි. උදෙස් (= උද්දෙශ) නම් මාතෘකා වශයෙන් පමණක් කීම යි.

2. **කිව ද** – කිය ධාතු කෙරෙන් 'ව' ප්‍රත්‍යය යෙදී සිද්ධ කාලාර්ථයෙහි අසමානාර්ථ ක්‍රියා යි. 'කියුව' යි සිටිය යුතු වුවත් ය කාර ලොපයෙන් 'කිව' යි ද ලැබේ.

3. **නිදෙසිනි** – නිදෙස් (= නිර්දේශ) නම් විස්තර ලෙස දක්වීම යි.

4. **සිලිල් ආරැ** – සාගර වාචී 'සලිලාකර' සඳහා 'සිසිලාර' යි සිඳේ. මෙහි වෘත්තය රැකීම පිණිස 'සිලිල් ආර' යි වෙනස් කොට ගන්නා ලදී.

99\. ඉති වනන අනත්දෙව්නා තමා වත් සහස්නෙන්
රුසිරු රුසිරු නෙත් ගත් නන් විලස්නෙන් තිලෝනා
සැණ පුද කර සිව්දිව්මේ විලස්නෙන් ම වස්නා
නැමද සුරනරන් කැන් නන් දිගත් සිත් සෙ යා ගත්.

**අන්වය හා පදාර්ථ:** **ඉති** – මෙසේ, **අනත් දෙව්නා** – අනන්ත දිව්‍ය නාගයා, **තමා වත් සහස්නෙන්** – තමාගේ වක්ත්‍ර සහස්‍රයෙන්, **තිලෝනා** – තථාගතයන් වහන්සේගේ, **නන් විලස්නෙන්** – අනෙකාකාරයෙන්, **නෙත් ගත්** – නෙත්‍රග්‍රහණය කළ, **රුසිරු** – රුචිර වූ, **රුසිරු** – රූපශ්‍රිය, **වනන** – වර්ණනා කරන කල්හි, **සුර නරන් කැන්** – දිව්‍ය මනුෂ්‍යයන් පිළිබඳ සමූහයෝ, **වස්නා** – වර්ෂණය කරන්නා වූ, **සිව්දිව්මේ විලස්නෙන් ම** – චාතුර්ද්වීපික මේඝයක් මෙන් ම, **සැණ පුද කර** – උත්සව පූජා කොට, **නැමද** – නමස්කාර කොට, **නන් දිගත්** – අනෙක දිශාවන්ට, **සිත් සෙ** – අභිමත තියායෙන්, **යා ගත්** – යාත්‍රා ග්‍රහණ කළහය.

**විස්තර:**

i සිව්දිව්මේ විලස්නෙන් ම වස්නා,

මහාද්වීප සතරට ම එක විට වස්නේ **චාතුර්ද්වීපික** මේඝ නම්. ඒ අතිශයින් ම විශාල ය. මුළු ලොවට ම එක විට වර්ෂණය කරන්නට ප්‍රමාණවත් හෙයිනි. දෙවාදීන් කළ උත්සව පූජාව ද එසෙයින් මහත් වූ බව මින් සූචිත යි. චාතුර්ද්වීපික මේඝය යම් සේ අතුරක් නො තබා වසී ද, එ මෙන් නිරතුරු මහපුද පැවැත්තේ ය යනු අංශය යි.

**විසඳුම්:**

1. **අනත්දෙව්නා** – අනන්ත නම් දිව්‍ය නාගයා. හේ අතිශයින් දීර්ඝ ය, බවල ය, මුව දහසක් ඇත්තේ ය. රසාතල වැසි එක් නා කුලයක ප්‍රමුඛයා යි.

2. **රුසිරු** – රුචිර යන්නෙන් සිඳුනා යි.

3. **රුසිරු** – රූප ශ්‍රී. 'රුසිරි' යි ද ලැබේ.

4. **සිව්දිව්** – පූර්වවිදෙහය, අපරගොයානය, ජම්බුද්වීපය, උත්තරකුරුය යන මහා ද්වීප සතර.

**100.** **යළි තෙපද විකුම් පා ගොස් එ දෙව්ලෝ පසස්නා**
**පඬු ඇඹුල සලස්නේ හුන්නෙ තුස්වා එ සක්මන්**
**යදිතු සුරිඳු දම්නා දම් දෙසා ඉන් සකස් නම්**
**පුරස මග සැපත් වී සිව්මුවා ඈ සුරන් හා.**

**අන්වය හා පදාර්ථ:** **යළි** – නැවත, (සර්වඥයන් වහන්සේ) **තෙපද විකුම්** – ත්‍රිපදවික්‍රමය, **පා** – දක්වා, **පසස්නා** – ප්‍රශංසා කරනු ලබන, **එදෙව්ලෝ** – ඒ දිව්‍යලෝකයට, **ගොස්** – ගමනය කොට, **එසක් මන්** – ඒ ශක්‍රයාගේ චිත්තය, **තුස්වා** – තුෂ්ටකරවා, **පඬුඇඹුලසලස්නේ** – පාණ්ඩුකම්බල ශෛලාසනයෙහි, **හුන්නෙ** – වැඩ හුන් සේක. **සුරිඳු** – සුරේන්ද්‍රයා, **යදිතු** – යාච්ඤා කරන කල්හි, **දම්නා** – ධර්මනායකයන් වහන්සේ, **දම් දෙසා** – ධර්මය දේශනා කොට, **ඉන්** – එයින්, **සිව්මුවා ඈ සුරන් හා** – බ්‍රහ්මාදි දෙවතාවන් හා, **සකස් නම්** – සඞ්කස්ස නම්, **පුරස මග** – නගරය සමීපයෙහි මාර්ගයට, **සැපත් වී** – සම්ප්‍රාප්ත වූසේක.

**විස්තර :**

i **යළි තෙපදවිකුම් පා ගොස් එ දෙව්ලෝ පසස්නා,**

යමාමහපෙළහර පෑ සර්වඥයන් වහන්සේ ත්‍රිපද වික්‍රමයක් දක්වා තව්තිසා දෙව්ලොවට වැඩිසේක. එහෙයින් කියන ලදී **මයූරපාද** පරිවෙණාධිපතීන් වහන්සේ විසින් **පූජාවලියෙහි**:–

"මෙසේ මිනිස් ලොව පියවරෙක, යුගන්ධර මුදුනේ පියවරෙක, මෙර මුදුනේ පියවරෙකැ යි ශක්‍රභවනයට තුන් පියවරකින් වැඩිසේක." යි.

**ටිප්පනී :**

1. **තෙපද විකුම්** – පද (= පිය) තුනක් තැබීමෙන් කළ විකුම් = තෙපදවිකුම්.

2. **පඬු ඇඹුල සලස්නේ** – පාණ්ඩු කම්බල ශිලාසනයෙහි. 'පණ්ඩු කම්බල සිලාසන' ශබ්දය ඇසුරින් 'පඬු ඇඹුල් සලස්න' යි පැමිණියේ යි. මෙය විවරණය කරන ලදි **ධම්මපියා අටුවා ගැටපදයෙහි**: "රත්පලස්හි සිවි බඳු සිවි ඇති බැවින් පඬුකඹල නම් සලතෙලක්." යි. මෙහි පඬු සද රක්තවර්ණයෙහි වැටේ. මේ අස්ත මැවුණු ශෛලය වනාහි බඳුවද මල් රැසක් මෙන් රක්ත වර්ණ ය.

3. **තුස්වා** – 'තුෂ්' ධාතු කෙරෙන් 'ආ' ප්‍රත්‍යය හා ප්‍රයෝජ්‍ය 'ව' ප්‍රත්‍යය යෙදී සිද්ධ පූර්වක්‍රියා යි.

4. **යදිතු** – 'යද' ධාතුවෙන් 'ත' ප්‍රත්‍යය ව සිද්ධ අසම්භාව්‍ය ක්‍රියා යි. පිළිපෙරැළියෙන් 'යදිතු' යි සිද්ධ යි. 'කෙළිතු' ආදි මෙසෙයින් යෙදුණු අන්‍ය අසම්භාව්‍ය ක්‍රියා ද දක්නා ලැබේ.

5. **සකස් නම් පුරස** – 'සංකස්ස' නම් නගර සමීපයෙහි. මෙහි 'අස' සද සමීපාර්ථයෙහි යි, **සඞ්කස්ස** නම් **සැවත්** නුවරට තිස් යොදුන් ඔබ්බෙහි වූ නගරයෙකි, විජම් දෙසා දෙව්ලොවින් බටුයේ මේ නගරයට ය.

**101. සුර සරසුන දික් වත් ඒ විලස් හා නො වෙන් වූ**
**මිණිගිගිණි ගිණින් පත් සිව්වනා ඈ සුරන් හා**
**රුසිරු රුසිරු හව්වෙන් ලෝනුවන් ගත් එදම්නා**
**සවැනිය වැනුවන් මුත් අන් කො ඇද්ද තිලෝගි.**

**අන්වය හා පදාර්ථ:** **සුර සරසුන** - ඉන්ද්‍රචාපය, **දික්වත්** - (වක්‍ර නො ව) දීර්ඝ = (ඍජු) වූව හොත්, **ඒ විලස් හා** - එහි විලාසය හා, **නො වෙන් වූ** - සදෘශ වූ, **මිණි ගිගිණි** - මාණික්‍යයෙන් ගහණ වූ, **ගිණින්** - සෝපානයෙන්, **සිව්වනා ඈ සුරන් හා** - බ්‍රහ්මාදි දෙවතාවන් සමග, **පත්** - පැමිණියා වූ, **රුසිරු** - රුචිර වූ, **රුසිරු හව්වෙන්** - රූපශ්‍රී විලාසයෙන්, **ලෝනුවන් ගත්** - ලොකයාගේ නෙත්‍ර ග්‍රහණය කළ, **එ දම්නා** - ඒ ධර්ම නායක වූ, **සවැනිය** - සර්වඥයන් වහන්සේ, **වැනුවන් මුත්** - වර්ණනා කළවුන් මිස, **තිලෝගි** - ත්‍රෛලොක්‍යයෙහි ම, **අන් කො** - අන්‍ය කවර කෙනෙක්, **ඇද්ද** - ඇත්තාහු ද?

**විස්තර:**

i සුර සරසුන දික් වත් ඒ විලස් හා නො වෙන් වූ
මිණිගිගිණි ගිණින් පත් සිව්වනා ඈ සුරන් හා,

ඉන්ද්‍රචාපය නීල, පීත, රක්තාදි වර්ණයන්ගෙන් බබළ යි. ඒ වක්‍ර ව ම දක්නා ලැබේ. විජම් දෙසූ ලොකස්වාමීන්ට සක්ස් පුර දෙරට බස්නා පිණිස ශක්‍ර තෙම සෝපානයක් නිර්මිත කරවී. ඒ සත් රුවන්මුවා වී. දකුණැලයෙන් දෙවියන්ට බස්නා පිණිස රන් හිණක් ද වමැලයෙන් බඹුන් පිණිස රිදී හිණක් ද මැවී සත්රුවන් හිණ සප්තරත්නයන්ගේ කාන්තියෙන් විරාග ව බබළයි. එහෙයින් ඒ හිණි තුණ ම ඉන්ද්‍ර චාපයක් මෙන් දර්ශිතය වේ. එහෙත් ඉඳු සැව්ව මෙන් වක්‍ර නො වේ. වක්‍ර නො වූ ඉඳු සැව්වක් ඇතොත් එ මෙනැ යි කීයේ එහෙයින.

**විපසනී:**

1. **සුරසරසුන** - සුරන්ගේ සරසුන = සුරසරසුන. ඉන්ද්‍රචාප නමින් හඳුන්වනු ලබන වක්‍ර වූ ආලොක රේඛාව දුටු පැරණී ඇතැම්හු එය ශක්‍රයාගේ දුන්න ය යි සලකා **ඉන්ද්‍රචාප** ආදි නම් තැබූහ. එහෙත් ඇතැම් පැරණී ආචාර්‍යයෝ ද එය වාෂ්පයන්හි සූර්‍යරශ්මිය හුණු විට දක්නා ලැබෙන ආලොකයක් බව පැවසූහ. මේ ම සම්භාව්‍ය මතය යි, සරසුන නම් දුන්න යි.

2. **ඒ** - එහි යනු ඉහි යි ද විකල්පයෙන් සිටී, එහි වූ හකාර ලොපයෙන් හා ඉකාරද්වය එක් ව එක ම දීර්ඝයක් වී මෙන් ඒ යි සිටී.

3. **මිණි ගිගිණි හිණින්** - මිණින් ගිගිණී වූයේ = මිණිගිගිණී. මිණි ගිගිණී වූයේ ද එ ම හිණී වූයේ ද = මිණී ගිගිණී හිණී. 'ගහණ' ශබ්දය තත්සම ලෙස ගෙන පිළිපෙරළි කිරීමෙන් ගිගිණී යි සිද්ධ යි. 'සෙණි' ශබ්දයෙන් සිත්නා සෙණි යනු හකාර දෙශයෙන් හා පිළිපෙරළියෙන් හිණී යි සිටී.

102. තුන්ලෝතෝතැන්නෙ * ඉන්දූ කුළුණඹිනි පිරූ
පත් රසල් සිල්තුමුල්මුල්
නන්දික් යාගත් විසල් සව් සොම්ගුණවග නන්
සාසියෙන් නෙත් සගන්නා
සව්වේනේ විකැලන් සිත් තුටු † කල සිවුසස්
නන්පෙලෙන් කිත්සුපුල්මල්
රැස්නෙන් නෙවුනා එදම්නා වැජඹි මුළු දියේ
දෙව්තුරෙව් ලෝ සතොස්වා.

**අන්වය හා පදාර්ථ:** **කුළුණඹිනි** – කරුණා නමැති ජලයෙන්, **පිරූ** – පූරණය කරන ලද, **තුන්ලෝ තෝතැන්නෙ** – ත්‍රෛලෝක්‍ය නමැති ආලවාලයෙහි, **ඉන්දූ** – රෝපණය කරන ලද, **රසල් පත්** – රසා තලයට ප්‍රවිෂ්ට වූ, **සිල්** – ශීල නමැති, **තුමුල් මුල්** – මහත් මූල් ඇති, **නන් දික්** – අනේක දිශාවන්ට, **යාගත්** – යාත්‍රාග්‍රහණය කළ = (විහිදුණු), **සව්සොම්ගුණවග** – සකල සෞම්‍ය ගුණ සමූහ නමැති, **විසල්** – මහත් වූ, **නන් සාසියෙන්** – අනේක ශාඛා ශතයෙන්, **නෙත් සගන්නා** – නේත්‍රයන් සතුටු කරන්නා වූ, **සිවු සස්** – චතුරාර්‍යසත්‍ය නමැති, **නන් පෙලෙන්** – අනේක ඵලයෙන්, **සව් වේනේ** – සකල වෛනෙයජන නමැති, **වි කැලන්** – පක්ෂි සමූහයන්ගේ, **සිත්** – චිත්තයන්, **තුටු කල** – තුෂ්ට කළා වූ, **කිත් සුපුල් මල් රැස්නෙන්** – කීර්ති නමැති සුඵුල්ල කුසුම රාශියෙන්, **නෙවුනා** – විරාජමාන වූ, **එදම්නා** – ඒ ධර්මස්වාමීන්වහන්සේ, **දෙව්තුරෙව්** – දිව්‍යවෘක්ෂයක් මෙන්, **ලෝ** – ලොකයා, **සතොස්වා** – සන්තොෂ කොට, **මුළු දියේ** – සකල ලොකයෙහි, **වැජඹි** – විජෘම්භමාණ වූසේක.

**විස්තර:**

මේ පද්‍යයෙන් බුදුහු කල්පවෘක්ෂයක් මෙන් බැබළුණහ යි දක්වති.

i තුන්ලෝ තෝතැන්නෙ ඉන්දූ කුළුණඹිනි පිරූ,

වෘක්ෂයකට තෝතැන්නක් ඇත්තේ ය. මුනීන්ද්‍රයන් වහන්සේට තුන්ලොව ම තෝතැන්න වී. තෝතැන්නෙහි ද ජලයෙන් තොර ව වෘක්ෂයක් නො වැඩේ. බුද්ධවෘක්ෂයාගේ හටගැන්මට කරුණාව ම ජලය වී. කරුණාව නිසා ම බුදුවරුන් ලොව ඇතිවන හෙයින් මෙ සේ කීහ.

ii පත් රසල් සිල්තුමුල්මුල්,

වෘක්ෂයක පැවැත්මට ප්‍රබල මුල් අවශ්‍ය ය. බුද්ධ නමැති වෘක්ෂයට වනාහි සිල් ම මුල් වේ. 'රසල් පත්' යි කීමෙන් ඒ මූලයන්ගේ ප්‍රබලත්වය හඟවති. **රසාතල** නම් පෘථිවියෙහි යට තලය වූ නාගලොකය යි. එතෙක් බැස ගත්

* උන්වූ † කර.

මුල් ඇති විට කෙසේ නම් ශාන්තිසම්පන්න නො වේ ද? මේ අතිශයින් ස්ථිර වූ සිල් ඇති ය යි කී සේ යි.

සෙස්ස සුබෝධ යි.

**ටිප්පනී :**

1. **තෝතැන්නෙ** - තෝතැනි + ඒ. තෝ (= ජලය) පිණිස වූ තැනි (= තැනුණු වැටිය) = තෝතැනි. දිය රැඳීම පිණිස ගස් වැල් අවට තනන වැටිය යි.

2. **ඉන්දු** - 'හිඳු' ධාතුවෙන් කර්මකාරකයෙහි සිද්ධ අතීත කෘදන්ත යි. 'හින්දු' ය යි සිටිය යුතු තන්හි හ කාර ලෝපයෙන් 'ඉන්දු' යි විය.

3. **රසල්** - පෘථිවියෙහි අධොභාග (= නාගලොව) වාචී රසාතල ශබ්දයෙන් 'රසල්' යි නිපන යි.

4. **තුමුල්** - මහත්. 'තුමුල' ශබ්දයෙන් නිපන යි.

5. **වග** - සමූහ. 'වග්ග' ශබ්දයෙන් නිපන යි.

6. **වී** - පක්ෂීන්ට නම්.

7. **වැජඹි** - 'වජඹ' දයින් 'ඉ' ප්‍රත්‍යය ව සිද්ධ අතීත කාලික ප්‍රථම පුරුෂ එකවචන ක්‍රියා යි. වි පූර්ව ජඹ "බැබලී" මෙහි ධාතුවෙන් සිද්ධයයි ද සැලකුහ.

9. **දෙව්තුර** - දෙවියන්ගේ තුර (= වෘක්ෂය) = දෙව්තුර. මෙහි කල්ප වෘක්ෂය අභිමත යි. ඒ රිසිරිසි දේ දීමෙන් හා ශෝභනත්වයෙන් සියල්ලන් සතුටු කෙරේ.

**සංලක්ෂ්‍යය :**

1. **වෘත්තය** - ස්‍රග්ධරා නම්.

එහි ලක්ෂණ කීහ **කෙදාරභට්ටයෝ වෘත්තරත්නාකරයෙහි**:-

"ම්‍රභ්නෛර්‍ය්‍යානාං ත්‍රයෙණ ත්‍රිමුනි යතියුතා ස්‍රග්ධරා කීර්තිතේ'යම්" යි.

('ම - ර - භ - න' ගණයන්ගෙන් හා ය ගණ තුනකින් යුක්ත වූ සතකින්, තෙවරක් කරන ලද යතියෙන් යුක්ත වූවා ස්‍රග්ධරා නමු.)

**වින්‍යාසය :**

ම ර භ න ය ය ය.

◡ ◡ ◡, ◡ — ◡, ◡ | — —, — — —, — ◡ | ◡, — ◡ ◡, — ◡ ◡ |

1 යති 2 යති 3 යති.

———o———

**ප්‍රාතිහාර්‍ය්‍යශතක විස්තරාර්ථ වර්ණනාව**

**නිමි.**



